222 වන කාණ්ඩය - 13 වන කලාපය
தொகுதி 222 - இல. 13
Volume 222 - No. 13

2013 දෙසැම්බර් 17වන අඟහරුවාදා
2013 டிசம்பர் 17, செவ்வாய்க்கிழமை
Tuesday, 17th December, 2013

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත: කථානායකතුමාගේ තීරණය

**2014 වර්ෂයේ අය වැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභාවේ වාර්තාව**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**විසර්ජන පනත් කෙටුම්පත, 2014 [ විසිවන වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 3 (විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු); 101,201 සිට 205, (බුද්ධශාසන හා ආගමික කටයුතු); ශීර්ෂ 124, 216 (සමාජ සේවා); ශීර්ෂ 183 (මහජන සම්බන්ධතා හා මහජන කටයුතු); ශීර්ෂ 142, 207 සිට 209 (ජාතික උරුමයන් පිළිබඳ); ශීර්ෂ 177, 206 (සංස්කෘතික හා කලා කටයුතු); ශීර්ෂ 134, 236 (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා); ශීර්ෂ 145 (නැවත පදිංචි කිරීමේ); ශීර්ෂ 106, 304 (ආපදා කළමනාකරණ); ශීර්ෂ 188, 294, 322 (උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු); ශීර්ෂ 179, 284 (වනජීවී සම්පත් සංරක්ෂණ); ශීර්ෂ 181 සහ 328 (ඵලදායිතා ප්‍රවර්ධන) ] – කාරක සභාවේදී සලකා බලන ලදි

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
உயர்நீதிமன்ற நீதியரசர்களை நீக்குதல் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம் : சபாநாயகரின் தீர்ப்பு

**2014ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்ட மதிப்பீடுகளிலிருந்து தெரிவுசெய்யப்பட்ட அமைச்சுக்களின் செலவுத் தலைப்புக்கள் பற்றிக் கலந்துரையாடுவதற்கான தெரிகுழுவினது அறிக்கை**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2014: [ஒதுக்கப்பட்ட இருபதாம் நாள்]**
[தலைப்பு 3 (விசேட செயற்பாடுகளுக்கான பணியகம் (சிரேட்ட அமைச்சர்கள்); தலைப்புகள் 101, 201-205 (பௌத்த சாசன, மத அலுவல்கள்); தலைப்புகள் 124, 216 (சமூக சேவைகள்); தலைப்பு 183 (மக்கள் தொடர்பாடல், மக்கள் அலுவல்கள்); தலைப்புகள் 142, 207-209 (தேசிய மரபுரிமைகள்); தலைப்புகள் 177, 206 (கலாசார, கலை அலுவல்கள்); தலைப்புகள் 134, 236 (தேசிய மொழிகள், சமூக ஒருமைப்பாடு); தலைப்பு 145 (மீள்குடியேற்றம்); தலைப்புகள் 106, 304 (அனர்த்த முகாமைத்துவம்); தலைப்புகள் 188, 294, 322 (தாவரவியல் பூங்காக்கள், பொதுப் பொழுதுபோக்கு அலுவல்கள்); தலைப்புகள் 179, 284 (வனசீவராசிகள், வளப் பேணுகை); தலைப்புகள் 181, 328 (உற்பத்தித்திறன் ஊக்குவிப்பு)] - குழுவில் ஆராயப்பட்டது

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Removal of Judges of the Superior Courts (Special Provisions) Bill: Speaker's Ruling

REPORT OF SELECT COMMITTEE TO DISCUSS THE HEADS OF EXPENDITURE OF THE MINISTRIES SELECTED FROM THE BUDGET ESTIMATES OF THE YEAR 2014

ORAL ANSWERS TO QUESTIONS

APPROPRIATION BILL, 2014 – [TWENTIETH ALLOTTED DAY]
Considered in Committee – [Head 3 (Secretariat for Special Functions (Senior Ministers) ); Heads 101, 201-205 (Buddha Sasana and Religious Affairs); Heads 124, 216 (Social Services); Head 183 (Public Relations and Public Affairs); Heads 142, 207-209 (National Heritage); Heads 177, 206 (Culture and the Arts); Heads 134, 236 (National Languages and Social Integration); Head 145 (Re-settlement); Heads 106, 304 (Disaster Management); Heads 188, 294, 322 (Botanical Gardens and Public Recreation); Heads 179, 284 (Wildlife Resources Conservation); Heads 181, 328 (Productivity Promotion)]

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2013 දෙසැම්බර් 17 වන අඟහරුවාදා*
*2013 டிசம்பர் 17, செவ்வாய்க்கிழமை*
*Tuesday, 17th December, 2013*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම පිළිබඳ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත: කථානායකතුමාගේ තීරණය
### உயர் நீதிமன்ற நீதியரசர்களை நீக்குதல் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்: சபாநாயகரின் தீர்ப்பு
### REMOVAL OF JUDGES OF THE SUPERIOR COURTS (SPECIAL PROVISIONS) BILL: SPEAKER'S RULING

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

2013 දෙසැම්බර් මස 11 වැනි දින න්‍යාය පත්‍රයට ඇතුළත් කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින් පාර්ලිමේන්තුවේ අවසරය ගැනීමට නියමිතව තිබූ "උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම පිළිබඳ (විශේෂ විධිවිධාන)" නම් වූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ හා විරුද්ධ පාර්ශ්වයේ ගරු මැති ඇමතිතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද කරුණු සලකා බැලීමෙන් අනතුරුව එම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මාගේ තීරණය සභාවට දැනුම් දෙනු කැමැත්තෙමි. ස්ථාවර නියෝග 47 ප්‍රකාර පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සලස්වා ඇති අතර, පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම මන්ත්‍රීතුමන්ලා සතු අයිතිවාසිකමක් හා වරප්‍රසාදයක් වන බව සඳහන් කරනු කැමැත්තෙමි.

එසේ වුවද, පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ දී ස්ථාවර නියෝග 47(5) ප්‍රකාරව ඒ සඳහා පාර්ලිමේන්තුවේ අවසරය ලබා ගත යුතුය. ඉන් අනතුරුව එම පනත් කෙටුම්පත අදාළ අමාත්‍යවරයා වෙත වාර්තා කිරීම පිණිස යොමු කරනු ලබයි. අදාළ අමාත්‍යවරයා එම පනත් කෙටුම්පතෙහි අරමුණු සහ අඩංගු කරුණුවලට එකඟ වන්නේ නම් එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77වන ව්‍යවස්ථාව ප්‍රකාරව නීතිපතිතුමාගේ සහතිකය ලබා ගැනීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ද ලබා ගැනීමෙන් පසුව පාර්ලිමේන්තුව වෙත අමාත්‍යවරයාගේ වාර්තාව යොමු කළ හැකිය.

අමාත්‍යවරයාගේ එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව දෙවන වර කියවා සලකා බලා වාර්තා කිරීම පිණිස ස්ථාවර කාරක සභාව වෙත මවිසින් යොමු කරනු ලබයි.

ආණ්ඩු පක්ෂයේ හා විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වූ එම කාරක සභාව විසින් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ අමාත්‍ය වාර්තාව සලකා බලා පාර්ලිමේන්තුව වෙත වාර්තා කරනු ලබයි. පාර්ලිමේන්තුව විසින් එම කාරක සභා වාර්තාව සලකා බැලීමෙන් පසුව, පනත් කෙටුම්පත සම්මත විය යුතුය.

මේ අනුව පනත් කෙටුම්පතක් සම්බන්ධ තීරණයක් ගැනීමේ පූර්ණ බලය පාර්ලිමේන්තුව සතු වන අතර එහි අඩංගු -අන්තර්ගත - කරුණු පිළිබඳව සලකා බැලීම සඳහා අවශ්‍ය සියලු ඉඩ ප්‍රස්තා ස්ථාවර කාරක සභාව තුළ දී සහ ඉන්පසුව එහි වාර්තාව සලකා බැලීමේ දී පාර්ලිමේන්තුව වෙත ද හිමි වේ. ඒ අනුව, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින් 2013 දෙසැම්බර් මස 11 වැනි දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත නැවත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දිය හැකි අතර, ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දිය යුතු ද නැද්ද යන්න ස්ථාවර නියෝග 47 (5) ප්‍රකාරව සභාව විසින් තීරණය කළ යුතුය.

## 2014 වර්ෂයේ අය වැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන විශේෂ කාරක සභාවේ වාර්තාව
## 2014 ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட மதிப்பீடுகளிலிருந்து தெரிவுசெய்யப்பட்ட அமைச்சுக்களின் செலவுத் தலைப்புக்கள் பற்றிக் கலந்துரையாடுவதற்கான தெரிகுழுவினது அறிக்கை
## REPORT OF SELECT COMMITTEE TO DISCUSS THE HEADS OF EXPENDITURE OF THE MINISTRIES SELECTED FROM THE BUDGET ESTIMATES OF THE YEAR 2014

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා )**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මෙම කාරක සභාවේ පසු බිම පිළිබඳව වචන ස්වල්පයක් කථා කිරීමට කැමැතියි. 2014 වර්ෂයේ අය වැය ඇස්තමේන්තු පිළිබඳ කාරක සභා අවස්ථාවේ වැඩසටහන් සඳහා

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

වෙන් කොට ඇති කාල සීමාව දින 16ක් නිසාත්, අය වැය කාරක සභා අවස්ථාවේ වැඩසටහන් සඳහා දිනකට පැය 8ක් වෙන් කර ඇති නමුත් එක් දිනකදී අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂ පිළිබද සාකච්ඡා කිරීමට සිදු වී තිබෙන නිසාත්, 2013 නොවැම්බර් මස 22 වන දින ඔබතුමා වෙත මෙම විශේෂ කාරක සභාව පිළිබඳ යෝජනාව මවිසින් ඉදිරිපත් කරනු ලැබුවා. ඔබතුමා ඒ යෝජනාව සැලකිල්ලට ගනිමින් වඩාත් ඵලදායී ලෙස අමාත්‍යාංශ කිහිපයක හෝ වැඩ කටයුතු සාකච්ඡා කිරීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කළා. මීට පෙර වර්ෂ තුනකදීත් මේ ආකාරයෙන්ම මෙවැනි කාරක සභාවක් පත් කරලා, දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා අත් දැකීම් රාශියක් මේ පාර්ලිමේන්තුව ලබා ගෙන තිබෙනවා. ඒ අනුව ඔබතුමා විසින් මෙම කාරක සභා වාර්තාවේ දෙවැනි පිටුවේ සඳහන් මන්ත්‍රීවරුන් මාගේ සභාපතිත්වයෙන් යුතුව එම කාරක සභාව සඳහා පත් කළා. ගරු කථානායකතුමනි, මෙම කාරක සභාව පත් කළායින් අනතුරුව විශේෂයෙන්ම මෙම කාරක සභාවේදී සාකච්ඡාවට භාජනය කළ යුතු යැයි තීරණය කරන ලද විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලයට අයත් අමාත්‍යාංශ 10ක හා ඊට අමතරව තවත් අමාත්‍යාංශ 16ක වැඩ කටයුතු, ඔක්කෝම අමාත්‍යාංශ 26ක වැඩ කටයුතු -එම අමාත්‍යාංශ සියල්ල මෙම වාර්තාවේ 4වැනි පිටුවේ තිබෙන නිසා මම ඒ ගැන කියවන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ- සාකච්ඡාවට භාජනය කළ යුතු යැයි තීන්දු කළා.

ඒ අනුව අපි 2013 දෙසැම්බර් මස 02වැනි දින සිට 2013 දෙසැම්බර් මස 09වැනි දින දක්වා පෙර වරු 10 සිට පස් වරු 4.30 දක්වා වූ කාල සීමාවන් තුළදී එම කාරක සභාව සඳහා පත් කරන ලද මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන්, විශේෂයෙන්ම අදාළ අමාත්‍යාංශවල අමාත්‍යතුමන්ලාගේ, ඒ වාගේම ලේකම්තුමන්ලාගේ සහ නිලධාරි මණ්ඩලයේ, විශේෂයෙන්ම මහා භාණ්ඩාගාරයේ -Treasury එකේ- ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් යුතුව ඉතාම හොඳ වාතාවරණයක් තුළ, බොහොම සුහදශීලී ලෙස එම සභාවේ වැඩ කටයුතු කර ගෙන ගියා කියන එක මම ඔබතුමාට වාර්තා කරන්න කැමැතියි. ඒ වාගේම කාරක සභාවේ සිටින අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා, මැති ඇමතිතුමන්ලා දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුව තුළ ලබා තිබෙන අත් දැකීම් හා පරිපාලනමය දැනුම මත මේ කාරක සභාව මෙහෙය වීමට මට ලබා දෙන ලද සහයෝගය පිළිබඳව මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. අපේ ජෝන් අමරතුංග මැතිතුමාත්, ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමාත්, හර්ෂ ද සිල්වා මැතිතුමාත් බොහොම උනන්දුවෙන් විපක්ෂය වෙනුවෙන් නිරතුරුව ඒ රැස්වීම් සඳහා සහභාගී වීම ගැන මේ අවස්ථාවේදී අපේ ස්තුතිය ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ වාගේම රජය පැත්තෙනුත් අපේ ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා, රවුෆ් හකීම් ඇමතිතුමා, දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා වාගේම ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා බොහෝ කාලයක් තමන්ගේ කාලය වැය කරමින් මේ කාරක සභාවේ වැඩ කටයුතු සාර්ථකව නිම කිරීම සඳහා අපට උදවු කළා. එමෙන්ම පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය, ලේකම් මණ්ඩලයේ අපේ ලේකම්තුමිය ඇතුළු විශාල පිරිසක් නිසි ලෙස වාර්තා තබමින් අපට ඉතා හොඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා සහාය ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ මන්ත්‍රීතුමන්ලා සහ කාරක සභාවේ සාමාජිකතුමන්ලා මේ කාරක සභාවේදී ඉදිරිපත් කරන ලද කරුණු ඒ ආකාරයෙන්ම වාර්තාගත කිරීමේ අවස්ථාවත් මෙවර අපට ලැබිලා තිබෙනවා. එසේම පසු ගිය වර්ෂයේ මේ කාරක සභාව පැවති අවස්ථාවේදී අමාත්‍යාංශ මඟින් කිරීමට පොරොන්දු වුණු කාරණා පිළිබඳව ප්‍රශ්න නගමින්, ඉදිරි කාලයේදී වඩාත් ඵලදායී ලෙස එම අමාත්‍යාංශවල වැඩ කටයුතු නියාමනය කිරීමේ අවස්ථාවත් අපිට මේ කාරක සභාව තුළින් ලැබුණා.

ඒ නිසාම මේ කාරක සභාවේ මෙම පටිපාටිය වැඩිදියුණු කර අනාගතයේ දිගටම පවත්වා ගෙන යා යුතු බව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව නිර්දේශ කරලා තිබෙනවා. සෑම වර්ෂයකදීම කාරක සභා විවාදයට ප්‍රථමයෙන් මේ ආකාරයෙන් සියලු වැය ශීර්ෂයන් විශේෂ කාරක සභාවක් මඟින් සලකා බැලීම වඩා සුදුසු බවත් සඳහන් කරමින් දීර්ඝ කාලීන යෝජනාවකුත් ඉදිරිපත් කරලා තිබෙනවා. අය වැය කාරක සභා විවාදයන්හිදී මන්ත්‍රීවරුන්ට හිමි නොවන අවස්ථාවක් වන නිලධාරින් ලවා කරුණු ගෙන්වා පැහැදිලි කරවා ගැනීම සඳහා යහපත් සාකච්ඡා මණ්ඩපයක් මෙමඟින් සැපයෙන බව ද මේ වාර්තාවේ සඳහන් කරලා තිබෙනවා. එමෙන්ම වත්මන් වසරේ අත් කර ගත් ප්‍රගතිය සහ එළඹෙන වසර සඳහා වන සංවර්ධන සැලසුම් ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හමුවේ තැබීමටත් මේ මඟින් අවස්ථාවක් උදා වනවා. මේ වාර්තාව මඟින් මීට අදාළ කරුණු සියල්ල සවිස්තරාත්මකව ඉදිරිපත් කර තිබෙනවා. මා හිතනවා, මෙයට සහභාගි නොවුණු අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාටත් මෙය හොඳ මඟ පෙන්වීමක් වේවිය කියලා. එක් එක් අමාත්‍යාංශය තුළ තිබෙන අඩු පාඩු, එක් එක් අමාත්‍යාංශයෙන් කළ යුතු වැඩ කටයුතු පිළිබඳව ඉතා පැහැදිලි මඟ පෙන්වීමක්, ඒ වාගේම නිලධාරින්ට අත හැරුණු තැන්, නිලධාරින් විසින් නොකරන ලද සමහර ක්‍රියාවන් පිළිබඳව ක්‍රියාත්මක කිරීමට උනන්දු කරවන තැන් රාශියක් මෙම වාර්තාවේ සඳහන් වනවා. එම නිසා ගරු කථානායකතුමනි, මේ සඳහා සහයෝගය දුන් සියලුම සාමාජික මහතුන්ට හා නිලධාරි මණ්ඩලයටත්, පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් ඉතාම සතුටින් නැවත වතාවක් මගේ ස්තුතිය පුද කරමින්, මේ වාර්තාව ඉදිරිපත් කරනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඒ පිළිබඳව මම විපක්ෂය වෙනුවෙනුත් වචනයක් කථා කරන්නට ඕනෑ. ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ විශේෂ කාරක සභාව පිහිටුවන්නටත්, එම කටයුත්ත කර ගෙන යාම සඳහාත් ඔබතුමා ලබා දුන් සහයෝගය පිළිබඳව. ඒ වාගේම අපේ සභානායකතුමා ඒ විශේෂ කාරක සභාවේ සභාපතිවරයා විධියට එහි කටයුතු සාධාරණව, ප්‍රජාතන්ත්‍රවාදීව සිදු කළ බව මම කියන්නට ඕනෑ.

නමුත් කනගාටුවට තිබෙන එක කරුණක් තමයි, මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වය මදිකම. අපි බලාපොරොත්තු වුණා මේ විශේෂ කාරක සභාවට යොමු කළ විෂයන් පිළිබඳව අපි පාර්ලිමේන්තුවේ වාද විවාද කරනවාට වඩා, කාරක සභාවේ වාඩි වෙලා, අදාළ අමාත්‍යාංශවල නිලධාරින් කැඳවාගෙන ඒ අයගෙන් ප්‍රශ්න කිරීමට තිබුණු අවස්ථාව මේ මන්ත්‍රීවරුන් ප්‍රයෝජනයට ගනීවි කියලා. ඊකට හේතුව, මම දන්නේ නැහැ. එම කාරක සභාවට යොමු කළ අමාත්‍යාංශවල වටිනාකමක් නොතිබුණු නිසා ද කියලාත් පොඩි සැකයක් තිබෙනවා. එම නිසා තමයි සභානායකතුමා කිව්වේ ලබන වර්ෂයේදී සියලුම අමාත්‍යාංශ මෙම කාරක සභාවට යොමු කරලා වාර්තාවක් ලබා ගෙන, ඉන් පසුව මේ පාර්ලිමේන්තුවේ දවස් 10ක විවාදයක් තියමු කියලා, කාරක සභා අවස්ථාව වෙනුවෙන්. මේ නිසා තමයි අපි කියන්නේ මේක තවත් පුළුල් කරන්න ඕනෑ කියලා. ඇත්ත වශයෙන්ම මේ කාරක සභාවේදී අර්ථවත් වැඩ පිළිවෙළක් සිදු වුණා. මෙවර මේ කාරක සභාවට යොමු කළ අමාත්‍යාංශවලට අපේ මන්ත්‍රීවරුන් එපමණ අවධානයක් යොමු කළේ නැහැ. මම දන්නේ නැහැ එය අපේ වරදක්ද කියලා. අපට හුඟක් දේවල් ගැන බලන්නට තිබෙනවා. තර්කයක් තිබුණා ඇමතිවරුන්ට පාර්ලිමේන්තුව තුළ කථා

කරන්න, අදහස් දැක්වීමට අවස්ථාව තිබිය යුතුයි කියලා. හේතුව ඒක වෙන්නත් පුළුවන්. නමුත් මෙම විශේෂ කාරක සභා වාර්තාව පිළිබඳව අපි විවාද කරන්නේ දවස් 2යි. නමුත් ඉදිරියේදී දෙවැනිවර කියවීමේ විවාදයෙන් පසු සියලුම අමාත්‍යාංශ විශේෂ කාරක සභාවකට යොමු කර, වාර්තාවක් ලබා ගෙන කාරක සභා අවස්ථාව වෙනුවෙන් දවස් 10ක පමණ විවෘත විවාදයක් මේ පාර්ලිමේන්තුවේ පවත්වන්නට පුළුවන්. එවිට කාලයත් ඉතිරි වෙනවා, මුදලුත් ඉතිරි වෙනවා.

ඒ වාගේම අපට ඵලදායී ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් අවස්ථාවක් ඇති වනවා කියන එක ඔබතුමාට මේ අවස්ථාවේ දී මතක් කරනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා ඇතුළු එම නිලධාරි මණ්ඩලයටත් ප්‍රශංසා කරනවා. බොහොම වෙහෙස මහන්සි වෙලා ඒ කටයුතුවල යෙදිලා, හැකි ඉක්මනින් වාර්තාවක් ඉදිරිපත් කරන්නට පුළුවන් වීම ගැන අපි සන්තෝෂ වනවා. කෙසේ වෙතත් මෙය ආරම්භයක් පමණයි. අපි මේක තවදුරටත් අර්ථවත් වැඩ පිළිවෙළක් බවට පරිවර්තනය කර ගනිමු කියමින් මා නිහඬ වනවා, ස්තුතියි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. ඒ අත් දැකීම් ප්‍රයෝජනයට අරගෙන අපි සාකච්ඡා කරලා වඩාත් හොඳ වැඩ පිළිවෙළක් හදා ගනිමු.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, "මෙම වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ගාමිණී ලොකුගේ මහතා - පැමිණ නැත.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)
ගරු කථානායකතුමනි, දිගන, සෙනරත්වෙල, පින්නකැටිය, අංක 51 දරන ස්ථානයෙහි පදිංචි එස්.පී. මුත්තුරාජා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු පොන්. සෙල්වරාසා මහතා**
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)
Mr. Speaker, I present a petition from Mr. P. Jehanathan of No. 69/2, Selvanayagam Road, Batticaloa.

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
ගරු කථානායකතුමනි, ඕපනායක, හුණුවල, "සත්සර" නිවසෙහි පදිංචි කේ.ඒ. කාන්ති මහත්මියගෙන්ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු කථානායකතුමනි, ගම්පහ, ඉහළගම, සාගර, අංක 196 බී දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ.එම්. ලක්ෂ්මී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න 09ක් තිබෙනවා. විනාඩි 15යි තිබෙන්නේ. ඒ නිසා කරුණාකර ගරු මන්ත්‍රීවරුන් කෙටියෙන් අතුරු ප්‍රශ්න අහන්න.

ප්‍රශ්න අංක 1-2457/'12 - (2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) අතුරලිය ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඇමතිතුමනි,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය ඇහුවා. පිළිතුරු දෙන කල් ඉන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මට අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ ඇමතිතුමාගෙන්. ඒ නිසා ඇමතිතුමා පැමිණ පිළිතුරු දෙනවා නම් හොඳයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් පිළිතුර සභාගත කළාට පස්සේ අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, එතකොට අතුරු ප්‍රශ්න අහන්නේ කොහොමද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පස්සේ දවසක පැමිණිලි කරන්න එපා. ගරු කථානායකතුමනි, දෙවැනි අවස්ථාවට මේ ප්‍රශ්නය අහන්නේ. ඒ නිසා පස්සේ පැමිණිලි කරන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. ඇමතිතුමා පැමිණිලා පිළිතුරු දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඇමතිතුමා පැමිණියාම පිළිතුර බලාපොරොත්තු වනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එසේ බලාපොරොත්තු වෙනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ළමා අපචාර හා අපයෝජන නඩු : දඬුවම්
## சிறுவர் துர்நடத்தை மற்றும் துஷ்பிரயோக வழக்குகள் : தண்டனைகள்
## JUVENILE DELINQUENCY AND CHILD ABUSE CASES: PUNISHMENTS

2997/'12

**2. ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වර්ෂ 2009 සිට 2012 දක්වා කාල සීමාව තුළ අධිකරණයට ඉදිරිපත්ව ඇති සමස්ත ළමා අපචාර හා අපයෝජන නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම නඩු අතුරින් මේ වන විට විභාග වෙමින් පවතින සංඛ්‍යාව සහ විභාග කොට අවසන් කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට මේ දක්වා විභාග කළ ළමා අපචාර හා අපයෝජන නඩු වලදීවරදකරුවන් වී දඬුවම් ලැබූ සංඛ්‍යාව කොපමණද;

(ii) ළමා අපචාර හා අපයෝජන සිද්ධි සම්බන්ධයෙන් වරදකරුවන් වූවන්ට ලබා දෙන උපරිම දඬුවම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2009ஆம் ஆண்டு முதல் 2012ஆம் ஆண்டு வரை நீதிமன்றத்தில் தாக்கல் செய்யப்பட்டுள்ள சிறுவர் துர்நடத்தை மற்றும் துஷ்பிரயோக வழக்குகளின் மொத்த எண்ணிக்கை யாது;

(ii) மேற்படி வழக்குகளில் தற்போது விசாரணை மேற்கொள்ளப்படுகின்ற மற்றும் விசாரணை முடிவடைந்துள்ளவற்றின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2009ஆம் ஆண்டு முதல் இற்றைவரை விசாரணைக்கு எடுக்கப்பட்ட சிறுவர் துர்நடத்தை மற்றும் துஷ்பிரயோக வழக்குகளில் குற்றவாளிகளாகக் காணப்பட்டு தண்டனை வழங்கப்பட்டவர்களின் எண்ணிக்கை யாது;

(ii) சிறுவர் துர்நடத்தை மற்றும் துஷ்பிரயோக சம்பவங்களுடன் தொடர்புடைய குற்றவாளிகளுக்கு வழங்கப்படும் உயர்ந்தபட்ச தண்டனை யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice:

(a) Will he state -

(i) the total number of juvenile delinquency cases and child abuse cases which have been brought before the courts of law from the year 2009 to 2012; and

(ii) separately out of those cases, the number of cases which are still being heard and the number of cases which have been concluded by now?

(b) Will he inform this House -

(i) the number of individuals who were convicted and punished in juvenile delinquency and child abuse cases heard from the year 2009 up to now; and

(ii) the maximum punishment meted out to those who are convicted in juvenile delinquency and child abuse cases?

(c) If not, why?

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவூப் ஹக்கீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i)

| වර්ෂය | ඉදිරිපත් කරන ලද අධි චෝදනා සංඛ්‍යාව |
|---|---|
| 2009 | 497 |
| 2010 | 483 |
| 2011 | 617 |
| 2012 | 830 |
| එකතුව | 2,427 |

(නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබුණු තොරතුරු - ඇමුණුම i බලන්න)

(ii) පුළුල් ලෙස ව්‍යාප්ත වූ කොටස්වලට වර්ගීකරණය කරන ලද දත්ත ඇතුළත් විස්තීර්ණ දත්ත පදනමක් නොමැත. එම නිසා දත්ත එක්රැස් කිරීම සඳහා දීර්ඝ කාලයක් ගත වේ.

(ආ) (i) වරදකරුවන් කොට බන්ධනාගාරගත කළ තැනැත්තන්

| වර්ෂය | වරදකරුවන් කොට දඬුවම් පමුණුවන ලද තැනැත්තන් සංඛ්‍යාව |
|---|---|
| 2009 | 168 |
| 2010 | 273 |
| 2011 | 76 |
| 2012 | සකස් කොට නොමැත. |

(බන්ධනාගාර මූලස්ථානය වෙතින් ලැබුණු තොරතුරු - කරුණාකර ඇමුණුම ii බලන්න.)

(ii) පුළුල් ලෙස ව්‍යාප්ත වූ කොටස්වලට වර්ගීකරණය කරන ලද දත්ත ඇතුළත් විස්තීරණ දත්ත පදනමක් නොමැත. එම නිසා දත්ත එක්රැස් කිරීම සඳහා දීර්ඝ කාලයක් ගත වේ. කෙසේ වුවද, ළමා අපචාර සඳහා උපරිම දඬුවම් පැමිණ වීම වරදේ බරපතළකම අනුව වෙනස් වේ. ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව උපරිම දණ්ඩනය වසර 30ක් සහ දඩයකින් සමන්විත වනු ඇත. (වරදවල් සහ අදාළ දඩ මුදල්වල සාරාංශය මීට අමුණා ඇත. - කරුණාකර ඇමුණුම iii බලන්න.)

I have given you a detailed list of what the punishments are and what type of offences attract those punishments.

(ඇ) පැන නොනඟී.

ඇමුණුම් **සභාගත*** කරමි.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් අහන්නේ ළමා අපයෝජන නඩු සම්බන්ධයෙනුයි. මෙවැනි නඩුවක් සමහර විට වසර 8ක් 10ක් වැනි කාලයක් පුරාවට අහනවා. අවුරුදු 6ක දරුවෙක් අපයෝජනයට ලක් වුණොත් ඒ දරුවාට අවුරුදු 16 වන කොට තමයි ඒ නඩුව අහලා අවසන් වන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් බලන්න වේලාව. ඒ නිසා අතුරු ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මා ඉතාම කෙටියෙන් අහන්නම්, ගරු කථානායකතුමනි.

ගරු ඇමතිතුමනි, මේ නඩු මාස හයක් හෝ වසරක් වැනි කෙටි කාලයක් තුළ අහලා අවසන් කිරීමට ක්‍රමවේදයක් නැද්ද? අප විටින් විට මේ ගැන කථා කර තිබෙනවා. එවැනි ඉක්මන් ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන් ද?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
අපි දැනට මේ වෙනුවෙන් විශේෂ උසාවි පිහිටු වීමේ ක්‍රියා දාමයක් පටන් ගෙන තිබෙනවා. ඒ සඳහා වූ මහේස්ත්‍රාත් අධිකරණ පිහිටුවමින් පවතිනවා. ඒ වාගේම මහාධිකරණ පවා දැන් පිහිටුවමින් පවතිනවා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි, ගරු කථානායකතුමනි. අධිකරණ ඇමතිතුමා දැන් කියපු ආකාරයට, මේ කාල පරිච්ඡේදය ඇතුළත දී නඩු ගණනාවක් -මා හිතන්නේ නඩු 4,000කට කිට්ටු ප්‍රමාණයක්- වාර්තා වෙලා තිබෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු ආකාරයට මේ වන විට සිර බත් කන්නේ වූදිතයන් 520දෙනකු පමණයි. 2008 සිට 2012 දක්වා බල හා සුළු අපරාධ-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු ඇමතිතුමනි, සිර බත් කන්නේ වූදිතයන් 520දෙනකුය කියලායි ඔබතුමා සඳහන් කළේ. ඒ වූදිතයන් අතර දේශපාලනඥයන් කොපමණ ඉන්නවා ද? ඒ වූදිතයන්ට නිසි දඬුවම් ලබා දීමට ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ගරු කථානායකතුමනි, මෙවැනි ප්‍රශ්නයක් මට යොමු කරලා නැහැ. ප්‍රථම වතාවටයි, එතුමිය මේ ගැන අහන්නේ. එබැවින් මට දැන් ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමට නොහැකියි. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කියපු අනෙක් කාරණාව වැරැදියි. මා කියාපු පරිදි වරදකරුවන් ලෙස දඬුවම් පමුණු වන ලද තැනැත්තන්ගේ සංඛ්‍යාව -

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
520යි කියලායි ඔබතුමා කිව්වේ.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
සාමාන්‍යයෙන් නඩුවකට කල් ගත වෙනවා. නමුත් ඒ නඩු ශීඝ්‍රයෙන් අසා නිම කිරීම සඳහා තමයි, අපි අලුත් පියවර කීපයක් ගෙන තිබෙන්නේ. ඒ සඳහා වූ විශේෂ කමිටුවක් අප අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ සභාපතිත්වය යටතේ අපි පත් කර ගෙන තිබෙනවා.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙසේයි, ගරු කථානායකතුමනි. මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි කියා තිබෙනවා, විශේෂයෙන් ළමයින් සම්බන්ධයෙන් වන නඩු අසා දඬුවම් නියම කිරීම ඉක්මන් කිරීමට ජාතික ළමාරක්ෂණ අධිකාරියට විශේෂ බලතල දෙනවාය කියා. මේ සම්බන්ධයෙන් තවමත් කිසිම ක්‍රියා මාර්ගයක් අරගෙන නැහැ. ඒ සඳහා ජාතික ළමාරක්ෂණ අධිකාරියට දෙන්න බලාපොරොත්තු වන්නේ මොන වාගේ බලතල ද?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ජාතික ළමාරක්ෂණ අධිකාරිය ඇතුළුව අපේ අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, බන්ධනාගාර නිලධාරින් අපි සියලු දෙනාම එකතු වෙලා මේක කඩිනම් කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කර එය විධිමත්ව කර ගෙන යන්න සූදානමින් සිටිනවා. [බාධා කිරීමක්]

## මුලතිව් දිස්ත්‍රික්කයේ ඉඩම් : අන්සතු කිරීම
### முல்லைத்தீவு மாவட்டக் காணிகள்: பராதீனப்படுத்தல்
### LANDS IN MULLAITIVU DISTRICT : ALIENATION

3112/'12

**3. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) දේශපාලනඥයින් සහ දේශපාලනයට සම්බන්ධ නිලධාරින් විසින් මුලතිව් දිස්ත්‍රික්කයේ සමහර ඉඩම් 2010 ජනවාරි මස සිට බලහත්කාරයෙන් අල්ලාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 සිට බලපත්‍ර හෝ ස්වර්ණභූමි ඔප්පු මත අයිතිය පවරනු ලැබූ, බදු දුන් හෝ අන්සතු කළ මුලතිව් දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල නම්, අක්කර ප්‍රමාණය සහ වටිනාකම කොපමණද;

(ii) ඉහත ඉඩම් පැවරීමට හෝ ලබා දීමට හේතු සහ එහිදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත (අ) හි සඳහන් ප්‍රදේශවල දශක ගණනාවක් තිස්සේ ජීවත්වන පුද්ගලයන්ට සහ අන් අයටත් ඉහත ආකාරයට ඉඩම් ලබා ගැනීමට අවස්ථාව සහ පහසුකම් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ත්‍රස්තවාදීන්ට අයත්ව තිබූ ප්‍රදේශ ශුද්ධකරණය කිරීමේ මුවාවෙන් මුලතිව් දිස්ත්‍රික්කයේ වෙරළාශ්‍රිත ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ගෙන් බලහත්කාරයෙන් හෝ තර්ජනය කිරීමෙන් අත්පත් කර ගැනීම පිළිබඳව චෝදනාව කරුණු සහගතද;

(ii) නොඑසේ නම්, එවන් චෝදනා එල්ල වන්නේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

காணி, காணி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010சனவரி மாதத்திலிருந்து முல்லைத்தீவு மாவட்டத்திலுள்ள சில காணிகள் அரசியல்வாதிகளாலும் அரசியல் ரீதியாகத் தொடர்புடைய அலுவலர்களாலும் பலவந்தமாக எடுக்கப்பட்டிருப்பது பற்றி அவர் அறிவாரா?

(ஆ) (i) 2010 ஆம் ஆண்டிலிருந்து முல்லைத்தீவு மாவட்டத்தில் உடைமை மாற்றப்பட்டிருக்கின்ற, குத்தகைக்கு விடப்பட்டிருக்கின்ற மற்றும் அனுமதிப் பத்திரம் அல்லது `சுவர்ணபூமி' உறுதிகளின் பிரகாரம் பராதீனப்படுத்தப்பட்டிருக்கின்ற அரசாங்கக் காணிகளின் பெயர்கள், ஏக்கர் அளவுகள், பெறுமதிகள் ஆகியவற்றை காணி வாரியாகவும்;

(ii) மேற்சொன்ன காணிகளை மாற்றிக்கொடுத்தல் அல்லது ஒப்படைத்தல் மற்றும் அதில் கேள்விப் பத்திர நடைமுறைகளைப் பின்பற்றாமை ஆகியவற்றுக்கான காரணங்களையும்;

(iii) மேலே(அ)இல் குறிப்பிடப்பட்டுள்ள தசாப்த காலங்களாக வாழ்ந்துகொண்டிருக்கும் மக்களுக்கும் ஏனையவர்களுக்கும் மேற்படி காணிகளைப் பெற்றுக்கொள்வதற்கு வாய்ப்புகள் அல்லது வசதிகள் வழங்கப்பட்டிருக்கின்றனவா என்பதையும்

அவர் கூறுவாரா?

(இ) (i) பயங்கரவாதிகளின் உடைமையாக இருந்த பகுதிகளைச் சுத்திகரித்தல் எனும் பெயரில் முல்லைத்தீவு மாவட்டத்திலுள்ள கடற்கரைக் காணிகளைச் சட்டரீதியான உரிமையாளர்களிடமிருந்து பலவந்தமாக அல்லது வலுக்கட்டாயத்துடன் சுவீகரித்தல் தொடர்பான சார்த்துரை உண்மையானதா என்பதையும்;

(ii) இன்றேல், அத்தகைய சார்த்துரை எவ்வாறு எழுகின்றது என்பதையும்

அவர் கூறுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Lands and Land Development:

(a) Is he aware that since January 2010, certain lands in the Mullaitivu District have been grabbed by politicians and politically affiliated officials?

(b) Will he state -

(i) the names, acreages and values of the Government lands in the Mullaitivu District of which ownerships have been transferred, leased out, alienated on permit or "Swarnabumi" deeds, on per land basis since 2010;

(ii) the reasons for transferring or handing over the aforesaid lands and not following the tender procedures therein ; and

(iii) whether the opportunities and facilities have been given to the people living for decades in the areas referred to in (a) and others to obtain lands as per above?

(c) Will he also state -

(i) whether the allegation of taking over the beach lands in the Mullaitivu District from the lawful owners forcibly or with duress under the pretext of cleansing the terrorists owned areas is factual; and

(ii) if not, as to how such allegation comes about?

(d) If not, why?

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා (ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன் - காணி, காணி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Janaka Bandara Tennakoon - Minister of Lands and Land Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) අල්ලා ගෙන නොමැත.

(ආ) (i) බලපත්‍ර/ස්වර්ණභූමි ඔප්පු මත අයිතිය පවරනු ලැබූ, බදු දුන්, අන්සතු කළ ඉඩම් 11ක් තිබෙන අතර ප්‍රමාණය හෙක්ටෙයාර 62.3238කි. තක්සේරු වටිනාකම රුපියල් ලක්ෂ 93කි.

(ii) ඉහත ඉඩම් රජයේ අවශ්‍යතා සඳහා විවිධ දෙපාර්තමේන්තුවලට සහ නේවාසික, කෘෂිකාර්මික සහ වාණිජ කටයුතු සඳහා පවරා තිබේ. ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනතෙහි විධිවිධාන අනුව මෙම පැවරීම් කර ඇත.

(iii) ඔව්. 2008/4 හා 2013/1 චක්‍රලේඛවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම මඟින් ලබා දී ඇත.

(ඇ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ඈ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. මට අහන්න තිබෙන්නේ අතුරු ප්‍රශ්න දෙකයි. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය අහන්න යොමු වුණේ මේ හේතුව නිසායි.

උතුරු ප්‍රදේශයේ ව්‍යාපාරවල නියැලුණු අය, අවුරුදු 20ක්, 25ක්, 30ක් ඒ පැත්තේ පදිංචිව සිටි සිංහල සහ දෙමළ අය උතුරු පළාත් සභා මැතිවරණය අවස්ථාවේදී නැවත ඔවුන්ගේ ඉඩම්වලට ගියාම දේශපාලනඥයන් විසින් ඒ ඉඩම් අත් පත් කර ගෙන තිබෙන බව ඔවුන් කියනවා. වග කීමක් තිබෙන ඇමතිවරයෙකු විධියට ඔබතුමාගෙන් මම මෙය ඇහුවේ ඒ පළාතේ ඉඩම් පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන නිසායි. එහෙම නැතිව දේශපාලන අරමුණකින් නොවෙයි.

මුලතිව් කළපුව ළඟ එක පැත්තක පන්සලක් තිබුණා. අනෙක් පැත්තේ පල්ලියක් තිබුණා. ඒ තැන්වල ගහලා තිබෙනවා, මේ ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට අරගෙන තිබෙනවා, මේ ඉඩම Coast Conservation Department එකට අරගෙන තිබෙනවා කියලා. ඒ ඉඩම්වල සැබෑ හිමිකරුවන් අපට ඔවුන්ගේ ඔප්පු පවා පෙන්වූවා.

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்)
(The Hon. Janaka Bandara Tennakoon)
ගරු මන්ත්‍රීතුමනි, මේ සඳහා හොඳ පසු බිම් වාර්තාවක් සපයා තිබෙනවා. මම ඒක ඔබතුමාට පිරිනමන්නම්. ඊට පස්සේ ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමා මට කථා කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා රජයේ ඇමතිවරයෙකු වශයෙන් මට මේ සඳහා පිළිතුරක් ලබා දෙන්න. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභාවලට අයිති ඉඩම් පිළිබඳ කටයුතු කෙරෙන්නේ පළාත් සභා තුළින් ද, නැත්නම් ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් ද?

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்)
(The Hon. Janaka Bandara Tennakoon)
අවසානයේ අපේ අමාත්‍යාංශය තුළින් තමයි ඒවා කෙරෙන්නේ. පළාත් සභාවේ පළාත් ඉඩම් කොමසාරිස්තුමාගෙන් අපි ඒ සම්බන්ධයෙන් වාර්තා ලබා ගන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
යම් ව්‍යාපාරයක් කරන්න අවශ්‍ය නම්, නැත්නම් පෞද්ගලික කටයුත්තක් කරන්න අවශ්‍ය නම් ඒ ඉල්ලීම කරන්න ඕනෑ ඔබතුමාගේ අමාත්‍යාංශයට ද? එහෙම නැත්නම් දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභාවෙන් ඒ ඉල්ලීම ඔබතුමාගේ අවසරය ලබා ගන්න යොමු කරනවා ද?

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்)
(The Hon. Janaka Bandara Tennakoon)
ඒ ඉල්ලීම ප්‍රාදේශීය ලේකම්තුමා මාර්ගයෙන් පළාත් ඉඩම් කොමසාරිස්ට ගිහිල්ලා එතුමා මාර්ගයෙන් අපට එනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා මේ සම්බන්ධයෙන් යම් විධියක වැඩ පිළිවෙළක් ඇති කරන්න.

**ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்)
(The Hon. Janaka Bandara Tennakoon)
අවසානයේ අපි තමයි එය තීන්දු කරන්නේ. මේ තුළින් කාටවත් අසාධාරණයක් වන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

## ආයෝජන මණ්ඩලය යටතේ ඇති ඇඟලුම් කර්මාන්තශාලා: විස්තර
## முதலீட்டுச் சபையின்கீழான ஆடைத் தொழிற்சாலைகள்: விபரம்
## GARMENT FACTORIES REGISTERED UNDER BOARD OF INVESTMENT: DETAILS

3926/'13

4. **ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල සීමාව තුළ,
- (i) ආයෝජන මණ්ඩලය යටතේ ලියා පදිංචි වී ඇති මුළු ඇඟලුම් කර්මාන්තශාලා සංඛ්‍යාව;
- (ii) ඒවායින් වැසී ගොස් ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව;
- (iii) ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ පැවති මුළු රැකියා සංඛ්‍යාව;
- (iv) ඇඟලුම් අපනයනය කිරීමෙන් ලැබූ විදේශ විනිමය ප්‍රමාණයේ වටිනාකම;
- (v) ඇමෙරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා ඇඟලුම් අපනයන වෙළෙඳ පොළ ප්‍රතිශතය;
- (vi) යුරෝපා සංගමය තුළ එම වෙළෙඳ පොළ ප්‍රතිශතය;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

முதலீட்டு ஊக்குவிப்பு அமைச்சரைக் கேட்ட வினா:
(அ) 2005ஆம் ஆண்டிலிருந்து 2011ஆம் ஆண்டு வரையான காலப்பகுதியில்,
- (i) முதலீட்டுச் சபையின்கீழ் பதிவுசெய்யப்பட்டுள்ள ஆடைத் தொழிற்சாலைகளின் மொத்த எண்ணிக்கை எவ்வளவென்பதையும்;
- (ii) அவற்றில் மூடப்பட்டுள்ள தொழிற்சாலைகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;
- (iii) ஆடைத்தொழில் துறையில் காணப்பட்ட தொழில் வாய்ப்புகளின் மொத்த எண்ணிக்கை எவ்வள வென்பதையும்;
- (iv) ஆடைகள் ஏற்றுமதியின்மூலம் பெறப்பட்ட வெளிநாட்டுச் செலாவணியின் பெறுமதி எவ்வளவென்பதையும்;
- (v) ஐக்கிய அமெரிக்காவுக்கான இலங்கையின் ஆடைகள் ஏற்றுமதிச் சந்தையின் சதவீதம் எவ்வளவென்பதையும்; அத்துடன்
- (vi) ஐரோப்பிய ஒன்றியத்தில் மேற்படி சந்தையின் சதவீதம் எவ்வளவென்பதையும்

ஆண்டுவாரியாக வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Investment Promotion:

(a) Will he state separately, for each year for the period from the year 2005 to 2011 -
- (i) the total number of garment factories that have been registered under the Board of Investment;
- (ii) the number of factories that have been closed down out of them;
- (iii) the total number of employment opportunities prevailed in the garment industry sector;
- (iv) the amount of foreign exchange earned through garment exports;
- (v) the percentage of Sri Lanka's garment export market share in United States of America; and
- (vi) that percentage of market share in the European Union?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - முதலீட்டு ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Minister of Investment Promotion)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල සීමාව තුළ,

(i) ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති මුළු ඇඟලුම් කර්මාන්ත ශාලා සංඛ්‍යාව

| වර්ෂය | ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති මුළු ඇඟලුම් කර්මාන්ත ශාලා සංඛ්‍යාව |
|---|---|
| 2005 | 23 |
| 2006 | 36 |
| 2007 | 28 |
| 2008 | 21 |
| 2009 | 10 |
| 2010 | 24 |
| 2011 | 18 |
| එකතුව | 160 |

*මූලාශ්‍රය : MIS BOI*

(ii) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති ඇඟලුම් කර්මාන්ත ශාලා අතුරින් වැසී ගොස් ඇති කර්මාන්ත ශාලා සංඛ්‍යාව

| වර්ෂය | වැසී ගොස් ඇති කර්මාන්ත ශාලා සංඛ්‍යාව |
|---|---|
| 2005 | 06 |
| 2006 | 14 |
| 2007 | 13 |
| 2008 | 05 |
| 2009 | 01 |
| 2010 | 01 |
| 2011 | 00 |
| **එකතුව** | **40** |

*මූලාශ්‍රය : MIS BOI*

(iii) ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ පැවති මුළු රැකියා සංඛ්‍යාව
(Garment Companies under BOI)

ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ පැවති මුළු රැකියා සංඛ්‍යාව (Garment Companies Under BOI)

| වර්ෂය | සේවක සංඛ්‍යාව |
|---|---|
| 2005 | 275,888 |
| 2006 | 271,508 |
| 2007 | 296,332 |
| 2008 | 302,304 |
| 2009 | 307,912 |
| 2010 | 264,456 |
| 2011 | 276,551 |

*මූලාශ්‍රය : MIS BOI*

(iv) ඇඟලුම් අපනයනය කිරීමෙන් ලැබූ විදේශ විනිමය ප්‍රමාණයේ වටිනාකම

| වර්ෂය | ඇඟලුම් අපනයනය කිරීමෙන් ලැබූ විදේශ විනිමය ප්‍රමාණය(ඇ.එ.ජ.ඩොලර් මිලියන) | |
|---|---|---|
| | සියලු ඇඟලුම් කර්මාන්ත ශාලාවලින් | BOI ඇඟලුම් කර්මාන්තශාලාවලින් |
| 2005 | 2,748 | 2,718 |
| 2006 | 2,917 | 2,548 |
| 2007 | 3,144 | 3,058 |
| 2008 | 3,284 | 3,210 |
| 2009 | 3,120 | 3,026 |
| 2010 | 3,178 | 3,115 |
| 2011 | 3,986 | 3,906 |

*මූලාශ්‍රය : BOI and Central Bank of Sri Lanka*

(v) ඇමෙරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා ඇඟලුම් අපනයන වෙළෙඳපොළ ප්‍රතිශතය

| වර්ෂය | ඇ.එ.ජනපදයේ ශ්‍රී ලංකා ඇඟළුම් අපනයන වෙළෙඳපොළ ප්‍රතිශතය |
|---|---|
| 2005 | 2.12% |
| 2006 | 2.08% |
| 2007 | 1.88% |
| 2008 | 1.82% |
| 2009 | 1.68% |
| 2010 | 1.50% |
| 2011 | 1.61% |

*මූලාශ්‍රය : International Trade Centre*

(vi) යුරෝපා සංගමය තුළ එම වෙළෙඳපොළ ප්‍රතිශතය

| වර්ෂය | යුරෝපා සංගමයේ ශ්‍රී ලංකා ඇඟලුම් අපනයන වෙළෙඳපොළ ප්‍රතිශතය |
|---|---|
| 2005 | 0.94% |
| 2006 | 1.03% |
| 2007 | 1.09% |
| 2008 | 1.15% |
| 2009 | 1.24% |
| 2010 | 1.21% |
| 2011 | 1.20% |

*මූලාශ්‍රය : International Trade Centre*

(ආ) අදාළ නොවේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්න එකකට සීමා කළොත් හොඳයි. තව විනාඩි දෙකකින් ප්‍රශ්නවලට වෙන් වුණු කාලය අවසාන වනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

හොඳයි, ගරු කථානායකතුමනි. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි ඇමතිතුමනි. ඔබතුමන්ලාත් හිටපු එක්සත් ජාතික පක්ෂයේ ඒ කාලයේ ආණ්ඩුවේ මේ ඇඟලුම් කර්මාන්තයට විශාල තැනක් ලැබුණා. විශේෂයෙන් බංග්ලා දේශය අපනයනය -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

විස්තර කරන්න දෙන්න බැහැ. කෙටි වෙලාවකුයි තිබෙන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

බංග්ලා දේශය බිලියන 5 ක් අපනයනය කරනකොට ලංකාව බිලියන 3ක් අපනයනය කළා. දැන් වෙනකොට බංග්ලා දේශය බිලියන 20ක් අපනයනය කරනවා, ලංකාව බිලියන 4යි. මේ අපනයනය පහත වැටීම ගැන ඔබතුමා දෙන උත්තරය මොකක් ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

කිසි පහත වැටීමක් නැහැ. ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ අපට quota system එක නැති වුණත්, ඒ වාගේම අපට GSP නැති වුණත් එය රඳවා ගෙන ඉන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අප යුරෝපා වෙළඳ පොළට අද ගිහින් තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ වෙළඳ පොළට අප ගිහින් තිබෙනවා. දැන් බංග්ලා දේශයේ අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. දැන් ඇඟලුම් කර්මාන්තශාලා පැමිණෙමින් පවතිනවා. මේ වන විට ඇඟලුම් කර්මාන්තශාලා 20කට වැඩි ප්‍රමාණයක් අලුතින් ඇති කිරීම සඳහා ඉඩම් ලබා ගෙන තිබෙනවා. එම නිසා quota නැති වුණත්, GSP නැති වුණත් ඉදිරි කාලයේදී ඇඟලුම් ක්ෂේත්‍රයේ ඉස්සරහට යන්නට පුළුවන් ශක්තියක් අපට තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් නවත්වන්න. වෙලාව හරි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

2005ත් එක්ක බැලුවාම රැකියා ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම ඇමෙරිකාව සහ එංගලන්තයත් එක්ක බැලුවාම ප්‍රතිශතය අඩු වෙලා තිබෙනවා. එතකොට අපනයන පහත වැටිලා නැහැ කියලා ඔබතුමා කියන්නේ කොහොමද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේ රටින් විදේශවල වෙනත් රැකියාවලට විශාල ප්‍රමාණයක් ගිහිල්ලා තිබෙනවා. මේ වනවිට ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ 7,000ක් පුරප්පාඩු තිබෙනවා. සේවකයෝ හොයලා දෙන්න. පුරප්පාඩු 7,000ක් තිබෙනවා. සේවකයෝ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දැන් අපි -[බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, වෙලාව නැහැ නේ. [බාධා කිරීමක්] මොකක්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මේක අහන්නම ඕනෑ ප්‍රශ්නයක්, ගරු සභාපතිතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් 10.00ට ප්‍රධාන කටයුතු ආරම්භ කරන්න ඕනෑ නේ. පොඩ්ඩක් මට උදවු කරන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එහෙම නම් කමක් නැහැ. ඔබතුමා හින්දා දෙනවා.[බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි.

## ධාවනය නොකර නවතා තබා ඇති ශ්‍රීලංගම බස් රථ : ගම්පහ දිස්ත්‍රික්කය
## சேவையில் ஈடுபடுத்தப்படாத இபோச பஸ் வண்டிகள் : கம்பஹா மாவட்டம்
## SLTB BUSES PARKED WITHOUT PLYING : GAMPAHA DISTRICT

4172/'13

**7. ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මේ වනවිට ගම්පහ දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝ සහ වෙනත් භූමි තුළ දින 30 කට වැඩි කාලයක් ධාවනයේ නොයොදවා නවතා තබා ඇති බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ ධාවනය නොකර නවතා තබා ගැනීමට හේතු කවරේද;

(iii) එම බස් රථ නැවත ධාවනය කරවීම සඳහා අලුත්වැඩියා කිරීමට සිදුවේ නම්, ඒ සඳහා අවශ්‍ය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සුනාමි ව්‍යසනයෙන් පසුව ආධාර වශයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ලැබුණු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම බස් රථ අතරින් ධාවන තත්ත්වයේ පවතින බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 ජනවාරි සිට මේ දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා ආනයනය කර ඇති බස් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது கம்பஹா மாவட்டத்தில் இலங்கைப் போக்குவரத்துச் சபைக்கு உரித்தான டிப்போக்கள் மற்றும் வேறு காணிகளில் 30 நாட்களுக்கும் அதிக காலம் சேவையில் ஈடுபடுத்தாது நிறுத்தி வைக்கப்பட்டுள்ள பஸ் வண்டிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி பஸ் வண்டிகள் சேவையில் ஈடுபடுத்தப்படாது நிறுத்தி வைக்கப்பட்டுள்ளமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி பஸ் வண்டிகளை மீண்டும் சேவையில் ஈடுபடுத்துவதற்காக திருத்த வேண்டியிருப்பின், அதற்குத் தேவையான பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சுனாமி அனர்த்தத்தின் பின்னர் உதவியாக இலங்கைப் போக்குவரத்துச் சபைக்குக் கிடைத்த பஸ் வண்டிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) தற்போது மேற்படி பஸ் வண்டிகளில் சேவையில் ஈடுபடுத்தக்கூடிய நிலையில் உள்ள பஸ் வண்டிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) 2012 ஜனவரி முதல் இன்றுவரை இலங்கைப் போக்குவரத்துச் சபைக்கு இறக்குமதி செய்யப்பட்டுள்ள பஸ் வண்டிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அதற்காக செலவிடப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport:

(a) Will he inform this House -

(i) the number of buses parked at the depots of the Sri Lanka Transport Board and other sites in the Gampaha District for more than 30 days;

(ii) the reasons for keeping those buses at parking places without being routed for plying; and

(iii) if these buses needed repair, the cost needed to put them into running condition?

(b) Will he state -

(i) the number of buses received by the SLTB as grants after the tsunami disaster;

(ii) the number of those buses that are in running condition by now;

(iii) the number of buses imported for SLTB since January 2012 up to now; and

(iv) the cost incurred for that?

(c) If not, why?

**ගරු කුමාර වෙල්ගම මහතා (ප්‍රවාහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார வெல்கம - போக்குவரத்து அமைச்சர்)
(The Hon. Kumara Welgama - Minister of Transport)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 193කි.

(ii) එන්ජින්, ගියර් පෙට්ටි, බොඩි අලුත්වැඩියා ඇතුළු සියලුම අලුත්වැඩියා කටයුතු සිදු කළ යුතු බැවින් එම බස් රථ ධාවනයෙන් ඉවත් කර ඇත.

(iii) රුපියල් 33593000.00කි. (තිස්තුන් මිලියන පන්ලක්ෂ අනූතුන්දහසකි.)

(ආ) (i) බස් රථ 201කි.

(ii) බස් රථ 52කි.

(iii) ආසන 54 බස් රථ සංඛ්‍යාව - 120

ආසන 33 බස් රථ සංඛ්‍යාව - 281

(iv) රුපියල් මිලියන 1496.9කි.

(ඇ) පැන නොනඟී.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 8 - 3013/'12 - (2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය : පවරා ගත් ඉඩම්
## கொழும்பு வெளி சுற்றுவட்ட அதிவேக நெடுஞ்சாலை அபிவிருத்திக் கருத்திட்டம்: சுவீகரித்த காணிகள்
## COLOMBO OUTER CIRCULAR HIGHWAY DEVELOPMENT PROJECT: LANDS ACQUIRED

3261/'12

**9. ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රජයට පවරා ගත් ඉඩම්වල දළ තක්සේරු වටිනාකම හා භූමි ප්‍රමාණය කොපමණද;

(ii) පවරා ගත් එම ඉඩම් අයත් ප්‍රදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව සහ එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) කටුනායක අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පවරා ගත් ඉඩම්වල වටිනාකම දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு வெளி சுற்றுவட்ட அதிவேக நெடுஞ்சாலை அபிவிருத்திக் கருத்திட்டத்திற்காக அரசாங்கத்தினால் சுவீகரிக்கப்பட்ட காணிகளுக்கான அண்ணளவான மதிப்பீட்டுப் பெறுமதி மற்றும் நிலத்தின் பரப்பளவு எவ்வளவென்பதையும்;

(ii) சுவீகரிக்கப்பட்ட மேற்படி காணிகள் உரித்தாகின்ற பிரதேச செயலாளர் பிரிவுகளின் எண்ணிக்கை மற்றும் அப்பிரதேச செயலாளர் பிரிவுகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) கட்டுநாயக்க அதிவேக நெடுஞ்சாலை அபிவிருத்திக் கருத்திட்டத்திற்காக சுவீகரிக்கப்பட்ட காணிகளின் பெறுமதி அண்ணளவாக எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Highways, Ports and Shipping:

(a) Will he inform this House of -

(i) the gross assessed value and the extent of land that have been acquired by the Government for the Colombo Outer Circular Highway Development Project;

(ii) the number of Divisional Secretariat

[ගරු රෝසි සේනානායක මහත්මිය]

Divisions and the names of those Divisional Secretariat Divisions to which the acquired lands belong to; and

(iii) the gross value of the land area acquired for the Katunayake Highway Development Project?

(b) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා (මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Minister of Highways, Ports and Shipping)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

| | ප්‍රශ්නය | පිළිතුරු | | |
|---|---|---|---|---|
| (අ) (i) | කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රජයට පවරාගත් ඉඩම්වල දළ තක්සේරු වටිනාකම හා භූමි ප්‍රමාණය කොපමණද; | ව්‍යාපෘතියේ නම | භූමි ප්‍රමාණය | දළ තක්සේරු වටිනාකම |
| | | පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර I (දකුණු කොටස) | හෙක්ටයාර 100.35<br>• තක්සේරු වර්ෂය 2005-2013<br>• නිවාස සහිත ගෙවතු සංඛ්‍යාව 58<br>• ව්‍යාපාරික ගොඩනැගිලි සංඛ්‍යාව 22<br>• නිවාස,ව්‍යාපාරික ගොඩනැගිලි සහ වගාකල බිම් ප්‍රමාණය හෙක්.96.17<br>• මුඩුබිම් ප්‍රමාණය හෙක්. 4.18 | රුපියල් මිලියන 2200 |
| | | පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර II (කඩුවෙල සිට කඩවත දක්වා) | හෙක්ටයාර 82<br>• තක්සේරු වර්ෂය 2006-2008<br>• නිවාස සහිත ගෙවතු සංඛ්‍යාව 279<br>• ව්‍යාපාරික ගොඩනැගිලි සංඛ්‍යාව 25<br>• නිවාස,ව්‍යාපාරික ගොඩනැගිලි සහ වගාකල බිම් ප්‍රමාණය හෙක්.49.3<br>• මුඩුබිම් ප්‍රමාණය හෙක්. 32.7 | රුපියල් මිලියන 2750 |
| | | පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර III | හෙක්ටයාර 80.94<br>• තක්සේරු වර්ෂය 2009-2012<br>• නිවාස සහිත ගෙවතු සංඛ්‍යාව 266<br>• ව්‍යාපාරික ගොඩනැගිලි සංඛ්‍යාව 70<br>• නිවාස,ව්‍යාපාරික ගොඩනැගිලි සහ වගාකල බිම් ප්‍රමාණය හෙක්.49.78<br>• මුඩුබිම් ප්‍රමාණය හෙක්. 31.16 | රුපියල් මිලියන 5000 |
| (ii) | පවරාගත් එම ඉඩම් අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව සහ එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද; | ව්‍යාපෘතියේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම |
| | | පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර I (දකුණු කොටස) | 02 | 1. මහරගම<br>2. කඩුවෙල |
| | | පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර II (කඩුවෙල සිට කඩවත දක්වා) | 03 | 1. කඩුවෙල<br>2. බියගම<br>3. මහර |
| | | පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර III | 02 | 1. මහර<br>2. වත්තල |
| (iii) | කටුනායක අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පවරාගත් ඉඩම්වල වටිනාකම දළ වශයෙන් කොපමණද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද? | දළ වශයෙන් රුපියල් මිලියන 3000 ක් පමණ වේ. | | |
| (ආ) | නොඑසේ නම්, ඒ මන්ද? | පැන නොනගී. | | |

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දෙවන වටය.
ප්‍රශ්න අංක 5 - 3943/'13 - (1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## යුද්ධය නිසා අනාථ වූ ළමුන් සහ වැන්දඹුභාවයට පත් කාන්තාවන් : පුනරුත්ථාපනය

### யுத்தத்தினால் அநாதைகளான சிறுவர்கள் மற்றும் விதவைகள் : புனர்வாழ்வளிப்பு

### CHILDREN ORPHANED AND WOMEN WIDOWED DUE TO WAR: REHABILITATION

3964/'13

**6. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු පී.හැරිසන් මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு பீ. ஹரிசன் சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. P. Harrison)
ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල පැවති යුද්ධය හේතුවෙන්,

(i) අනාථ වී ඇති ළමුන් සංඛ්‍යාව කොපමණද;

(ii) පුනරුත්ථාපනය කිරීම සඳහා ආරම්භ කර ඇති වැඩසටහන් කවරේද;

(iii) වැන්දඹුභාවයට පත් වී ඇති කාන්තාවන්ගේ සහ අනාථභාවයට පත් වී ඇති දරුවන්ගේ පුනරුත්ථාපන කටයුතු සඳහා 2013 අය වැයෙන් වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) வடக்கு, கிழக்கில் நடைபெற்ற யுத்தம் காரணமாக,

(i) அநாதைகளான சிறுவர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) அவர்களுக்கு புனர்வாழ்வளிப்பதற்காக ஆரம்பிக்கப்பட்டுள்ள நிகழ்ச்சித்திட்டங்கள் யாவை என்பதையும்;

(iii) விதவைகளான பெண்கள் மற்றும் அநாதைகளான சிறுவர்களின் புனர்வாழ்வளிப்புக்காக, 2013 வரவு செலவுத்திட்டத்தின் மூலம் ஒதுக்கப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Child Development and Women's Affairs:

(a) Will he state -

(i) the number of children who have been orphaned;

(ii) the names of the programmes which have been initiated to rehabilitate them; and

(iii) the amount of money allocated from the Budget of 2013 for the rehabilitation activities of women who were widowed and children who were orphaned;

as a result of the war that prevailed in the North and the East?

(b) If not, why?

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ආ) ඉහත අසා ඇති ප්‍රශ්නය ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතට අයත් නොවන බැවිනි.

කෙසේ වෙතත් මෙම අමාත්‍යාංශය මඟින් පහත සඳහන් කාර්යයන් උතුරු නැඟෙනහිර පළාත්වල වාසය කරන ළමුන්ගේ සහ කාන්තාවන්ගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියාත්මක කොට ඇත.

උතුරු පළාත් ළමා සහ කාන්තා කටයුතු පුළුල්ව විධිමත්ව හා මනා සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ළමා සහ කාන්තා සංවර්ධන ඒකක පිහිටුවීමටත් පවත්නා ඇබැර්තු සම්පූර්ණ කිරීමටත් කටයුතු කර ඇත. එම ප්‍රදේශවල සේවය කරන වනිතා සංවර්ධන නිලධාරින්ගේ රාජකාරි ක්ෂේත්‍ර ගමන් අවශ්‍යතා විශේෂ කොට සලකා යතුරු පැදි පවා ලබා දී ඇත.

යුද්ධය නිසා භාරකරුවන් නොමැතිව අනාථ භාවයට පත් වූ ළමුන්ට හා මව හෝ පියා භාරයේ පසුවන ළමුන්ට ආධාර කිරීම සඳහා 'සුරක්නා' යන වැඩසටහන ආරම්භ කර ඇත. මේ යටතේ ළමුන්ගේ

[ගරු තිස්ස කරල්ලියද්ද මහතා]

භාරකාරත්වය සඳහා ඥාතියකු හඳුනා ගන්නා අතර, එම ඥාතියාට ළමුන්ගේ සුභසිද්ධිය සඳහා රු.750/-ක මාසික මූල්‍යාධාරයක් සපයනු ලැබේ. මෙමගින් ළමුන් අඛණ්ඩව පාසැල් යැවීම අපේක්ෂා කෙරෙන අතර පාසල් බලධාරීන් සමඟ කටයුතු කරමින් මෙවැනි ළමුන් පාසලට පැමිණීම අධීක්ෂණය කරනු ලැබේ.

මෙම වැඩසටහනේ ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ආරම්භය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | මන්නාරම | 2011 ජූලි | 84 |
| 02. | කිලිනොච්චි | 2011 අගෝස්තු | 53 |
| 03. | මුලතිව් | 2011 දෙසැම්බර් | 52 |
| | එකතුව | | 189 |

කාන්තා කටයුතු සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වෙත වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් රු. මිලියන 3.44ක් 2013 වසරේදී උතුරු නැගෙනහිර පළාත්වල යුද්ධය නිසා වැන්දඹුභාවයට පත් කාන්තාවන්ගේ පුනරුත්ථාපන කටයුතු සඳහා යොදවා ඇත. එම වැඩසටහන් පහතින් දැක්වේ.

01 වැන්දඹු කාන්තාවන් සඳහා ස්වයං රැකියා ආධාර ලබා දීම.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදල (රු .මිලියන) |
|---|---|---|---|
| 01. | එරාවූර් පත්තු | 14 | 0.28 |
| 02. | එරාවූර් නගරය | 14 | 0.28 |
| 03. | කොරළේපත්තු මධ්‍යම | 34 | 0.68 |
| 04. | මන්මුනේපත්තු | 26 | 0.52 |
| 05. | කාත්තන්කුඩි | 49 | 0.98 |
| 06. | ඔඩ්ඩමාවඩි | 2 | 0.04 |
| 07. | කෝරළේපත්තු (උතුර) | 19 | 0.38 |
| එකතුව | | 158 | 3.16 |

02. වැන්දඹු තත්ත්වයට පත් අඩු ආදායම්ලාභී ගෘහ මූලික කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා ඔවුන් ස්වයංරැකියා ගැන්වීමට උපරිමය රු.20,000/-ක පොලී රහිත සහන ණය මුදලක්, වාරික 12කින් ආපසු අය කර ගැනීම හා එය චක්‍රීයව ක්‍රියාත්මක කිරීම.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුදල රු.මිලියන |
|---|---|---|---|
| ➢ යාපනය<br>➢ මුලතිව්<br>➢ කිලිනොච්චි<br>➢ මඩකලපුව<br>➢ අම්පාර<br>➢ ත්‍රිකුණාමලය | සත්වපාලනය<br>වෙළඳාම<br>ඇඳුම්මැසීම<br>බෝග වගාව<br>ගෘහ කර්මාන්ත හා අත්කම් නිෂ්පාදනය<br>ආහාර නිෂ්පාදනය හා විකිණීම | 140 | 0.28 |

* දැනටමත් ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් යුද්ධය නිසා සිදු වූ ජීවිත හා දේපොළ හානි පිළිබඳව දීප ව්‍යාප්තව ගණනය කිරීම සඳහා සංගණනයක් අරඹා තිබෙන බව ද වැඩිදුරටත් දන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

# පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 70(2)හි විධිවිධානවල සහ 2013.11.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2014)" සලකා බැලීම සඳහා 2013 දෙසැම්බර් මස 17 සහ 2013 දෙසැම්බර් මස 18 දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා.7.00 දක්වා ද විය යුතු ය. අ.භා. 6.30ට ස්ථාවර නියෝග අංක 7හි (5) සහ (6) ඡේදයන් ක්‍රියාත්මක විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# විසර්ජන පනත් කෙටුම්පත, 2014
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2014
## APPROPRIATION BILL, 2014

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-
[ප්‍රගතිය: දෙසැම්බර් 14 ]
[කථානායකතුමා මූලාසනාරූඪ විය. ]

குழுவில் மேலும் ஆராயப்பெற்றது. - [தேர்ச்சி : டிசம்பர் 14]
[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]

Considered further in Committee.- [Progress: 14th December]
[MR. SPEAKER in the Chair.]

**3 වන ශීර්ෂය.- විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු)**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 367,325,000

**தலைப்பு 3.- விசேட செயற்பாடுகளுக்கான பணியகம் (சிரேட்ட அமைச்சர்கள்)**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 367,325,000

HEAD 3. - SECRETARIAT FOR SPECIAL FUNCTIONS (SENIOR MINISTERS)

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 367,325,000

**101 වන ශීර්ෂය.- බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.158,075,000

**தலைப்பு 101.- பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 1.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 158,075,000

HEAD 101. - MINISTER OF BUDDHA SASANA AND RELIGIOUS AFFAIRS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs.158,075,000

**124 වන ශීර්ෂය.- සමාජ සේවා අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 359,915,000

**தலைப்பு 124.- சமூக சேவைகள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 359,915,000

HEAD 124. - MINISTER OF SOCIAL SERVICES

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 359,915,000

**183 වන ශීර්ෂය.- මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 74,180,000

**தலைப்பு 183.- மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 74,180,000

HEAD 183. - MINISTER OF PUBLIC RELATIONS AND PUBLIC AFFAIRS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 74,180,000

**142 වන ශීර්ෂය.- ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 108,440,000

**தலைப்பு 142.- தேசிய மரபுரிமைகள் அமைச்சர்**

**நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 108,440,000**

HEAD 142. - MINISTER OF NATIONAL HERITAGE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 108,440,000

**177 වන ශීර්ෂය.- සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 144,640,000

**தலைப்பு 177.- கலாசார மற்றும் கலை அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 144,640,000

HEAD 177. - MINISTER OF CULTURE AND THE ARTS

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 144,640,000

**134 වන ශීර්ෂය.- ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යවරයා**

01 වන වැඩසටහන - මෙහෙයුම් වැඩ සටහන - පුනරාවර්තන වියදම, රු. 141,010,000

**தலைப்பு 134.- தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 141,010,000

HEAD 134. - MINISTER OF NATIONAL LANGUAGES AND SOCIAL INTEGRATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 141,010,000

**145 වන ශීර්ෂය.- නැවත පදිංචි කිරීමේ අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 147,105,000

**தலைப்பு 145.- மீள்குடியேற்ற அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 147,105,000

HEAD 145. - MINISTER OF RE-SETTLEMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 147,105,000

**106 වන ශීර්ෂය. - ආපදා කළමනාකරණ අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 114,840,000

**தலைப்பு 106.- அனர்த்த முகாமைத்துவ அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 114,840,000

HEAD 106. - MINISTER OF DISASTER MANAGEMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 114,840,000

**188 වන ශීර්ෂය.- උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යවරයා**

01 වන වැඩසටහන - මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 72,290,000

**தலைப்பு 188.- தாவரவியல் பூங்காக்கள் மற்றும் பொது பொழுதுபோக்குகள் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 72,290,000

HEAD 188. - MINISTER OF BOTANICAL GARDENS AND PUBLIC RECREATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 72,290,000

**179 වන ශීර්ෂය.- වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන -පුනරාවර්තන වියදම, රු.92,725,000

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

**தலைப்பு 179.- வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 92,725,000

HEAD 179. - MINISTER OF WILDLIFE RESOURCES CONSERVATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 92,725,000

**181 වන ශීර්ෂය.- ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන -පුනරාවර්තන වියදම, රු.101,600,000

**தலைப்பு 181.- வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 101,600,000

HEAD 181. - MINISTER OF PRODUCTIVITY PROMOTION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 101,600,000

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

පළමුවැනි උපලේඛනය, ශීර්ෂ අංක 3, 101, 201 සිට 205, 124, 216, 183, 142, 207 සිට 209, 177, 206, 134, 236, 145, 106, 304, 188, 294, 322, 179, 284, 181 සහ 328 සලකා බැලීම අපර භාග 6.30 දක්වා. ගරු ජෝන් අමරතුංග මහතා.

[පූ.භා. 10.03]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු සභාපතිතුමනි," 2014 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ දී, අද දින එනම් 2013 දෙසැම්බර් 17වන අඟහරුවාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ වැය ශීර්ෂ අංක 03, 101, 201-205, 124, 216, 183, 142, 207-209, 177, 206, 134, 236, 145, 106, 304, 188, 294, 322, 179, 284, 181, 328 දරන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහනින් සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් දහයකින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

[පූ.භා. 10.04]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

කාරක සභාවේ මූලසුන හොබවන ගරු සභාපතිතුමනි, ඉතාමත්ම වැදගත් කාර්යයක් පිළිබඳවයි මා කථා කරන්නේ. ඒ, වැය ශීර්ෂ ගැන නොවෙයි, අය වැය කාරක සභාව පිළිබඳවයි. අය වැය කාරක සභාවේ විමර්ශනයට ලක් වුණු සියලුම අමාත්‍යාංශ පිළිබඳව මගේ අදහස් ප්‍රකාශ කරන්නට මම අවසරය පතනවා.

පළමුවෙන්ම මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ජාතික අය වැය සලකා බැලීම සඳහා යෝජිත ආකෘතිය කෙරෙහි. එහි මෙහෙම සඳහන් වනවා :

"විසර්ජන පනත් කෙටුම්පත හා ඇස්තමේන්තු අය වැය දෙවන වර කියවීම අවම වශයෙන් එක් මසකට පෙරාතුව ඉදිරිපත් කළ යුතු වේ."

මේක ඉතා වැදගත්. නමුත් එහෙම වෙලා නැහැ. එහෙම නොවුණොත් මේ කිසිම මන්ත්‍රීවරයෙකුට මේ කාරක සභාවට ඒ කරුණු අධ්‍යයනය කරලා ඉදිරි කටයුතු කරන්නට ලැබෙන්නේ නැහැ.

"අය වැය කාරක සභාව ඒ අවස්ථාවේදීම පත් කරනු ඇත."

විශේෂයෙන්ම මේ සම්පූර්ණ අය වැය, සියලුම අමාත්‍යාංශ මේ කාරක සභාවට පත් කළ යුතුයි කියන එක තමයි අපි යෝජනා කළේ. මේ කොමිටියත් ඒකට එකඟ වුණා.

"අය වැය කාරක සභාව විසින් ඇස්තමේන්තු හා උපලේඛන සමඟ විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලිය යුතු වේ"

එහෙම නැත්නම් මේ පාර්ලිමේන්තුවේ කරන කථාත්, කොමිටියේ කරන කථාත් සාර්ථක කථා බවට පත් වෙන්නේ නැහැ. අපට වෙලාව පිළිබඳ ප්‍රශ්නය හරියට තිබුණා. ඒ සුළු කාලය තුළදී අපට ඒ කටයුතු කරන්නට හම්බ වුණේ නැහැ.

"කාරක සභා අවස්ථාවේදී අය වැය කාරක සභා වාර්තාව සමඟ අය වැය යෝජනාව සලකා බැලිය යුතුය."

මේකත් ඉතාම වැදගත් යෝජනාවක්.

"අය වැය කාරක සභාව විසින් එයට යොමු කර ඇති අමාත්‍යාංශ සලකා බලා ඒ සම්බන්ධව වාර්තාව ද ඉදිරිපත් කළ යුතු වේ"

මෙයින් ඉතාමත්ම වැදගත් වැඩ කොටසක් වෙයි කියලා මම හිතනවා.

මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා මේ අමාත්‍යාංශ ගැන ප්‍රශ්න රාශියක් තිබුණ බව. ඒ ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන් ආකාරය පිළිබඳවත් අප වෙනම සාකච්ඡා කළ යුතුව තිබෙනවා. ඒ නිසාම අපට තිබෙනවා සාකච්ඡාවට භාජන කළ යුතු විශේෂ කරුණු.

මා සූදානම් කළ මගේ කථාව කියවන්න වෙලාව මදි වුණොත් මා ඔබතුමාගේ අවසර පතනවා, කථාවේ ඉතිරි කොටස හැන්සාඩගත කරන්න ඉඩ දෙන්න කියලා.

2014 අය වැයට අදාළව තෝරා ගත් අමාත්‍යාංශ ගණනාවක වැය ශීර්ෂ සාකච්ඡා කිරීම සඳහා පිහිටුවන ලද පාර්ලිමේන්තු විශේෂ කාරක සභා අවස්ථාවේ වාර්තාව පිළිබඳව සාකච්ඡා වන අද දිනයේ ඒ ආරම්භක කථාව කිරීමට හැකි වීම ගැන මා සතුටු වෙනවා. තෝරා ගත් වැය ශීර්ෂ කිහිපයක් හෝ මෙලෙස විශේෂ කාරක සභා අවස්ථාවකදී විවාදයට ගැනීම අප ලද ජයග්‍රහණයක්. මන්ද, එවැනි විශේෂ කාරක සභා අවස්ථාවකට ඇමතිවරු, මන්ත්‍රීවරු මෙන්ම අදාළ නිලධාරින් ද සහභාගි වන බැවින් ඵලදායි සාකච්ඡාවක් පවත්වා නිර්දේශ ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබෙන නිසා. පාර්ලිමේන්තුවේදී වැය ශීර්ෂයක් විවාදයට ගත් විට

මන්ත්‍රීවරුන් තමන්ට හැකි අයුරින් කරුණු සොයා බලා කථා කරනවා. විපක්ෂයේ අපි ආණ්ඩුව විවේචනය කරනවා; වැය ශීර්ෂ විවේචනය කරනවා; අඩු පාඩු කථා කරනවා. ඇමතිවරුන් කුමක් හෝ පිළිතුරක් ලබා දී ඒ චෝදනාවලින් නිදහස් වෙනවා.

ගරු සභාපතිතුමනි, මේ නිසාම අපට ඇති වෙලා තිබෙන ප්‍රශ්න රාශියක් ගැන ඒ කාරක සභාවේ ගරු සභාපතිතුමාත් ඔබතුමාගේ අවධානයට යොමු කළා. අපත් ඒ කරුණු ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

විශේෂ කාරක සභා අවස්ථාවේදී චෝදනාවලට අමාත්‍යවරයාට මෙන්ම නිලධාරීන්ට ද පිළිතුරු දීමට හැකි වන නිසා කාට කාටත් වැරදි අවබෝධ කර ගෙන වඩාත් ඵලදායි තීරණ ගන්න අවස්ථාව ලැබෙනවා.

මෙවර වාගේම ගිය වරත් අප මේ අත් දැකීම ලබා ගත්තා. දැන් පවතින තත්ත්වයේ ගැටලු කිහිපයක් තියෙනවා. මින් එකක් තමයි ගැටලු වැඩි, මහජනතාවට වඩාත් සමීප අමාත්‍යාංශ විශේෂ කාරක සභාවට යොමු නොකිරීම. ප්‍රවාහන, කෘෂිකර්ම, ධීවර වැනි ගැටලු විශාල ප්‍රමාණයක් පවතින අමාත්‍යාංශ මෙවැනි විශේෂ කාරක සභාවකට යොමු කරනවා නම් අපට පුළුවන් වෙනවා අදාළ නිලධාරීන් සමඟ එම ගැටලු ගැන කථා කරන්න. එතකොට අමාත්‍යවරුන්ටත් ලේසියි. බොරු බයිලා, විහිළු කථා කියන්න ඔවුන්ට අවශ්‍ය වෙන්නේ නැහැ. පසු ගිය විවාදවලදී අප දැක්කා, විපක්ෂය ජනතාවගේ ගැටලු කථා කළාම අදාළ ඇමතිවරු වෙන වෙන විහිළු කථා කියලා මාරු වෙලා යන බව. පාර්ලිමේන්තුව මේ විවාදවලට වියදම් කරනවා. අපේ කාලය, ධනය, ශ්‍රමය නාස්ති වෙනවා. හැබැයි, ජනතාවගේ ප්‍රශ්න විසඳීම බොහොම මන්දගාමියි. ඇමතිවරුන්ට තමන්ගේ මුළු විෂය ක්ෂේත්‍රය ගැනම පුළුල් දැනුමක් තියෙනවා නම් ඒ ඇමතිට විශේෂ බලයක් තියෙන්න ඕනෑ. සාමාන්‍ය කෙනෙකුට එහෙම හැකියාවක් නැහැ කියලා අප දන්නවා. ඒකයි අප කියන්නේ නිලධාරීන් හා මුහුණට මුහුණලා සාකච්ඡා කළ හැකි විශේෂ කාරක සභා අවස්ථාවට වැය ශීර්ෂ කිහිපයක් නොව සියල්ලම එක් කරන්න කියලා. එතකොට අපට පුළුවන් ගැටලු සාකච්ඡා කරලා අනතුරුව පාර්ලිමේන්තුවේදී අපේ අදහස් ඉදිරිපත් කරන්න.

මේ ක්‍රියාදාමයට අපේ දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාත් සහයෝගය දෙනවා කියලා පොරොන්දු වෙලා තිබුණා. යෝජනා ඉදිරිපත් කරන්න. එය අප පත් කර එවන ජනතාවට අප කරන සේවය වඩාත් ඵලදායි වීමට හේතු වෙනවා. ඒ නිසා මම මෙයට පෙර අවස්ථාවල යෝජනා කළා සේම, මෙවර ද යෝජනා කරනවා, සියලුම අමාත්‍යාංශවල වැය ශීර්ෂ විශේෂ කාරක සභා අවස්ථාවකට යොමු කළ යුතු බව. ඒ සඳහා විශේෂ කාරක සභාවේදී එකඟත්වය ලැබුණා. අපි එය යෝජනාවක් හැටියට පිළිගත්තා.

විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය යටතේ තිබෙන ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ වැය ශීර්ෂ පිළිබඳවත් අපි මෙම කාරක සභා අවස්ථාවේදී සාකච්ඡා කළා. එහිදී අප දුටුවා, අනෙකුත් සෑම අමාත්‍යාංශයකටම උපදේශක කාරක සභා තිබුණත් මෙම විශේෂ කාර්යයන් සඳහා වූ ලේකම් කාර්යාලයට උපදේශක කාරක සභාවක් නොමැති බව. මෙය බලවත් ගැටලුවක්. අමාත්‍යාංශ කිහිපයක් ඇතුළත් විශේෂ කාර්යයන් සඳහා වූ ලේකම් කාර්යාලයට අවශ්‍ය උපදෙස් දීම, ගැටලු සාකච්ඡා කිරීම, මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම ආදී කාර්යයන්ට ඇති අවස්ථාව මෙම අමාත්‍යාංශවලට උපදේශක කාරක සභාවක් නොමැති වීමෙන් අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා කඩිනමින් මෙම විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලයටත් උපදේශක කාරක සභාවක් පත් කිරීමට අපි යෝජනා කළා. ඒ සඳහාත් අපේ කමිටුවේ එකඟතාව පළ කළා.

මෙහිදී මතු වුණු තවත් ගැටලුවක් තමයි ඇතැම් අමාත්‍යාංශවලට අමාත්‍යවරයා ඉල්ලුම් කරන මුදල නොලැබීම. උදාහරණයක් ලෙස කියනවා නම්, විද්‍යාත්මක කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයා ගියවර ඉල්ලා තිබූ රුපියල් මිලියන 140 වෙනුවට භාණ්ඩාගාරයෙන් දී ඇත්තේ රුපියල් මිලියන 85ක් පමණයි. ඒ නිසා සූදානම් වුණු කටයුතු කර ගන්න බැරිව අමාත්‍යවරයා බලවත් ගැටලුවකට මුහුණ දෙනවා. පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් අමාත්‍යවරයා කරන සහ සැලසුම් කරන කාර්යභාරය ඉතාම වැදගත්. මේ නිසා අමාත්‍යවරයාට අවශ්‍ය මුදල් භාණ්ඩාගාරයෙන් ලබා දෙන ලෙස අප නිර්දේශ කළා.

ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් සඳහා රජය මඟින් නොමිලේ පෙළ පොත් ලබා දිය යුතු බවට මෙයට පෙරත් යෝජනා වී තිබුණා. ගිය වතාවේත් අපි මේ යෝජනාව ඉදිරිපත් කළා. නමුත් ඇතැම් ආගම්වල දහම් පාසල්වලට තවමත් රජය මඟින් පෙළ පොත් නොමිලේ ලබා දීලා නැහැ. ඒකට හේතුව මොකක්ද කියලා මම නම් දන්නේ නැහැ. විශේෂයෙන්ම ක්‍රිස්තියානි ආගමේ දහම් පාසල්වලට තවමත් නොමිලේ පෙළ පොත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපි මෙවරත් ආණ්ඩුවට මතක් කර සිටිනවා, සියලුම ආගම්වල දහම් පාසල්වලට නොමිලේ පෙළ පොත් බෙදා දීම කඩිනමින් සිදු කරන්න කියලා.

මෙවර අය වැයෙන් යෝජනා කර තිබුණා ආබාධිත පුද්ගලයන් සඳහා රුපියල් 3,000ක සහනාධාරයක් දෙනවා කියලා. මේ යෝජනාව මීට ඉස්සෙල්ලාත් කරලා තිබුණා. නමුත් එවැනි අය කොච්චර ඉන්නවාද, කොච්චර පිරිසකට දුන්නා ද කියලා පැහැදිලි තත්ත්වයක් නැහැ. මේ තරම් ලෙහෙසියෙන් මෙවැනි ආධාරයක් දෙන්න බැහැ. අපි ඒක පිළිගන්නවා. ලබන ජනවාරි මාසයේ සිට පටන් ගන්නවා නම් මේ වන විටත් ඊට අදාළ මූලික කටයුතු අවසන් වෙලා තිබෙන්න ඕනෑ. කාටද ඒ ආධාරය දෙන්නේ? දෙන අය කොහොමද තෝරන්නේ? මොකක්ද තෝරන පදනම? සහනාධාරය දෙන්නේ කොහොමද? ජනතාව මේ ගැන දැන ගන්නේ කොහොමද? මේ කිසිවක් ගැන තවම පැහැදිලිතාවක් නැහැ. අපි දන්නා තරමට මේ පිළිබඳව තවම ක්‍රමවේදයක් නැහැ.

මේ ආකාරයට නිවැරදි අධ්‍යයනයකින් තොරව සහනාධාර දෙන්න ගියොත්, ආබාධිතයන්ගේ සහනාධාරයටත් වෙන්නේ ධීවරයන්ගේ ඉන්ධන සහනාධාරයට වුණ දේමයි. අපි එදාත් මේ විධියටම කරුණු මතු කළා. ආණ්ඩුව, ආණ්ඩුවට හිතුණු හිතුණු විධියට යෝජනා ගෙනෙනවා. ඒවා ක්‍රියාත්මක කරනවා; මාස දෙකක්, තුනක් යන කොට නවත්වනවා. අපි පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළාම "දුන්නා" කියනවා. මෙවැනි වැඩ නිසා දුක් විඳින්නේ කවුද? ආණ්ඩුව රවටන්නේ මේ අප ද; විපක්ෂය ද? නැහැ. මේ රවටන්නේ මේ රටේ අහිංසක ජනතාවයි. මේ නිසා අපි ආණ්ඩුවට බල කර කියා සිටිනවා, "කරුණාකර මේ වැලි සෙල්ලම් බත් උයන එක නවත්වලා වග කීමෙන් වැඩ කරන්න, මේ රටේ අහිංසක ජනතාව අසරණ කිරීම, රැවටීම වහාම නතර කරලා දාන්න" කියලා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වන අපට පළාත් සභා මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාදවත් නැහැ. විමධ්‍යගත මුදල් වෙන් කිරීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සීමා පනවා තිබෙනවා. උදාහරණයක් ලෙස කියනවා නම්, ආබාධිත පුද්ගලයන්ට සහාය වීමේ ව්‍යාපෘතිවලට -නිවාස සෑදීමේ වැඩ පිළිවෙළට, අධ්‍යාපනික කාරණාවලට- උදවු වීමට අපි කැමැතියි. නමුත් එවැනි දේකට මුදල් වෙන් කරන්න අපට පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි කියනවා, පළාත් සභා මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාද පරිදිම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් තමන්ගේ විමධ්‍යගත අරමුදලින් මුදල් වෙන් කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා.

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

විශේෂයෙන්ම අපි ආණ්ඩුවට කියන්න කැමැතියි, නැවත පදිංචි කරවන්නන්ගේ ජල හා සනීපාරක්ෂක පහසුකම් ගැන වඩාත් සැලකිලිමත් වෙන්න කියලා. මේ වන කොට ඒ අය සඳහා වැසිකිළි 45,600ක් ඉදි කරන්න ඕනෑය කියලා හඳුනාගෙන තිබෙනවා. එහෙත් 2014ට මේ සඳහා අනුමත කරලා තිබෙන්නේ රුපියල් මිලියන 150යි. මෙයින් හදන්න පුළුවන් වැසිකිළි 2,600ක් විතරයි. 45,600ක් අවශ්‍ය තැනට වැසිකිළි 2,600ක් හදලා දුන්නාම ඇති වන තත්ත්වය ගැන මේ සභාවේ මම අලුතින් කියන්න අවශ්‍ය වන්නේ නැහැ.

නැවත පදිංචි වූ අයට හදන්න යෝජිත නිවාස දාහේ වැඩ පිළිවෙළ ගැනත් අපිට සතුටු වන්න බැහැ. අවුරුදු තුනකදී ඔවුන් වෙනුවෙන් නිවාස 65,000ක් හදන්න අද යෝජනා කරලා තිබෙනවා. මේ සඳහා අවශ්‍ය මුදල් රජයෙන් සහ ඉන්දියන් රජයෙන් ලැබිලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ගැන එච්චර පැහැදිලි තත්ත්වයක් නැහැ. නැවත පදිංචි වූ සිංහල, දෙමළ, මුස්ලිම් කාගේත් ගැටලු හඳුනා ගැනීම, ඒවාට පිළියම් යෙදීම බොහොම සැලකිල්ලෙන්, කඩිනමින් කළ යුතු කාර්යයක් වෙනවා. සිංහල, මුස්ලිම්, දෙමළ කියන මේ කොයි ජාතියේ තරුණයන් වුණත් තමන්ගේ ගැටලු විසඳා ගන්න අවි අතට ගන්න පුළුවන්. නිය පොත්තෙන් කඩන්න පුළුවන් දෙයක් පොරොවෙන් කපා දමන මට්ටමට එන තුරු බලාගෙන සිටියොත් මේ ආණ්ඩුවට විතරක් නොවෙයි, මුළු රටටම -අනාගතයේ උපදින අයටත්- වන්දි ගෙවන්න වෙයි. මේ නිසා අපි ආණ්ඩුවට බල කර සිටිනවා, අවතැන් වූ ජනතාවගේ අවශ්‍යතාවන් සොයා බලා කඩිනමින් කටයුතු කරන්නය කියලා.

අපේ රටේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව බොහොම අඩු පාඩු තිබෙන දෙපාර්තමේන්තුවක්. නවීන තාක්ෂණික දැනුම වාගේම උපකරණත් අමාත්‍යාංශයට අවශ්‍ය බව ආපදා කළමනාකරණ ඇමතිතුමාත් පිළිගන්නවා. අපට මතකයි, පසු ගිය දවස්වල මුහුදේ ඇති වුණ කුණාටු තත්ත්වය පිළිබඳ නිවැරැදිව කාලගුණික දත්ත නොලැබුණ නිසා අසරණ වුණේ අහිංසක ධීවරයින් කියලා. ඒ අවස්ථාවේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයත්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයත් ගැටුණු ආකාරය අපි දුටුවා. එය විපක්ෂයේ අපට කාලකණ්ණි සතුටක් කියලා සමහරු දැක්කා. අපි ඒ ගැන අවංකවම දුක් වුණා. ඒ මේ සිද්ධියේදී ඇත්තටම අසරණ වුණේ අපේ ධීවරයන් නිසායි. එම නිසා මේවා ගැන සැලකිලිමත් වෙලා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට නව තාක්ෂණික උපකරණ හා දැනුම එක්කර ගන්න කියලා අපි ආණ්ඩුවට කියා සිටිනවා.

තැපැල් සේවා අමාත්‍යාංශයක් තිබෙනවා. එහි ඇමතිවරයා, නියෝජ්‍ය ඇමතිවරයා වාගේම ලේකම්වරයාත් රටේ ප්‍රසිද්ධ චරිත. ඒ අය විවිධ ක්ෂේත්‍රවල නියැලෙන අය නිසා වෙන්න ඇති අද රටේ තැපැල් සේවය බොහෝම දුර්වල ලෙස ඉදිරියට යන්නේ.

සේවකයන්ගේ වැටුප් පිළිබඳ ගැටලු වාගේම, මාරු කිරීම්, උසස් වීම් ලබා දීමේදීත් විවිධ ගැටලු තිබෙනවා. බොහෝ තැපැල් කාර්යාල ගරා වැටෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. රාගම තැපැල් කාර්යාලය බොහොම පැරණි තැපැල් කාර්යාලයක්. ඒ බව විශේෂ කාරක සභාව සහ ලේකම්තුමා පිළිගත්තා. දිස්ත්‍රික්කයෙන් උසස් කරන්න තෝරා ගත් කාර්යාලයක් බවට රාගම තැපැල් කාර්යාලය වහාම පත් කරන්නය කියලා මම මේ වෙලාවේ විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්ම පෞද්ගලික බස්වල රියැදුරන්ගේ වෘත්තීය තත්ත්වය පිළිබඳව අද බරපතළ ගැටලු තිබෙනවා. සමහර අවස්ථාවලදී කොන්දොස්තර මහත්වරු එක පාරටම රියැදුරු මහත්වරුන් වෙනවා. මඟී ජීවිත ගැන, තව කෙනෙකුගේ ජීවත් වීමේ අයිතිය ගැන කිසිදු වග කීමකින් තොරව, රියැදුරු ආසනය කිසිම වෘත්තීය සුදුසුකමක් නැති කෙනකුට පවරන්න අද බස් හිමියන් දෙපාරක් හිතන්නේ නැහැ. ඔවුන් ලාභය ප්‍රධාන අරමුණ කර ගෙන තමන් කරන්නේ සේවයක් කියන දේ අමතක කරලා තිබෙනවා. ඔවුන් මඟීන්ට කථා කරන්නවත් දන්නේ නැහැ. වයසක මනුස්සයකු බස් එකෙන් බහිනවා නම් බස් එක නවත්වා ගෙන ඉන්න ඉවසීමක් නැහැ. වේග රිද්මයේ කැසට් පටයක් කන් බිහිරි වන තරම් සද්දෙට දමලා ඒ රිද්මයම හිතට අරගෙන බස් රථය පදවනවා. ඔවුන්ට මාර්ග නීති නැහැ. තමුන්ගේ ලාභය තමයි එකම නීතිය. එම නිසා අපි විශේෂයෙන්ම පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යවරයාට කියන්නේ කරුණාකර මේවා ගැන සොයා බලන්න කියලායි. රියැදුරන්ට licence තිබෙනවා ද බලන්න. ජීවිත රැසක් අතට ගන්න සුදුසුකම් තිබෙනවා ද කියා සොයා බලන්න. මේවා කරන්න පුළුවන් ක්‍රමවේදයක් නැහැ. ඒක අමාත්‍යවරයාගේ කාර්ය භාරයක්. ආණ්ඩුව අපේ නොවන නිසා මේ රටේ ජනතාව වෙනුවෙන් අපට කරන්න පුළුවන් මේ දේවල් ඔබතුමන්ලාට පෙන්වා දීම පමණයි. විශේෂයෙන්ම බස් රථවල ප්‍රමිතිය ගැනත් සොයා බලන්න. ටයර්වල, තිරිංගවල තත්ත්වය සොයා බලන්න. ඊට සුදුසු ක්‍රමවේදයක් ගොඩ නඟන්න.

ගරු සභාපතිතුමනි, පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. විශේෂයෙන්ම මේ කාරණයත් මා මතක් කරන්න කැමැතියි. අද හුඟාක් බස්වලට, දරුවන්ව පාසල්වලට ගෙන යන වාහනවලට දාන්නේ පරණ ටයර්. අලුත් ටයර් දාන්නට තරම් වත්කමක් ඒ අයට නැහැ. මේක accidents වැඩි වෙන්නට විශාල හේතුවක් වෙනවා.

අද අපේ රටේ රාජ්‍ය සේවයේ ගැටලු බොහොමයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මේ කාරණය මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මෙහි තිබෙන විශාලම ගැටලුව තමයි පුරප්පාඩු රැසක් තිබීම. මහා භාණ්ඩාගාරයෙන් එම තනතුරු සඳහා -වැටුප් සඳහා- මුදල් වෙන් කර තිබුණත් ආයතනවල නිලධාරින් නැහැ. මට තේරෙන්නේ නැහැ මොකක්ද මේ වෙන්නේ කියලා. රටේ රැකියා නැති බොහෝ පිරිසක් සිටිනවා. ඒ අතර උපාධිධාරින් ද සිටිනවා. සුදුසුකම් සහ පළපුරුද්ද ඇති අයට උසස්වීම් නැහැ කියා මැසිවිලි නඟනවා. රාජ්‍ය ආයතනවල වැඩ කර ගන්නට ගියාම නිලධාරින් අඩුයි කියනවා. කොතැනද ගැටලුව තිබෙන්නේ? තම අමාත්‍යාංශයේ විධායක ශ්‍රේණියේ තනතුරු සියයට 60ක පමණ පුරප්පාඩු තිබෙන බව ගරු නවීන් දිසානායක ඇමතිතුමා කියනවා. එතුමාගේ අමාත්‍යාංශයේ පමණක් නොවෙයි අනෙක් රාජ්‍ය ආයතනවල තත්ත්වයත් එසේමයි. ආණ්ඩුව වහාම මේ ගැන සොයා බලා කටයුතු කළ යුතුයි. මේ ගැටලුවට කඩිනම් විසඳුම් දිය යුතුයි. හිටපු කම්කරු ඇමතිවරයෙක් වශයෙන් මා දකිනවා, අද අපේ රටේ සිටින වැඩ කරන ජනතාව, ශ්‍රම බලකාය ගැටලු රැසකට මුහුණ දී තිබෙන බව.

මේ ආණ්ඩුවේ හැම වැඩක්ම වාගේ අද අපේ රටේ තිබෙන කර්මාන්තශාලාවලත් කිසිම ප්‍රමිතියක් නැහැ. කර්මාන්තශාලා ආරම්භ කිරීමේදීත් ප්‍රමිතිය ගැන සොයා බැලීම ඉතාම වැදගත්. මේ නිසා සේවකයන්ගේ ජීවිත අනාරක්ෂිත වෙලා තිබෙනවා. කර්මාන්තශාලා නිසා සාමාන්‍ය ජනතාවගේ ජීවිතවලට තර්ජන ඇති වෙලා තිබෙනවා. පසු ගිය දවස්වල අපි දැක්කා, රතුපස්වල සිදු වුණු දේවල් සහ පිළියන්දල සිදු වුණු දේවල්. මේ නිසායි අපි ආණ්ඩුවට මේ තරම් ඕනෑකමින් පෙන්වා දෙන්නේ කර්මාන්තශාලා ඇරඹීමේදී කම්කරු අමාත්‍යාංශයෙන් පරිසරය පිළිබඳව විශේෂ බලපත්‍රයක් ලබා දෙන්න කියලා. එවිට සේවකයන්ගේ වාගේම සාමාන්‍ය ජනතාවගේත් ජීවිතවලට ඇති වන තර්ජන වළක්වා ගැනීමට පුළුවන්.

සේවකයන්ට නිවාස සහ වෛද්‍ය ආධාර ලබා ගැනීම සඳහා සේවක අර්ථ සාධක අරමුදලෙන් සහ සේවක භාරකාර අරමුදලෙන් සියයට 30ක ප්‍රමාණයක් නිකුත් කරන්න යෝජනා කරමින් පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනැත් තිබෙනවා. දැන් ඒකට මොකක්ද වෙලා තිබෙන්නේ? එය කඩිනමින් ගෙන එන්න පුළුවන් නම් හොඳයි.

ඒ වාගේම මම සේවක භාරකාර අරමුදල ගැන අහන්නට කැමැතියි. මුල්‍ය මණ්ඩලයට කම්කරු දෙපාර්තමේන්තුවේ හා වෘත්තීය සමිතිවල නියෝජිතයන් ඇතුළත් කරන්න කියලා අපි යෝජනා කළා. ඒ වාගේම වෘත්තීය සමිති හැටියට අපි තීරණයක් ගත්තා, ආණ්ඩුවත් මේකට එකඟ වුණා. EPF එක, සේවක භාරකාර අරමුදල් මණ්ඩලය රජයටත් නැහැ, වෘත්තීය සමිතියටත් නැහැ. ඒ මණ්ඩලයේ ඉන්නේ නිලධාරීන් පිරිසක් පමණයි. ඒ මණ්ඩලයට කම්කරු අමාත්‍යාංශයේ නිලධාරිවරයෙක් සහ වෘත්තීය සමිතිවලින් නිලධාරිවරයෙක් පත් කරන්න කියලා අපි යෝජනා කළා. මෙය පිළිගත්තත් තවම ක්‍රියාත්මක වෙලා නැහැ.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම මම ලංගම සේවකයන් ගැන මතක් කරන්නට ඕනෑ. අද ආණ්ඩුව මොනවා කීවත් ලංගම සේවකයන් ඉන්නේ කොට උඩ. 2010 වසරේ සිට ඔවුන්ට සේවක භාරකාර අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල් බැර කරලා නැහැ. මේ 2013 වසරත් ගෙවී යන වෙලාව. 2008 වසරේ සිට විශ්‍රාම ගිය අයට පාරිතෝෂික මුදල් ගෙවලා නැහැ. මේ අහිංසක ලංගම සේවකයන් සේවයේ ඉන්නතුරුත් දුක් විඳලා විශ්‍රාම ගිහිල්ලත් තමන්ගේ උරුමය ලබා ගන්න බැරුව පීඩනයට ලක් වෙලා සිටිනවා.

මේ සේවකයන් පීඩනයට ලක්වීමේ ප්‍රතිඵලයක් තමයි ලංගම බස් රථ නිරන්තරයෙන් අනතුරුවලට ලක්වීම. සේවකයන් තෘප්තිමත් කිරීම හාම්පුතෙකුගේ ප්‍රධාන යුතුකම වෙන්න ඕනෑ. ආණ්ඩුව ඒක කරන්නේ නැහැ. ශ්‍රී ලංගමයේ විතරක් නොවෙයි, මේ රටේ අනෙක් ක්ෂේත්‍රවලත් තත්ත්වය මෙහෙම තමයි. තමන්ගේ සේවයට සරිලන වැටුපක්, රැකියාවට උරුම පහසුකම් ලබා ගන්න අද රජයේ සේවකයන්ට හැකිවෙලා නැහැ. ඔවුන් ඔවුන්ට ලැබෙන දේ ගැන තෘප්තිමත් නැහැ. අතෘප්තිමත් සේවකයකුගෙන් උපරිම කාර්යක්ෂමතාවක් ලබා ගන්න බැහැ. ඔවුන් මන්දගාමී වෙනවා. මෙය අපේ රටේ සංවර්ධනයට හානියක්. මේ ගැන රජය සැලකිලිමත් විය යුතුයි.

තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැඟී සිටින ජනතාවට මේ රජයෙන් ලැබෙන්නේ මරණය, බැටන් පොලු පහර, රබර් වෙඩි උණ්ඩ, කඳුළු ගෑස්. අපට මතකයි ඉන්ධන සහනාධාරය ඉල්ලන්න ගිහින් හලාවත ඇන්ටනීව මැරුවා. පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් සම්බන්ධ උද්ඝෝෂණයේ දී රොෂේන් චානකව මැරුවා. තවත් සමහර උද්ඝෝෂණ මෙහෙයවන්නන් අද්‍යාගත නොහැකි ලෙස හදිසි අනතුරුවලින් මැරුණා.

විශේෂයෙන්ම මා මතක් කරන්න කැමැතියි, රතුපස්වල සිද්ධියේ දී පල්ලියක් ඇතුළට ගිහින් වෙඩි තබලා තිබුණා. අපි මේ ගැන පාර්ලිමේන්තුවේ දී ඇහුවා. හමුදාව එතැනට ගෙන්නුවේ කවුද කියලා අපි ඇහුවා. එයට උත්තරයක් නැහැ. වෙඩි තබන්න අණ දුන්නේ කවුද කියලා අපි ඇහුවා. එයටත් උත්තරයක් නැහැ. මේවා තමයි රහස්. එක එක factory වෙනුවෙන් රජය පෙනී සිටිනවා ද, රජයේ වෙනත් පුද්ගලයන් පෙනී සිටිනවා ද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා.

අද මේ රට මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ යහපාලනය මේ සමාජයෙන්, මේ රටෙන් දවසින් දවස ඈත් වන නිසායි. මා ඔබතුමාගේ අවධානයට යොමු කළා, යහ පාලනය කියන්නේ මොකක්ද කියලා. රේගුවෙන් හෙරොයින් ඇල්ලුවා. අර ගමේ කුඩු කාරයෙක් ඇල්ලුවා නම් එහෙම එකපාරටම රිමාන්ඩ් කරනවා. නැත්නම් මරණීය දණ්ඩනය නියම කරන අවස්ථාත් තිබෙනවා. නමුත් මේ තරම් විශාල හෙරොයින් ප්‍රමාණයක් හසු වුණාම ඒකෙ ඇත්ත තත්ත්වය මොකක්ද කියලා සොයා බලන්න වෙනවා. නමුත් එවැනි සොයා බැලීමක් නැහැ.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම ඊතයිල් කන්ටේනර් ගණනක් ගෙනාවා. කාටද මේවා ගෙනාවේ, කොහේද මේවා තිබෙන්නේ කියන එක පිළිබඳව කිසිම කථාවක් නැහැ. ගරු සභාපතිතුමනි, මේවා ගැන කථා කරද්දී දැන් යහ පාලනයක් තිබෙනවා ද කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම රජයට සම්බන්ධ නිලධාරියෙකුගෙන් ආධාර ලබන බුරු පොළක් වැටලුවා. ඊළඟට ඒ වැටලීමට සම්බන්ධ වුණු පොලිසියේ සියලුම නිලධාරීන් මාරු කර යැව්වා. මේ යහ පාලනය කොහේද තිබෙන්නේ කියන එක ගැන අපට දැන් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

අද මේ ආණ්ඩුව කරනවා කියලා ඉදිරිපත් කරන යෝජනාවලටවත් වැය කරන්න ආණ්ඩුවට සල්ලි නැහැ. මේක තමයි ඇත්ත කථාව. එක, එක යෝජනාවන් කරනවා. අය වැයෙන් එක, එක යෝජනාවන් කරනවා. ඇස්තමේන්තුවල මුදල් තිබෙනවා. වැඩ කරන්න ගියාම සල්ලි නැහැ. භාණ්ඩාගාරයෙන් සල්ලි release කරන්නේ නැහැ. අද මේ ආණ්ඩුව කරනවා කියලා ඉදිරිපත් කරන යෝජනාවලටවත් වැය කරන්න ආණ්ඩුවට සල්ලි නැහැ කියලා මම ඒකයි කිව්වේ. රටේ සාමාන්‍ය මිනිස්සු පාවිච්චි කරන සබන් කෑල්ලෙන්, ආහාරයට ගන්නා හාල්මැස්සන්ගෙන් තමයි මේ ආණ්ඩුව සල්ලි හොයන්න හදන්නේ. පසු ගිය දා සරත් අමුණුගම මුදල් නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා ඉදිරියේදී -මේක වැදගත්- සියයට 20කින් බදු ඉහළ නංවනවා කියලා. අය වැය ඉදිරිපත් කළාට පස්සේ ඇයි එතුමා මෙහෙම කියන්නේ? කාටද මේ කොළේ වහන්නේ? මේ රටේ අහිංසක ජනතාවට නේද? ආණ්ඩුව මේ කොහේද යන්නේ? ආණ්ඩුව කරන බලවතුන් තමන්ගේ දිව්‍ය ලෝකය හදන්නේ මේ රටේ ජනතාවට අපායක් හදලා දීලාද? ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්නට මේ කරුණු පිළිබඳව ඔබතුමාට අපි මතක් කළා.

මීට අමතරව පාර්ලිමේන්තුවේ සේවකයන්ගේ රක්ෂණයක් පිළිබඳව අපි කථා කළා. පාර්ලිමේන්තුවේ සේවකයෙක් මොකක් හරි ආපදාවකට ලක් වුණොත් උපරිමය ලක්ෂ දෙකක් තමයි හම්බ වෙන්නේ. ඉතුරු ඒවාට ලැයිස්තුවක් හදාගෙන ඔබතුමා ළඟටත් එයි. අපි ළඟටත් එයි. ඒ නිසා මම බොහොම වුවමනාවෙන් මේ යෝජනාව කරනවා. මම කියන්නේ නැහැ, බෙහෙත් අරගෙන ඒ බෙහෙත් තුන්ඩුව ඉදිරිපත් කරලා සල්ලි ගන්න කියලා. Heart surgery එකක් වාගේ බරපතළ ප්‍රශ්නයකදී අද මේ සේවකයන්ට සිදු වෙලා තිබෙනවා හැම තැනකටම ගිහිල්ලා සල්ලි හොයන්න. ඒ සල්ලි හොයලා තමයි ඒ අයට පුළුවන් වෙන්නේ සිදු වන ආපදාව සංසිඳුවා ගන්න. ඒ නිසා මේ සේවකයන් වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ඇති කරනවා නම් ඉතාමත් වැදගත්, ගරු සභාපතිතුමනි. මේ සේවකයන් බොහොම වුවමනාවෙන් වැඩ කරනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් විශේෂයෙන් ඒ ඉල්ලීම මේ අවස්ථාවේ කරන්න කැමැතියි.

වසර නවයක් අය වැය ඉදිරිපත් කළත් මහ ජනතාවට කිසිදු සහනයක් ලැබුණේ නැහැ. එයින් අවුරුදු හතරක්ම යුද්ධයෙන් පසුව ඉදිරිපත් කළ අය වැයයි. ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, විජයානන්ද දහනායක, සිරිමාවෝ බණ්ඩාරනායක, ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස, ඩී.බී. විජේතුංග, චන්ද්‍රිකා බණ්ඩාරනායක ඒ වාගේම රනිල් වික්‍රමසිංහ යන මේ අගමැතිවරුන්ගේ කාලයේදී අපේ ණය ප්‍රමාණය තිබුණේ

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

රුපියල් ට්‍රිලියන 1.86යි. 2013 වන විට අවුරුදු නවයක් තනි රාජපක්ෂ කෙනෙක් රට පාලනය කරලා රාජ්‍ය ණය ප්‍රමාණය ට්‍රිලියන 6.63යි. යුද්ධය ඉවර වෙන කොට රාජ්‍ය ණය තිබුණේ ට්‍රිලියන 3.58ක් හැටියටයි. එහෙත් අවුරුදු හතරක් යුද්ධය නැතුව ට්‍රිලියන 6.63ක් ණය වෙලා. ණය දෙගුණයක් වෙලා. අවුරුදු 55ක් තිස්සේ ට්‍රිලියන 1.86ක් රාජ්‍ය ණය හැටියට අරගෙන අමාරු කාලයේ නොමිලයේ හාල් දුන්නා. බස් ජනසතු කළා. ඉඩම් ජනසතු කිරීමේදී වන්දි දුන්නා. මහවැලිය, උදාගම් හැදුවා. අතිවිශාල ජලාශ හැදුවා. නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය ඇති කළා. නිදහස් වෙළඳ කලාප හැදුවා. රට සංවර්ධනය කළා. බඩු මිල අඩු කළා. පාසල් යන හැම දරුවෙකුටම නිල ඇඳුමක් ලබා දුන්නා. අද මේ නිල ඇඳුම දෙන්නේ "ෂෝ" එකටයි. මේ ආණ්ඩුව "ෂෝ" එකට තමයි ඒ නිල ඇඳුම් සඳහා රෙදි දෙන්නේ. ඒ වාගේම පාසල් පොත් ටික නොමිලේ ලබා දුන්නා. ගමේ සිටි නැති බැරි දරුවන්ට මේ සමාජයට එන්න ඉඩ හැරපු එක කොයි තරම් දෙයක්ද? එහෙම කරලාත් එදා අප බැලුවාම පැහැදිලි වුණේ මේ ණය ප්‍රමාණය අඩු වෙලා ජනතාවට එන සහන ප්‍රමාණය වැඩි වෙලා තිබුණා කියලායි.

ජනාධිපතිතුමා කියනවා පාන් කන්න දෙන්න නොවෙයි ණය ගන්නේ කියලා. ඒක හරි. අපි ඒක පිළිගන්නවා. පාන් කන්න ණය ගන්න ඕනෑ නැහැ, ගරු අගමැතිතුමනි.

Transparency International ආයතනයේ අලුත්ම වාර්තාව අනුව ලංකාවේ දූෂණය වැඩි වෙලා. රටවල් 177කින් ගිය අවුරුද්දේ ලංකාව හිටියේ 79වැනි තැනයි. මේ අවුරුද්දේ දූෂණය නිසා අපේ රට තව පහළට වැටිලා තිබෙනවා. දැන් ලංකාව 91වැනි තැනයි ඉන්නේ. ලංකාවේ දූෂණය වැඩි වෙලාය කියලා ණය දෙන චීනයේ රජයේ මාධ්‍යත් ප්‍රසිද්ධ කරලා තිබෙනවා. ණය දුන්න චීනයත් කියනවා, ණය ගත්ත ලංකාවේ ආණ්ඩුව දූෂිතයි කියලා. එක පැත්තකින් ණය අරගෙන වාර්තා තියන කොට, අනෙක් පැත්තෙන් දූෂණයෙනුත් වාර්තා තියනවා. ණය වැඩි වෙන කොට දූෂණයත් වැඩි වෙනවා. ණයට ගන්න මුදල් දූෂණය හරහා කිහිප දෙනෙකුගේ සාක්කුවට යනවා. ණයයි, දූෂණයයි මේ ආණ්ඩුවේ රේල් පීලි දෙක වාගෙයි. ඒ රේල් පීලි දෙක දිගේ රාජපක්ෂ ආණ්ඩුව දුවනවා. ණය ගත්තේ පාන් කන්න නොවෙයි කියමින් ඒ ණය සාක්කුවට දමා ගනිද්දි මහ ජනතාවට පාන් කියා ගන්න බැරිව ඒ ණය වෙනුවෙන් බදු ගෙවනවා. ගරු සභාපතිතුමනි, මේ ණය අරගෙන සංවර්ධනයට යෙදෙව්වා නම් ඒකෙන් return එකක් එන්නේ කොයි කාලයේ ද? මේක වැදගත්.

හම්බන්තොට වරාය හැදුවා. අප ඒකට විරුද්ධ නැහැ. ඒකෙන් මහජනතාවට return එකක් එන්නේ කවදාද? ඊළඟට මත්තල ගුවන් තොටුපළ හැදුවා. මේවායින් return එකක් එන්නේ කවදාද? ඊළඟට නොරොච්චෝලේ හදපු විදුලි බලාගාරය. මේවායින් return එකක් එන්නේ කවදාද? මේවා අවුරුදු ගණනක් තිස්සේ මේ රටේ ජනතාවට බරක් වෙලා.

එක්සත් ජාතික පක්ෂය මහවැලිය හැදුවා. ඩී.එස්. සේනානායක මැතිතුමා ගල්ඔය වැනි විශාල ව්‍යාපාර කළා. ඒවා ඉවර වෙන කොට ඊළඟට ආවේ මහ ජනතාවට සහන ලැබෙන එකයි; ඒවායේ ප්‍රතිඵලය ලැබෙන එකයි. අද වෙලා තිබෙන්නේ මේ තරම් විශාල මුදලක් අරගෙනත් ඊට පසුව මේ ණය ගෙවන්නේ කොහොමද කියන ප්‍රශ්නයට අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන එකයි. ඒක ගෙවන්න වන්නෙත් මහ ජනතාවටයි.

පාර්ලිමේන්තුවේදී ඇසූ ප්‍රශ්නයකට පිළිතුර දෙමින් ආචාර්ය සරත් අමුණුගම ඇමතිතුමා කියා සිටියේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 13ක් වන බදු ආදායම 2015 වන විට සියයට 16ක් දක්වා වැඩි කර ගැනීමට බලාපොරොත්තු වන බවයි. මේ සල්ලි හොයන්න යන්නේ කොහෙන්ද? ආදායම වැඩි කර ගන්නේ කොහෙන්ද? මේ පාර්ලිමේන්තුවේදී එතුමා කිව්වේ. ආපහු අර දුප්පත් ජනතාවගේ බඩට ගහලා තිබෙනවා. වෙන දෙයක් නැහැ. බදු ගන්න යන්නේ එතැනින්. රටේ සංවර්ධනයකින් නොවෙයි. රට සංවර්ධනය කරලා, එමඟින් ගන්න යනවා නොවෙයි. බදු ගහලා තමයි සල්ලි ගන්න යන්නේ.

ගරු සභාපතිතුමනි, 2009 දී පත් කළ බදු කොමිසමේ වාර්තාව 2010 දී රජයට බාර දී ඇතත් එය තවමත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. අපි අහනවා, ඒ ඇයි කියලා? මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට, ධනපතියන්ට බදු සහන දී දුප්පතුන්ට පටවන වක්‍ර බදු වැඩි කිරීමට ඉන් යෝජනා කර තිබෙනවා. එය බදු කොමිසමක්ද, බලු කොමිසමක්ද කියා මම දන්නේ නැහැ. තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලා සිටිනවා, කරුණාකර ඉතා ඉක්මනින් ඒ කොමිසමේ වාර්තාව පාර්ලිමේන්තුවට ගෙනෙන්න කියලා.

ගරු සභාපතිතුමනි, මේ අය වැයෙන් ද දුප්පතුන්ගේ කෑම බීමවලට බදු වැඩි කර උසස් තත්ත්වයේ බල්ලන්ගේ සහ බළලුන්ගේ කෑම බද්දෙන් නිදහස් කළේ සියයට 1ක් වන රටේ සුපිරි පන්තියේ අය සතුටු කිරීමටයි. මේ බලු - බළල් කෑමවලට දීපු නිදහස පිළිබඳව කිසිම මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් ආණ්ඩුව පැත්තෙන් කථා කරන්නේ නැහැ. ඒ කියන්නේ, එතුමන්ලාට එවැනි බල්ලන් නැහැ, එවැනි පූසෝ නැහැ කියන එකයි. කා ළඟ ඉන්න පූසන්ටද, කා ගාව ඉන්න බල්ලන්ට ද මේ සහනය ලබා දීලා තිබෙන්නේ කියලා අපට කියන්න. තමුන්නාන්සේ අද කථා කරනවා නේ. ඒ කථා කරනකොටවත් ඒ ගැන කියන්න. බළලුන්ට, බල්ලන්ට ඒ සහනය ලබා දුන්නාම, තමුන්නාන්සේලා එය අනුමත කරනවා ද කියලා කියන්න.

දෙසැම්බර් 15වන දා කොළඹ පැවැත්වෙන night race විනෝද බද්දෙන් නිදහස් කර තිබෙනවා. මෙන්න බලන්න ගරු සභාපතිතුමනි. දුප්පත් මිනිසුන්ට මේ තරම් බර පටවන ආණ්ඩුව දෙසැම්බර් 15වන දා කොළඹ පැවැත් වුණු night race විනෝද බද්දෙන් නිදහස් කර තිබෙනවා. ගිය වසරේත් night race බද්දෙන් නිදහස් කළා. කොළඹ තිබුණු කාල්ටන් රගර් සැණකෙළියත් බද්දෙන් නිදහස් කළා. මේවා පවත්වන්නේ කාල්ටන් ක්‍රීඩා සමාජයයි. මේ අවුරුද්දේ night raceවලින් රුපියල් තුන්කෝටි අටලක්ෂයක ටිකට් විකිණීමට නියමිතව තිබුණා. සියයට 10 විනෝද බද්ද හැටියට රුපියල් තිස්හතරලක්ෂයක් ගෙවන්න තිබුණා. බස්නාහිර පළාතේ ප්‍රධාන ඇමතිවරයාගේ නියෝගය පරිදි එය බද්දෙන් නිදහස් කරලා තිබෙනවා. Car racing පැවැත්වීමට බදු සහන දුන්නා. බලපත්‍ර නැතිව racing cars ගෙන්වීමට ඉඩ දුන්නා. Night race බද්දෙන් නිදහස් කළා. රාජපක්ෂවරුන්ගේ විනෝද ක්‍රීඩා බද්දෙන් නිදහස් කර මහ ජනතාවට බදු ගහනවා. මේවා ගැන මොකක්ද මේ ආණ්ඩුවේ හැසිරීම? ගරු සභාපතිතුමනි, එක පැත්තකින් සූදුවට සහයෝගය දෙනවා. තවත් පැත්තකින් මේ විධියේ night race සඳහා සහයෝගය දෙනවා. අපි විරුද්ධ නැහැ ඒවාට. ඒවා කරන්න. සල්ලි ගෙවලා කරන්න. අනෙක් පැත්තෙන්, අපට පෙනෙන්නේ අහිංසක දුප්පත් ජනතාවට ජීවත් වන්න බැරි තත්ත්වයට මේ පරිවර්තනය ඇති කරලා තිබෙනවා කියලායි.

ගරු සභාපතිතුමනි, මම මීට වඩා කථා කරන්නේ නැහැ. ඔබතුමාත් ඔරලෝසුව දිහා බැලුවා. ඔබතුමාටත් ස්තුතියි, ගරු සභාපතිතුමනි. විශේෂයෙන් අපේ ගරු ඇමතිතුමා ඉතාම ඉවසිලිවන්තව මේ සභාවේ ප්‍රධානියා විධියට වැඩ කටයුතු කරගෙන ගියා. පාර්ලිමේන්තු ලේකම් කාර්ය මණ්ඩලයටත්, ඊට

සහය දුන් රජයේ සියලු නිලධාරින්ටත් අපි ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, තවත් එක් කාරණයක් තිබෙනවා කනගාටුවෙන් වුවත් කියන්න. මන්ත්‍රීවරුන්ගේ පැමිණීම නම් ඉතාම දුර්වලයි. ඔබතුමාට එය මේ අවස්ථාවේ කියමින් මගේ කථාව අවසන් කරවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
දැන් නම් රටම බලා ගෙන ඉන්නවා.

මීළඟට ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා. ඔබතුමා දැන් කථා කරනවාද, පසුව කථා කරනවාද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
පසුව කථා කරනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අගමැතිතුමා.

[පූ.භා. 10.34]

**ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)
ගරු සභාපතිතුමනි, ලබන වර්ෂය සඳහා අමාත්‍යාංශ කිහිපයක ඇස්තමේන්තු සලකා බලා ඉදිරිපත් කළ විශේෂ කාරක සභාවේ වාර්තාව පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට අදහස් කරනවා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා අමාත්‍යාංශවල තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ඒ වැඩ පිළිවෙළ හොඳින් ක්‍රියාත්මක කිරීම ගැන මම බොහොම සන්තෝෂ වෙනවා.

අප අමාත්‍යාංශයේ මූලික කාර්යය වන්නේ සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නැඟීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති, වැඩ සටහන්, ව්‍යාපෘති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති ආකාරයට සියලුම් ආගම්වල අයිතිවාසිකම් සුරක්ෂිත කරමින්, බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම ද බෞද්ධ, හින්දු, ඉස්ලාම්, රෝමානු කතෝලික හා ක්‍රිස්තියානි ආගමික කටයුතුවලට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය මෙන්ම පූජා භූමි සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීමද, බුද්ධාගම ප්‍රචාරණය කිරීමට සහාය වීම, උත්තරීතර අනුශාසක මණ්ඩලයේ අවශ්‍යතා ඉටු කිරීම හා ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයට අදාළ කටයුතු සම්පාදනය කිරීම ද වේ. මෙම කටයුතු පහසු කරනු වස් බෞද්ධ කටයුතු, හින්දු ආගමික, ඉස්ලාම් ආගමික, ක්‍රිස්තියානි ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු මඟින් සේවා පහසුකම් සලසා තිබේ. ඊට අමතරව මහා භාරකාර දෙපාර්තමේන්තුව ද අප අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරේ.

ගරු සභාපතිතුමනි, මේ විධියට අපේ රටේ ආගම් හතරක් තිබෙනවා. මේ රටේ ජාතීන් පහක් ජීවත් වෙනවා. ඒ සියලුම ජාතීන්ටත්, සියලුම ආගම්වලටත් සාධාරණව සලකමින් අතිගරු ජනාධිපතිතුමාගේ දර්ශනය හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාත් සමඟ මේ පාර්ලිමේන්තුවේ ඉන්න ගරු මන්ත්‍රීවරුන් 225 දෙනාම මොනවා හරි ආගමක් අදහනවා. පසු ගිය කාලයේ නම් ආගමක් පිළිගත්තේ නැති සමහර අය සිටියා. දැන් ඒක වෙනස් වෙලා සියලු දෙනාම ආගමක් අදහන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගරු සභාවේ කටයුතු කරද්දීත් සංස්කෘතික වශයෙන්, ආගමික වශයෙන් ශ්‍රේෂ්ඨ චින්තනයක් ඇති කර ගෙන කටයුතු කරන්න ඕනෑ. පත්තරය බලලා, වෙන කවුරුවත් කියපු එකක් අහලා අනවශ්‍ය විධියට වෛරයෙන්, ක්‍රෝධයෙන්, ඊර්ෂ්‍යාවෙන් වැරදි විවේචන, ප්‍රචාර නොකර මේ ස්ථානය බුද්ධිමත් පිරිසක් සිටින ශ්‍රේෂ්ඨ ස්ථානයක් හැටියට සලකා ක්‍රියා කරන්න අප සියලු දෙනාම හිතා ගන්න ඕනෑය කියන එක ආගම ගැන කථා කරන මේ අවස්ථාවේදී මා මතක් කරනවා. එහෙම නැත්නම් ආගමෙන් වැඩක් නැහැ. පුද්ගලයා ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකු බවට පත් කරන ආකාරය මේ සියලුම ආගම්වලින් පෙන්නුම් කරනවා. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, මානය ආදී සියලු දේවල් ඉවත් කරන්න සියලුම ආගම්වලින් කටයුතු කරනවා. මේ ගරු සභාවේත් ඒ වාගේ තත්ත්වයක් ඇති කරන්න ඕනෑ. පත්තරයේ තිබෙන දේවල් ඒ වාගේම අරයා කිව්වා, මෙයා කිව්වා කියලා ඒ කියන දේවල් මේ ගරු සභාවට යෝග්‍ය නැහැ, ගරු සභාපතිතුමනි. මේක බුද්ධිමත්ව ක්‍රියා කරන තැනක් වෙන්න ඕනෑ. දෙකෝටි හත්ලක්ෂයක් ජනතාව දිරිමත් කරන, සවිමත් කරන කණ්ඩායම තමයි, මේ දෙසිය විසිපස් දෙනාගේ කණ්ඩායම. මෙවැනි ප්‍රකාශ කරන්න ඒ 225ට අයිතිය තිබෙනවාද? මේ විධියේ වැරදි ප්‍රකාශ කරලා, ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයෙන් කථා කරලා ක්‍රියා කිරීම තුළ නිවැරදිභාවයක් තිබෙනවාද කියලා අපි කල්පනා කරලා බලන්න ඕනෑ. ජනතාව මේ ගැන කල්පනා කරන්නේ කොහොමද?

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ක්‍රිස්තියානි දහම් පාසල්වලට අච්චු පොත් නොදෙන්නේ ඇයි? අනෙක් සැම දහම් පාසලකටම දෙනවා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඔබතුමාට ආගමක් තිබෙනවා ද? එහෙනම් ඒ ආගම අනුව ක්‍රියා කරන්න ඕනෑ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
තමුන්නාන්සේට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*
ආගමක් නැති වුණාට මට ආගමක් තිබෙනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
වරදකාරයෙක් කියලා චෝදනා කරන්න එපා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*
ද කියලා මා අහනවා. කුඩුකාරයෙක් හැටියට නේ ඔබතුමා කථා කරන්නේ. [බාධා කිරීමක්] ඒක තමයි, මම කියන්නේ මේ ගරු සභාවේදී ක්‍රියා කරන ආකාරය වැරදියි කියලා. ඔබතුමාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[ගරු දි.මු. ජයරත්න මහතා]

ප්‍රශ්නයක් අපට වුවමනා කරන්නේ නැහැ. ඒක එළියේ දී කරන්න ඕනෑ. මේ ගරු සභාවේ දී ඊට අවශ්‍ය වෙන දේවල් කරන්න ඕනෑ. මේ ගරු සභාවේදී කථා කරන්නේ ජනතාවගේ දියුණුව සඳහායි; ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහායි. ඒ මිසක් මෝඩ විධියට,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විධියට කථා කරන එක නොවෙයි මෙතැන දී කරන්න තිබෙන්නේ. [බාධා කිරීමක්]

ඔබතුමන්ලාගේ පක්ෂයට මොකද වෙලා තිබෙන්නේ? ඒක නිසා නේද පක්ෂය විනාශ වෙලා තිබෙන්නේ? ඔබතුමන්ලාට පක්ෂයක් තිබෙනවා ද? ඒකට ප්‍රතිපත්තියක් තිබෙනවා ද? දර්ශනයක් තිබෙනවා ද? [බාධා කිරීමක්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
අධිකරණයෙන් තීන්දුවක් දෙන තෙක් එසේ චෝදනා කරන එක වැරදියි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගරු සභාපතිතුමනි, ඔය පක්ෂය විනාශ වෙලා තිබෙන්නේ ඔය වාගේ පුද්ගලයන් නිසාය කියන එක මේ රටත් දන්නවා; ලෝකයත් දන්නවා. ඒකයි, අද තිබෙන තත්ත්වය.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
හිටපු කථානායකවරයෙක් ඔය විධියට කථා කරනවා ද?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒ නිසා යහපත් ආකාරයෙන් ක්‍රියා කරන්න ඕනෑය කියලා මා විශේෂයෙන් මතක් කරනවා. [බාධා කිරීම්] එසේම "මහින්ද චින්තන ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි "කය මනස සමබර සිත නිවන දැයක්" යන පාඨය යටතේ යම් කිසි සඳහනක් තිබෙනවා. ඔන්න ඔය වචන ටික හිතට ගන්න. ඇහුණා ද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඇහෙන්නේ නැහැ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
"මහින්ද චින්තන ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් "කය මනස සමබර සිත නිවන දැයක්" යන මේවා හිතට අරගෙන ක්‍රියා කරන්න ඉගෙන ගන්න ඕනෑය කියන එක මා මේ ගරු සභාවේදී ඔබතුමන්ලාට කියනවා. ගමට ගිහිල්ලත් එහෙම කරන්න. ගමේ ජනතාවට ඔය විධියට කථා කරන්න ගියොත් ඒ මිනිස්සුන්ට මොකද වෙන්නේ? ඒ ගොල්ලොත් ඔය වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බවට පත් වෙන්නේ නැද්ද? [බාධා කිරීමක්] ඔබතුමාත් මේ ගරු සභාවේ අර ආසනයේ ඉඳගෙන හිටපු පුද්ගලයෙක්. ඒ වාගේ පුද්ගලයෙක් මේ විධියේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කථා කරනවා නම්, වැරදි විධියට කථා කරනවා නම් ඒ පුද්ගලයා - [බාධා කිරීමක්] මන්ත්‍රීවරයෙක් වශයෙන් පිළිගන්න පුළුවන්ද? මොකක්ද, දේශපාලනයේදී කරන්න තිබෙන්නේ? ඒ නිසා මේ වාගේ නැතිව හිත හදා ගෙන මනුෂ්‍යයෙක් වෙන්නය කියා මා ඉල්ලනවා. - [බාධා කිරීමක්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
දෙපැත්තෙන්ම ඒ වචන පාවිච්චි වුණා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
එච්චරයි, මම එතුමාගෙන් ඉල්ලන්නේ. ආධ්‍යාත්මික සංවර්ධනයෙන් යුතු පුද්ගලයා රටක සමාජ සංවර්ධනය හඳුනා ගැනීමේ කැඩපතයි. අහගන්න මේවා. අපේ රට ලෝකයේ අනිකුත් බොහෝ රටවල ගෞරවයට පාත්‍ර වෙන්නේ අප සතු මාහැඟි උරුමය වූ බුදුදහම නිසාය. එබැවින් රාජ්‍ය ආගම වන බුද්ධාගමට තිබෙන ඒ තැන ආරක්ෂා කර ගනිමින් සියලු ආගම්වල උන්නතිය සඳහා සම්පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබා දෙනවා. පන්සල්, කෝවිල්, පල්ලි සහ මුස්ලිම් දේවස්ථාන ඇතුළු සියලුම ආගමික ස්ථානවල උන්නතිය සඳහා ඒවායේ යටිතල පහසුකම් සංවර්ධනයට ආධාර වැඩසටහනක් සකස් කිරීම සහ විනාශ වී ගිය උතුරු, නැඟෙනහිර ආගමික ස්ථාන සම්පූර්ණයෙන්ම රජයේ වියදමින් අලුත්වැඩියා කර දීම අපේ පරමාර්ථයයි; වැඩ පිළිවෙළයි; ක්‍රියාත්මකභාවයයි. ඒ අනුව ක්‍රියා කරමින් බෞද්ධ සාරධර්ම, පිළිවෙත් මත ජීවිත හැඩගස්වා ගැනීමට අවශ්‍ය පසු බිම සකස් කිරීම මෙන්ම, මේ රටේ පවතින සෑම ආගමකටම සමානාත්මතාවයෙන් සැලකීමත්, අප රටේ ජීවත් වන විවිධ ජන වර්ගවලට හා විවිධ ආගම්වලට අයත් ජනයාට අන්‍යෝන්‍ය අවබෝධයෙන්, සහජීවනයෙන් ජීවත් විය හැකි සදාචාරසම්පන්න සමාජයක් ගොඩ නැඟීමත් මහින්ද රාජපක්ෂ රජයේ අරමුණයි. එම අරමුණ සාක්ෂාත් කර ලීම සඳහා සියලු ආගම් නියෝජනය කරමින් සමස්ත ශ්‍රී ලාංකීය සමාජයම ආවරණය වන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත්, ශ්‍රී ලාංකික ජන සමාජයේ දියුණුව පිණිස හේතු වන්නා වූ වැඩසටහන් දියත් කිරීමත් දිනෙන් දින ඉටු කරමින් මාගේ අමාත්‍යාංශය ඉදිරියට ගෙන යාමට හැකි වීම ඉමහත් සතුටක්.

2012 ජන සංගණනයට අනුව බෞද්ධාගමිකයන් සියයට 70.2ක් ද, හින්දු ආගමිකයන් සියයට 12.6ක් ද, ඉස්ලාම් ආගමිකයන් සියයට 9.7ක් ද රෝමානු කතෝලිකයන් සියයට 6.1ක් ද, වෙනත් ක්‍රිස්තියානි ආගමිකයන් සියයට 1.3ක් ද අප රටේ සහජීවනයෙන් ජීවත් වෙනවා. සියලු ආගමිකයන්ට එක් තැනක දී තම තමන්ගේ ආගම් ඇදහීමට හැකි වනු පිණිස මා අම්බුළුවාව සර්ව ආගමික කේන්ද්‍රස්ථානය නිර්මාණය කර තිබෙනවා. ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමනි, බලන්න, සියලුම ආගම්වල අය එක තැනක; අඩි 1000ක් උස එක කන්දක් උඩ. සෑම දෙනාටම එකට වන්දනා කරන්නට පුළුවන් වන හැටියට සකස් කර තිබෙනවා. සියලුම ආගම්වල අය නිතරම එක තැනකට යනවා. ගිහින් වන්දනා කරනවා. දරුවෝ හැම ආගමික ස්ථානයකටම ගිහින් බලලා සන්තෝෂ වෙලා එනවා. මේ තුළින්

අපේ ජනතාව තුළ අනෙක් ආගම් කෙරෙහි වෛරය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව තිබෙනවා නම් නැති වෙන්නට පුළුවන්ය කියා පෙන්නුවා. දකුණු කොරියාවේ මේක කරලා පෙන්නුවා. රටවල් 180ක සම්මේලනයට අපේ මැති ඇමතිවරුනුත් ගියා. ලෝකයේ කොහේවත් -කිසිම තැනක- එහෙම එකක් නැහැයි කියා ප්‍රකාශයට පත් කළා.

ශ්‍රී ලාංකික සමාජය තුළ පිළිගැනීමට ලක් වන ප්‍රධාන ආගම්වල ආගමික පුනර්ජීවනය හා අන්‍යොන්‍ය සහජීවනය සුරැකීම වෙනුවෙන් ගනු ලැබූ සාමූහික ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් තමයි, මේ වැඩපිළිවෙළ.

පුද්ගලයා තුළ මානසික සංවරය ඇති කිරීම, සමාජ සාරධර්ම සුරකින ගුණගරුක සමාජයක් බිහි කිරීමේ අඩිතාලම වන බැවින් භෞතික සංවර්ධනය පමණක් නොව ආධ්‍යාත්මික සංවර්ධනයේ ද අවශ්‍යතාව නිරන්තරයෙන් අවධාරණය කරන්නා වූ අතිගරු ජනාධිපතිතුමා මෙවර ද අප අමාත්‍යාංශය වෙත විශේෂ අවධානය යොමු කර තිබෙනවා.

2014 වර්ෂය සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1850ක් වෙන් කර දී තිබෙනවා. ඊට අමතරව පිරිවෙන් අධ්‍යාපනය හා සිල්මාතා ආරාමය ඉදි කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට ද, දහම් පාසල් සංවර්ධනයට හා ආගමික සමාජ සංවර්ධනයට මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශයට ද, සෙල්ල කතරගම නිවාඩු නිකේතනය ඉදි කිරීම හා දඹුල්ල පූජා භූමිය සංවර්ධනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ද ලබන වසර සඳහා වෙන වෙනම මුදල් වෙන් කර මුළු එකතුව වශයෙන් රුපියල් මිලියන 4571ක් අප අමාත්‍යාංශයට ලබා දීම පිළිබඳව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට මුළු මහත් ආගමික ජනතාව වෙනුවෙන් අප බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

2013 වසරේ වෙන් කරන ලද රුපියල් මිලියන 4,325ක මුදල විශේෂයෙන් සියලුම ආගම්වල දහම් අධ්‍යාපනය තුළින් ප්‍රජාව සවිබල ගැන්වීම, සියලුම ආගම්වල ආගමික ස්ථාන වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා යොදවා තිබෙනවා. ඊට අමතරව, සියලුම ආගම් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහාත් බෞද්ධ භික්ෂූන් වහන්සේ, සිල් මාතාවන් සහ දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම සඳහාත් මේ වසරේ මුදල් වැය කෙරුණා. ඒ සමඟම ආරම්භ කළ කොත්මලේ මහවැලි මහා සෑය ඉදි කිරීම, විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය ඉදි කිරීම, දහම් පාසල් 2,600ක් සංවර්ධනය කිරීම යන කටයුතු දැනට නිම වෙමින් පවතිනවා.

මල්වතු, අස්ගිරි මහා විහාරස්ථානවල ගොඩනැඟිලි සංවර්ධනය කරලා බොහොම ලස්සනට ඒවා සකස් කරලා තිබෙනවා. මහා සංඝයා වහන්සේලාට නොයෙක් විධියේ ආධාර උපකාර කරලා තිබෙනවා. බෙත් හේත් පවා ලබා දීලා තිබෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, මේ මහා සංඝ රත්නය අතරේ චීවරධාරීන් පිරිසකුත් ඉන්නවා. මම ඒවා වහන්න යන්නේ නැහැ. චීවරධාරීන් ඉන්නවා. චීවරය තිබුණාට බුද්ධිය අඩුයි, ආගම ගැන දැනීම අඩුයි. නොයෙක් නොයෙක් විධියේ ප්‍රකාශ කරමින් සම්බුද්ධ ශාසනයටත්, ජාතියටත්, සංස්කෘතියටත්, සහෝදරත්වයටත් අවමාන කරන පුද්ගලයන් චීවරධාරීන් හැටියට ඉන්නවා. ඒක අපි ගණන් ගන්න හොඳ නැහැ කියලා මා හැම තැනම කියනවා. ඒ ගැන මේ ගරු සභාවේදීත් කථා කරන්න හොඳ නැහැ. චීවරධාරීන් ඉන්නවා. හැම ආගමකම වැරදි කරන අය ඉන්නවා. ඒ ගැන අපට බලන්න ඕනෑ නැහැ. බුද්ධිමත්ම සියලුම ආගම්වල ශ්‍රේෂ්ඨ විධියට ක්‍රියා කරන, ආගම පිළිබඳ දැනීමක් ඇතිව ක්‍රියා කරන අය ගැනයි අපි කථා කරන්න ඕනෑ, ඒ අය ගැනයි බලන්න ඕනෑ.

මෙම කටයුතු සර්වප්‍රකාරයෙන් ඉටු කිරීම සඳහා පූර්ණ සහයෝගය ලබා දුන් අතිගරු මහානායක ස්වාමීන් වහන්සේලා ප්‍රමුඛ මහා සංඝ රත්නයට ද, අනෙකුත් ආගමික නායකතුමන්ලාට ද, මාගේ නියෝජ්‍ය අමාත්‍ය ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතාට ද, අමාත්‍යාංශ ලේකම් එම්.කේ.බී. දිසානායක මහතා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලයට ද මම ස්තුතිය පළ කරනවා.

ගරු සභාපතිතුමනි, ධම්ම පදයේ පණ්ඩිත වග්ගයෙහි එන මේ ගාථාව සිහිපත් කරන්න මා කැමැතියි.

"සේලෝ යථා ඒකඝනෝ
වාතේන න සමීරති
ඒවං නින්දා පසංසාසු
න සමිඤ්ජන්ති පණ්ඩිතා"

මේ ගාථාවෙන් කියැවෙන්නේ, "විශාල ගල් පර්වතය සිවු දිගින් හමන වාතයෙන් නොසෙල්වන්නේ යම් සේද, එසේම නින්දා, ප්‍රශංසා දෙකෙහිදී පණ්ඩිතයෝ නොසෙල්වෙති" යන්නයි. මේ පාඨය සිහි ගන්වමින් වසර 62ක් දේශපාලනයේ නියැලෙමින් ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් කැප කළ මාගේ ජීවිතයට කොපමණ නින්දා අපහාස කළත් ඉන් නව පණක් ලැබෙන බවත් ආදරය, කරුණාව, මෛත්‍රිය ප්‍රගුණ කළ මා නිහතමානීව මහජන සේවයේ යෙදෙන බවත් සඳහන් කරමින් තමුන්නාන්සේලා සියලු දෙනාටම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

**සභාපතිතුමා**
(තවිසාළර් අවර්කළ්)
(The Chairman)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු ජෝන් අමරතුංග මහතා.

[පූ.භා. 10.50]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(මාණ්පුමිකු ජෝන් අමරතුංග)
(The Hon. John Amaratunga)

ගරු සභාපතිතුමනි, අපේ අගමැතිතුමා ආගමික කටයුතු පිළිබඳව ලොකු විස්තරයක් කළා. බෞද්ධ ශාසනය පිළිබඳවත්, එහි සාරධර්ම පිළිබඳවත් බොහොම විස්තරාත්මක කථාවක් කළා. මා දන්නවා, එතුමාගේ අමාත්‍යාංශය බොහොම සාධාරණ ලෙස සියලු ආගම්වලට සලකන බව. එහි කිසිම තර්කයක් නැහැ. කතෝලික සභාව වෙනුවෙන් අපි මොනවා හෝ ඉල්ලුවත් එතුමා ඒවා ඉෂ්ට කර දීලා තිබෙනවා. නමුත් එක ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට අපට තවම පැහැදිලි උත්තරයක් ලැබිලා නැහැ. මේ කැසිනෝ ව්‍යාපාරය නවත්වන්නය කියලා දැන් මේ රටේ ආගමික බලවේගයක් ඇති වී තිබෙනවා. ඒක නවත්වනවාය කියාවත්, එහෙම නැත්නම් ඒ පනත ගෙනෙන්නේ නැහැයි කියාවත් තවම ප්‍රකාශයක් කළේ නැහැ. අගමැති කියන්නේ මේ ඇමතිවරු 60 දෙනාගේම ප්‍රධානියා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(මාණ්පුමිකු ටි.එම්. ජයරත්න)
(The Hon. D.M. Jayaratne)

විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, කැසිනෝ වුණත්, රා අරක්කු වුණත්, වෙනත් නරක හැසිරීම් වුණත් ඒ සියල්ලම නතර කරන්න ආණ්ඩුවකට බැහැ. ඒවා ජනතාවගේ සිත් සතන් තුළින් හැදෙන්න ඕනෑ. ඒකයි ආගම්වල උගන්වන්නේ. ඒවා සම්පූර්ණයෙන් නවත්වන්න බැහැ. හොරෙක් හොරකම් කළාට පසුවයි පොලීසියට අල්ලන්න පුළුවන් වන්නේ. හොරකම් කරන්න ඉස්සර පොලීසියට හොයා ගන්න බැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
තමුන්නාන්සේ හරි කථාවක් නේ කියන්නේ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
පරචිත්ත විජානන ඥානය කියන එක නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ආණ්ඩුවක් මොකටද ඒවා නවත්වන්න බැරි නම්? ඇමතිවරයෙක් මොකටද ඒවා නවත්වන්න බැරි නම්?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඔබතුමන්ලා වාගේ දේශපාලනඥයිනුත් ආගමික වශයෙන් ජනතාවට හැඟීම් ලබා දෙන්න ඕනෑ මේවා නරක දේවල්; ඒවා අත් හරින්න ඕනෑ කියා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මගේ වෙලාව, ගරු සභාපතිතුමනි.

කැසිනෝ නීතිගත කරන්න හදන අවස්ථාවේ අගමැතිතුමා කියන්නේ පුදුම කථාවක්. එතුමා බෞද්ධාගම ගැන බොහොම ඉහළින්ම කථා කළා. මේ බලන්න, පත්තරවල මොනවාද කියන්නේ? "කැසිනෝ එපා - ත්‍රෛනිකායික නාහිමිවරු ජනාධිපතිට ලියයි." තමුන්නාන්සේ බුද්ධ ශාසන ඇමති හැටියට ත්‍රෛනිකායික නායක ස්වාමීන් වහන්සේලාගේ කීම පිළිගන්නවා ද?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒකයි මම කිව්වේ, චීවරධාරියෝ කියා ජාතියකුත් සිටිනවාය කියා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මල්වතු නාහිමි, අස්ගිරියේ නාහිමි, අමරපුර නිකායේ නාහිමි, රාමඤ්ඤ නිකායේ නාහිමි යන හිමිවරුන්ගේ ප්‍රකාශ තමුන්නාන්සේ පිළිගන්නේ නැද්ද? ඒ කියමන පිළිගන්නේ නැද්ද? බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යවරයා හැටියට ඒක පිළිගන්නේ නැද්ද?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඔළුවක් නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේගොල්ලන්ගේ ඔළුව නැහැ? ඒ කියන්නේ නායක ස්වාමීන් වහන්සේලාගේ ඔළුව නැහැ කියාද කියන්නේ?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඔබතුමා වාගේ බුද්ධිමත් කෙනෙකුත් ඒ වාගේ දේවල් කියනවා ද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, මම නොවෙයි කියන්නේ. තමුන්නාන්සේ බුද්ධ ශාසන ඇමතිවරයා හැටියට මේ නායක ස්වාමීන් වහන්සේලා කියන දේ පිළිගන්නේ නැහැ කියා ද කියන්නේ?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
නැහැ, නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එහෙම නම්?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මම කාගේ කාගෙත් වැරදි දේවල් පිළිගන්නේ නැහැ. වැරදි ඒවා කර තිබෙනවා නම් මම ඕනෑ එකකට -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේ ඉල්ලන්නේ කැසිනෝ එපා කියලායි. තමුන්නාන්සේට බැරි ද අද මේ ගරු සභාවේ ප්‍රකාශයක් කරන්න, "මම ඒකට ඉඩ දෙන්නේ නැහැ; එහෙම පනතක් මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න ඉඩ දෙන්නේ නැහැ; මේක සම්පූර්ණයෙන් නීති විරෝධියි; නායක ස්වාමීන් වහන්සේලා කියන දේට හිස නමනවා" කියා?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඊර්ෂ්‍යාවට -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඊර්ෂ්‍යාවක් නොවෙයි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
බලය ගන්න උත්සාහ කරනවා -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මට බලයක් ඕනෑ නැහැ, ගරු සභාපතිතුමනි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
තමුන්නාන්සේලාගේ පක්ෂය බලා ගන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒවා කථා කරන්න එපා. අදාළ ප්‍රශ්නයට උත්තර දෙන්න.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
අගමැතිතුමාට නොවෙයි ඒ කිසි දෙයක් සඳහන් කළේ. ඔබතුමා කථාව කර ගෙන යන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අගමැතිතුමාට brake නැහැ. කමක් නැහැ. කටානේ යෝජිත කැසිනෝ ගම්මානයට එරෙහි වන්න කියා කොළඹ අගරදගුරු මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණෝ කියනවා. තමුන්නාන්සේ ආගමික නායකයන්ට ගරු කරනවා නම් මේ ආගමික නායකයෝ මේ කරන ඉල්ලීමට ඇයි පිටුපාන්නේ? "මම අගමැතිවරයා හැටියට, මම ආගම භාරව සිටින අමාත්‍යතුමා හැටියට මේවාට ඉඩ දෙන්නේ නැහැ" කියා ඒ පිළිබඳව ප්‍රකාශයක් කරන්න බැරි ඇයි?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
අප දන්නේ නැති දේවල් කථා කරන්න -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
දන්නේ නැති දෙයක් නොවෙයි. බබෙක් වෙන්න එපා. තමුන්නාන්සේ අවුරුදු 62ක් දේශපාලනය කළාය කිව්වා. දේශපාලනය කළා නම් මේ ගැන නොදන්නේ මොකද?

මේකේ කියනවා, "Cardinal Malcolm Ranjith, Archbishop of Colombo has condemned the setting up of a casino village to attract foreign investment in this island nation".

ආගමික නායකයෝ මෙහෙම කියනවා. ඒ වාගේම බෞද්ධ නායකයෝ, හින්දු නායකයෝ ආගමික සම්මේලනයේ දී ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කර තිබෙනවා. එය සියලු ආගම්වල නායකයන් සිටින සම්මේලනයක්. මේක තහනම් කරන්න කියා රජයෙන් ඉල්ලීමක් කරන බව බොහොම පැහැදිලිව කියා තිබෙනවා. මම අහන්නේ මේක තහනම් කරනවා ද නැද්ද කියලායි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
වැරදි වැඩ කරන අයට නිසි දඬුවම් දෙනවා කියා එතුමා පිළිතුරු දුන්නා. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
යන්නේ කොහේද? ඕවා කියලා වැඩක් නැහැ. අගමැතිතුමා මගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නේ නැතුව පැනලා යන්න එපා. බොහොම වැරදියි. තමුන්නාන්සේ ආගමික කටයුතු අමාත්‍යවරයා හැටියට, මේ රටේ සිටින ආගමික නායකයෝ, ඒ වාගේම බෞද්ධ ආගමේ ප්‍රධාන නායක ස්වාමීන් වහන්සේලා කරන ඉල්ලීමට ඇහුම් කන් දීලා මේ ව්‍යායාමය මේ රටේ ගෙන යන්න දෙන්නේ නැහැ කියා ප්‍රකාශයක් කරන්න බැරි ඇයි කියන එකයි මම අහන්නේ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒ වැඩ පිළිවෙළවලට මම සම්පූර්ණයෙන්ම විරුද්ධයි. අපි ඒවා නැති කිරීමට ක්‍රියා කරනවා. ඔබතුමන්ලා මේ ගැන ප්‍රචාරයක් දීලා පත්තරවල මුහුණ දමාගෙන තැනක් ලබා ගන්න උත්සාහ කරනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
තැනක් ලබා ගන්න නොවෙයි, ඔබතුමා කරුණාකර කියන්න ඒ පනත් පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ නැහැ කියලා. පසු ගිය දවස්වල එම පනත් පාර්ලිමේන්තුවට ගේන්න හදලා පස්සේ ගේනවා කියලා ඉල්ලා අස් කර ගත්තා. ලබන අවුරුද්දේ නැවත වරක් මේ ව්‍යායාමය කරන්න කුමන්ත්‍රණයක් තිබෙනවා කියලා දැන් අපට ආරංචියක් තිබෙනවා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඔබතුමා ඇහැට දැක්කේ නැති, දන්නේ නැති දෙයක් ඇත්තක් වශයෙන් ප්‍රකාශ කරන එක කොයි තරම් මෝඩකමක්ද කියලා ඔබතුමාම කල්පනා කරලා බලන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමා පාර්ලිමේන්තුවේ හිටියා නම් දකින්න ඇති නේ. මේවා දන්නේ නැහැ කියන්න බැහැ නේ. මෝඩකම මගේ නොවෙයි නේ. ඒක මේ පාර්ලිමේන්තුවට ගේනන හැදුවා, කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කළා. ඒක නැහැයි කියන්න එපා. මම තමුන්නාන්සේට හරියට ගරු කරනවා. නමුත් මේ වාගේ ප්‍රකාශ කළාම ඒ ගරුත්වය හීන් වෙලා යනවා. කරුණාකර මම කථා කරලා ඉවර වෙනකල් ඔහොම ඉන්න.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
වැරැද්දක් වෙලා තිබෙනවා නම් -වැරදි කරලා තිබෙනවා නම්- ඒ අයට මරණීය දණ්ඩනය දෙන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
දැන් ඔබතුමාගේ ප්‍රශ්නය බලන්න. ජාතික හෙළ උරුමය ඔබතුමාට කරන අවනම්බුව බලන්න. මම නම් හිතන්නේ නැහැ තමුන්නාන්සේ මේක කරන්න ඇති කියලා. නමුත් ජාතික හෙළ උරුමය කියනවා, හෙරොයින් කිලෝග්‍රෑම් 252 වරායෙන් නිදහස් කර ගන්න හැදුවේ අගමැතිතුමාගේ ලියුමෙන් කියලා. මම දන්නේ නැහැ, මේක ජාතික හෙළ උරුමය කියන දේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
අගමැතිතුමාට එහෙම කියන එක වැරදියි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ආණ්ඩුව පැත්තේම ඉන්න ප්‍රධාන පක්ෂයක් කියන්නේ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ජාතික හෙළ උරුමය තියා මොන උරුමය කිව්වත්, චීවරධාරියෙක් කිව්වත්, ඔබතුමා කිව්වත් ඒකේ සත්‍යය සොයා බලන්න කියන එකයි මම කියන්නේ. කොයි එක පත්තරේ තිබුණත් පත්තරේ තිබෙන ඒ හැම දේම සත්‍යය නොවෙයි. සත්‍යය සොයා බලන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම දන්නවා. ඒක කළේ තමුන්නාන්සේ නොවෙයි කියලා මම දන්නවා. [බාධා කිරීමක්] මේ විවාදයේ මගේ වේලාව තුළ මට කථා කරන්න දෙන්නේ නැහැ නේ. තමුන්නාන්සේ පොඩ්ඩක් වාඩි වෙන්න කෝ. තමුන්නාන්සේ අගමැතිතුමා නේ. [බාධා කිරීමක්] මෙන්න ඒ ලියුම. 2013 අගෝස්තු 23 දාතමින් ලියුමක් තිබෙනවා. Sir, it states, I quote:

> "Request for a Waiver of Demurrage and SLPA Charges as a Concession Container No. ............"

එසේ කියලා container එකේ අංකය සඳහන් කරලා තිබෙනවා. ඒ ලිපියේ තවදුරටත් මොනවාද කියන්නේ?

> "I would be much thankful to you on behalf of the Hon. Prime Minster that if you take appropriate action to grant a waiver of duty and concession ……….…… above container which has been imported by Rohan Impex………"

කියලා නමත් සඳහන් කරලා තිබෙනවා. මේ බලන්න මේක කොපමණ වැරදිද කියලා. ඔබතුමා වෙනුවෙන් මේ ලියුම ඉදිරිපත් කළා කියලා නේ කියන්නේ. [බාධා කිරීමක්] මේක ලියුමේ සඳහන් වෙලා තිබෙන දේ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමා මේ සිද්ධිය ඇතුළේ තිබෙන දේ දකින්නේ නැතුව නේ ඔය ලියුම ගැන කියන්නේ. දැන් ඒක ගැන පරීක්ෂණයක් පැවැත්වෙන නිසා අපට ඉන් පසුව ඒක ගැන කථා කරන්න පුළුවන්. එහෙම නැතුව දිගින් දිගටම මේ විධියට කථා කරන එක සාධාරණ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
හොඳයි, මේ පිළිබඳව පරීක්ෂණය කරනකල් ඉන්නම් කෝ. තව ප්‍රශ්නයක් තිබෙනවා.[බාධා කිරීමක්]

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ක්‍රෝධය නිසා, ඊර්ෂ්‍යාව නිසා ඉදිරියේදී තව තව දේවල් කියන්න පුළුවන්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
තව දෙයක් තිබෙනවා. මේක තමුන්නාන්සේ ගැන නොවෙයි තිබෙන්නේ. දෙසැම්බර් මස 16වැනි දා "ලංකාදීප" පත්තරේ මෙන්න මෙහෙම පළ වෙලා තිබෙනවා:

> "කෝටි 10ක හෙරොයින් හික්කඩුවෙන් අල්ලයි"

මේ විධියට කෝටි 10ක හෙරොයින් ආවේ, මේ විධියටම බලය පාවිච්චි කරලා හොරෙන් එළියට අරගෙන ගිය ඒවා ද කියන එකයි මම අහන ප්‍රශ්නය. මේ වාගේ container කීයක් ආවා ද දන්නේ නැහැනේ. මේ එකයි ඇල්ලුවේ. කිලෝග්‍රෑම් 252ක් ඇල්ලුවා කිව්වේ එක් අවස්ථාවක් පමණයි. ඊට ඉස්සෙල්ලා තව කොපමණ මේ රටට ගේන්න ඇති ද? අද ශ්‍රී ලංකාව කුඩු ජාවාරම් මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. ඒකයි මෙතැන තිබෙන භයානකකම. [බාධා කිරීමක්] මේකේ කියනවා, ඒ කිලෝග්‍රෑම් 252න් කිලෝග්‍රෑම් 100ක් ලංකාවේ පාවිච්චියටත්, අනෙක් ඒවා වියට්නාමය, එංගලන්තය, ඒ වාගේම ආසියාවේ තවත් රටවල් කිහිපයකට යවන්න ලංකාව transit මධ්‍යස්ථානයක් හැටියට පාවිච්චි කරනවා කියලා. මේක මහා භයානක තත්ත්වයක්. මේ රටට මොකද වෙලා තිබෙන්නේ? ලෝකයේ අත් අඩංගුවට ගත් හෙරොයින්වලින් වැඩිම කිලෝ සංඛ්‍යාව අල්ලලා තිබෙන්නේ මේ ලංකාවේයි. මේක ලොකු ජාවාරමක් කෙරෙන රටක් බවට පරිවර්තනය වීගෙන එනවා. මේක හරි අල්ලා ගත් එකට රේගු නිලධාරින්ට අපි ස්තුතිවන්ත වෙනවා. නමුත් මීට කලින් මේ වාගේ containers කීයක් පිට වුණාද කියන එකයි අද අපට අහන්න තිබෙන ප්‍රශ්නය. ඊයේ "ලංකාදීප" පත්තරේ තිබෙන්නේ "කෝටි 10ක හෙරොයින් හික්කඩුවෙන් අල්ලයි" කියලා.

ගරු ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා ඊතයිල් ගැන කිව්වා. කෙළවරක් නැතුව ඊතයිල් ලංකාවට එනවා. එක එක දේවල් හදන්න කියලා ගෙන්වලා අරක්කු වාගේ දේවල් හදන්න ඒවා පාවිච්චි කරනවා. [බාධා කිරීමක්] මේවායින් රටට ආදායමක් එන්නේත් නැහැ. ඒවාට බදු ගෙවන්නේත් නැහැ. ඒවා හොරෙන් 'පාස්' කර ගන්නවා. එක එක රාජ්‍ය නායකයන්ගේ නම් පාවිච්චි කරලා ලියුම් ඇරලා ඔවුන් ඒවා එළියට ගන්නවා. මේ අහු වුණේ එකක් පමණයි. මීට කලින් මේ වාගේ තව කීයක් 'පාස්' කර ගත්තාද දන්නේ නැහැ. මේකද මේ රටේ ආර්ථිකය, ගරු සභාපතිතුමනි? අපට අහන්න තිබෙන්නේ ඒකයි.

අපේ විපක්ෂයට ආරංචි ලැබෙන්නේ ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් තමයි. අපට වෙන ක්‍රමයක් නැහැ, තොරතුරු ලබා ගන්න. ඒ ආරංචි ලැබුණාම පාර්ලිමේන්තුවේදී අපි ආණ්ඩුවෙන් අහනවා, "මේක ඇත්ත ද, මේක මෙහෙමද, මේක නවත්වනවා ද, මේවාට ඉඩ දෙනවා ද?" කියලා.

විශාල ගරුත්වයක් තිබෙන, බෞද්ධාගමේ බහුතරයක් ජීවත් වන රටක මේ වාගේ දේවල් සිද්ධ වන එක ගැන ඇත්ත වශයෙන්ම අපි කනගාටු වෙනවා. අගමැතිතුමනි, මේක හොඳ නැත්තේ තමුන්නාන්සේටයි. තමුන්නාන්සේ බුද්ධ ශාසන හා ආගමික කටයුතු ඇමතිවරයා. අපි තමුන්නාන්සේ දිහා බලන්නේ අවංක, පාරිශුද්ධ, රටට යහපතක් ගෙනෙන ඇමතිවරයකු හැටියටයි. මගේ ගරුත්වය ඔබතුමාට ඒ ලෙසම තිබෙනවා. නමුත් මේ වාගේ දේවල් පළ වන කොට ඔබතුමාට හොඳ නැහැ. මේ ලියුම යවලා තිබෙන්නේ "ඔබතුමා වෙනුවෙන්" කියලා සඳහන් කරලායි. මම කියන්නේ මේවා මීට පස්සේ වෙන්න දෙන්න එපා කියලායි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හැටියට ඔබතුමාගේ අය ඒ විධියට ලියුම් ලියන්නේ නැද්ද? අවුරුදු 62ක් වූ මගේ දේශපාලන ජීවිතයේදී ලියුම් ලියන්නේ මම නොවෙයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම අහන්නේ මේ වාගේ ලියුම් කීයක් කලින් ඇරියා ද කියලායි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මේ ගැන පරීක්ෂණයක් වන නිසා, පරීක්ෂණයෙන් පසුව සොයා බලමු.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
විශේෂයෙන්ම බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ කථා කරන අවස්ථාවේදී අද ශ්‍රී ලංකාව මෙවැනි තත්ත්වයකට වැටිලා තිබීම ගැන මගේ කනගාටුව පළ කරනවා. ගරු අගමැතිතුමනි, කරුණාකර මේ හෙරොයින් වැනි මත් කුඩු වර්ග ගෙනෙන එක නවත්වන්න ක්ෂණික වැඩ පිළිවෙළක් ඇති කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒක කරන්න අවශ්‍යයි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඇත්තටම අපේ ජනාධිපතිතුමාත්, පාර්ලිමේන්තුවේ සිටින සියලුම දෙනාත් -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු සභාපතිතුමනි, දැන් මෙතැන තිබෙන වරද මෙයයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේම කොටසක් තමයි ජාතික හෙළ උරුමය. හෙළ උරුමයේ සභාපති ධුරය දරන සභාපති ස්වාමීන් වහන්සේ තමයි කියන්නේ අගමැතිතුමා පන්නන්න ඕනෑ කියලා. මම නොවෙයි කියන්නේ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඒ වෙන චීවරධාරියෙක්. පාර්ලිමේන්තුවේ කෙනෙකු නොවෙයි කිව්වේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, නැහැ, මා ළඟ තොරතුරු තිබෙනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
තව විනාඩි දෙකක කාලයක් පමණයි ඉතුරුව තිබෙන්නේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු සභාපතිතුමනි, එක්කෝ හෙළ උරුමය ආණ්ඩුවෙන් අස්වෙලා විපක්ෂයේ ඇවිල්ලා වාඩි වෙන්න ඕනෑ. [බාධා කිරීමක්] ඒ අය කරන ඉල්ලීමට ඉඩ දෙන්නේ නැත්නම් අගමැතිතුමනි, තමුන්නාන්සේ ඒගොල්ලන් අයින් කරන්න. තමුන්නාන්සේ තමයි රටේ අගමැති. ඔබතුමාට බොරු චෝදනාවක් කරනවා නම් එතුමන්ලාට කියන්න, ආණ්ඩුවෙන් අයින් වෙන්න කියලා. එහෙම කරන්නේ නැතිව -[බාධා කිරීමක්] අද වන තුරු මම දන්නේ නැහැ, මේක කාගේවත් කීමකට කෙරෙන වැඩක් ද කියලා. ඒක අපි දන්නේ නැහැ. කෙසේ වෙතත් මේ කාරණය තමුන්නාන්සේ මතක තියා ගන්න. මේක අපි කියන දෙයක් නොවෙයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේම ඉන්න පාර්ශ්වයක් තමයි තමුන්නාන්සේට මේ චෝදනාව කරන්නේ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
එක්සත් ජාතික පක්ෂයේ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ඔබතුමාට විරුද්ධ කියන ඒවා -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපි ආණ්ඩුවේ නොවෙයි නේ. අපි විපක්ෂයේ. ඒ නිසා ඒක අපට ප්‍රශ්නයක් නැහැ. මේ ප්‍රශ්නය තිබෙන්නේ ආණ්ඩුවට.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
සමහර අය එහෙම කියන්න පුළුවන්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේකේ තිබෙන භයානකකම, බරපතළකම මේක අපි කියන දෙයක් නොවන එකයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේම ඉන්න පාර්ශවකරුවකු වන ජාතික හෙළ උරුමය තමයි මේක කියන්නේ. ඒ අය තමයි කියන්නේ තමුන්නාන්සේ අත් අඩංගුවට ගන්න කියලා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
යූඑන්පී එකේ එහෙම කරන අය නැද්ද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මොකද ඒකට කරන්නේ?

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ඔළුව නැති අය ඉන්නවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒ කියන්නේ හෙළ උරුමයේ ඉන්නේ ඔළුව නැති අය ද? ඒකයි මට දැන ගන්න ඕනෑ, ගරු සභාපතිතුමනි.
බොහොම ස්තුතියි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මීළඟට ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මා මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න ගියා. නමුත් අපේ මන්ත්‍රීවරුත්, එක්සත් ජාතික පක්ෂයේ අපේ හිතවත් අයත් කිව්වා - [බාධා කිරීමක්] මා ඉතින් "හා" කියලා නිකම් හිටියා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
බොහොම ස්තුතියි.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මා කෙටියෙන් කිව්වා, මා ප්‍රකාශයක් කරන්නේ නැත්තේ මේ පරීක්ෂණයට මා අත ගැහුවාය කියලා කියන නිසායි කියලා. [බාධා කිරීමක්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳමයි. පරීක්ෂණවලට හුඟක් කල් යනවා. හොඳ පරීක්ෂණයක් කරන්න ඕනෑ. [බාධා කිරීමක්] හොඳයි, ගරු අගමැතිතුමා. ගරු රත්නසිරි වික්‍රමනායක අමාත්‍යතුමා කථා කරන්න.

[පූ.භා. 11.06 ]

**ගරු රත්නසිරි වික්‍රමනායක මහතා (යහපාලනය හා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்னசிறி விக்கிரமநாயக்க - நல்லாட்சி மற்றும் உட்கட்டமைப்பு அமைச்சர்)
(The Hon. Ratnasiri Wickramanayaka - Minister of Good Governance and Infrastructure)
ගරු සභාපතිතුමනි, අය වැය පිළිබඳ විශේෂ කාරක සභා වාර්තාවේ ඇතුළත් වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡාව ඇරඹිලා තිබෙන මේ මොහොතේ මට අවසර දෙන්න, යහ පාලනයට අදාළව කරුණු කිහිපයක් තමුන්නාන්සේ ඉදිරියේ තබන්නට. එදා කාරක සභා අවස්ථාවේදී මවිසින් කෙටියෙන් පෙන්වා දුන්නා, අපි රාජ්‍ය සේවයේ විශාල වෙනසක් ඇති කරන්න යනවාය කියලා.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
ගරු සභාපතිතුමනි, මට සමා වෙන්න. මේ අනවශ්‍ය ලියවිලි හැන්සාඩ්ගත කරනවාට මා සම්පූර්ණයෙන් විරුද්ධයි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
හොඳයි. ඒවා සොයා බලා ඉවත් කරන්නම්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
හැන්සාඩ්ගත කළේ නැහැ.

**ගරු දි.මු. ජයරත්න මහතා**
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
කවුරුන් හෝ ලියලා තිබෙන ඒවා තමන්ගේ කථාවේදී හැන්සාඩ්ගත කරන්න බැහැ. ඔබතුමා පරීක්ෂා කර බලා ක්‍රියා කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
මේ අවස්ථාව මඩ ගැසීම සඳහා පාවිච්චි කරන්න එපා. මොකද, මේ සියලුම තොරතුරු සජීවීව විකාශනය වනවා. එම නිසා කාටවත් අසාධාරණයක් වෙන්න ඉඩ තබන්න එපා. ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු රත්නසිරි වික්‍රමනායක මහතා**
(மாண்புமிகு ரத்னசிறி விக்கிரமநாயக்க)
(The Hon. Ratnasiri Wickramanayaka)
ගරු සභාපතිතුමනි, මම තමුන්නාන්සේට අනුකම්පා කරනවා මේ අනවශ්‍ය ප්‍රශ්න මේ ආකාරයෙන් ඇදි-ඇදී ඇවිල්ලා -

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ආණ්ඩුව ඇතුළේ.

**ගරු රත්නසිරි වික්‍රමනායක මහතා**
(மாண்புமிகு ரத்னசிறி விக்கிரமநாயக்க)
(The Hon. Ratnasiri Wickramanayaka)
ආණ්ඩුව ඇතුළේ හෝ පිටත. මේ සභා ගර්භය තුළ.

ගරු සභාපතිතුමනි, ඕනෑම රජයක් සාර්ථක වන්නේ යහ පාලනය හොඳ වුණොත් විතරයි. යහ පාලනයේදී ආණ්ඩුවකට මුල් වෙන්නේ රාජ්‍ය සේවකයායි. රාජ්‍ය සේවකයා මතයි, රජයක යහ පාලනය ක්‍රියාත්මක වන ආකාරය මනින්නේ. එම නිසා අපි කල්පනා කළා, අපේ අමාත්‍යාංශය යහ පාලනය සම්බන්ධව අලුත් ඇසකින් බලා, සේවකයායි, ස්වාමියායි අතර තිබෙන්නා වූ සම්බන්ධකම් තහවුරු කරලා ශක්තිමත් කරන්න. දැන් පෞද්ගලික අංශයේ මෙය ක්‍රියාත්මක වනවා; අනවශ්‍ය ආරවුල් ඇති වන්නේ නැහැ. එහෙම කළොත් ඒ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව ගැන නිරන්තර සාකච්ඡාවක් ඇති වෙනවා.

ගරු සභාපතිතුමනි, මේ ආකාරයේ වැඩ පිළිවෙළක් රාජ්‍ය සේවයටත් ඇති කිරීම සඳහායි, අත් හදා බැලීමේ ව්‍යාපෘතියක් හැටියට සෞඛ්‍ය අමාත්‍යාංශයට සීමා කරලා එම කටයුත්ත ආරම්භ කරන්න බලාපොරොත්තු වන්නේ. මෙයට සම්පූර්ණ සහාය දෙන්නේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයයි. ඒ සංවිධානයේ අනුග්‍රහය යටතේ තමයි අපි මේ කටයුත්ත කරන්න බලාපොරොත්තු වන්නේ. අවුරුද්දක් යන තෙක් ඒ සම්පූර්ණ වියදම ඒ සංවිධානය දරනවා. පෞද්ගලික අංශයෙන් ලත් ඒ අත් දැකීම් මේ අංශය තුළ ඒ ආකාරයෙන්ම පැළ කරන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. මේ අංශය ඊට වඩා වෙනස්. ඒ වෙනස්කම්වලට අනුකූල වන ආකාරයට, ගැළපෙන ආකාරයට වැඩ පිළිවෙළක් තමයි අපි සකස් කරන්න බලාපොරොත්තු වන්නේ. අපේ අදහස් වෙනත් කෙනකු මත බලෙන් පටවන්න අපේ බලාපොරොත්තුවක් නැහැ. සාකච්ඡා මාර්ගයෙන්, ප්‍රශ්න විසඳා ගෙනයි ඉදිරියට යා යුත්තේ. දෙපාර්තමේන්තුවක හෝ අමාත්‍යාංශයක ඕනෑම ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන කොට නිරන්තර සාකච්ඡාවක් ඇති විය යුතුයි. ආණ්ඩුවේ ඇමතිවරයා විතරක් නොවෙයි, දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විතරක් නොවෙයි, අනෙක් අයත් දැන ගන්නට ඕනෑ, මොකක්ද කරන්නේ

කියලා. එතකොට සුහදතාවක් ගොඩ නැඟෙනවා; අනවශ්‍ය සැකය අයින් වෙනවා. ඒ විධියේ වැඩ පිළිවෙළකට යන්නයි අපේ බලාපොරොත්තුව. අපි ඒ අත්හදා බැලීමේ ව්‍යාපෘතිය නිල වශයෙන් මෙහෙට ආරම්භ කරනවා. ඒ ව්‍යාපෘතිය පළමුවෙන් සීමා කරන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයට විතරයි. ඒ ව්‍යාපෘතිය සෞඛ්‍ය අමාත්‍යාංශයට සීමා කරලා ඒ තුළින් ලැබෙන අත් දැකීම් අනුව ඊළඟ අවුරුද්දේ අවශ්‍ය වෙනස්කම් කරන්නට අපි බලාපොරොත්තු වනවා.

ඕනෑම සමාජයක් වෙනස් වනවා. වෙනස් වෙන සමාජයත් එක්ක ප්‍රතිපත්ති වෙනස් වෙනවා. ඒ වාගේම අපේ ඉලක්ක වෙනස් වෙනවා. එම නිසා අත්හදා බැලීමක් වශයෙන් විතරයි මෙය කරන්න බලාපොරොත්තු වෙන්නේ. මේ තොරතුරු ටික තමුන්නාන්සේ ඉදිරියේ තැබුවේ විශේෂ කාරක සභාවේදී මේ විෂය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා වුණු නිසායි. එම විශේෂ කාරක සභාවේදී මා විසින් ඉදිරිපත් කළ කරුණු කෙටියෙන් ඉදිරිපත් කිරීම සඳහායි මා මේ අවස්ථාව යොදා ගත්තේ.

ගරු සභාපතිතුමනි, අපි ඒ ව්‍යාපෘතිය හඳුන්වන්නේ, "රාජ්‍ය සේවයේ ආරවුල් නිරවුල් කිරීමේ සමාජ කථිකාව හා ක්‍රමවේදය" හැටියටයි. ඒ තුළින් අපි බලාපොරොත්තු වෙනවා මීට වඩා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කරන්නට. එහිදී රාජ්‍ය සේවය ඔප මට්ටම් කරලා, අනවශ්‍ය හැප්පීම් නවත්වලා, කවුරුත් සාකච්ඡා මේසයට ඇවිල්ලා ප්‍රශ්න සාකච්ඡා කරන්නට පුළුවන්. ඒක තමයි කෙටියෙන් එහි අදහස.

තමුන්නාන්සේට මම නැවත වරක් ස්තුතිවන්ත වෙනවා, මෙම කාරණය පිළිබඳව ඒ කාරක සභාවෙන් පිටට ඇවිල්ලා මේ ගරු සභාව ඉදිරියේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දීම සම්බන්ධව. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.12]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු සභාපතිතුමනි, විෂයයන් කිහිපයක් ගැන සාකච්ඡා කරන, විවාද කරන මේ වෙලාවේදී මම විශේෂයෙන්ම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ගැන කරුණු කිහිපයක් කියන්න කැමැතියි. මෙහිදී අපට විශේෂයෙන්ම මතක් වෙනවා, අවුරුදු 9කට උඩ දී, - 2004 දී දෙසැම්බර් මාසයේ 26 වෙනි දා- සුනාමිය නිසා ජීවිත නැති වුණු ඒ පිරිස. මේ දෙසැම්බර් මාසයේ ඒ පිළිබඳව කථා කරන්න ඒක විශේෂ හේතුවක් වෙනවා. නැවත කවදාවත් මේ රටේ මෙවැනි සිද්ධියක් නොවේවා කියන එකයි අපේ ප්‍රාර්ථනාව. කවදාවත් ස්වාභාවික ආපාදාවකින්වත් 40,000ක පිරිසකගේ නැති වෙන තත්ත්වයට රට පත් වන්නට ඕනෑ නැහැ.

ස්වාභාවික ආපදා තිබෙනවා. ඒ වාගේම මනුෂ්‍යයා විසින් නිර්මාණය කරනු ලබන ආපදා තිබෙනවා. ස්වාභාවික ආපදාව අපට වළක්වන්නට බැහැ. නමුත් ස්වාභාවික ආපදාවෙන් සිදු වන හානිය අපට අවම කරන්නට පුළුවන්.

ආපදා කළමනාකණ පනත කියලා පනතක් 2005 දී - සුනාමියෙන් පසුව- මේ ගරු සභාව විසින් සම්මත කර ගත්තා. ඒ පනතින් රජයකට නොයෙකුත් වග කීම් පැවරෙනවා, විශේෂයෙන්ම ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරනු ලබන සිද්ධීන් වැළැක්වීමටත්, ඒ වාගේම එවැනි දෙයක් සිදු වුණොත් ඊට පසුව ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳවත්. විශේෂයෙන්ම ඒ පනතේ සඳහන් වෙනවා, ආපදා කළමනාකරණ කවුන්සිලයක් තිබෙන්නට ඕනෑ කියලා. ඒ වාගේම ජාතික වැඩසටහනක්, ජාතික ආපදා කළමනාකරණ වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. ඒ වැඩ පිළිවෙළ පිළිබඳව ජනතාව දැනුවත් කරන්නත් ඕනෑ. නමුත් අද ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ www.desinventar.lk කියන වෙබ් අඩවියට ගියොත්, කනගාටුවෙන් වුණත් කියන්න වෙනවා, ඒ වෙබ් අඩවියවත් යාවත්කාලීන කරලා නැහැ කියලා. 2011ට පසුව, 2012 සහ 2013 දී මේ රටේ සිදු වෙලා තිබෙන කාලගුණ විපර්යාස පිළිබඳවත්, ඒවාට ගත්ත පියවර පිළිබඳවත් විස්තර ඒ වෙබ් අඩවියේ ඇතුළත් කරලා නැහැ. පනතින්ම කියනවා ජනතාව හැම තිස්සේම දැනුවත් කළ යුතුයි කියලා. විශේෂයෙන්ම ජාතික සැලැස්ම ගැන දැනුවත් කළ යුතුයි කියන කාරණයත් ඒ පනතේ සඳහන් වෙනවා.

කාලගුණ දෙපාර්තමේන්තුවේ තොරතුරු අපට කලින් කලට අහන්නට ලැබෙනවා. මේවා නිවැරදිද, නැද්ද කියලා ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ ආපදා ගැන මීට කලින් මේ ගරු සභාවේ සාකච්ඡා කරලා තිබෙනවා; මන්ත්‍රීවරුන් ප්‍රශ්න ඉදිරිපත් කරලා තිබෙනවා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු හුඟාක් තිබෙනවා. මීට පෙරත් ගරු මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේ අහලා තිබෙනවා, මේ අඩු පාඩු තිබෙන තැන්වලට සුදුසු පුද්ගලයන් පත් කරන්නේ කවදාද කියලා. ගරු මහින්ද අමරවීර ඇමතිතුමා එදා ඒකට උත්තරයක් දුන්නේ නැහැ. එතුමා ඒ ප්‍රශ්නයෙන් බේරිලා ගියා. බේරිලා ගිහින් කිව්වා, එයට පිළිතුරක් සපයන්න ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා එයට මැදිහත් වන්නට ඕනෑ කියලා.

මේ අමාත්‍යාංශ දෙකේ ඇමතිවරුන් දෙදෙනා අතරේ මේ සාකච්ඡාව යන අතරේ දී මේ වාගේ ආපදාවන් කිහිපයක්ම සිදු වෙලා තිබෙනවා. අපි දන්නවා, මේ අවුරුද්දේ විතරක් ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා මාස හයක කාලය තුළ මේ රටේ ලක්ෂ හයක් විතර ජනතාව මොකක් හරි ආපදාවකට මුහුණ දීලා තිබෙන බව. පසු ගිය අවුරුද්දේ මිලියනයකට වැඩි ජනතාවක් ආපදාවන්ට මුහුණ දීලා තිබෙනවා. නමුත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට තමයි නීතියෙන් වග කීම පවරා තිබෙන්නේ. කාලගුණයේ වෙන්න පුළුවන්, විපර්යාස ගැන මූලික විද්‍යාත්මක කරුණු විශේෂයෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට දෙන්න ඕනෑ, ඒ අයයි. නමුත් එතැනම ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, එතැන සිටින අධ්‍යක්ෂවරුන් සඳහන් කරලා තිබෙනවා, සමහර වෙලාවට සුදුසු අය නැති නිසා ඒ දේවල් හරියටම කරන්න බැරි වෙලා තිබෙනවා කියලා. ඇත්තටම ආපදාවක් සිදු වුණාට පසුව අපි ගිහිල්ලා එක එක අයට සහන දීලා වැඩක් නැහැ. ආපදාව සිදුවීමට කලින් තමයි අපි පියවර ගන්නට ඕනෑ.

ජූලි මාසයේ විතර දකුණේ ධීවරයන් 54 දෙනෙක් අතුරුදන් වුණා. මේක මීගමුවේත් සිදු වුණා. ඇත්තටම මේ අයගේ ජීවිත නැති වුණේ අපේ අඩු පාඩු නිසාය කියන එක රජය තවමත් පිළිගෙන නැහැ. ඒ ගැන සොයා බලනවා කියලා අපට කිව්වා. අපට ඒ ගැන දන්වන්නම් කියලා කිව්වා. නමුත් ඇත්තෙන්ම රජය තවමත් පිළිගෙන නැහැ, මේ අයගේ ජීවිත නැති වුණේ රජයේ අඩුපාඩු නිසාය කියලා. ඇමතිතුමා එක් වරක් මේ ගරු සභාවේ දී සඳහන් කළා, "රුපියල් බිලියනයක විතර ආයෝජන හිඟයක් තිබෙනවා, ඒ නිසා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ගන්න බැරි වුණා" කියලා. එතකොට මම අහන ප්‍රශ්නය මේකයි. ඇත්තටම මේක මුදල් හිඟකම නිසා ඇති වුණු ප්‍රශ්නයක් ද? මොකද, අපි හැමතිස්සේම දෙයක් සිදු වුණාට පසුව තමයි විසඳුමක් සොයන්නේ.

දැන් අපට දැන ගන්නට ලැබිලා තිබෙනවා, සුනාමිය ගැන අනතුරු ඇඟවීමේ පද්ධතියක් තිබෙනවා ලු. ඒක එදා ඉඳලාම තිබෙනවා. නමුත් ළඟදී මේ අනතුරු ඇඟවීමේ පද්ධතිය අක්‍රිය

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

වෙලා තිබෙනවා කියලා නොයෙකුත් මාධ්‍යවල සඳහන් වෙලා තිබුණා. ඉතින් මේවා සක්‍රිය කරන්න අපි තවත් ආපදාවක් වෙනකන් සිටිනවා ද? අපි දන්නවා, රත්නපුර දිස්ත්‍රික්කය ගත්තොත් විශේෂයෙන්ම මැණික් පතල් කැණීම නිසාත්, මාතලේ දිස්ත්‍රික්කය ගත්තොත් නාය යාම නිසාත්, එහෙම නැත්නම් පස සේදී යාම නිසාත් යම් ආපදාවන් සිදු විය හැකි තත්ත්වයක් ඒ දිස්ත්‍රික්කවල තිබෙනවා කියලා. පොළොවේ පැළුම් තිබෙන නිසා කඳු නාය යාමට ලක් වන්නට ඉඩ තිබෙනවා කියලා භූ විද්‍යා පර්යේෂණ දෙපාර්තමේන්තුව දැනටමත් සඳහන් කර තිබෙනවා. අපි මේ විස්තර ඔක්කොම දන්නවා. නොදන්නා දෙයක් නොවෙයි. එක කාරණයක් තමයි ජනතාව දැනුවත් කිරීමක් සිදු වෙලා නැති එක.

දෙවැනි කාරණය තමයි මේ විස්තර දැන ගත්තත්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි ක්‍රියා මාර්ගයක් ගෙන නැති එක. මේ ක්‍රියා මාර්ගය රාජ්‍ය සේවකයන් කිහිප දෙනෙක් පමණක් දැනගෙන සිටියාට මදි. එම ආපදාවලින් වැළකෙන්නට නම් මේ ගැන ජනතාවත් දැනුවත් කරන්නට ඕනෑ. ගං වතුර, සුළි සුළං, මේ වාගේ දේවල් අපේ රටේ සිදු වෙනවාමයි. මොකද, ලෝකයේ අද කාලගුණ වෙනස්වීම් තිබෙනවා. ඒ නිසා මේක වෙනස් වෙමින් පවතින තත්ත්වයක්. ඒක නිසා මේක දිගින් දිගටම සිදු වෙනවා.

ආපදා කළමනාකරණය ගැන කථා කරනකොට මිනිසා විසින් ඇති කරන මේ අපදා සම්බන්ධයෙන් විශේෂ යොමු වීමක් තිබෙන්නට ඕනෑ. මාස තුනකට විතර උඩදී අවිස්සාවේල්ල නගරයට ආසන්නව තිබෙන පෙන්රිත් කියන වත්තේ - Penrith Estate එකේ- මේ වාගේ සිදුවීමක් වුණා. ඒ වත්තේ වැඩ කරන වතු ජනතාවගේ නිවාසවල ඉඳන් යාර 50ක්වත් නැහැ, ඒ ජල පොම්පාගාරයට. ඒ ජල පොම්පාගාරය දාලා තිබෙන්නේ පසු කලෙකයි. ඉස්සෙල්ලා ඒ වත්තේ මිනිස්සු ජීවත් වුණා. ඔවුන් ඒ වතු කර්මාන්තය තමයි කළේ. මේ පොම්පාගාරය ගෙනැල්ලා එතැන දැම්මා. මේක දාන කොට කවුරුවත් කල්පනා කළේ නැහැ, ආපදාවක් සිදු වෙන්න පුළුවන් කියලා. මොනවාද මේ පොම්පාගාරයෙන් කරන්නේ? මේක ක්ලෝරීන් වායුව වතුර එක්ක මිශ්‍ර කරන පොම්පාගාරයක්. මේ කියන සිදු වීම මාස තුනකට උඩදී රාත්‍රී 9ට විතර සිදු වුණේ. ඒ පොම්පාගාරයෙන් ක්ලෝරීන් වායුව පිටවෙලා මේ නිවාස ඇතුළට ආවා. මිනිස්සු 350කට විතර බැරෑරුම් විධියට රෝගී තත්ත්වයක් ඇති වුණා. අවිස්සාවේල්ල රෝහලට එකවරම රෝගීන් 350ක් විතර ගෙනාවා. මම මේ වත්තට ගියා. මම දවස් තුනකට පස්සේයි ඒ වත්තට ගියේ. පාර්ලිමේන්තු රැස්වීම් තිබෙන සතියක බදාදා දවසක තමයි මේක සිදු වුණේ. මම සෙනසුරාදා ගියා. ඒ වත්තේ තිබෙන ඒ නිවාසවලට ඇතුළු වුණාම ඒ නිවාසවල ඒ වෙනකොටත් ක්ලෝරීන් වායුව තිබුණා. මොකද ක්ලෝරීන් වායුව බොහොම බර වායුවක්. මේ වායුව නිවාසවල තිබුණා. ඒ මිනිස්සුන්ට ජීවත් වෙන්න ක්‍රමයක්වත් නැහැ.

ගරු සභාපතිතුමනි, දවස් තුනක් ගත වෙලාත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන්වත්, අමාත්‍යාංශයෙන්වත් පිහිටක් ලැබුණේ නැහැ. සමහර දේශපාලනඥයන් ගිහිල්ලා තිබුණා. ඒ අයට ජීවත් වෙන්න කුඩාරමක්වත් ලැබිලා තිබුණේ නැහැ. ඒ අවස්ථාව වෙනකලුත් ඒ වාගේ කිසිම ක්‍රියාවලියක යෙදිලා තිබුණේ නැහැ. ඒ සිද්ධියට ලක් වුණු කාන්තාවන් අනෙක් අයගේ නිවාසවල හිටියා. පිරිමි අය නිකම් එළිමහනේ තමයි රාත්‍රී දෙක, තුනක් ගත කළේ. මෙතැන ඇත්තටම ආපදාවක් සිදු වෙන්න ප්‍රථමයෙන් ක්‍රියා කරන්න තිබුණේ. ආපදාව සිදු වුණාටත් පස්සේ ඔවුන්ට සහන සලසන ක්‍රියාවලියක් යොදලා තිබුණේ නැහැ. මට අහන්න අවශ්‍ය වන ප්‍රශ්නය මේකයි. ඒ වත්තේ ඉන්න මිනිසුන්ගේ දේශපාලන බලය අඩු නිසා ද මේ වාගේ සැලකීමක් ඒ අයට තිබෙන්නේ කියලා මම අහන්න කැමැතියි. මිනිස්සු පාරට බැහැලා බස් එකකට ගිනි තිබ්බා නම් රජය එක පාරින්ම ක්‍රියා කරනවා. නමුත් ඒ මිනිසුන් නිහඬව, සාමකාමීව ජීවිතය ගෙන යන නිසා ද මේ වාගේ සැලකිල්ලක් ඒ පෙන්රිත් වත්තට දැක්වූයේ කියන එක මම අහන්න කැමැතියි. දැන් මාස තුනක් ගතවෙලා තිබෙනවා.

මම එතැනදී මැදිහත් වෙලා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉන්න ජනරාල්වරයාටත් කථා කළා. වෙනත් රජයේ නිලධාරින් කිහිප දෙනෙකුටමත් කථා කළා. නමුත් අද වුණත් එතැනට පිළියමක් යොදලා නැහැ. අද වුණත් පිළිතුරක් නැහැ. ඇත්තටම ඒ පොම්පාගාරය දිගින් දිගටම පවත්වාගෙන යනවා නම් කළ යුතු වන්නේ ඒ නිවාස 60 ගණන එතැනින් අයින් කරලා, අලුතෙන් ඉඩම් බෙදා දීලා, වෙන තැනකින් ඒ නිවාස ගොඩ නඟලා දෙන එකයි. අපි බලාගෙන ඉන්නවා ද, මේ වාගේ අනතුරක් ආයෙත් සිදු වෙන කල්? මනුෂ්‍යයා විසින්ම නිර්මාණය කරන ආපදා තමයි දැන් මේ රටේ වැඩි වැඩියෙන් සිදු වේ ගෙන යන්නේ. අපි රතුපස්වල සිද්ධිය ගැන දන්නවා. එක එක අය එක එක දේවල් කියනවා, ඒ සිද්ධිය වුණු හේතුව පිළිබඳව. නමුත් අපට අනිවාර්යයෙන්ම කියන්න පුළුවන්, කර්මාන්තශාලාවල් ජනාකීර්ණ ප්‍රදේශවල තිබෙන කොට ඒ වාගේ බොහොම උග්‍ර ප්‍රශ්න ඇති වෙනවා කියලා. කර්මාන්තශාලාවල් කර්මාන්ත කලාප තුළ තිබෙන කොට එවැනි ප්‍රශ්න ඇති වුණොත් අපට ඒක වෙනම බලන්න පුළුවන්. නමුත් ජනාකීර්ණ තැන්වල තිබෙන කොට විශාල කොම්පැනි පවා මෙවැනි දේවල්වලට තමන්ගේ අවධානය එච්චර යොමු කරන්නේ නැහැ. ඒ නිසා තමයි රජයේ අධීක්ෂණය අවශ්‍ය. මේ විශාල කොම්පැනිවලට කියන්න ඕනෑ, මහ ජනතාව ජීවත් වන ප්‍රදේශවල මහ ජනතාව එකතු කරගෙන තමයි මේ දේවල් කරන්න ඕනෑ කියලා.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ බලපුවාම අපට පෙනුණා, ගිය අවුරුද්ද වෙන කල් ඒ අමාත්‍යාංශයට වෙන් කරපු මුදල ටිකක් අඩු වෙලා තිබෙන්නේ කියලා. මේ අවුරුද්දේ වැඩි වෙලා තිබෙනවා. ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි, මොනවාටද මේ මුදල පාවිච්චි කරන්න යන්නේ කියලා. ඔබතුමාගේ පිළිතුරු කථාවේ දී ඒකට උත්තරයක් දෙන්න. අපි හුඟක් ණය ගන්නවා. ඒ ණයවලින් යටිතල පහසුකම් ගොඩනඟනවා. මේ වාගේ අනතුරු වැළැක්වීමට ඒ ණය භාවිත නොකරන්නේ ඇයි? ඇයි ඒක නොකරන්නේ? මේකට හේතුවක් තිබෙනවා. මම ආර්ථික විද්‍යාව හදාරන ශිෂ්‍යයෙක් වෙලා ඉන්න කාලයේ අප්‍රිකාව ගැන ඉගෙන ගන්න කොට අපට කිව්වා අප්‍රිකාවේ අධිරාජ්‍යවාදින්, නායකයන් හුඟක් වේලාවට විශාල ආකෘති, විශාල යටිතල පහසුකම් සපයන ව්‍යාපෘති තමයි කරන්න කැමැති කියලා. ඒකට හේතුව, අප්‍රිකාවේ ඒ නායකයන් දන්නවාලු ඒවායෙන් තමයි ගසා කන්න පුළුවන් කියලා. මේක ආර්ථික විද්‍යාවේ උගන්වන දෙයක්. ඒක ලංකාවට අදාළ නම් කරුණාකරලා අදාළ කර ගන්න. මොකද මේ ප්‍රශ්නය අපට පේන්නේ හුඟක් වේලාවට රජයේත් ප්‍රමුඛත්වය තිබෙන්නේ විශාල ආකෘතිවලට සහ යටිතල පහසුකම්වලට නිසායි. නමුත් පුද්ගලයා කේන්ද්‍ර කරගෙන කරන ඒ වැඩ පිළිවෙළට, සංවර්ධනයට ඒ තරම් යොමුවක් නැහැ කියලා කියන්න ඕනෑ.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ වාර්තාව අනුව රටවල් 177කින් ලංකාව 79 වන ස්ථානයේයි තිබුණේ. ඒකේ අලුත්ම වාර්තාවේ තිබෙනවා ලංකාවේ දූෂණය වැඩි වෙලාය කියලා. දැන් ලංකාව 91වන තැනට පත්වෙලා කියලා එහි සඳහන් කර තිබෙනවා. මේක ඒ අය ගණනය කර තිබෙන්නේ අද කථා කරපු ඔය එතනෝල් container, හෙරොයින් container ගේන්න ඉස්සර වෙලායි. අද සඳහන් කරපු ඒවාත් ගණනය කළාට පස්සේ, 91වන ස්ථානයේ සිට කී වැනි තැනට ලංකාව වැටෙයි ද කියන එකවත් කියන්න අපහසුයි. අපට මේ 91වැනි තැන ලැබිලා තිබෙන්නේ ඊට ප්‍රථමයෙන් කියලා සඳහන් කරන්න ඕනෑ.

අද මේ විවාදය යන කොට මම දැක්කා ගරු සභාපතිතුමාත් ඊට මැදිහත් වුණු ආකාරය. එතුමා මැදිහත් වුණේ අගමැතිතුමාව ගලවා ගන්න ද කියලා මම දන්නේ නැහැ. එතුමා මැදිහත් වුණු එක බොහොම හොඳ දෙයක්. මොකද අද මේ විවාදය යන කොට මට එක කාරණයක් පෙනුණා. පාර්ලිමේන්තුවට එන මම වාගේ මන්ත්‍රීවරුන්ට සුදුසුකම් තිබිය යුතුද, නැද්ද කියන එක පිළිබඳ සංවාදයක් රටේ තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් වෙන්න සුදුසුකමක් නැද්ද කියලාත් හුඟක් අය එක එක තැනට යන කොට අහනවා. අප රැකියාවකට යනවා නම් සුදුසුකමක් තිබෙනවා නේ. ගරු සභාපතිතුමනි, අප සම්මුඛ පරීක්ෂණයකට ගියොත් අපෙන් අහනවා නේ, O/L තිබෙනවා ද, A/L තිබෙනවා ද, degree එකක් තිබෙනවා ද, නැත්නම් වෙන මොකක් හරි සුදුසුකමක් තිබෙනවා ද කියලා. එවැනි දේවල් අහනවා. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට සුදුසුකමක් නැහැ කියන මතය තුළ තමයි මේ රටේ දේශපාලනඥයන් සිටින්නේ. ඒකට හේතුව ලෙස ඒ අය කියන්නේ මොකක්ද? අප ජනතාව නියෝජනය කරනවා නම්, ජනතාව අපට ඡන්දය දෙන්න කැමැති නම් අප එතැන සිටිය යුතුයි කියන මතයයි ඔවුන් තුළ තිබෙන්නේ.

සාමාන්‍යයෙන් අප රස්සාවක් කරනවා නම් යම් කිසි වයසකට ආවාම විශ්‍රාමයක් ලබනවා. ඒක අවුරුදු 55 වන්න පුළුවන්, අවුරුදු 60 වන්න පුළුවන්, 65 වන්න පුළුවන්. සමහර යුරෝපීය රටවල දැන් එහෙම විශ්‍රාම යන වයසක් නැහැ. විශ්‍රාම යන වයසක් තිබෙන්න ඕනෑ නැහැ කියන මතයේ තමයි මමත් ඉන්නේ. නමුත් විශ්‍රාම වයසක් තියලා -අවුරුදු 55 හෝ 60- ඊට පසුව ඉහළ ඉන්න එක එක නිලධාරින්ට, නැත්නම් ඇමතිවරුන්ට ඕනෑ ඕනෑ විධියට -ඒ අය කැමැති අයට විතරක්- අවුරුදු 61,62,63,64,65 වෙන තුරු වැඩ කරන්න දෙන එකට මම සම්පූර්ණයෙන්ම විරුද්ධයි. මම කියනවා රජයට මේක ගැන හොයා බලන්න කියලා. හේතුව මේකයි. හුඟක් වේලාවට මේ හොරකම, වංචාව වන්නේ එවැනි අය තුළිනුයි. මම අද ඒ අයගේ නම් මේ ගරු සභාවට හෙළිදරවු කරන්නේ නැහැ. නමුත් මම පසුව ඒ අයව නම් කරන්න යනවා. මම රජයෙන් ඉල්ලනවා එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන්න එපා කියලා. එක්කෝ වයස අයින් කරන්න. නැත්නම් විශ්‍රාම ලබන්න වයසක් තියන්න. ඒ වයස ක්‍රියාත්මක කරන්න කියලා මම සඳහන් කරනවා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙන්න එහෙම විශ්‍රාම වයසකුත් නැහැ. ඕනෑම කෙනෙකුට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවන්. නමුත් අද දිනයේ, මේ මොහොත වන තුරු වුණු විවාදය ජනතාව දැක්කා නම් රටේ තිබෙන ඒ පීඩනය -පාර්ලිමේන්තුවට එන මන්ත්‍රීවරුන්ට මොකක් හරි සුදුසුකමක් තිබෙන්න ඕනෑය කියන එක- අද ඇත්තටම සනාථ වෙනවා. මොකද ඒ අයට හිතෙයි, මොනවාද අප මේ කථා කරන්නේ, එක එක්කෙනාට නිකම් කෑ ගහ ගන්නවා, ඒ පැත්තෙන් මේ පැත්තට කෑ ගහනවාය කියලා. මේකේ සුදුසුකමක් තිබෙන්න ඕනෑ. නමුත් ගරු සභාපතිතුමනි, අද නම් මට පැහැදිලි වුණේ මේකයි. මට මේක කියන්නම වෙනවා. මේක අධ්‍යාපන සුදුසුකම් නොවෙයි, අත් දැකීමේ සුදුසුකම් නොවෙයි, දීර්ඝ කාලයක් සේවය කරපු එකේ සුදුසුකම් නොවෙයි. මෙහිදී අපට මානසික සුදුසුකම් තිබෙනවා ද කියලාත් පොඩ්ඩක් හොයා බලන්න සිදු වෙනවාය කියලා මට කනගාටුවෙන් හරි කියන්න වෙනවා.

අපේ ගරු මහින්ද අමරවීර ඇමතිතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. එතුමා හිටියා නම් මම මේ කාරණය එතුමාටම යොමු කරනවා.

එතුමා කිව්වා රුපියල් බිලියනයක් විතර අඩු නිසා තමයි -ඒ හිඟකම තිබුණු නිසා තමයි-, අවශ්‍ය යන්ත්‍රෝපකරණ නැති නිසා තමයි කාලගුණය පිළිබඳව හරි විස්තරයක් ඉදිරිපත් කරන්න එතුමාට බැරි වුණේ කියලා. ඒ නිසා කලට වේලාවට විස්තර සපයලා ඒ ධීවරයන්ගේ ජීවිත බේරා ගන්න බැරි වුණා කියලා කිව්වා. නමුත් ඇත්තටම මා මුලින් කිව්වා වාගේ, මේ රජයේ වියදම් හා ආයෝජන ප්‍රමුඛත්වය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක් තිබෙනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු සභාපතිතුමනි, මම කථාව අවසන් කරන්නම් ඉක්මනින්.

විද්‍යාව ගත්තොත්, පර්යේෂණ ගත්තොත්, ආපදාවන් ගත්තොත්; මේ වාගේ scientific and technological ආයෝජන ගත්තොත් මේ රජය ඒවාට බොහොම අඩුවෙන්මයි වියදම් කරන්නේ. මේ රටේ පුරවැසියාගේ ජීවන තත්ත්වය ඉහළ යන්න නම් අපට මෙය සංකීර්ණ ආර්ථිකයක් කරන්න වෙනවාමයි. මොකද, ඒ සංකීර්ණ ආර්ථිකය තුළින් තමයි ඉහළ මට්ටමේ පඩි, ආදායම් ලබාගන්න පුළුවන් වන්නේ. නමුත් ඒක කරන්න නම් අපට ඒ සඳහා ආයෝජනය කරන්න වෙනවා. ගරු සභාපතිතුමනි, මේ රටේ අපට තිබෙන වැදගත්ම සම්පත මානව සම්පතයි. අපි ඒ මානව සම්පත විද්‍යාත්මක හා technological පැත්තට ගෙන යන්න ඕනෑ. මේ ගරු සභාවේදී සඳහන් කළා 2003 වර්ෂයේ දී රුපියල් ට්‍රිලියන 1.86ක තිබුණු ණය රුපියල් ට්‍රිලියන 6.86ක් විතර වෙලා තිබෙනවා කියලා. ඒ කියන්නේ අවුරුදු 55ක ගත්තු ණය ප්‍රමාණය මේ අවුරුදු 9 තුළ දෙගුණයක් වෙලා තිබෙනවා කියන එකයි. ඒ ණය බර දෙගුණයක් වෙලා තිබෙනවා. මම රජයෙන් නැවත ඉල්ලනවා, අඩුවෙන් ආයෝජනය කරන අමාත්‍යාංශවලට ප්‍රමාණවත්ව ආයෝජනය කරන්න; විශේෂයෙන්ම විද්‍යාත්මක අංශවලට ආයෝජනය කරන්න කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

[පූ.භා. 11.33]

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)
ගරු සභාපතිතුමනි, 2014 අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයට භාජනය කරන අමාත්‍යාංශ සමූහයක් මධ්‍යයේ වචනයක් දෙකක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මේ වැය ශීර්ෂ හැම එකක් පිළිබඳවම අදහස් දක්වන්න, මට ලැබී තිබෙන කාලය අනුව කොහොමවත්ම පුළුවන්කමක් නැහැ. ඒ නිසා මම විශේෂයෙන් අවධානය යොමු කරනවා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයන්ට අදාළ වන විධියේ වචන කීපයක් ප්‍රකාශ කරන්න.

ගරු සභාපතිතුමනි, මෙයට ප්‍රාරම්භයක් වශයෙන් මම යම් උපුටා දැක්වීමක් කරනවා. අතීතයේ ඉන්දියාවේ සිටියා බොහොම ශ්‍රේෂ්ඨ අර්ථ ශාස්ත්‍රඥයෙක්. ඒ අර්ථ ශාස්ත්‍රඥයා කෞටිල්‍ය කියලායි අප සඳහන් කරන්නේ. ඔහු අතිශය වැදගත් ලෝක ප්‍රකට අර්ථ ශාස්ත්‍ර ග්‍රන්ථයක් සංස්කෘත භාෂාවෙන් ලියා තිබෙනවා. ඒ ග්‍රන්ථයේ ඔහු සඳහන් කරන එක ප්‍රකාශයක් මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න මම කැමැතියි. මෙය තිබෙන්නේ සංස්කෘත භාෂාවෙන්. එය මෙසේයි:

"ප්‍රජා සුඛේ සුඛං රාඥඃ - ප්‍රජානාංච හිතේ හිතම්
නාත්මප්‍රියං හිතං රාඥඃ - ප්‍රජානාං තු ප්‍රියං හිතම්"

[ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි]

එහි තේරුම, 'ප්‍රජාවගේ සැපය රජුගේ සැපයයි. ප්‍රජාවගේ ශුභසිද්ධිය රජුගේ ශුභසිද්ධියයි. තමාට ප්‍රිය වන දේ රජුට හිත පිණිස නොවෙයි. ප්‍රජාවට ප්‍රිය වන දේ රජුට හිත වෙයි.' කියන එකයි. මේ විධියට කෞටිල්‍ය කියන අර්ථ ශාස්ත්‍රඥයා කියා තිබෙනවා. කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රඥයාගේ අතිශය වැදගත් වන ප්‍රකාශය දිහා බලන කොට, ඒ කරුණු අනුව මේ අය වැය සසඳා බලන විට එහි අර්ථය මේ අය වැය තුළ ගැබ් වෙලා තිබෙනවා කියලා මට පෙනෙනවා. ප්‍රජාවට හිත පිණිස පවතින ගොවි විශ්‍රාම වැටුප ඉදිරිපත් කිරීම, රාජ්‍ය සේවක දීමනා වැඩි කිරීම, විශ්‍රාම වැටුපට දීමනා එක් කිරීම, අධ්‍යාපනයේ ශුභසිද්ධිය, ශිෂ්‍යාධාර ආදි බොහෝ යෝජනා මෙහි ඇතුළත් කරලා තිබෙනවා. ඒ නිසා සමස්තයක් වශයෙන් ගන්න කොට කෞටිල්‍යාගේ අර්ථශාස්ත්‍රය අර්ථවත් කරන්නක් හැටියට මේ අය වැය මට පෙනෙනවා.

මෙහිදී මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ එයින් ජාතික උරුමය පිළිබඳව වැදගත් වන කරුණක්, දෙකක් ගැනයි. ජාතික උරුමය කියන්නේ ලෝකයේ ඕනෑම රටක ජාතියකට හිමි වන්නා වූ නිර්මාණාත්මක සහ ස්වාභාවිකව ඇති වෙලා තිබෙන යම් යම් විශේෂ දේවල්. අපි සාකච්ඡා කරන විට එයින් ප්‍රධාන වශයෙන්ම පුරා විද්‍යාත්මක දේ ජාතික උරුමයේ ප්‍රධාන සංකේත හැටියට සැලකෙනවා. එය එක ආගමකට හෝ එක ජාතියකට හෝ පමණක් උරුම වූ කරුණක් නොවෙයි. සමස්තයක් වශයෙන් ගත්තාම යම් රටක ජීවත් වන විවිධ ආගම් අදහන, විවිධ ජන වර්ගවල ඒ සිටින සියලු දෙනාටම පොදු වස්තු තමයි ජාතික උරුම කියලා කියන්නේ. නිදර්ශනයක් වශයෙන් ගත්තොත් අපේ රටේ වැඩි වශයෙන් බෞද්ධ පුරා විද්‍යාත්මක ස්ථාන තිබෙනවා; හින්දු පුරා විද්‍යාත්මක ස්ථාන තිබෙනවා. ඒ වාගේම ආගම් වශයෙන් සලකන විට ක්‍රිස්තියානි, මුස්ලිම් ආදී වශයෙන් ඒ ඒ ආගම්වලට ආවේණික වූ පුරා විද්‍යාත්මක ස්ථාන තිබෙනවා. මේවා සමස්ත ජාතියේම -මේ රටේ වාසය කරන හැම දෙනාගේම- පොදු උරුමයන්. යම් ආගමිකයෙක් විසින් හෝ වේවා යම් ජාතියක් විසින් හෝ වේවා ඒවා විනාශ කරනවා නම්, ඒවා නැති කරනවා නම් ඒක සම්පූර්ණ වරදක්. පොළොන්නරු රාජධානිය -රජරට- යටත් කර ගෙන කාලයක් සොළීන් පාලනය කළා. පළමුවැනි විජයබාහු රජතුමා ඒ සොළීන්ගේ පාලනයෙන් රට නිදහස් කර ගත්තා. සොළීන්ගේ පාලන කාලයේ දී පොළොන්නරුවේ වටදා ගේ, හැටදා ගේ, ලංකාතිලක වැනි ස්ථාන ආශ්‍රිතවම -ඒ පරිශ්‍රයේම- ඔවුන්ගේ ආගමේ සංකේත ස්ථාන ශිව දේවාල , ශිව කෝවිල් හැදුවා. සොළීන්ගෙන් මේ රට නිදහස් කර ගත්තාට අපේ සිංහල බෞද්ධයෝ කවදාවත් ඒ කෝවිලක් කඩන්න, විනාශ කරන්න ගියේ නැහැ. අදත් පොළොන්නරුවට ගිහින් බැලුවාම ඒ ශිව දේවාල සුරක්ෂිතව ආරක්ෂා කරලා තිබෙනවා. අදත් ජාති වශයෙන් හෝ ආගමික වශයෙන් හෝ කිසිම භේදයක් නැතිව ජනතාව ගිහින් ඒවා බලනවා. ඒ නිසා මේවා කාටත් පොදු දේවල්.

ගරු සභාපතිතුමනි, ඊයේ පෙරේදා ඉතාම වැදගත්, වාසනාවන්ත ගවේෂණ ගණනාවක් ඉන්දියාවේ දී සිදු වුණා. මේ ස්ථානවල තිබෙන ඓතිහාසික තත්ත්වය පාදලා, මතු කරලා ගන්නවා. කණිංහැම් කියන පුරාවිද්‍යාඥයා විසින් නේපාල රාජ්‍යයට අයිති ලුම්බිනියේ විශේෂ කැණීම් වගයක් සිදු කළා. අපේ ලංකාවේ ආගමික ඉතිහාස පොත පතේ තිබෙනවා, බෝධිසත්වයන් වහන්සේ ලුම්බිනියේ සල් ගසක් මුලදී මායා දේවියගේ කුසින් බිහි වුණාය කියලා. ඒ ස්ථානය කැණලා පරීක්ෂා කරලා බලන කොට මතු වුණා, සල් ගසක් වටා සකස් කර තිබුණු ඒ සූතිකාගාරය. එදා තාවකාලිකව වට තිර ඇදලා සකස් කළ තැන පසු කාලයකදී ගොඩ නඟන ලද ඒ සූතිකාගාරයේ නෂ්ටාවශේෂ, ඒ දැව කොටස් ආදිය සම්පූර්ණයෙන්ම මතු වෙලා ආවා. මේ සොයා ගැනීම නිසා ලෝක ඉතිහාසයේම අතිශය වැදගත් ඓතිහාසික ප්‍රවෘත්ති සමූහයක් පුරා විද්‍යාත්මක කරුණු වශයෙන් තහවුරු වුණා. බුදුරජාණන් වහන්සේගේ උපත සිදු වූ කාලය පිළිබඳව සමහර අය මතයක් දැරුවා, ක්‍රිස්තු පූර්ව 4වන සියවසේ දී කියලා. සමහරු කිව්වා, 5වන සියවසේදී කියලා. නමුත් අපේ පොත පතේ සඳහන් වන්නේ ක්‍රිස්තු පූර්ව 6වන සියවසේදී කියලායි. මේ පුරා විද්‍යාත්මක කැණීම්වලින් පැහැදිලිවම තහවුරු වුණා, බුදුරාජාණන් වහන්සේගේ -බෝධිසත්වයන්ගේ- උත්පත්තිය සිද්ධ වෙලා තිබෙන්නේ ක්‍රිස්තු පූර්ව 6වන සියවසේදීය කියලා. මේ නිසා ජාතියක් සතු ආවේණිකව එන අතිශය වැදගත් වන්නා වූ දායාදයන්හි ඓතිහාසික සත්‍යතාව මේ වාගේ පුරා විද්‍යාත්මක ජාතික උරුම සුරක්ෂිත කරලා තබා ගැනීමෙන් අපට තේරුම් ගන්න පුළුවන්කම ලැබෙනවා. ඔය වාගේ අපේ ලෝක ඉතිහාසය පිළිබඳව, අපේ රටේ ඉතිහාසය පිළිබඳව වැරදි විවරණ කරපු අවස්ථා තිබෙනවා. මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කරලා මේ රටේ බුද්ධ ශාසනය පිහිටෙව්වාය කියන ප්‍රවෘත්තිය අපේ සියලුම ලේඛනවල සඳහන් වනවා. ඒක ප්‍රසිද්ධ කාරණයක්. නමුත් චුල්ලවග්ග පාලිය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරපු ඕල්ඩන්බර්ග් කියන පඬිවරයා මේකට ප්‍රස්තාවනාවක් සපයමින් කිව්වා, "ලංකාවට බුදු දහම ලැබුණේ ඉන්දියාව හරහා පැමිණි වෙළෙන්දන් මඟින්"ය කියලා. මේ කථාව යුරෝපයේ රටවලත් පිළිගැනීමට ලක් වුණා. මේක ලෝකයේ නොයෙක් රටවලට ගියා. එතකොට අපේ පොත පතේ තිබෙන කරුණුවලට වඩා මේ අදහසට තැනක් ලැබුණා. නමුත් කනිංහැම් වැනි උදවිය පසුව කර ගෙන ගිය පරීක්ෂණ වාගේම, අපේ රටේදීත් කරපු පුරාවිද්‍යාත්මක ගවේෂණවලින් මේ ඕල්ඩන්බර්ග්ගේ මතය ප්‍රතික්ෂේප කරලා නියම සත්‍ය ලෝකයට දෙන්න පුළුවන්කම ලැබුණා. අම්පාරේ, රජගල කියන ස්ථානයේ පුරාවිද්‍යා ගවේෂණයකින් මිහිඳු හාමුදුරුවෝ වැඩම කිරීම සහ උන්වහන්සේ සමඟ වැඩි අනෙකුත් ස්වාමීන් වහන්සේලාගේ නම් සමඟ සඳහන් වන ඒ තොරතුරු ටික එකතු කරලා ගත්තාම මේ ප්‍රකට ශාස්ත්‍රඥයාගේ මතය ප්‍රතික්ෂේප කරන්න අපට පුළුවන්කම ලැබුණා.

අපේ රටට සීමා කරලා ගත්තොත් අපේ ජාතික උරුම වශයෙන් මේ දිවයින පුරා විවිධ යුගවලට අයිති වන පුරාවිද්‍යාත්මක ස්ථාන ලක්ෂ ගණනක් තිබෙනවා. මේවා සුරක්ෂිත කර ගැනීම පිළිබඳව අපි දැඩි අවධානයක් යොමු කළ යුතු කාල පරිච්ඡේදයක් දැන් ඇති වෙලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. ඊට හේතුව, වස්තු හොයා ගෙන යන ඉතාමත්ම ම්ලේච්ඡ ක්‍රියාවලීන්හි යෙදෙන ධන වැද්දන් විසින් අපේ මේ ජාතික උරුම සම්පූර්ණයෙන්ම විනාශ කිරීමේ වැඩ පිළිවෙළක් දැන් ක්‍රියාත්මක කර ගෙන යෑමයි. ඒවාට අහු වුණු පුරාවිද්‍යාත්මක ස්ථානවල තිබෙන වටිනා හැම දේම මුදලෙන් තක්සේරු කරනවා මිසක්, ඒකේ තිබෙන ජාතික උරුමය, ජාතික දායාදයක් වශයෙන් ඒකේ තිබෙන වටිනාකම පිළිබඳව කිසිදු සැලකිල්ලක් ඔවුන් දක්වන්නේ නැහැ.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ඔබ වහන්සේගේ කාලය අවසන්. දැන් විනාඩියකුත් වැඩිපුර අරගෙන තිබෙනවා.

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

මට තව හුභාක් දේ කියන්න තිබෙනවා. සුගලා රැජිනගේ මම්මිය හම්බ වුණාය කියන මිථ්‍යා කථාව ඇත්ත වශයෙන්ම සත්‍ය සිද්ධියක් නොවෙයි. සුගලා දේවියගේ මම්මිය කියලා එකක් ලංකාවේ සංස්කෘතියට කවදාවත් එකතු වුණු දෙයක් නොවෙයි.

නමුත් ඒ ස්ථානය පුරාවිද්‍යාත්මක ස්ථානයක්. එතැන පුරාවස්තු තිබුණා. නමුත් සම්පූර්ණයෙන්ම ඒක විනාශ කළා. හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේදී ගරු ගාමිණී දිසානායක ඇමතිතුමා මහවැලි ප්‍රදේශ භාරව කටයුතු කරද්දී ඒ ප්‍රදේශවල පුරාවිද්‍යා ගවේෂණ කාර්යය කළේ මම. ඒ කාලයේ දී ඇමතිතුමාගේ ඉල්ලීමකට අනුව ස්වේච්ඡාවෙන් මා ඒ කටයුතු කළා. ඒ කාල පරාසය තුළ අපි ඔය ප්‍රදේශවල ඇවිදලා බලපු අවස්ථාවලදී ඒ තැන්වල තිබුණු පුරාවස්තූන් අපට දැක ගන්නට ලැබුණා. ඒ පුරාවස්තූන් අපි පරීක්ෂා කර බැලුවා; ඒවායේ යම් වටිනාකමක් තිබුණා. නමුත් මේ ධන වැද්දන් විසින් ඒවා විනාශ කරලා තිබෙන ආකාරය ඉතාම කනගාටුදායකයි.

ගරු සභාපතිතුමනි, මේවා එකතු කර ගන්න, මේවා ආරක්ෂා කර ගන්න ඉන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශක්තිමත් කරන්න ඕනෑය කියන එක මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම මතක් කරනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරි සංඛ්‍යාව මේ කාර්යය කරන්න ප්‍රමාණවත් මදි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරාවස්තු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ හිඟයක් තිබෙනවා. මෙන්න මේ අඩු පාඩු ටික සකස් කරලා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශක්තිමත් කරලා මේ ජාතික උරුම ආරක්ෂා කර ගන්න කටයුතු කළොත් ඒක අපේ ආර්ථිකය ශක්තිමත් කර ගන්නත් මාර්ගයක් වන බව ප්‍රකාශ කරමින් මගේ කාලය අවසන් නිසා මා මගේ කථාව අවසන් කරනවා. ඔබතුමාට ස්තුතියි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
බොහොම ස්තුතියි. ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
මට කොපමණ වෙලාවක් තිබෙනවා ද, ගරු සභාපතිතුමනි?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමාට විනාඩි 13ක් තිබෙනවා.

[පූ.භා. 11.46]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පළමුවෙන්ම ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා පළ කරපු අදහසකට මගේ ප්‍රතිචාරය දක්වන්න ඕනෑ. පාර්ලිමේන්තුවට තේරී පත් වෙන්න සුදුසුකම් තිබෙන්න ඕනෑය කියන මතය සනාථ වෙන පැත්තට බරව එතුමා කථා කළා. ඒක ඉතිහාසයේ පරණ කථාවක්. අධ්‍යාපන සුදුසුකම් අනුව, දේපළ සුදුසුකම් අනුව ඡන්දය ඉල්ලීමේ අයිතිය පැවැති කාලයක් තිබුණා. අපි ඒ කාලය ඉක්මවා ආවා. අද ලෝකයේ තිබෙන කිසිම ප්‍රජාතන්ත්‍රවාදයක එහෙම නැහැ. Any voter has the right to be a candidate. ඒක මේ ප්‍රජාතන්ත්‍රවාදයේ සර්ව ව්‍යාප්තිය. ඒක ආපිට හරවන්න ඒ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව නම් ප්‍රතිගාමී අදහසක්ය කියන එක මම මතක් කරන්න ඕනෑ. සමා වෙන්න. මම එතුමාගෙන් ඒකට පිළිතුරක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි පසුව වෙලාවක ඒ ගැන කථා කරමු. විශ්‍රාම යන ප්‍රශ්නය ගැනත් මට කියන්න තිබෙන්නේ ඒ ටිකමයි. ඡන්දය දෙන්න විශ්‍රාම කාලයක් නැත්නම් ඡන්දය ඉල්ලන්නත් විශ්‍රාම කාලයක් ඕනෑ නැහැ. එහෙමයි ඒක තිබෙන්න ඕනෑ. හැබැයි අර මානසික තත්ත්වය පිළිබඳ කාරණය ගැන නම් අපේ ව්‍යවස්ථාවේ වගන්තියක් තිබෙනවා. යම් අයෙකු මානසික වශයෙන් ශක්තිමත් නොවේ නම් ඔහුට අපේක්ෂකයෙක් වෙන්නත් බැහැ. ඒක ව්‍යවස්ථාවේ තිබෙනවා. ඒ ගැන කථාව එතැනින් නවත්වා මගේ අමාත්‍යාංශය ගැන කථා කරනවා.

අපේ අමාත්‍යාංශයට පැවරී තිබෙන්නේ රජයේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නයි. ඒක තමයි ජාතික භාෂා ප්‍රතිපත්තිය.

මට තව කොච්චර වෙලාවක් තිබෙනවාද, ගරු සභාපතිතුමනි?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
දැන් නම් විනාඩි 12ක් විතර ඇති.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා වාගේම සමාජ ඒකාබද්ධතාව ඇති කිරීමේ වග කීමත් අපේ අමාත්‍යාංශයට පැවරී තිබෙනවා. සමාජයේ තිබෙන අහිතකර පරතරයන් පියවීමත්, ජනවාර්ගීය සුහදතාව ගොඩ නැඟීමත් තමයි අපේ කාර්ය භාරයන් වෙලා තිබෙන්නේ. රජයේ සේවකයන්ට ද්වි භාෂා පුරුදු කරන්නේ නැතිව අපට පුළුවන්කමක් නැහැ, ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න. රජයේ සේවකයන් ද්වි භාෂාවෙන් කටයුතු කිරීමට පුහුණු කිරීම සඳහා අප ගෙන යන වැඩ පිළිවෙළ තුළින් අපට පුළුවන් වෙලා තිබෙනවා, 2013 වර්ෂයේ දී රාජ්‍ය සේවකයන් 35,000කට පමණ ඒ පුහුණුව දෙන්න. ද්වි භාෂාව පුහුණු කරනවා කියන්නේ සිංහල අයට දෙමළ භාෂාවත්, දෙමළ අයට සිංහල භාෂාවත් පුහුණු කිරීමයි. ඒ රාජ්‍ය සේවකයන් 35,000 පුහුණු කිරීම සඳහා අපි විවිධ ක්‍රමවේදයන් යොදා ගෙන තිබෙනවා. ඒක සාර්ථක කටයුත්තක්.

ඊළඟට, රජය මඟින් ප්‍රදර්ශනය කරන සියලු දැන්වීම් පුවරු, සන්නිවේදන, ඒ වාගේම මහ ජනතාව අතර බෙදා හරින රජයේ සියලුම පෝරම, උපදෙස් පත්‍රිකා ආදිය භාෂා දෙකෙන්ම තිබෙන්න ඕනෑ. ඒක ඒ පෝරමය ලබන්නේ කවුද කියන එක අනුව කරන්න පුළුවන් දෙයක් නොවෙයි. අනික් එක තමයි, භාෂා දෙකෙන් පෝරම දෙකක් තිබෙන එකත් හොඳ නැහැ. එතකොට දෙමළ භාෂාව දන්නා කෙනෙක් ආවාම, දෙමළ පෝරමය දෙන්න ඕනෑ. සිංහල භාෂාව දන්නා කෙනෙක් ආවාම සිංහල පෝරමය දෙන්න ඕනෑ. ඒක කරන්න ගිහින් ඇති වෙන පටලැවිල්ල ඊට වඩා වැඩියි. ඒ නිසා භාෂා දෙක තුනෙන්ම මේවා තිබෙන්න ඕනෑ. දැන් ඒක රජයේ ප්‍රතිපත්තිය වෙලා තිබෙනවා. ඒක අපි පෙර ඉඳලා කර ගෙන ආපු එකක්. දැන් ඒක ආපහු කරගෙන යන්න අපේ අමාත්‍යාංශය මැදිහත් වෙමින් ඉන්නවා. භාෂා තුනෙන්ම ඒවා මුද්‍රණය කරන්න හා සපයන්න අපි සූදානම් වෙලා ඉන්නවා.

ඊළඟට, මේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික පැත්තකුත් තිබෙනවා. එක කාරණයක් තමයි සිංහල කථා කරන ජනතාව විශාල වශයෙන් ඉන්න ප්‍රදේශවල දෙමළ භාෂාවෙනුත් වැඩ කරන්න ඕනෑය කිය කියා ආකාරගතව නිකම්ම එතැනට නීති පනවන එකේ තේරුමක් නැහැ. එතැන ඉන්නේ සම්පූර්ණයෙන්ම සිංහලෙන් වැඩ කරන ජනතාවක්. ඒ වාගේම සම්පූර්ණයෙන්ම දෙමළ ජනතාවක් සිටින ප්‍රදේශයකට ගිහින්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

සිංහලෙන් වැඩ කරන්න ඕනෑය කිය කියා එතැන අපේ කාලය නාස්ති කරන එකේයි, මුදල් නාස්ති කරන එකේයි තේරුමක් නැහැ. මේ කාරණයේදී ඉතා වැදගත් වන්නේ මේ ප්‍රදේශ මොනවාද කියා භූගෝලීය වශයෙන් හරියාකාරව හඳුනා ගැනීමයි. විශේෂයෙන් කොළඹ වාගේ නාගරික ප්‍රදේශවල ත්‍රෛභාෂාව අත්‍යවශ්‍යයි. ඒ වාගේම අපේ රටේ ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 72ක් තිබෙනවා. එයින් 60ක් විතර දැනට ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒ ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයිති හැම රාජ්‍ය ආයතනයකම පරිපාලන කටයුතු භාෂා දෙකෙන්ම කරන්න ඕනෑ. දෙමළ භාෂාව කථා කරන ප්‍රදේශවල පරිපාලන භාෂාව දෙමළ. ඒ තමයි උතුරු හා නැඟෙනහිර. අනෙකුත් සියලුම පළාත්වල පරිපාලන භාෂාව සිංහල. එතකොට ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල භාෂා දෙකින්ම පරිපාලන කටයුතු කරන්නට ඕනෑ. එහෙමයි දැනට නියමිත වෙලා තිබෙන්නේ. දැන් මේකේදී භාෂා දෙකම දන්නා රාජ්‍ය සේවකයෝ අවශ්‍යයි. බොහොම අමාරුවෙන් භාෂාව උගන්වලා ඉවර වුණාට පස්සේ, අපේ රාජ්‍ය සේවකයෝ ගිහින් මේසය ළඟ වාඩි වුණාම අර ඉගෙන ගත් ඒවා පැත්තකින් තියලා පුරුදු විධියට වැඩ කරන්න පටන් ගන්නවා. එම නිසා අප දැන් හැම රාජ්‍ය ආයතනයකටම අත් පොතක් දී තිබෙනවා, රාජ්‍ය භාෂා භාවිතය හසුරුවන්නේ මෙන්න මෙහෙමයි, ක්‍රියාත්මක කරන්නේ මෙන්න මෙහෙමයි කියා. දැන් ඒ මඟින් අප කරන්න හදන්නේ ඒ ප්‍රදේශයේ තිබෙන හැම ආයතනයකටම අවශ්‍යතාව පරිදි ඒ භාෂා දෙකේම දැනුම නැවත අලුත් කර ගැනීමට යම් ආකාරයකට අභ්‍යන්තරිකව සම්මන්ත්‍රණ පැවැත්වීමයි.

ඊළඟට, අප ඇමතුම් මධ්‍යස්ථානයක් ආරම්භ කළා. ඒ කියන්නේ කවුරු හෝ භාෂා ගැටලුවකට මුහුණ දුන්නා නම්, ඒ අවස්ථාවේ නොමිලයේම 1956 අංකය අමතන්න පුළුවන්. 1956 අංකය ඇමතුවාම අපේ අමාත්‍යාංශයේ ඇමතුම් මධ්‍යස්ථානයටයි යන්නේ. එතැනට කියන්න පුළුවන්, "මා මෙතැනට ආවා; මගේ භාෂාවෙන් කටයුතු කරන කවුරුවත් මෙතැන නැහැ; මේක අසවල් රාජ්‍ය ආයතනය; එම නිසා මට උදවු වෙන්න" කියා. එතකොට ඔහුගේ නොම්මරය අරගෙන අපේ ඇමතුම් මධස්ථානය වහාම එම ආයතනයේ ප්‍රධානියාට කථා කරලා එම කටයුත්ත සපුරාලන්න පුළුවන් විධියට මැදිහත් වීමක් කරනවා. ඊළඟට නැවතත් අර පුද්ගලයාගෙන් අහනවා, තමන්ගේ කාරණය ඉෂ්ට වුණා ද කියා. මේ ඇමතුම් මධ්‍යස්ථානය අප ආරම්භ කළේ ගිය අවුරුද්දේ. 2013 අවුරුද්දේ තමයි ඒක ප්‍රමාණවත් ලෙස කාර්යක්ෂම තත්ත්වයකට ගෙන එන්නට පුළුවන්කම ලැබුණේ.

පරිවර්තකයන් පුහුණු කිරීමත්, ගුරුවරුන් පුහුණු කිරීමත් ඒ වාගේම වැඩක්. කොහොමද උගන්වන්නේ ගුරුවරු නැතිව? ඒ නිසා නිරන්තරයෙන් ගුරුවරුන් පුහුණු කරන්නත් ඕනෑ. ඒ වාගේම මේ රටේ රජයේ හැම ආයතනයකම පරිවර්තන පහසුකම් තිබෙන්නට ඕනෑ. අප නමක් දුටු හැටියේම දන්නවා, මේක දමිළ කෙනෙකුගේ නමක්, මේක මුස්ලිම් කෙනෙකුගේ නමක් කියා. ඔහු මොන භාෂාව දන්නවා ද කියා හිතන්නේ නැතිව, සිංහල භාෂාවෙන් යවන ලියුම දෙමළ භාෂාවටත් පරිවර්තනය කර යවන්න ඕනෑ. එතකොට තමයි කෙනෙකුට ඒකෙන් සෑහීමකට පත් වන්නට පුළුවන් වන්නේ. අපේ ගරු යෝගරාජන් මන්ත්‍රීතුමාට මෝටර් රථ කොමසාරිස් -RMV එකෙන්- සිංහල භාෂාවෙන් ලියුමක් එවනවා නම්, ඒක පිහියෙන් අනිනවා වාගේ වැඩක්. ඒ කියන්නේ සිංහල නොදන්නා කෙනෙකුට සිංහලෙන් පමණක් ලියුමක් එව්වොත් ඒ වාගෙයි. දෙමළ නොදන්නා කෙනෙකුට දෙමළ භාෂාවෙන් පමණක් ලියුමක් එව්වත් ඒ වාගෙයි. ඒ වාගේ පැමිණිලි මට ගලා ගෙන එනවා. ඒවා භාෂා කොමසාරිස්තුමාට යවා, පැමිණිලි හැටියට විභාග කර, ඒ ගොල්ලන් ඒවා නිවැරදි කර ගන්නට බලනවා. අමාත්‍යාංශයේ ඇමතිතුමාගේ ඉඳලා ලේකම්තුමා ඇතුළු හුඟක් අයට වෙලා තිබෙන්නේ, it does not occur to them. මේක සිංහල භාෂාවෙන් කියනවා නම්, "අනේ මෙහෙමත් කරන්න ඕනෑ නේද?" කියා මේක ඒ ගොල්ලන්ට මතක් වෙන්නේ නැහැ. විශේෂයෙන්ම අපේ රටේ තිබෙන හොඳකම තමයි, දෙමළ කෙනෙකුගේ නමක් දැක්ක හැටියේ බොහෝ දුරට ඒ නමින් ඔහු දෙමළ කෙනකු බව හඳුනා ගන්නට පුළුවන් වීම. නම දැකපු ගමන් ඔහු දෙමළ භාෂාව මව් භාෂාව කර ගත් කෙනෙක් ද නැද්ද කියා හඳුනා ගන්නට පුළුවන්. ඔහු හෝ ඇය සිංහල භාෂාව දන්නවා ද නැද්ද කියන එක වෙනම දෙයක්. නමුත් නමින්ම ඔහු දෙමළ භාෂාව මව් භාෂාව කර ගත් අයකු බව පේනවා නම් වහාම ඒ යවන ලියවිල්ලට දෙමළ පරිවර්තනයක් අමුණා යවන්න තරම් අප සාධාරණ වන්නට ඕනෑ. එතකොට අර අයට ලොකු තෘප්තියක් ලැබෙනවා.

යමෙක් තමන්ට පිට රටකදී හෝ වෙනත් තැනකදී හෝ තමන්ගේ භාෂාවෙන්ම ඇමතුවොත් කොතරම් සතුටට පත් වෙනවා ද? ඔවුනොවුන් කොයි තරම් ආදරයකින් බැඳෙනවා ද? විශේෂයෙන් තමන්ගේ නොවන කෙනෙක් තමන්ගේ භාෂාවෙන් ඇමතුවාම කොතරම් සතුටක් දැනෙනවා ද? මේවා ආශ්වාදජනක දේවල්. මේ ආශ්වාදජනක හැඟීම මේ රට තුළ ඇති කිරීම තුළින් තමයි ජනවාර්ගික සංහිඳියාව ඇති වන්නේ. එම නිසා තමයි අප නිතරම මේ භාෂා භාවිතය නියමානුකූල කර ගන්නට උත්සාහ කරන්නේ. මා දන්නවා, අපට සතුටු වෙන්නට පුළුවන් තරමට මේ කාරණාව තවමත් සඵල වෙලා නැහැ කියා. අප ඉන්නේ තවමත් කන්ද පාමුල. අපට තරණය කරන්න මහා කන්දකුයි තිබෙන්නේ.

මේ රටේ රාජ්‍ය ආයතන එක් දහස් ගණනක් තිබෙනවා. මේ හැම රාජ්‍ය ආයතනයක්ම මේ විධියට ක්‍රියාත්මක කරවන්නට වුවමනා කරන්නා වූ වෙහෙස මහන්සිය විශාලයි. නිලධාරින්ට අවශ්‍ය වන පුහුණුව විශාලයි. ඒවා හැම එකක්ම අප සොයා බලන්න ඕනෑ. අප විගණනය කරනවා. රාජ්‍ය ආයතනයෙන් ආයතනය අප විගණනය කරනවා. කොළඹ නගර සභාව විගණනය කළා, ත්‍රෛභාෂාව තිබෙනවා ද කියා බලන්න. එතැන දෙපාර්තමේන්තුම හැත්තෑ ගණනක් තිබෙනවා. මේවා ඔක්කොම විගණනය කර ගෙන යන්නට වුවමනා කරන පුහුණු නිලධාරින් සංඛ්‍යාව අපට නැහැ. අපේ රාජ්‍ය භාෂා කොමිසමේ ආයතන එදා හැදිලා තිබුණේ එක්තරා සීමිත කාර්යයන් ඉටු කිරීම වෙනුවෙනුයි. දැන් මේවායේ ධාරිතාව වැඩි කරන්නට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා රාජ්‍ය භාෂා කොමිසමේ මේ විගණන ක්‍රියාවලිය අපි වේගවත් කරන්න ඕනෑ.

ඉදිරි කාලයේ දී LLRC වාර්තාවත් අනුව පළාත්බදව අපේ අමාත්‍යාංශයේ කාර්යාලයක් ස්ථාපනය කරන්න අපි බලාපොරොත්තු වනවා. එතකොට ඒ කාර්යාලයේ රාජ්‍ය භාෂා කොමිසමත් තිබෙනවා; අපේ සමාජ ඒකාබද්ධතා අංශයත් තිබෙනවා; භාෂා අංශයත් තිබෙනවා; භාෂා සංගම් පුහුණු කිරීමත් තිබෙනවා. මේ ඔක්කෝම තිබෙනවා. එතකොට පළාත පදනම් කරගෙන මේ කටයුත්ත ක්‍රියාත්මක වනවා ද කියා බලන්න පුළුවන්. එතකොට මේ කටයුත්ත වඩාත් හොඳින්, වඩාත් ඉක්මනින් කෙරෙනවා. ඒ සඳහා අපි පළමුවෙන්ම අපේ අමාත්‍යාංශයේ පළාත් කාර්යාලයක් කිලිනොච්චියේත්, සබරගමුවේ රත්නපුරයේ තව කාර්යාලයකුත් ඇති කරන්න කටයුතු කරගෙන යමින් තිබෙනවා. 2014 වර්ෂයේ ඒ කටයුත්ත කරන්න පුළුවන් වේවි කියලා මා බලාපොරොත්තු වනවා.

දැන් මේ කටයුතු කරගෙන යනකොට අපි ඉගැන්වීමේ ක්‍රමවේද පවා නැවත නැවත අත් හදා බලන්න ඕනෑ; පර්යේෂණ කරන්න ඕනෑ. ඒ අනුව දැන් අපට ජාතික භාෂා අධ්‍යාපනය සහ පුහුණු ආයතනය - National Institute of Language Education and Training - තිබෙනවා. දැන් මේ මඟින් කරපු අත් හදා බැලීම්, පර්යේෂණ හරහා අපි එක්තරා තැනකට එළැඹිලා තිබෙනවා. දින 10 නේවාසික පුහුණු පාඨමාලා අපි හඳුන්වා දී තිබෙනවා. දින 10ක්ම නේවාසිකව ඉන්න ඕනෑ. සීමාවාසික

පත්වීම් ලබන්න හිටපු වෛද්‍ය නිලධාරින් 600ක් මේ නේවාසික දින 10 පාඨමාලාව හදාරා ගියා. සිංහල අය දෙමළ භාෂාව ඉගෙන ගත්තා. දෙමළ අය සිංහල භාෂාව ඉගෙන ගත්තා. ඒ අය තමන්ට උවමනා කරන භාෂා දැනුම අපූරුවට ලබා ගෙනයි දින 10 ඉක්මවලා ගියේ. ඇත්තටම දැන් අපේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලාටත් අපි දෙමළ භාෂාව පුහුණු කරමින් තිබෙනවා. මමත් ඒ දින 10 නේවාසික පාඨමාලාවට යන්න බලාපොරොත්තු වනවා. ජනවාරි මාසය තුළ දින 10ක් ගත කරලා, මේ භාෂාව පුහුණු වෙලා එන්න මම බලාපොරොත්තු වනවා. මේ හැමෝටම භාෂාව පුහුණු කිරීමේදී ඒ අයට උවමනා කරන ආකාරයටයි භාෂාව පුහුණු කරන්නේ.

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මේ භාෂා දැනුම ලබා දෙනවා නම් කථානායක ධුරයේ කටයුතුවලට අදාළව ඒ ඇසුරින් තමයි භාෂාවේ වචන ටික හඳුන්වා දෙන්නේ. මෙන්න මේ වාගේ ක්‍රමවේද අප ආරම්භ කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම භාෂා සංගම් තිබෙනවා. මේවා ආරම්භ කළේ 2012 වර්ෂයේයි. කැමැති අයට සංගම් හැටියට එකතු වෙලා මේ සඳහා ඉදිරිපත් වෙන්න කියලා අපි දැන්වීමක් දැම්මා. 15කට වැඩි පිරිසක් එකතු වුණොත් ඒ අයට අපෙන් උපදේශකවරු ඉල්ලන්න පුළුවන්. අපි උපදේශකවරු නොමිලේ ලබා දෙනවා. අපට පළාත්බදව විසිරිලා එක්දහසකට වැඩි උපදේශකවරු ඉන්නවා. අර භාෂා සංගමයට උගන්වන්න අපි ඒ අයව යවනවා. පැය 150ක් උගන්වනවා. ඒ මඟින් ඒ අයට කථනයේ යම් දැනුමක් ලබා දෙනවා. ඊට පස්සේ ඒ භාෂා සංගම්වල අඛණ්ඩ පැවැත්ම අපි ක්‍රියාත්මක කරගෙන යනවා. සමථ ක්‍රියාවේ යෙදෙන අය හැටියට, ජනවාර්ගික සබඳතාව ඇති කරන කණ්ඩායම් හැටියට, ඒ වාගේම ඒ අය අලුතින් ලබා ගත්ත දැනුම නැවත නැවත අලුත් කර ගැනීමට-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමනි, කථනයේ දැනුවත් කිරීමට පැය කීයක් ද?

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
පැය 150යි. පැය 150න් පස්සේ ඒ ගොල්ලන්ගේ දැනුම නැවත නැවත අලුත් කරනවා. ඒ සඳහා ඒ ගොල්ලන්ම මාස දෙකකට වතාවක් මුණ ගැහෙනවා. මුණ ගැහිලා වර්තමාන ප්‍රශ්නයක් ගැන එහෙම නැත්නම් ඒ ගොල්ලන්ගේ ප්‍රදේශයේ ප්‍රශ්නයක් ගැන ඉගෙන ගත්ත භාෂාවෙන් සාකච්ඡා කරනවා. මේ ක්‍රියාදාමය තුළින් ඇත්තටම සංස්කෘතික වශයෙනුත් ඒ අය තුළ උනන්දුවක් ඇති කර තිබෙනවා. මේ විධියට අපි වැඩ කරගෙන යනවා.

ඒ වාගේම ඔබතුමන්ලා දකිනවා ඇති, දැන් පෞද්ගලික බස් රථ හැම එකකම වාගේ ගමනාන්ත පුවරු සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන්ම තිබෙනවා. ලංගමය තුළ තවම අපට මේ කාර්යය ඉටු කර ගන්න බැරි වුණා. අය වැය පිළිබඳ විශේෂ කාරක සභාව අවස්ථාවේදී ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා සභාපතිතුමා හැටියට කිව්වා වහාම ලංගමට විරුද්ධව නඩු දමන්න කියලා. ඒක එදා වාර්තාවෙත් ලියැවිලා තිබෙනවා. දැන් අපි නඩු දාලා වාර්තා කරන්න ඕනෑ. අපට ඒ සඳහා කාරක සභාවෙන් උපදෙස් ලැබුණු බව ලංකා ගමනාගමන මණ්ඩලයට කියන්න ඕනෑ.

මේ අතර සමහර මන්ත්‍රීවරු සමාජ ඒකාබද්ධතාව ගැනත් කිව්වා. ඒ ගැන වැඩිපුර කථා කරන්න වෙලාවක් නැහැ. මූලික ලේඛන අපි ලබා දෙන්නේ නැතිව මිනිස්සුන්ට සමාජයේ තමන් අයිතියි කියා හැඟීමක් එන්නේ නැහැ. උප්පැන්න සහතිකය, identity card එක නැති මිනිස්සු ලක්ෂ ගණනක් ඉන්නවා. අපි පසු ගිය අවුරුද්දේ ජංගම සේවා සංවිධානය කරලා පණස්දහසකට විතර ඒ මූලික ලේඛන ලබා දුන්නා. UNDP එකෙන් අපට ඒකට ආධාර දුන්නා. ඒ වාගේම සමාජ ඒකාබද්ධතාව සඳහා ජර්මනිය අපට ආධාර දෙනවා. ඊළඟට දේශපාලන මතය කුමක් වුවත් අපේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා කැනඩාව අපට ආධාර දෙනවා. ඉතා හොඳ වැඩ සැලැස්මක් ඒ අය අපට ඉදිරිපත් කර තිබෙනවා. ඔවුන්ගේ භාෂා දෙකේ තාක්ෂණික දැනුම අපේ ප්‍රයෝජනයට ලැබිලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, සමාජය ඒකාබද්ධ වෙන්න බැහැ. ඇත්තටම උසාවි යන්න ඕනෑ. නමුත් වත්කමක් නැහැ. ඒ අයට නීති ආධාර ලබා දෙන්න නීති ආධාර සංගමය ඔවුන් සමඟ සම්බන්ධ කරන්න අපේ අමාත්‍යාංශය කටයුතු කරමින් තිබෙනවා.

ඊළඟට, ගුවන් විදුලියේ "පාලම" කියලා වැඩසටහනක් තිබෙනවා. ඒක කලාත්මක ආස්වාදය ලබා දෙන වැඩසටහනක්. ඒ වාගේම අපි ඉදිරි කාලයේදී රූපවාහිනිය හරහා ටෙලිනාට්‍ය ඉදිරිපත් කිරීමටත් බලාපොරොත්තු වනවා. ඒ ඉතා ලස්සන කතන්දර හරහා මිනිසුන් අතර තිබෙන සංහිඳියාව දියුණු කරන්නත්, හැඟීම් වර්ධනය කරන්නත් අප බලාපොරොත්තු වනවා.

ඊළඟට අපේ බලාපොරොත්තුව, ජාතික සමඟියේ මහා සමුළුවක් පවත්වන්නයි. හැම අංශයකම ඉතාමත්ම පිළිගත හැකි ප්‍රධාන පෙළේ උදවිය -සියලු ජන වර්ගයන්ට, ආගම්වලට, සියලුම ජන කණ්ඩායම්වලට අයත් අය- දාහකට වැඩි පිරිසක් එකතු කරලා 'ජාතික සමඟියේ මහා සමුළුව' කියලා සමුළුවක් ලබන අවුරුද්දේ පවත්වන්නත්, ප්‍රඥප්තියක් ප්‍රකාශයට පත් කරන්නත් අපි බලාපොරොත්තු වනවා. මේ ආකාරයට මේ වැඩ කටයුතු කර ගෙන යාමට අපගේ ලේකම්තුමියගෙන්, ඒ වාගේම අපගේ කාර්ය මණ්ඩලවලින් ඉතා විශාල සේවාවක් ඉටු වෙනවා. ඒ අයට මම මාගේ ස්තුතිය මේ වෙලාවේදී පුද කරනවා.

ගරු සභාපතිතුමනි, මට කියන්න තිබෙන්නේ මේ සියලුම දේ කරන්නේ මේ රටේ එකම ජාතියක් ගොඩනඟන්න කියන එකයි. ඒ, ලාංකීය ජාතිය ගොඩනඟන්නයි. අප මේ කරන්නේ මේ ලාංකීය ජාතිය ගොඩනඟන්නට සමාජ කාර්යයක්; පරිපාලන කාර්යයක්; ඒ සඳහා වටපිටාව සූදානම් කිරීමක්. නමුත් ඇත්තටම එකම ජාතියක් ගොඩ නඟන්නට නම් දේශපාලන විසඳුමක් අවශ්‍යයි. ඒ සඳහා දෙපාර්ශ්වය, තුන් පාර්ශ්වය අතරේ විශ්වාසයක් ගොඩ නැඟෙන්න අවශ්‍යයි.

උතුරු පළාත් සභාව පිහිටු වීම සඳහා ඒ මැතිවරණය නිරවුල්ව පවත්වන්න මේ රජය පහසුකම් ලබා දීමෙන්, ඒ වාගේම උතුරු පළාත් සභාවේ මහ ඇමතිතුමා ඇතුළු පිරිස ජනාධිපතිතුමා හමු වී දිවුරුම් දීමෙන් ඇරඹූ ඒ පියවර දැන් block කරලා තිබෙනවා. මේ බාධකය දැන් වහාම ඉවත් කරලා මේ විශ්වාසය ඇති කිරීමේ අන්‍යෝන්‍ය ක්‍රියාවලිය නැවතත් ආරම්භ කරලා ඉදිරියට යන්න ඕනෑ.

අවසාන වශයෙන් අපි කවුරුත් දැන ගත යුතු එකම දේ තමයි, මේ සිංහල ජනතාවගේ එකඟත්වය නැතුව දෙමළ ජනතාවගේ අයිතිය දිනා ගන්නත් බැහැ, දෙමළ ජනතාවගේ එකඟත්වය නැතුව මේ රටේ ජාතිය එක්සත් කරන්න සිංහලයන්ට පුළුවන් වන්නෙත් නැහැයි කියන එක. ඒ නිසා ජාතික සමඟිය ගොඩ නැඟීම තමයි අපේ අරමුණ විය යුත්තේ. ඒ අරමුණ වෙනුවෙන් අපි ගොඩනඟා ගත යුතු විශ්වාසය ගොඩනඟා ගන්න දෙපැත්තේම ඉන්න උග්‍ර මතවාදීන්ව කොන් කරලා මධ්‍යස්ථ මතවාදීන්ගේ මහා ඒකාබද්ධ

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

එකතුවක් ඇති කරන්න අපේ රජයට, ඒ වාගේම TNA එකට හැකි වේවා! අපේ රවුෆ් හකීම් ඇමතිතුමාට හැකි වේවා! යි ප්‍රාර්ථනා කරමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[பி.ப. 12.03]

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

கௌரவ தவிசாளர் அவர்களே, தெரிகுழுவுக்கு ஆற்றுப்படுத்தப்பட்ட அமைச்சுக்களின் நிதி ஒதுக்கீடுகள் மீதான இன்றைய குழுநிலை விவாதத்தில் கலந்து கொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். இன்றைய தினம் பல்வேறு அமைச்சுக்கள் தொடர்பாகவும் பல்வேறு அனர்த்தங்கள் தொடர்பாகவும் இங்கு பலரும் உரையாற்றி னார்கள். அதேவேளையில், மட்டக்களப்பு மாவட்டத்தில் மூன்று பேர் யானையின் தாக்குதலுக்குள்ளாகி இறந்திருக் கிறார்கள். கடந்த ஒரு வாரத்துக்குள் இந்த அனர்த்தம் இடம்பெற்றிருக்கிறது. நேற்று முன்தினம் கேதாரபிள்ளை பேகேஸ்வரன் என்னும் 16 வயதுடைய மாணவன் யானையின் தாக்குதலினால் இறந்திருக்கிறார். அதற்கு முன்னர் இரண்டு பேர் - மகிழடித்தீவைச் சேர்ந்த சின்னத்தம்பி பொன்னுத்துரை என்னும் 56 வயதுடைய நபரும் செல்வநாயகம் இளையதம்பி என்னும் 42 வயதுடைய நபரும் - அங்கு விறகு வெட்டச் சென்றபொழுதும் மாடு பார்க்கச் சென்றபொழுதும் யானைத் தாக்குதலுக்குள்ளாகி இறந்திருக்கிறார்கள். ஆகவே, மட்டக்களப்பு மாவட்டத்திலே யானையின் தாக்கம் தொடர்ந்த வண்ணம் இருக்கிறது. அதனைத் தடுப்பதற்காக அங்குள்ள அரசாங்க அதிபர் பல்வேறு முயற்சிகளை எடுத்துள்ளபோதும், யானை இன்று யாரைத் தாக்கிக் கொல்லப்போகின்றதோ என்னும் பீதி அங்கு தினமும் நிலவுகின்றது. மட்டக்களப்பு மாவட்டத்தில் குறிப்பாக பட்டிப்பளை, வெல்லாவெளி, வவுணதீவு போன்ற இடங்களில் யானைத் தாக்குதல் அதிகமாக இருக்கின்றது. இப்பொழுது அப்பிரதேசங்களில் மானாவாரி நெற்செய்கைக் காலம் என்பதால், மாடு வளர்ப்போர் தமது மாடுகளை மேய்ச்சல் தரைக்குக் கொண்டு செல்கின்றனர். இவ்வாறான வேளைகளிலே இத்தகைய அனர்த்தங்கள் தொடர்ந்த வண்ணம் இருக்கின்றன. ஆகவே, அதனை உடனடியாகத் தடுக்க உரிய நடவடிக்கை எடுக்கவேண்டும் என இச்சந்தர்ப்பத்தில் தெளிவாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இப்பொழுது இனங்களைப் பற்றியும் நிருவாகத்தைப் பற்றியும் பல்வேறுபட்ட கருத்துக்கள் முன்வைக்கப்பட்டிருக் கின்றன. நிருவாகத்தைச் சரியான முறையில் கொண்டு செல்லவேண்டும் என்று இங்குள்ள பல அமைச்சர்களும் எதிர்க்கட்சியைச் சேர்ந்தவர்கள் பலரும் கூறியிருந்தார்கள். அம்பாறை மாவட்டத்தில் கல்முனை தமிழ் பிரதேச செயலாளர் பிரிவு கடந்த 30 வருட காலமாக இயங்கிவருகின்றது. ஆனால், அதனை ஒரு நிரந்தரமான பிரதேச செயலகப் பிரிவாக மாற்றுவதற்கு குறிப்பாக அங்குள்ள இஸ்லாமிய அரசியல்வாதிகள் பல்வேறு தடைகளை விதித்துக்கொண்டிருக் கின்றார்கள். இது வேதனைதரும் ஒரு சம்பவமாக இருக்கின்றது. அங்கு பல கட்சிகளிலும் உள்ள முஸ்லிம் அரசியல்வாதிகள் அதனைத் தடுப்பதற்கான முயற்சிகளை எடுத்துக்கொண்டிருக்கின்றார்கள். நாங்கள் இதனை அனுமதிக்க முடியாமலுள்ளது. நாங்கள் இன ஒற்றுமையைப் பற்றியும் மக்களுக்கான சமத்துவத்தைப் பற்றியும் இங்கு கதைக்கின்றோம். ஆனால், இந்தப் பிரதேச செயலாளர் பிரிவு கடந்த 30 வருட காலமாக ஸ்தாபிக்கப்பட்டிருந்தாலுங்கூட அதனை இயங்கச்செய்ய முடியாமல் பல்வேறுபட்ட தடைகள் இருந்துகொண்டிருக்கின்றன. இந்த நாட்டில் வாழ்கின்ற இரண்டு சிறுபான்மைச் சமூகங்களான எங்களிடையே பிரச்சினைகள் வராதவகையில், உண்மை நிலையை உணர்ந்து அந்த மக்களுக்கான நிருவாகத்தைச் சரியானவழியில் கொண்டுசெல்வதற்கு அங்கிருக்கும் கட்சிகளைச் சேர்ந்த முஸ்லிம் அரசியல்வாதிகள் முன்வரவேண்டும் என்பதை நான் இச்சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். அவ்வாறு அவர்கள் கல்முனையிலுள்ள பிரதேச செயலாளர் பிரிவைத் தரமுயர்த்துவதற்குத் தடைவிதிப்பார்களாயின், அது அங்கு இரு இனங்களுக்கிடையிலும் முறுகல் நிலை ஏற்பட வழிவகுக்கும். அதேநேரத்தில் மட்டக்களப்பு, திருகோணமலை ஆகிய மாவட்டங்களிலும் இரு இனங்களுக்கும் இடையில் பேசித்தீர்க்கப்பட வேண்டிய பல்வேறு பிரச்சினைகள் உள்ளன. இந்த நிலையில், கல்முனை பிரதேச செயலாளர் பிரிவைத் தரமுயர்த்தும் விடயத்தில் அவர்கள் தடையாக இருந்தால், அந்தப் பிரதேசங்களில் பேசித்தீர்க்க வேண்டிய விடயங்களுக்கு நாங்களும் தடையாக இருக்க வேண்டிய துர்ப்பாக்கிய நிலை ஏற்படுமென உங்களுக்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු බෂීර් සෙගු ඩාවුඩ් මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பசீர் சேகு தாவூத் - உற்பத்தித்திறன் ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Basheer Segu Dawood - Minister of Productivity Promotion)

கல்முனை பற்றிய விடயங்களைக் கல்முனையில் பேசுங்கள்! அதனை மட்டக்களப்புடனும் திருகோணமலை யுடனும் சேர்க்காதீர்கள்!

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

இது கல்முனையோ அல்லது மட்டக்களப்போ அல்ல. இது இலங்கைப் பாராளுமன்றம். இப்பாராளுமன்றம் இலங்கை யிலுள்ள அதியுயர் சபையாகத் திகழ்கின்றது. நாங்கள் இச்சபையிலே கல்முனையைப் பற்றியும் கதைக்கலாம்; மட்டக்களப்பைப் பற்றியும் கதைக்கலாம்; திருகோணலையைப் பற்றியும் கதைக்கலாம். ஏன், அமெரிக்காவைப் பற்றியும் சவூதி அரேபியாவைப் பற்றியும்கூட கதைக்கலாம். இதனை நீங்கள் புரிந்துகொள்ள வேண்டும். நாங்கள் இங்கு கதைப்பதைக் கல்முனைக்குச் சென்று கதைக்கவேண்டிய தேவையில்லை. எங்களை எமது மக்கள் இப்பாராளுமன்றத்துக்கு அனுப்பி யிருக்கிறார்கள். நாங்கள் எமது மக்களுக்கான தீர்வுகளைப் பெற்றுத்தரும்படி இந்தப் பாராளுமன்றத்தில் கூறுவோமே தவிர, இந்த விடயங்களைப் பற்றி கல்முனைக்கோ, காத்தான்குடிக்கோ சென்று கதைக்கவேண்டிய அவசிய மில்லை. இதனை நீங்கள் புரிந்துகொள்ள வேண்டும். நீங்கள் இதற்குத் தடையாக இருந்தால், நாங்களும் பல விடயங்க ளுக்குத் தடையாக இருக்க வேண்டிவரும் என்பதை நான் மீண்டும் வலியுறுத்த விரும்புகின்றேன்.

இந்த இடத்திலே கலாசாரம் சம்பந்தமாகப் பல்வேறு விடயங்கள் கூறப்பட்டன. அதாவது இந்து கலாசாரம் மற்றும் புத்த மதம் பற்றி எல்லாம் கூறப்பட்டன. ஆனால், இன்று மட்டக்களப்பிலே என்ன நடந்து கொண்டிருக்கின்றது என்பதை நீங்கள் அறிந்துகொள்ள வேண்டும். அதாவது மட்டக்களப்பிலே இருக்கின்ற பௌத்த மதகுரு ஒருவர் அங்கே பௌத்த மதத்தைப் போதிப்பதாகத் தெரியவில்லை. அவர் அங்கு அத்துமீறி நிலத்தைப் பிடிக்கின்ற ஒரு பௌத்த குருவாக

மாறியிருக்கின்றார். மட்டக்களப்பு மாவட்டத்திலுள்ள பட்டிப்பளை மற்றும் வெல்லாவெளிப் பிரதேச செயலாளர் பிரிவுகளிலுள்ள எல்லைக் கிராமங்களில் சிங்கள மக்களைக் குடியேற்றுவதற்கு அவர் தலைமைதாங்கிச் செயற்பட்டுக் கொண்டிருக்கின்றார். ஒரு மதத்துக்கான உடையை நாங்கள் மதிக்க வேண்டும். ஆனால், அவர் அந்த மதத்துக்கான உடையை அணிந்துகொண்டு - காவி உடையைத் தரித்துக்கொண்டு, அங்கே இவ்வாறான வேதனையான விடயங்களைச் செய்துகொண்டிருக்கின்றார். மாண்புமிகு பிரதம அமைச்சர் அவர்கள் இப்பொழுது இந்தச் சபையில் இல்லை. இல்லாவிட்டாலும்கூட நான் ஒரு விடயத்தை அவரின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன். அதாவது, மாண்புமிகு பிரதம அமைச்சர் அவர்கள் இந்த விடயத்தில் உடனடியாகத் தலையிட்டு அவரை மட்டக்களப்பிலிருந்து வேறு ஒரு விகாரைக்கு மாற்ற வேண்டும். அதேநேரம், மட்டக்களப்பு இருதயபுரத்திலுள்ள ஒரு விகாரையின் மதகுரு தனது கடமைகளைச் சரியாகச் செய்கின்றார். அதாவது, மத ரீதியான விடயங்களை மட்டும் கவனிக்கின்றார்; மக்களை நல்ல முறையில் அணுகுகின்றார். ஆனால், குறித்த மதகுரு அவ்வாறான ஒரு நடவடிக்கையையும் மேற்கொள்வதில்லை. இவ்வேளையில், எல்லாவல மேதானந்த தேரர் அவர்கள் கூறிய கருத்துக்களை நான் உள்வாங்க வேண்டியிருக்கின்றது. அந்த மதகுருவின் பெயரை நான் இங்கு குறிப்பிட வேண்டும். அதாவது, மட்டக்களப்பு மங்களாராம விகாராதிபதியான எம்பிலிப்பிட்டிய சுமணரத்தின தேரர் அவர்கள்தான் மிகவும் மதம் பிடித்தவராக இருந்து கொண்டிருக் கின்றார். ஆகவே, இந்த விடயத்தை நீங்கள் கவனத்திற் கொண்டு நடவடிக்கை எடுக்கவேண்டும் என்று நான் கேட்டுக்கொள்கின்றேன்.

இங்கு மொழி தொடர்பாகவும் கதைக்கப்பட்டது. வடக்கு, கிழக்கிலே தமிழ்மொழி அரசகரும மொழி என்று மாண்புமிகு அமைச்சர் அவர்கள் கூறியிருந்தார். ஆனால், அங்கு நடக்கின்ற நிகழ்வுகளில் தேசிய கீதத்தைத் தமிழில் பாடுவதற்கு முடியாமல் இருக்கின்றது. அதைச் சிங்கள மொழியிலே பாடவேண்டும் என்று பலர் வற்புறுத்துகின்றார்கள். ஆனால், நீங்கள் கூறுகின்றீர்கள், அந்தந்தப் பிரதேசத்தில் அந்தந்த மொழியிலே நிருவாகம் நடக்க வேண்டும் என்று. நான் உங்களிடம் அன்பான ஒரு வேண்டுகோளை விடுக்கின்றேன். அதாவது, வடக்கு, கிழக்கிலே சிங்கள மொழியில் தேசிய கீதம் இசைக்க வேண்டுமென்றால், அங்கு தேசிய கீதமே இசைக்காமல் நிகழ்ச்சிகளை நடத்துவதற்கு தயவுசெய்து நீங்கள் அனுமதி யுங்கள்! எங்களுக்குத் தேசிய கீதம் முக்கியமல்ல. *[இடையீடு]* ஆகவே, அந்த இனத்துக்குரிய மொழி, அதற்குரிய கலை, கலாசாரப் பண்புகளுடன்தான் எந்த விடயங்களும் கையாளப்பட வேண்டுமே தவிர, -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
What is your point of Order, Hon. Member?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

He is making a charge against a Venerable Buddhist Monk which cannot be allowed in this House. Also, he says that he will teach a lesson to the Muslims; he takes Islam into criticism. He cannot do that. They wanted to have North and East together. They cannot live together with the Muslims in Kalmunai. Then, how can they live? How can they ask the support of the Muslims?

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Hon. P. Ariyanethran, you continue.

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

நீங்கள் குறுக்கீட்டுக்கான அமைச்சர் போன்று செயற்பட்டுக்கொண்டிருக்கின்றீர்கள். ஏனெனில், உங்களுக்கு ஓர் அமைச்சுப் பதவி தரப்படவில்லையே! ஆகவே, குறுக்கீடு செய்கின்ற ஓர் அமைச்சராக உங்களை நியமிக்கும்படி நீங்களே கேட்டுப் பெற்றுக்கொள்ளுங்கள்! *[இடையீடு]* நீங்கள் குறுக்கீடு செய்யத் தேவையில்லை. *[இடையீடு]* நாங்கள் கதைக்கின்றபோது நீங்கள் குறுக்கீடு செய்யாமல் உங்களுடைய குறுக்கீடுகளை உங்களுடன் வைத்துக் கொள்ளுங்கள். *[இடையீடு]* ஆகவே, அந்தந்தப் பகுதிகளிலே அந்தந்த மொழியில் விடயங்களைக் கையாள வேண்டிய தேவை இருக்கின்றது. அதேநேரம் விளங்காத ஒரு மொழியில் தேசிய கீதத்தை இசைக்கின்றபோது உண்மையிலே அதில் பல பிழைகள் நேரலாம். ஆகவே, அந்த நிலைமையை நீங்கள் திருத்திக் கொள்ள வேண்டும். அதாவது, அதைத் தமிழில் இசைக்க முடியுமாக இருந்தால் தமிழிலேயே இசைக்க வேண்டும். ஆகவே, வடக்கு, கிழக்கில் தமிழில் தேசிய கீதம் இசைக்க முடியாவிட்டால் அங்கு நிகழ்வுகளில் தேசிய கீதமே தேவையில்லை என்பதை நான் மீண்டும் வலியுறுத்துகின்றேன்.

மீள்குடியேற்றம் சம்பந்தமாகவும் நான் இங்கு கூற வேண்டும். உண்மையில் இன்று 30 வருட யுத்தம் முடிந்த தற்குப் பிற்பாடு மீள்குடியேற்றம் சம்பந்தமாகப் பல்வேறுபட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளன. நாங்கள் அதனை ஏற்றுக்கொள்கின்றோம். இருந்தாலும், வட மாகாணத்தில் இந்திய அரசாங்கத்தினால் வழங்கப்பட்ட அந்த வீட்டுத் திட்டத்தில் பல அமைச்சர்களின் தலையீடுகள் இருந்து கொண்டிருக்கின்றன. அந்த அமைச்சர்கள் மற்றும் அதிகாரிகளின் தலையீட்டினால் அந்த வீடுகள் செல்வாக்கின் நிமித்தம் வழங்கப்படக்கூடிய வாய்ப்புக்கள் இருக்கின்றன. ஆகவே, நீங்கள் அந்தச் செயற்பாட்டைத் தடுத்து நிறுத்த வேண்டிய ஒரு தேவை இருக்கின்றது. வன்னியிலிருந்து இடம்பெயர்ந்தவர்கள் அல்லது யுத்தத்தினால் பாதிக்கப்பட்ட வர்களுக்கு இந்திய வீட்டுத் திட்டத்தில் முன்னுரிமை வழங்கப்பட வேண்டும் என்கின்ற ஒரு சுற்றுநிருபம் வெளியிடப்பட்டிருக்கின்றது. இருந்தாலும், வன்னியிலிருந்து போரினால் பாதிக்கப்பட்டவர்கள் மீள்குடியேறியபொழுது ஏற்கெனவே அவர்களுக்கு ஒரு வீட்டுக்கு ஓர் இலட்சம் ரூபாய் வீதம் வழங்கப்பட்டிருக்கின்றது. ஆனால், ஓரிலட்சம் ரூபாய் என்ற அந்த சொற்ப நிதியை வைத்துக்கொண்டு முழுமையான ஒரு வீட்டை நிர்மாணிக்க முடியாது. ஓரிலட்சம் ரூபாயில் கோழிக்கூடு அல்லது மாட்டுக்கொட்டில் போன்ற ஒன்றைத்தான் கட்ட முடியும். ஆகவே, வன்னியிலிருந்து இடம்பெயர்ந்த மக்களுக்கு அந்த இந்திய வீட்டுத் திட்டத்தை வழங்குவதற்கான நடவடிக்கை எடுக்கப்பட வேண்டும் அல்லது அந்த மக்களுக்கு வீடு கட்டுவதற்கு ஆகக்குறைந்தது ஐந்தரை இலட்சம் ரூபாயாவது வழங்கப்பட வேண்டும். அவ்வாறு ஐந்தரை இலட்சம் ரூபாய் கொடுத்தால் மட்டுந்தான் அவர்களால் வீடொன்றைக் கட்ட முடியுமென்பதை நான் தெளிவாக இவ்விடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

[ගරු පී. අරියනේත්‍රන් මහතා]

அடுத்து எமது மொழிக்கொள்கை சம்பந்தமாக பார்ப்போம். பல பல்கலைக்கழகங்களில் ஆங்கிலம், சிங்களம் ஆகிய இரண்டு மொழிகளில் விரிவுரைகள் வழங்கப்படுகின்றன. அப்படியிருந்தும் பெரும்பான்மையாக இருக்கின்ற சிங்கள மாணவர்கள் ஆங்கிலத்தில் விரிவுரை வழங்கப்படுகின்றபோது அதைத் தங்கள் மொழியான சிங்களத்தில் விளங்கப் படுத்துமாறு கேட்கின்றபோது விரிவுரையாளர்கள் ஆங்கி லத்தை விடுத்துச் சிங்களத்தில் விரிவுரையை மேற்கொள்கின் றார்கள். இதனால் தமிழ் மாணவர்களுக்குப் போதிய விளக்கம் கிடைக்காமல்போகின்றது. தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர் அவர்கள் இதை கவனத்தில் எடுக்க வேண்டும். அவ்வாறு சிங்களத்திலே விரிவுரை மேற்கொள்ளப் படுமாக இருந்தால் அங்கிருக்கின்ற தமிழ் மாணவர்களின் நலனையும் கருத்திற்கொண்டு அதைத் தமிழிலும் மொழிபெயர்ப்பதற்கான வசதியை அப்பல்கலைக்கழகங்களில் செய்துகொடுக்க வேண்டுமென்பதை நான் இவ்விடத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், போர் காரணமாக இறந்தவர்களுக்கு இரண்டு இலட்சம் ரூபாய் நஷ்டஈடாக வழங்குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. இந்த இரண்டு இலட்சம் ரூபாய் போதாது. ஒரு நபரின் சார்பில் குறைந்தது 3 இலட்சமாவது வழங்குவதற்கு நடவடிக்கை யெடுக்க வேண்டும். போர் காரணமாக இறந்த அல்லது பாதிக்கப்பட்ட எவருக்குமே இன்னும் அந்தத் தொகை வழங்கப் படவில்லை. இப்பொழுது போரினால் இறந்தவர் களின் தரவு சேகரிக்கப்பட்டுக்கொண்டிருக்கின்றது. அதிலே பல முறை கேடுகள் நடந்துகொண்டிருக்கின்றன. நான் ஏற்கெனவே இதுபற்றிக் கூறியிருந்தேன். அவர்களுக்கு வழங்கப்பட்டிருக் கின்ற அந்தப் படிவம் முழுமையான ஒரு தரவைச் சேகரிக்கின்ற படிவமாக இல்லை. இறப்பு வீதத்தை அல்லது இழப்பு வீதத்தை மாற்றுகின்ற அல்லது குறைக்கின்ற ஒரு படிவமாகத்தான் அது இருக்கின்றது. ஆகவே, அப்படிவத்தை மீள்பரிசீலனை செய்யவேண்டிய தேவை இருக்கின்றதென்பதை நான் இந்தச் சந்தர்ப்பத்திலே மீண்டும் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இவ்வாறாகப் பல்வேறுபட்ட குழறுபடியான நடவடிக்கைகள் நாட்டில் நடந்துகொண்டிருக்கின்றன. இன்னொரு விடயத்தை மட்டும் கூறி முடித்துக் கொள்கின்றேன். குறிப்பாக, வெளிநாட்டிலிருந்து வருகின்ற தமிழ் மக்களிடம் - அவர்கள் புலம்பெயர்ந்து வாழ்கின்ற மக்களாக அல்லது வெளிநாட்டுப் பிரசைகளாக இருக்கலாம் - விமான நிலையத்தில் சிலவேளைகளில் ஒருவிதமான கப்பம் வாங்கப்படுவதாக எங்களிடம் பலர் முறையிட்டிருக்கிறார்கள். வெளிநாடுகளிலிருந்து வருகின்ற மக்களின் வருகை கூடியிருக்கின்றது. இப்பொழுது நீங்கள் சமாதானம் பற்றிக் கூறுகின்றீர்கள். அதேபோல் ஒழுக்கத்தைப் பற்றிக் கதைக்கின்ற போது இந்த விடயங்களையும் கவனத்திற் கொள்ள வேண்டும். எனவே, இந்தப் பாராளுமன்றத்திலும் விமான நிலையத்திலும் ஒழுக்கத்தைப் பேணுங்கள்! அந்த வகையில், எல்லா விடயங்களிலுமே ஒழுக்கத்தைக் கடைப் பிடியுங்களென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

The National Anthem can be sung in Tamil - [*Interruption*.] At places in the North when it was sung in Tamil, I had joined him.

[12.16 p.m.]

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)

Mr. Chairman, I thank you for giving me a few minutes to speak.

As a Senior Minister and the Minister of Urban Affairs, I would like to inform this House that the urban population in our country has increased. The estimated increase in our urban population during the period 2005 to 2015 is about 3 per cent, while the population increase of the entire country is about 1.2 per cent. It has also been estimated that 50 per cent of the total population will live in urban areas by the year 2015.

Our Government has given priority to a planned approach, having understood the importance of strategies to be followed for developing infrastructure facilities in urban areas in order to provide basic facilities to the urban poor population with a view to minimizing the difficulties developing fast in urban areas towards a sustainable urban development, depending on the speed and extent of urbanization.

During this year, I have co-ordinated with the Central Government, Provincial Councils and Local Authorities individually and jointly regarding the common problems pertaining to water supply, sanitation and waste disposal, which are common features seen not only in the City of Colombo but also in the cities outside.

I have also taken action to co-ordinate some of the “Divi Neguma" Programme activities for the benefit of the urban poor especially in Jaffna, Mannar, Vavuniya, Polonnaruwa and Galle. In these programmes, we have distributed equipment among beneficiaries to promote domestic and household industries. We were able to extend a valuable contribution to the local communities by participating in various exhibitions and programmes organized jointly by the Ministry of Economic Development and the Ministry of Traditional Industries and Small Enterprise Development islandwide.

Awareness creation programmes were conducted at district level to promote cottage industries. Necessary training, technology and market opportunities were provided to suitable persons to start small industries. Exhibitions were conducted in many districts in order to attract the unemployed young men and women and to motivate them to start self-employment projects. A majority of those who started new businesses were women. We have also carried out follow-up action to monitor the progress of these activities.

Mr. Chairman, I had the opportunity of heading a Ministerial Committee to formulate a policy to determine bus fares. After having consultations with the relevant

parties to provide a sound and qualitative bus service to the public by reviewing the present policy, we were able to recommend an increase in the bus fare by 7 per cent based on the running cost index calculated by the National Transport Commission, avoiding a breakdown in the bus service until a new policy on bus fare is formulated based on the quality of bus service.

In conclusion, I would like to express my gratitude to my Secretary, Mr. Mahinda Madihahewa, to the officials and all those who gave me their support and co-operation to carry out the duties of my Ministry.
Thank you.

[12.22 p.m.]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා (විද්‍යාත්මක කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண - விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Prof.) Tissa Vitarana - Minister of Scientific Affairs)

Hon. Chairman, the importance of science, technology and innovation was accepted by the Cabinet when I presented a national strategy. It so happens that the mandate which has been given to me as a Senior Minister has enabled me to co-ordinate the implementation of that strategy, which is so vitally important to lift our economy so that we become a high value-added economy for our raw materials and become a developed rich country which can solve the problems of poverty in Sri Lanka. This was accepted by the Cabinet and the Cabinet Memorandum which I submitted to set up a co-ordinating secretariat for this purpose, was also accepted. The co-ordination and monitoring of all activities of this Co-ordinating Secretariat and other Ministries relevant to science, technology and innovation strategy would fall within the responsibilities of the Minister of Scientific Affairs. In terms of this, I am happy to say that the Co-ordinating Secretariat - COSTI - has been set up; half the personnel required have been recruited and they are working very well as a team with various line ministries, institutions and the private sector bringing about the necessary coordination, so that not only is the limited resources that are available best utilized by the scientific community, but the scientific community interacts with industrial community so as to give maximal benefit to our economy.

Now, we have worked out a detailed programme for implementation in the year 2014. I made a request for Rs. 160 million which is what is required for this, but unfortunately only Rs. 87 million had been allocated in the Budget. During the Meetings of the Select Committee, I brought this up and I am happy to say that at this meeting presided by Hon. Nimal Siripala de Silva, a decision was taken that the requested amount of Rs. 160 million will be included in the budgetary provisions for 2014 and I hope that this will be done.

That was one problem, but there is another problem which I want to draw the attention of the House. That is, the conduct of the Secretary of the Ministry of Technology and Research, Mrs. Dhara Wijayatilake. In accordance with the Cabinet Memorandum which was accepted by the Cabinet, the Secretary to the President, Mr. Lalith Weeratunga issued a circular which went round to all the Ministries, to all heads of institutions, directing them to cooperate and work with COSTI to bring about the necessary coordination and monitoring to maximize the benefit to our economy. The principles and aims of co-ordination ensure that national development considerations form an integral part of all science and technology activities as per the five-year science technology and innovation strategy.

Now, just to give you an example, as part of this strategy the setting up of a National Science Centre was mooted. The plans were drawn up for this National Science Centre by COSTI. This was submitted to the Department of National Planning and accepted. It was discussed with the Hon. (Dr.) Sarath Amunugama, Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning and he agreed to get the finances. Then, action was taken to obtain land from the UDA for this purpose. While all this was going on, there were several meetings called, and from the Ministry of Technology and Research representing the National Science Foundation, there was a representative who participated and cooperated in our efforts. This was going on very satisfactorily. I am very happy that His Excellency the President has included the setting up of this National Science Centre in the Budget, which practically every other country has. Developed countries such as the United States of America has over 100 and developing countries such as India has 27. So, developing countries have also appreciated the importance of setting up a National Science Centre. This whole thing was set in motion as part of this strategy, which was accepted by the Cabinet. While this is going on, I am sorry to say that on the directive of the Secretary to the Ministry of Technology and Research, the person from the National Science Foundation has withdrawn from participating in the meetings. Not only that, she has directed the National Science Foundation to come out with an alternative proposal. We have already put this up; this has been accepted and included in the Budget. Now, she is trying to set a separate process going, which is quite contrary to what has been accepted by His Excellency the President and the Government in terms of this Budget. So, I think this is not the way in which a responsible Secretary of a Ministry should behave.

In addition to that, I am sorry to say that we have had innumerable meetings, because there are so many sectors which we want to develop. The question of getting titanium dioxide from ilmenite, then going on to titanium; LAUGFS Gas has come in and SLINTEC, which I helped to establish, has now proceeded along that line. So, we

[ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා]

are trying to develop that same capability in other areas. For instance, we have the best graphite in the world and graphene is being developed. The European Union is setting up a whole unit of all the countries to make use of graphene as a new basis for industrial development. Here, we need to set up our own graphene production centre and we are working on those areas. So, in our effort to do this, we are having a number of committees, councils, which are meeting and trying to coordinate different sectors and develop the type of economic programme that will take our country forward. But, I am sorry to say that she has been communicating with various organizations, not only local organizations, but foreign organizations like the World Intellectual Property Organization - WIPO - in Geneva, the GIZ, the Asian Development Bank and trying to run down what we are doing and saying that we are not entitled to do this. Thereby, she is really acting as a spoiler in what we are doing, which has been approved by the Cabinet. Is this the way for a Secretary of a Ministry to behave? I think, here, we all have to get together and work together with all the relevant line Ministries and various institutions, pool our resources, coordinate our efforts and direct them towards meaningful development of our economy on a planned basis. This is what our Ministry together with COSTI has been trying to do. But I am very sad to say that this individual is behaving in this way, which is contrary to the very spirit of Government Service. I think we should work out some means of coming - [*Interruption.*]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු සභාපතිතුමනි, පැහැදිලි කර ගැනීමක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතාමත්ම බරපතළ කාරණයක් කිව්වේ, අමාත්‍යාංශයක ලේකම්වරියක් ඔබතුමාගේ ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළට විරුද්ධ වෙනවාය කියලා. මේ පිළිබඳව ගරු ජනාධිපතිතුමා දැනුවත් කරලා ඒක නිවැරැදි කර ගන්න මීට කලින් ඔබතුමා කටයුතු කළේ නැද්ද?

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

මම ජනාධිපතිතුමාගේ ලේකම් එක්ක සාකච්ඡාවක් ඉල්ලුවා. එතුමා තමයි හැම අමාත්‍යාංශයකටම අපි එක්ක සහයෝගයෙන් කටයුතු කරන්නය කියලා circular එක ඇරියේ. නමුත් දැන් මාස තුනක්, හතරක් ගිහිල්ලා තිබෙනවා, තවම ඒ සාකච්ඡාව අපි පැවැත්වූවේ නැහැ. අපි සාකච්ඡාව පැවැත්වූවේ නැති කාලයේදී මෙතුමිය මේ ආකාරයටම අපි කරන්න හදන දේවල් අවුල් කිරීමට ක්‍රියා කරනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඇමතිතුමා, ඔබතුමා පත් වෙලා තිබෙන තත්ත්වය ගැන අපි කනගාටු වෙනවා. මම හිතන්නේ ජනාධිපතිතුමාගේත් විශේෂ අවධානයට මේ කාරණය ඉක්මනින්ම ලක් වෙන්න ඕනෑ. මේක රටට විශාල අපකීර්තියක්. ඒ වාගේම රට පස්සට යන්නේ. විශේෂයෙන්ම වැදගත්ම ක්ෂේත්‍රයක මේ කටයුත්ත සිදු වෙන්නේ.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

අනිවාර්යයෙන්ම. එතුමිය විශ්‍රාම යන කාලය හුඟක් පහු වෙලා. ඉරාන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ පිට පිට එතුමියට extension ලැබිලා තිබෙනවා. ප්‍රයෝජනවත් වැඩක් නොවෙයි, එතුමිය කරන්නේ. සහයෝගය නොදීම එක දෙයක්. නමුත් මෙතැනට ඇවිල්ලා අපි කරන්න හදන දේ අවහිර කිරීම ඉතාමත්ම දරුණු ප්‍රශ්නයක් කියලායි මම හිතන්නේ. මේ කාරණය සභාවේ දැන ගැනීමට මම ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ස්තුතියි. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு,* சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] *தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[අ.භා. 12.34]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අමාත්‍යාංශ ගණනාවක් ඇතුළත් වන කාරක සභා අවස්ථාවේ, එම කමිටු වාර්තාව පිළිබඳවත්, ඒ අමාත්‍යාංශවලට අදාළ කරුණු පිළිබඳවත් සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව බෙහෙවින්ම සතුටු වෙනවා. ප්‍රධානකොටම මෙහි ජ්‍යෙෂ්ඨ අමාත්‍යාංශ 10ක් තිබෙනවා. ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ට අත් වී තිබෙන තත්ත්වය පිළිබඳව, ඒ අමාත්‍යවරයා ලේකම්තුමියවත් පිළිගන්නේ නැති තත්ත්වයට පත් වී ඇති බව තමයි මීට පෙර කථා කළ ගරු ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමා විසින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉස්සර කාලයේ රාජ්‍ය සභාවේ ඉන්න අය රාජ්‍ය උදහසට ලක් වුණාම ඔවුන්ගේ හිස ගසා දමනවා, එහෙම නැත්නම් සිරගත කිරීමට ලක් කරනවා. ඒ වාගේ දඬුවම් තමයි ඉස්සර තිබුණේ.

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

සමා වෙන්න, මගේ ලේකම් ගැන නොවෙයි කථා කළේ. රේඛීය අමාත්‍යාංශයේ -technology research එකේ- ලේකම්තුමිය ගැන කථා කළේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

පැහැදිලියි. රේඛීය අමාත්‍යාංශයෙන් ඔබතුමන්ලාගේ මැදිහත් වීම් සඳහා සකස් කරලා දීපු අමාත්‍යාංශ තිබෙනවා නේ ඔබතුමන්ලාට බාර දීලා හරි, අධීක්ෂණය කරන්න හරි, මැදිහත්

වෙන්න හරි, උපදෙස් සපයන්න හරි; ඒ අමාත්‍යාංශයක ලේකම්වරියක් පිළිබඳව. කෙසේ වුවත් අපේ රටේ ඉතිහාසයේ රාජ්‍ය සභාවේ ඉන්න රාජ්‍ය සභිකයින් රජතුමාගේ උදහසට ලක් වුණාට පස්සේ එක්කෝ හිස ගසා දමනවා, ජීවිතාන්තය දක්වා සිරගත කොට තබනවා. එසේ නැතිනම් පිටුවහල් කරනවා. වර්තමානයේ රාජ්‍ය සභාවේ ඉන්න ඇමැත්තෝ රාජ්‍ය උදහසට ලක් වුණාට පස්සේ දෙන දඬුවම බවට පත් වෙලා තිබෙන්නේ මේ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධුර ලබා දීමයි. ඒ නිසා මේ රාජ්‍ය උදහසට ලක් වූවාට පසුව ලබා දෙන තනතුරක් බවට තමයි මේ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ධුර පත් වෙලා තිබෙන්නේ. ඒ තත්ත්වය තමයි ගරු අමාත්‍යතුමන්ලා කරුණුවලිනුත් පෙන්නුම් කරමින් තිබෙන්නේ.

ඊළඟට, විශේෂයෙන් මම අවධානය යොමු කරන්න කැමැතියි, වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය පිළිබඳව. ඒ අමාත්‍යාංශය යටතේ විශේෂයෙන්ම වනජීවී ජාතික උද්‍යාන 22ක් තිබෙනවා. මේ වන විට දේශපාලන අධිකාරිය විසින් වනජීවී ජාතික උද්‍යාන 22න් 8ක්ම වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත උල්ලංඝනය කරමින් විනාශයට පත් කරමින් තිබෙනවා. මා ඒ ගැන එකින් එක කියන්නම්.

පළමුවෙන්ම විල්පත්තුව ජාතික වනෝද්‍යානය ගැන කියන්නම්. විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ අක්කර 50ක් "මාගා" කියන කොන්ත්‍රාත් සමාගමට වෙන් කරලා දීලා තිබෙනවා, පස් කැපීම සඳහා. අපි අහනවා, විල්පත්තුව ජාතික වනෝද්‍යානය ඇතුළේ පස් කැපීම සඳහා අවසර ලබා දෙන්න ගරු අමාත්‍යවරයා පදනම් කර ගත්ත හේතු සාධක මොනවාද කියලා. ජාතික වනෝද්‍යානයක් ඇතුළේ අඩුම තරමේ පොලිතින් බෑග් එකක්, වතුර බෝතලයක් විසි කරන්නවත් දෙන්නේ නැහැ. සාමාන්‍යයෙන් වනෝද්‍යානය නරඹන්න යන කෙනකුට බැහැලා යන්නවත් දෙන්නේ නැති තැනක බැකෝ යන්ත්‍ර යොදා ගෙන පස් කපන්න අක්කර 50ක් වෙන් කරලා දීලා තිබෙනවා. මෙය ලබා දුන්නේ කොහොමද කියලා ගරු අමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවට කිව යුතුයි.

ඊළඟට උඩවලව ජාතික වනෝද්‍යානය ගැන බලමු. උඩවලව ජාතික වනෝද්‍යානය ඇතුළේ "මව් ආර" කියන ජලාශය ගොඩ නැඟුවා. මේ මව් ආර ජලාශය ගොඩ නඟන කොට වාරි මාර්ග දෙපාර්තමේන්තුවත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කළා. මොකද, ජාතික වනෝද්‍යානයක් ඇතුළේ ජලාශයක් ගොඩ නඟන කොට ඒ ජාතික වනෝද්‍යානයට විය හැකි අහිතකර ප්‍රතිඵල වැළැක්වීම වෙනුවෙන් වාරි මාර්ග දෙපාර්තමේන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අතර ඇති වූ මේ අවබෝධතා ගිවිසුමෙන් ප්‍රධාන ලෙස අපේක්ෂා කළේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වාසි සහගත කරුණු ඇතුළත් කරන්නයි. එසේ කරන්නේ ජාතික වනෝද්‍යාන ආරක්ෂා කරන්නයි. හැබැයි දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් මව් ආර ජලාශයේ බෝට්ටු 50කට මාළු අල්ලන්න ඉඩ දීලා තිබෙනවා. අයිතිකරුවන් 50 දෙනකුට සහ සහායකයන් 150 දෙනකුට මේ ජලාශය ඇතුළේ මාළු අල්ලන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවාම ගරු ඇමතිතුමා කිව්වේ, "මේ ජලාශයේ ආක්‍රමණශීලි මාළුවන් ඉන්නවා, ඔවුන් ඇල්ලීම සඳහා අවසර ලබා දුන්නා"යි කියලායි. එතුමා කියනවා, "දැලට ඇස් තිබෙනවා. මේ ඇස් අනුව ආක්‍රමණික මාළු අල්ලන්න පුළුවන්" කියලා. එහෙම අල්ලන්න බැහැ. දැල් ඇස්වලින් අල්ලන්න පුළුවන් වන්නේ මාළුවාගේ සයිස් එක අනුව මිසක් වර්ගයට අනුව මාළු අල්ලන්න මේ රටේ දැල් හදලා නැහැ. එතකොට ජාතික වනෝද්‍යානය ඇතුළේ තිබෙන මව් ආර ජලාශයේ මාළු අල්ලන්න දුන්නේ කොහොමද? අවසර ලබා දුන්නේ කවුද? අපි දන්නවා, විශේෂයෙන්ම එවැනි කටයුත්තකට අවසර දෙනවා නම් ඒ සඳහා ජාතික වනෝද්‍යාන කළමනාකරණ සැලැස්මක් හදන්න ඕනෑය කියලා. ඒ සැලැස්ම සකස් කිරීම සඳහා වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තාක්ෂණ නිලධාරින්ගෙන් යුතු කමිටුවක් පත් කරන්න ඕනෑ. ඒ හදන ලද සැලැස්ම අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සහතික කරන්න ඕනෑ. ඉන් අනතුරුව තමයි, මෙවැනි ක්‍රියාදාමයකට මැදිහත් වන්න ඉඩ කඩ ලබා දෙන්නේ. නමුත් ඒ කිසිවක් නැතුව මාවිල් ආරු ජලාශය තමන්ගේ ඡන්ද බල ප්‍රදේශය තුළ තිබුණාම, උඩවලව ජාතික වනෝද්‍යානය තමන්ගේ ඡන්ද බල ප්‍රදේශයට ඇතුළත් වුණාම එහි තිබෙන ජලාශවල මාළු අල්ලන්න ඉඩ කඩ ලබා දීලා තිබෙනවා. ඒ අනුව අද උඩවලව ජාතික වනෝද්‍යානයත් තර්ජනයට ලක් වෙලා තිබෙනවා.

ඊළඟට වස්ගමුව, අංගම්මඩිල්ල, ගල්ඔය යන ප්‍රධාන ජාතික වනෝද්‍යාන තුනම ඇතුළේ අද මැණික් ගරන්න ඉඩ කඩ ලබා දීලා තිබෙනවා. අමාත්‍යවරු මැණික්වලට සම්බන්ධ වුණාම කැලෑ ඇතුළේ, වනෝද්‍යාන ඇතුළේ මැණික් ගරන්න දෙනවා. මේකද තත්ත්වය? කල්පනා කර බලන්න. පරිසරික තත්ත්වයන් පැත්තෙන් බැලුවත්, ස්වාභාවික සම්පත් පැත්තෙන් බැලුවත්, අනාගත පැවැත්ම පැත්තෙන් බැලුවත් මේ ජාතික වනෝද්‍යාන අපේ රටේ අතිශය වැදගත් ක්ෂේත්‍රයි. ඒ ක්ෂේත්‍රවල මැණික් මුදලාලි කෙනෙක් අමාත්‍යවරයකු වශයෙන් පත් වුණාම මොකක්ද වන්නේ? ඒවා ඇතුළේ මැණික් ගරන්න ඉඩ දෙනවා. එම නිසා වනජීවී අධ්‍යක්ෂ ජනරාල්තුමාගෙන් මා දැන ගන්න කැමැතියි, මැණික් ගරන අය අත් අඩංගුවට ගන්න නිලධාරින් යැව්වා ද කියලා. නිලධාරින්ට දීලා තිබෙන බලය මොකක්ද? මේ විධියට මැණික් ගරන්න දීලා නිලධාරින්ට ඇස් පියා ගෙන ඉන්න ඉඩ දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. වස්කඩුව ජාතික වනෝද්‍යානය ඇතුළෙන් තමයි අඹන් ගඟ ගලන්නේ. ඒ අඹන් ගඟේ වැලි ගොඩ දමන්න ඉඩ දීලා තිබෙනවා. දැන් ජාතික වනෝද්‍යාන ඇතුළේ පස් කපනවා; මාළු අල්ලනවා; වැලි ගොඩ දමනවා; මැණික් ගරනවා. මොකක්ද, මේ වෙලා තිබෙන්නේ? එම නිසා මේ කටයුතුවලට ඉඩ කඩ ලබා දුන්නේ ඇයි කියලා ගරු අමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට පිළිතුරක් ලබා දිය යුතුයි.

ඊළඟට මාදුරු ඔය ජාතික වනෝද්‍යානය ගැන බලමු. අද මාදුරු ඔය ජාතික වනෝද්‍යානය විශාල ලෙස හරක්ගහනයෙන් පිරිලායි තිබෙන්නේ. මේ කොහේ හරක්ද? මාදුරු ඔය ජාතික වනෝද්‍යානයෙන් ඒ හරක් අයින් කරන්න බැරි තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. හම්බන්තොට ප්‍රදේශයේ හරක් පට්ටි අයිතිකාරයන්ගේ හරක් තමයි ඒ. මහින්ද අමරවීර ඇමතිතුමා හොඳට දන්නවා, කාගේ හරක්ද කියලා. ඒ හරක් ටික ඔක්කොම ඇතුළු කරලා තිබෙන්නේ මාදුරු ඔය ජාතික වනෝද්‍යානයටයි. මේ කරුණු හේතු කොට ගෙන ඒ ජාතික වනෝද්‍යානය මුළුමනින්ම විනාශයට පත් වෙමින් තිබෙනවා. හම්බන්තොට හරක් ටික ඒ කැලයට යන කොට ඒක වළක්වන්න අමාත්‍යවරයාට කිසි බලයක් නැහැ. කල්පනා කරලා බලන්න.

ඊළඟට, කුමන සහ යාල හරහා මාර්ගයක් කැපුවා. මොකටද? කැබලිත්තට යන්න. කැබලිත්ත දේවාලයේ අමුතු සියඹලා පැළයක් තිබෙනවා ලු. ඒ සියඹලා පැළය ලොකු වන්නේ නැහැල්ලු. කතරගම දෙවියෝ ඇත්තටම වැඩ සිටියේ එතැන ලු. ඒක ඇත්ත හෝ බොරුව හෝ අපට කමක් නැහැ. ඒක වෙනම කථාවක්. "ඒ සියඹලා පැළය කවදාවත් ලොකු වන්නේ නැහැල්ලු. ඒකට මොකක් හෝ ලෙඩක් ඇති. ඒක බලන්න යන්න මොකක්ද කළේ? ඒක බලන්න යන්න කියලා ඩෝසර් දමා යාල වනෝද්‍යානයත්, කුමන අභයභූමියත් හරහා ලොකු පාරක් කැපුවා. ඒ නිසා අද අපේ රටේ ජාතික වනෝද්‍යාන විසි දෙකෙන් අටක්ම වර්තමාන ගරු අමාත්‍යතුමාගේ මැදිහත් වීම මත විශාල ලෙස විනාශයට පත් වෙමින් තිබෙනවා. ඒ පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරනවා.

[ගරු අනුර දිසානායක මහතා]

ඊළඟට, මා අවධානය යොමු කරන්න කැමැතියි, පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය කෙරෙහි. පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශයට "ලක්සල" අයිති වෙලා තිබෙනවා. ඒ කියන්නේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය කියන්නේ මේ රටේ පනතකින් ස්ථාපිත කරන ලද, මේ රටේ කුඩා හස්ත කර්මාන්තයේ යෙදෙන ශිල්පීන්ට තාක්ෂණික සහාය, ඔවුන්ට ප්‍රචාරණ සහාය ඔවුන්ගේ භාණ්ඩ අළෙවි කිරීම සඳහා පිහිටුවා තිබෙන වැදගත් ආයතනයක්. මේ ආයතනය ඉතිහාසයේ අපේ රටේ හස්ත කර්මාන්ත ශිල්පීන් වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කරන ලද ආයතනයක්. අද ඒ ආයතනයට මොකක්ද වෙලා තිබෙන්නේ? මා එකින් එක කියන්නම්. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයෙන් -ලක්සල ආයතනයෙන්- භාණ්ඩ ටෙන්ඩර් විධිවිධානවලින් බැහැරව රාජ්‍ය ආයතනවලට ලබා ගැනීම සඳහා කියා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ඒ කියන්නේ රාජ්‍ය ආයතනවලට භාණ්ඩ මිල දී ගන්නවා නම් ටෙන්ඩර් විධිවිධානවලින් තොරව ලක්සලින් ගන්න. හොඳයි නේ. රජයේ ආයතනයකින්ම රජයේ ආයතන මිල දී ගන්නවා. ඒ සඳහා දැමූ කැබිනට් මණ්ඩල පත්‍රිකාවේ අනුමැතිය මා ළඟ තිබෙනවා; අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංකය තිබෙනවා. "රාජ්‍ය ආයතන සඳහා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය මඟින් භාණ්ඩ මිලයට ගැනීමේ විධිවිධාන" යන මැයෙන් ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා ප්‍රවර්ධන ඇමතිතුමා 2006.01.30 වන දින සංදේශය ඉදිරිපත් කළා. "රාජ්‍ය ආයතන විසින් කාර්යාල උපකරණ වැනි භාණ්ඩ මිලයට ගැනීමේදී සංදේශය 1 ඇමුණුමේ සඳහන් භාණ්ඩ හා සේවා ටෙන්ඩර් කැඳවීමකින් හෝ මිල ගණන් කැඳවීමකින් තොරව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය මාර්ගයෙන් මිලයට ගැනීමට ප්‍රමුඛත්වය ලබා දිය හැකි බවට තීරණය කරන ලදී. කෙසේ වුවද අදාළ මිල ගණන් භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ඇතුළත් වන නිලධාරී කමිටුවක් විසින් නිශ්චය කළ යුතුය." ඕක තමයි කැබිනට් පත්‍රිකාව. මේ කැබිනට් පත්‍රිකාව අදාළ අමාත්‍යාංශවලට යවනවා, මෙන්න මෙහෙම කැබිනට් මණ්ඩලයේ අනුමැතියක් තිබෙනවාය කියලා. හැබැයි, එය යවන කොට මොකද කරන්නේ? කැබිනට් පත්‍රිකාවල වගන්තියක් මකනවා. තමුන්නාන්සේලා තීරණ අරගෙන මොකටද? මම ඒ කැබිනට් තීරණයත් **සභාගත*** කරනවා.

"කෙසේ වුවද අදාළ මිල ගණන් භාණ්ඩාගාරයේ නියෝජිතයකු ඇතුළත් නිලධාරී කමිටුවක් විසින් නිශ්චය කළ යුතුයි" කියන වගන්තිය අයින් කරනවා. වගන්තියක් අයින් කරන ලද කැබිනට් පත්‍රිකාවත් මා ළඟ තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙකට භාණ්ඩ ලැයිස්තුවක් අමුණනවා. මෙතැන ඒ භාණ්ඩ ලැයිස්තුව තිබෙනවා. එම භාණ්ඩ ලැයිස්තුවට අමතරව තවත් භාණ්ඩ ලැයිස්තුවක් එවනවා. විශේෂයෙන්ම ඉංජිනේරු ව්‍යාපෘති කියා එකක් දමනවා. දැන් ලක්සලට කොහෙන්ද ඉංජිනේරු ව්‍යාපෘති කියා එකක් එන්නේ? මේ ලක්සල නේ. ලක්සල කියන්නේ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ තාක්ෂණ ඥානය වැඩි කරන්න, ඔවුන්ගේ වෙළෙඳ ප්‍රවර්ධන වැඩ කටයුතු කරලා දෙන්න, ඔවුන්ට අළෙවි කිරීම සඳහා පහසුකම් සපයන්න සකස් කළ ආයතනයක් නේ. දැන් ඒ ආයතනයට ඉංජිනේරු ව්‍යාපෘති, ටෙන්ඩර් කැඳවීමකින් තොරව රාජ්‍ය ඒවා ගන්න පුළුවන්ය කියා කොන්දේසියක් දමා තිබෙනවා. මේක සම්පූර්ණයෙන්ම කැබිනට් පත්‍රිකාව විකෘති කරන ලද එකක්. ඒ අනුව මොකද කරන්නේ? ඒ කැබිනට් පත්‍රිකාව ගියාට පසු විශේෂයෙන්ම අනෙක් ආයතනවල ඉදිකිරීම් ගණනාවක් -රුපියල් මිලියන 380කට අධික රජයේ ප්‍රතිපාදන හා ලක්සල ගොඩනැඟිලි උකස් කර ඒ සමාන විශාල ප්‍රමාණයක්- ගන්නවා, දැන් මම දැන ගන්න කැමැතියි, ලක්සලට තිබෙනවා ද ඉදි කිරීම් ආයතනයක්? කරුණාකර, මේ පාර්ලිමේන්තුවට කියන්න. දැන් රජයේ ආයතනවලින් ටෙන්ඩර් ගන්නවා, ලක්සලට ඉදි කිරීම් ආයතනයක් තිබෙනවා. ඉදි කිරීමේ ආයතනයට ටෙන්ඩර් නැතුව දෙන්න කියලා ලක්සල ගන්නවා. මා ළඟ සියලු ගෙවීම් වාර්තා තිබෙනවා. මේ සියල්ල කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලක්සල ගත්තාට පසු මේ සියලු ඉදි කිරීම් කටයුතු පෞද්ගලික සමාගමක් වෙත ලබා දෙනවා. ලක්සලට ඉංජිනේරු අංශයක් නැහැ; එහෙම ඉදි කිරීම් අංශයක් නැහැ. එහෙම අංශයක් තිබෙනවාය කියා සම්මත කර ගෙන, රජයේ කොන්ත්‍රාත් අරගෙන ඊට පසුව කරන දේ තමයි, තමන් දන්නා පුද්ගලයෙකුට ලබා දෙන එක. මා ඒ සමාගමේ නම කියන්නම්. තමන් දන්නා, තමන්ට හිතවත් N.K. Construction (Pvt.) Limited කියන පෞද්ගලික සමාගමකට මේ සියල්ල ලබා දෙමින් තිබෙනවා. කරුණාකර ලක්සලේ සභාපතිතුමා හෝ නිලධාරි මණ්ඩලය මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පැහැදිලි කළ යුතුයි, තමන්ට ඉදි කිරීම් අංශයක් තිබෙනවා ද, ඒ ඉදි කිරීම් ගත්තේ කොහොමද කියන එක. පිට ඉදි කිරීම් පමණක් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක්සලේ ඉදි කිරීම් කටයුතුත් ගන්නවා.

ලක්සලේ ඉදි කිරීම් මේ ආයතනයෙන් කරනවායි කියලා කැබිනට් පත්‍රිකාවක් දමා තිබෙනවා. මා ළඟ තිබෙනවා, ඒ කැබිනට් පත්‍රිකාව. මේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ දයාශ්‍රිත තිසේරා අමාත්‍යතුමා. එතුමා දමපු කැබිනට් පත්‍රිකාවෙන් කෞතුකාගාර භූමිය තුළ ඉදි කිරීම් ගණනාවක් කිරීම වෙනුවෙන් කැබිනට් මණ්ඩලයෙන් අනුමැතියක් ලබා ගන්නවා. වැය වන මුදල රුපියල් මිලියන 220ක්. කැබිනට් මණ්ඩලයෙන් මේ අනුමැතිය ලබා ගන්න කොට විශේෂයෙන්ම ගරු මුදල් අමාත්‍යතුමා ඒකට නිර්දේශ දමනවා. ඒ නිර්දේශවල පැහැදිලිව මුදල් අමාත්‍යවරයා කියනවා, මෙම ඉදි කිරීම් කළ යුතු වන්නේ ලක්සලට අයිති ඉදි කිරීම් ආයතනයෙන්මය, ඒ ආයතනයෙන් හැර වෙන ඒවායෙන් කරන්නට බැරිය කියලා. එතකොට මොකද කරන්නේ? ගරු අමාත්‍යතුමා මේ කැබිනට් පත්‍රිකාව දමන කොට ලක්සල සතුව ඉදි කිරීම් අංශයක් තිබෙනවා කියලා කැබිනට් මණ්ඩලයට කියනවා. නමුත් එහෙම අංශයක් නැහැ. එහෙම අංශයක් තිබෙනවා කියලා තමයි මේ ඉදි කිරීම් ටික ගත්තේ. එහෙම අංශයක් තිබෙනවායි කියලා ඒ ඉදි කිරීම් ටික අරගෙන තමන්ට හිතවත්, තමන් දන්නා අර පරණ කොම්පැනියටම මේ සියල්ල ලබා දෙනවා. මේවා සිද්ධ වෙන්නේ කොහොමද කියා අපි දැන ගන්න කැමැතියි. කරුණාකර ඒ ඉදි කිරීම් අංශය පිළිබඳව කරුණු මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට ඕනෑ. ලක්සල සතුව එවැනි ඉදි කිරීම් අංශයක් තිබෙනවා ද කියන කරුණ ඉදිරිපත් කරන්නට ඕනෑ. මම ඒ කරුණු ටික ඉදිරිපත් කරන්නම්.

ඇමතිතුමාගේ කැබිනට් පත්‍රිකාවේ කියනවා, "එබැවින් මෙම ඉදි කිරීම් ලක්සල ආයතනය විසින්ම කඩිනමින්, එහෙත් ජාතික කෞතුකාගාරයේ අනන්‍යතාවට හානියක් නොවන ආකාරයට හා එහි ගෘහ නිර්මාණ ශිල්පයට ගැළපෙන ආකාරයෙන් සම්පූර්ණ කළ යුතුය" කියලා.

ඊළඟට කියනවා, "ඉහත පරිදි කටයුතු කිරීමේදී ප්‍රසම්පාදන කටයුතු පහසු කර ගැනීම සඳහා ලක්සල ඉංජිනේරු අංශය විසින්ම ඉදි කිරීම් කටයුතු සිදු කළ අතර, හැකිතාක් දුරට නියමිත පටිපාටිවලට සහ ප්‍රසම්පාදන පිළිවෙත්වලට අනුකූලවද, එහි විනිවිද භාවය පෙනෙන පරිදිද කටයුතු කර ඇත" කියලා. ලක්සල ආයතනයෙන්ම හදනවා කියලා කියනවා. ඒකට ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කරනවා. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණවලින් කියනවා,

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

"ප්‍රධාන ව්‍යාපෘතියට අයත් යෝජිත ව්‍යාපෘති 15 සඳහා සැලසුම් පිළියෙළ කිරීමේ කටයුතු හා ඉදි කිරීම් ඇස්තමේන්තු සකස් කිරීම ලක්සල ආයතනයේ ඉංජිනේරු අංශය විසින් අමාත්‍යාංශයේ සුපරීක්ෂණය යටතේ සිදු කිරීමට අනුමැතිය ලබා ගැනේ" කියලා.

මෙය ඉදි කිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ලක්සල ආයතනයේ ඉංජිනේරු අංශය විසින්ම සිදු කරන බව කියනවා. මෙම ඉඩමේ යෝජිත ඉදි කිරීම් සැලසුම් කිරීම, ඇස්තමේන්තු කිරීම ඇතුළු සියලු ඉදි කිරීම් කාර්යයන් ලක්සල ඉංජිනේරු අංශය වෙත පැවරීමට කර ඇති යෝජනාව සැලකිල්ලට ගන්නවා කියලාත් කියනවා.

දැන් අනුමැතිය දෙන්නේ මොකටද? ලක්සල සතුව ඉංජිනේරු අංශයක් තිබෙනවාය, ඒ ඉංජිනේරු අංශයෙන් හදනවාය කියලා තමයි මේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්නේ. ජනාධිපතිවරයාගේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නිරීක්ෂණවලිනුත් කියනවා, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ඒකට දෙන්න, කමක් නැහැ කියලා. නමුත් එහෙම ඉංජිනේරු අංශයක් නැහැ. ඉන් පසුව මොකක්ද වෙලා තිබෙන්නේ? එම කොන්ත්‍රාත් එක පැවරුවාට පසුව කෞතුකාගාරයේ කරන ලද කටයුතුවලට මුදල් ගෙවීම් කරන්නේ නවා ක්‍රිෂ්ණපිල්ලේ නමැති අයකුටයි. නවා ක්‍රිෂ්ණපිල්ලේ කියන්නේ මම කලින් සඳහන් කළ සමාගමේ අධ්‍යක්ෂවරයා. ඔහුට තමයි මේ මුදල් ඔක්කොම යවන්නේ. ඔහු දිගින් දිගටම Laksala Museum Gallery Café Project නමින් සල්ලි ඉල්ලා තිබෙනවා. Laksala Museum Gallery Café Project එකේ සියලුම සල්ලි ඉල්ලා තිබෙන්නේ නවා ක්‍රිෂ්ණපිල්ලේ කියන පුද්ගලයාට අයත් සමාගම. ඒ සමාගමට තමයි මේ සල්ලි දීලා තිබෙන්නේ. නමුත් කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය අරගෙන තිබෙන්නේ ලක්සල ඉංජිනේරු අංශයෙන් මේක කරනවා කියලායි. ඒ අනුව කැබිනට් මණ්ඩලයත් නොමඟ යවලා තිබෙනවා. නැති ආයතනයකට ඉදි කිරීම් ගන්නවා, ටෙන්ඩර් කැඳවීමකින් තොරව. ලක්සල ඒ විධියට ටෙන්ඩර් අරගෙන ඒ ටෙන්ඩර් ටික තමන්ගේ හිතවත් කොම්පැනියකට ලබා දෙනවා.

ඊළඟට, මම ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ අවධානය තවත් කාරණයක් කෙරෙහි යොමු කරන්නට කැමැතියි. සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයකට ගෙවීම් කරන්නේ කොහොමද? මා ළඟ තිබෙනවා, 2011 සැප්තැම්බර් 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛනය. එහි 2වන ඡේදයට අනුව, රජය සතු ආයතන අතුරින් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය "සී" ශ්‍රේණියේ ආයතනයක් ලෙස වර්ග කර තිබෙන බව කියනවා. මේ ආයතන මොන මොනවාටද අයිති කියලා ඔබතුමන්ලා වර්ගීකරණය කළා නේ. මම මේ කියන්නේ විගණකාධිපතිතුමාගේ වාර්තාවට අනුවයි. ඒ අනුව අදාළ ආයතනයන්ට පත් වන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට සහභාගි වීම වෙනුවෙන් ගෙවිය හැකි උපරිම දීමනාව රුපියල් 6,000ක් බව දක්වා තිබුණා. කෙසේ වෙතත් ඊට පටහැනිව ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට එක් වරකට රුපියල් 16,000 බැගින් වූ දීමනාවක් ගෙවා තිබුණා. දැන් අධ්‍යක්ෂ මණ්ඩල දීමනාව රුපියල් 16,000ක් දෙනවා. නමුත් "සී" ශ්‍රේණියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට ගෙවිය හැකිව තිබෙන්නේ රුපියල් 6,000ක දීමනාවක් පමණයි. ඒ ගණන තමයි තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලය විසින් දෙන ලද තීරණයට අනුව නිකුත් කරන ලද චක්‍රලේඛනයේ සඳහන් වන්නේ. නමුත් මේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට කැබිනට් තීරණ අදාළත් නැහැ, චක්‍ර ලේඛන අදාළත් නැහැ. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය මොකක්ද කරන්නේ? අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට එක් වරකට රුපියල් 16,000 බැගින් වූ අධ්‍යක්ෂ මණ්ඩල දීමනාවක් ගෙවනවා. 2012 වසරේදී රැස්වීම් වාර 09ක් පවත්වා අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ලෙස 1,105,000ක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත ගෙවා තිබෙනවා. ඒ අනුව චක්‍රලේඛනයට පටහැනිව වැඩිපුර ගෙවා තිබූ මුදල රුපියල් 793,000ක්. මේක කුඩා ආයතනයක්; සාමාන්‍ය මිනිසුන්ට හස්ත කර්මාන්ත ගැන තාක්ෂණය සහ දැනුම ලබා දෙන්න හදලා තිබෙන ආයතනයක්. ඒ ආයතනයයි මේ මුදල් නැති නාස්ති කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම ලක්සල ආයතනය තුළ සිදු වෙමින් තිබෙන දේ කල්පනා කරලා බලන්න. මා ළඟ විගණකාධිපතිතුමාගේ වාර්තාව තිබෙනවා. ඒ සියලු දීමනා ගත් අයගේ නාම ලේඛනයත් එහි සඳහන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට විගණකාධිපතිතුමාගේ තවත් වාර්තාවක් කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි.

විශේෂයෙන්ම මෙහි විගණනයට මොකද වෙලා තිබෙන්නේ? දැන් මේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට කටයුතු කරන්නේ, ජනාධිපති විමර්ශන ඒකකයේ කටයුතු කළ ප්‍රධානියායි. එතුමා තමයි දැන් මේ අමාත්‍යාංශයේ ලේකම්වරයා. එතකොට ඔහු ජනාධිපති විමර්ශන ඒකකයේ ලොක්කා හැටියට කටයුතු කළා. ඒ කියන්නේ අනෙක් රාජ්‍ය ආයතනවල සිදු වන වංචා, දූෂණ, ඇමතිවරුන්ගේ ක්‍රියා කලාපයන් විමර්ශනය කිරීම සඳහා ගොඩනඟන ලද ජනාධිපති විමර්ශන ඒකකයේ ලොක්කා හැටියට ඔහු කටයුතු කළා. එයාම තමයි දැන් මේ අමාත්‍යාංශයේ ලේකම්වරයා. මේ ලේකම්වරයා ගැන විගණකාධිපති දෙපාර්තමේන්තුව දැන් මොකක්ද කියන්නේ? "අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් .........හා 2011.12.02වැනි දිනැති ලිපිය මඟින් මුදල් අමාත්‍යාංශය කළමනාකරණ විගණන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දී ඇති නමුත් එවැනි සැලැස්මක් සකස් කළ බවට හෝ ක්‍රියාත්මක කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය." විගණනයට ඉදිරිපත් වන්නේ නැහැ. විගණනයෙන් ඉල්ලා සිටින කිසිදු ලේඛනයක් ලබා දෙන්නේ නැහැ. ජනාධිපති විමර්ශන ඒකකයේ යම් නිලධාරියෙක් කාර්යක්ෂමව වැඩ කළා නම්, ඔහුට අමාත්‍යාංශයක් ලැබුණාට පසුව ඔහු එහෙම කටයුතු කරන්න එපායැ. හැබැයි, අද සියලුම මූල්‍ය රෙගුලාසි උල්ලංඝනය කරමින් කටයුතු කරන තත්ත්වයක් තමයි පෙන්නුම් කර තිබෙන්නේ.

ඊළඟට, මා ඔබතුමාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි, විශේෂයෙන්ම දීමනා පිළිබඳව. සභාපතිතුමාට වැටුපක් ලැබෙනවා. ඊට අමතරව රජය පිළිගත් දීමනාවන් තිබෙනවා. ඒවා පමණයි ලබා ගත යුත්තේ. හැබැයි මේ දීමනාව කොහොමද? "ප්‍රධාන විධායක නිලධාරි දීමනා සඳහා වැටුප් සහ සේවක කොමිෂන් සභාවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි." දැන් ප්‍රධාන විධායක නිලධාරි කියලා ඒකෙනුත් යමක් ගන්නවා. ඊළඟට, "මණ්ඩලයේ මෙවැනි තනතුරක් නොමැති අතර, අලුතෙන් තනතුරක් ඇති කරන්නේ නම් ඒ සඳහා රාජ්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහ වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිසමේ අනුමැතිය ලබා ගත යුතුය." එහෙම කරලාත් නැහැ. ඊළඟට, "පීඊඩී/39 හා 2006 ඔක්තෝබර් මස 09වැනි දින රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව මණ්ඩලයේ සභාපතිවරයාට මසකට හිමි වනුයේ පෙට්‍රල් ලීටර් 180ක් හෝ ඩීසල් ලීටර් 235ක් වුවත් ඊට පටහැනිව 2011 පෙබරවාරි සිට ජූලි දක්වා මාසිකව රුපියල් 22,500ක් බැගින්ද, අගෝස්තු සිට දෙසැම්බර් දක්වා රියදුරු වැටුප සමඟ රුපියල් 50,000 බැගින්ද ගෙවීම් කර තිබුණි." මතක තබා ගන්න, මේක ගම්වල පොඩි පොඩි හස්ත කර්මාන්තවල යෙදී සිටින ශිල්පීන්ට සහන දෙන්න තිබෙන ආයතනයක්. මේ ආයතනවලට අරක් ගෙන සිටින මිනිස්සු ඒ ආයතනවල මුදල් රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් නාස්ති කරනවා නම් මොකක්ද

[ගරු අනුර දිසානායක මහතා]

මෙහි තිබෙන සාධාරණය? මේ පාර්ලිමේන්තුවේ මුදල් වෙන් කරන්නේ ඒ වෙනුවෙන්ද? ඊළඟට බලන්න, "අංක පීඊඅයි 000/6 හා 1998 ජූනි 03වැනි දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව සභාපතිවරයාගේ සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණ කරගත හැකි නමුත් ඊට පටහැනිව සභාපතිවරයාට 2011පෙබරවාරි මාසයේ සිට මැයි මාසය දක්වා මසකට රුපියල් 25,000 බැගින්ද,..." මේ සංග්‍රහ දීමනා සඳහා. ඔබතුමන්ලාට සංග්‍රහ දීමනා ලැබෙන්නේ කීයද? මම දන්නා විධියට අමාත්‍යවරයෙකුටත් සංග්‍රහ දීමනා ලැබෙන්නේ රුපියල් 7,500යි. [බාධා කිරීමක්] අමාත්‍යවරයෙකුට සංග්‍රහ දීමනා ලැබෙන්නේ රුපියල් 5,000යිලු. මෙතැන කීයක්ද? "2011 පෙබරවාරි මාසයේ සිට මැයි මාසය දක්වා මසකට රුපියල් 25,000ක් බැගින්ද, ජූනි සහ ජූලි මාසවල රුපියල් 50,000 බැගින්ද, අගෝස්තු සිට දෙසැම්බර් මාසය දක්වා මාසයකට රුපියල් 1,50,000 බැගින්ද, සමාලෝචිත වර්ෂයේ මුළු එකතුව රුපියල් 9,50,000ක සංග්‍රහ දීමනා ලෙස ගෙවීම් කර තිබුණි." එක අවුරුද්දකට රුපියල් 9,50,000ක සංග්‍රහ දීමනා ලබාගෙන තිබෙනවා. ආයතනවලට මොකක්ද මේ වෙන්නේ?

ඊළඟට බලන්න, "පීඊඩී/39 හා 2006 ඔක්තෝබර් මස 9වැනි දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයේ සභාපතිවරයාට වෙන් කළ වාහනයක් හිමි වන අතර ආයතනයේ එසේ වෙන් කළ වාහනයක් නොමැති නම් කුලී වාහනයකට හිමිකම් ඇති නමුත්, මාසික දීමනාවක් ලෙස 2011 වර්ෂයේ ජූනි සහ ජූලි මාසවල රුපියල් 1,00,035 බැගින්ද, 2011 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා රුපියල් 1,50,000 බැගින්ද එකතුව දස ලක්ෂ විසි දහසක දීමනාවක් සමාලෝචන වර්ෂය සඳහා ලබා දී තිබුණි." ඒ වාහනයක් වෙනුවෙන් ලබා ගෙන තිබෙන මුදලයි. වාහනය වෙනුවෙන් රුපියල් දස ලක්ෂ විසිදාහක් ලබා ගෙන තිබෙනවා. සංග්‍රහ වියදම්වලට රුපියල් 9,50,000ක් ලබාගෙන තිබෙනවා. මේක වරාය හා නාවික අමාත්‍යාංශය වැනි එකක් නම් කමක්වත් නැහැ. එහෙම නම් මොනවා හරි ලැබෙනවා නේ. ඒවා වුණත් හොඳ වැඩ නොවෙයි. එහෙම නැත්නම් එයාර් ලංකා ආයතනය වැනි ආයතන. ඒවා නම් කාලාම නැති වුණු ආයතන. ඒ වාගේ ආයතනත් නොවෙන මේ පොඩි ආයතන මොකක්ද මේ කරන්නේ? ඒ විතරක් නොවෙයි, සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාඩි වුණාටත් දීමනා ගන්නවා. සභාපතිවරයාට එහෙම අයිතියක් තිබෙනවා ද? සභාපතිවරයාගේ වග කීම තමයි අධ්‍යක්ෂ මණ්ඩලයේ වාඩි වන එක. ඒක තමයි එයාගේ ජොබ් එක. ඒකට දීමනා ගන්න බැහැ. හැබැයි මොකක්ද කර තිබෙන්නේ? "සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වීම වෙනුවෙන් දීමනා හිමි නොවන නමුත්, එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් වෙනුවෙන් රුපියල් 6,000 බැගින් ගෙවා තිබුණි." රුපියල් 6,000ක් බැගින් ලබාගෙන තිබෙනවා. මේක සාධාරණ ද? සභාපතිවරයාගේ කාර්ය තමයි අධ්‍යක්ෂ මණ්ඩලයේ වාඩි වන එක. ඒක නේ ඔහුට පැවරී තිබෙන රාජකාරිය. හැබැයි ඒ රාජකාරිය ඉටු කළාට වෙනම ගෙවීමක් ලබා ගන්නවා. එහෙම ගන්න බැහැ. ඒ විතරක් නොවෙයි, "හස්ත කර්මාන්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්විම සඳහා ලේකම් ලෙස කටයුතු කිරීම වෙනුවෙන් මණ්ඩලයේ කළමනාකරණ අධ්‍යක්ෂවරියට එක් රැස්වීමක් සඳහා රුපියල් 10,000 බැගින් සමාලෝචන වර්ෂය තුළ රුපියල් 60,000ක් ගෙවා තිබුණි." ඒ නිලධාරිනියගේ කාර්ය භාරය. හැබැයි, අතැන වාඩි වුණා කියලා වෙනම ගන්න, මෙතැන වාඩි වුණා කියලා වෙනම ගන්න බැහැ. එතකොට කොතැන වාඩි වුණාමද එතුමියට පඩිය ගෙවන්නේ? පඩිය ගෙවන්නේ ඒවා සඳහා තමයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. සාමාන්‍යයෙන් අපි දන්නා හැටියට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට භාණ්ඩාගාරයේ නියෝජිතවරියක් එනවා නේ. ඇයට දීමනාවක් ගෙවනවා ද? ඇයට දීමනාවක් ගෙවන්නේ නැහැ. නමුත් මේ ආයතනයේ ඒ සඳහාත් දීමනාවක් දෙනවා. මේ වාගේ කරුණු ගණනාවක් තිබෙනවා. තැනින් තැන තමයි මම මේ කරුණු ඉදිරිපත් කළේ. මේවා කුඩා ආයතන. මේවා මහා විශාල ආයතන නොවෙයි. අපේ රටේ ග්‍රාමීය මට්ටමින් කුඩා හස්ත කර්මාන්තවල යෙදෙන, කුඩා ශිල්පීය කර්මාන්තවල යෙදෙන අයට පහසුකම් සැපයීම වෙනුවෙන්, ඒ අයගේ ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන්, ඒ නිෂ්පාදනවල අළෙවි ප්‍රවර්ධනය වෙනුවෙන් සකස් කරලා තිබෙන කුඩා ආයතන. අඩුම තරමින් එම ආයතනවල මුදල්වත් යම් විගණනයකට යටත්ව, පාර්ලිමේන්තුවේ ක්‍රියාදාමයන්ට යටත්ව මෙහෙයවිය යුතුයි කියලා අපි හිතනවා.

ඊළඟට, මෙම ලක්සල ආයතනයේ ගොඩනැඟිල්ල උකස් තියලා ණයක් ලබාගෙන තිබෙනවා. ඒ කියන්නේ ගොඩනැඟිල්ල උකස් කරලා රුපියල් මිලියන 400ක බැංකු ණයක් ලබා ගත්තා. මම ගරු ඇමතිතුමාගෙන් ඒ ගැන දැන ගන්න කැමැතියි. ඇමතිතුමාත් දැන් මේ ගරු සභාවේ නැහැ වාගෙයි. ඒ වාගේම උකස් තියපු ගොඩනැඟිලි මොනවාද කියලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා නම් හොඳයි. ලක්සලට අයිති ගොඩනැඟිලි උකස් තියලා ණයක් ගත්තා. තම තමන්ට කැමැති ආකාරයට තම තමන්ගේ ආයතනවල ගොඩනැඟිලි උකස් තියලා ණය ගන්න රජයේ ආයතනවලට පුළුවන් ද? එතකොට කැබිනට් මණ්ඩලයක් මොකටද? මේ පාර්ලිමේන්තුව මොකටද? ඒ රුපියල් මිලියන 400 ණය ගත්තේ මොන ගොඩනැඟිලි උකස් තියලා ද; ඒ ණය මුදලට ගෙවනු ලබන පොලී අනුපාතය කවරේද; එසේ ලබා ගත් මුදල් බැර කරන ලද ගිණුම මොකක්ද; ඒ මුදල් වැය කළේ මොකටද කියලා මේ පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කළ යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ ලක්සල ආයතනයේ වැඩ කරපු සේවකයන් පිළිබඳව මම අවධානය යොමු කරවනවා. සාමාන්‍යයෙන් සේවකයන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යවන්න ක්‍රමවේද හදනවා. මීට කලින් වරායේ එහෙම ක්‍රමවේද හැදුවා; CTB එකේ හැදුවා. සේවකයන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමවේද හැදුවා. හැබැයි අපි දන්නා පරිදි එසේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමවේද හදන්නේ කැබිනට් මණ්ඩලයේ අනුමැතියකට යටත්වයි. එහෙම නැතිව ආයතනයකට විතරක් ඒක කරන්න බැහැ. ආයතනයකට පුළුවන් යෝජනාවක් ඉදිරිපත් කරන්න. මේ අය ස්වේච්ඡාවෙන් විශ්‍රාම යනවා, යන විට මෙන්න මේ වර්ගයේ දීමනා දෙනවා කියලා යෝජනාවක් ඉදිරිපත් කර ඒ සඳහා කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත යුතුයි. නමුත් මෙම ලක්සල ආයතනයේ සේවකයින් 55කට ආසන්න ප්‍රමාණයක් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගන්වලා තිබෙනවා. සමහර අය චෝදනා කරනවා, බලෙන් එහෙම කළා කියලා; බිය වද්දලා අත්සන් ගත්තා කියලා. නමුත් ඒ ඔවුන්ගේ ප්‍රකාශයි. ඒවා ඇත්ත ද නැත්ත ද කියලා අපි දන්නේ නැහැ. මේ විධියට

ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන තිබෙනවා ද? කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ගත්තේ කවදාද, ඒ අනුමැතිය අනුව ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීම සඳහා තෝරා ගන්නා ලද තනතුරු කවරේද, ඒ ගොල්ලන් විශ්‍රාම ගන්වනවා නම් ඒ ගොල්ලන්ට දෙන්න තීරණය කරන ලද දීමනා කවරේද කියා ගරු ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආයතනය පිළිබඳව මා ඊට වඩා වැඩිය සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

අපි ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාගේ අමාත්‍යාංශය වන ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පිළිබඳව කථා කළ යුතුයි. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා පිළිබඳව කථා කළොත්, භාෂාවන් සඳහා අසමානතාවෙන් සලකනවාය කියන එක වර්තමානයේ අපේ රටේ ජාතික ප්‍රශ්නය අරභයා මතු වී

තිබෙන විරසකභාවයන්, ගැටුම්, යුදමය තත්ත්වයන්වලට ප්‍රධාන සාධකයක් බවට පත් වෙලා තිබුණා. ඒ නිසා මේ අමාත්‍යාංශය විශාල කාර්ය භාරයක් පැවරෙන අමාත්‍යාංශයක් කියලා අපි හිතනවා. නමුත් අවාසනාවන්ත කරුණ තමයි "ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා" කියන එක නමට පමණක් තිබීම. නමින් ගත්තොත් මෙය අපේ රටේ වර්තමානයේ මුහුණ දී තිබෙන ගැටලුව සමනය කිරීම සඳහා විධිමත් යෝජනා සහ ක්‍රියා මාර්ග සකස් කිරීම සඳහා තිබෙන වැදගත් අමාත්‍යාංශයක්. හැබැයි ඒක වැදගත් අමාත්‍යාංශයක් වුණත් ඒ සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය, ඒ අමාත්‍යාංශය විසින් සකස් කරන ලද වැඩ පිළිවෙළවලට දෙන අනුග්‍රහය, කරන ලද යෝජනා සාර්ථක කර ගැනීම සඳහා ආණ්ඩුවක් හැටියට දක්වන සහයෝගය අතිශය ප්‍රමාණවත් නැහැ. ඉතාමත් අවම මට්ටමක තමයි ඒ මැදිහත් වීම තිබෙන්නේ. ඒ නිසා මේ අමාත්‍යාංශයට තිබෙන ලේබල් එක, මේ අමාත්‍යාංශයේ තිබෙන බෝඩ් එක දිහා බැලුවාම හැඟෙන දේ නොවෙයි අමාත්‍යාංශයේ ක්‍රියාකාරිත්වය ඇතුළේ තිබෙන්නේ. අමාත්‍යාංශය ඇතුළේ ක්‍රියාකාරිත්වය දිහා බැලුවොත් ඒ සඳහා අවශ්‍ය වන දායකත්වය සපයලා නැති බව තමයි පෙන්නුම් කරමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය ගැන කථා කළ යුතුයි. ඒක ගරු අගමැතිතුමාගේ අමාත්‍යාංශය. විශේෂයෙන්ම අපේ රටේ ප්‍රධාන ආගම් 4ක් තිබෙනවා. ඒ ආගම් හතරෙන්ම හික්මීමට ලක් කරන ලද සමාජයක් තිබෙනවා. ඒ සමාජය ඇතුළේ ගැටුම් අවම කර ගැනීමේදී ආගම්වලට විශාල කාර්ය භාරයක් තිබෙනවාය කියා අපි විශ්වාස කරනවා.

හැබැයි, අද අපේ රටේ මේ ආගම් ක්‍රියාත්මක වෙමින් තිබෙන්නේ ඒ ගැටලු සමනය කිරීමේ දිශාවට ද? ඉස්ලාම් භක්තිකයා සමඟ, හින්දු භක්තිකයා සමඟ බෞද්ධ ආගම අදහන්නා, කතෝලික ආගම අදහන්නා සමනය කිරීමේ දිශාවටද අද මේ අමාත්‍යාංශයේ කාර්ය භාරය ඉටු වෙමින් තිබෙන්නේ? අමාත්‍යාංශයට කවර දැක්මක් තිබුණත්, අමාත්‍යාංශය කවර කාර්ය භාරයක නිරත වෙනවාය කියලා බලාපොරොත්තුවක් තිබුණත්, අද අමාත්‍යාංශයෙන් පිටත බලවේග විසින් මෙම අමාත්‍යාංශයේ කාර්ය භාරය අත්පත් කොට ගෙන තිබෙනවා. මා දැක්කා, සමහර අවස්ථාවල සමහරු අමාත්‍යාංශයට කඩා පනිනවා. කොහෙන් බලයක් හම්බ වෙලාද ඒ?

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අමාත්‍යාංශයේ ලේකම්වරයා වාඩි කරවලා ඔහුගෙන් ප්‍රශ්න අහනවා. කවදාද එහෙම වුණේ? කොහෙන්ද එහෙම අවස්ථාවක් ලැබෙන්නේ? එහෙම නම් අමාත්‍යාංශයක් මොකටද? යම් යම් බලවේගවලට පුළුවන් වෙලා තිබෙනවා, බුද්ධ ශාසන අමාත්‍යාංශයට කඩා පැනලා, අමාත්‍යාංශයේ ප්‍රධාන ලේකම්වරයා වාඩි කරවලා, ඒ ලේකම්වරයාගෙන් ප්‍රශ්න අහන්න. එහෙම කරන්න කොහෙන්ද බලයක් හම්බ වෙලා තිබෙන්නේ? එහෙම ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? බෞද්ධාගමේ වේෂය පොරවා ගන්නා ලද කණ්ඩායමක් විසින් එක පැත්තකින් බෞද්ධාගම විනාශ කරමින් තිබෙනවා, අනෙක් පැත්තෙන් ජාතික සමඟිය විනාශ කරමින් තිබෙනවා, තවත් පැත්තකින් රටේ රාජ්‍ය ආයතනයකට තිබෙන පිළිගැනීම, ලේකම්වරයෙකුට තිබෙන පිළිගැනීම යන සියල්ල නැති කරමින් තිබෙනවා. ඒ අය අමාත්‍යාංශය ඇතුළට ගිහිල්ලා කියනවා, "මේක ගෝඨාභය රාජපක්ෂට භාර දෙන්න ඕනෑ. මේක මේ අයගේ අතේ තියලා හරි යන්නේ නැහැ. මේක ආරක්ෂක ලේකම්වරයාට දුන්නොත් තමයි හරියට ක්‍රියාත්මක කරන්න පුළුවන්." කියලා. එහෙම කියන්න කවුද ඒ ගොල්ලන්? ඒ ගොල්ලන්ට එහෙම යෝජනාවක් තිබෙනවා නම් ඒක ජනාධිපතිවරයාට කියන්න පුළුවන්. ඒකට අමාත්‍යාංශ ලේකම්වරයාට බලපෑම් කරලා හරියනවා ද? ඒ නිසා අද බෞද්ධාගම මුවාවෙන් මේ ක්‍රියාත්මක වෙමින් තිබෙන බලවේගවල ක්‍රියාකාරිත්වය රට ඇතුළේ ජාතික ව්‍යසනයක්, ජාතික ගැටුමක් නිර්මාණය කිරීම දක්වා වර්ධනය වෙමින් තිබෙනවා. එය පාලනය කිරීම සඳහා, එය යම් ප්‍රමාණයකට සමනය කිරීම සඳහා ගරු අමාත්‍යතුමාට කාර්යභාරයක් තිබෙනවාය කියලා විශ්වාස කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
The next speaker is the Hon. DEW Gunasekara. You have 13 minutes.

[අ.භා. 1.06]

**ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසු ගිය වර්ෂයේ අය වැය කාරක සභා අවස්ථාවේදී මා මේ ගරු සභාවට දන්වා සිටියා, අප අමාත්‍යාංශය විසින් සම්පාදනය කරන ලද මානව සම්පත් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියේ වැඩ කටයුතු අවසාන කරමින් තිබෙනවා කියලා. ඒ ප්‍රතිපත්තිය දැනට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගෙන තිබෙන බව ප්‍රථමයෙන්ම දන්වා සිටින්න කැමැතියි. ඒ අනුමැතිය ලබා ගන්නා අවස්ථාවේදී අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් පරිදි අපි ඒ සඳහා වන සැලැස්මක් - Master Plan එකක් - සකස් කළා. දැන් එය සකස් කරලා අවසාන වෙලා තිබෙනවා. මම බලාපොරොත්තු වෙනවා, ලබන මාසයේ මුල් සතිය වෙන කොට ඒ ක්‍රියාකාරී සැලැස්ම කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන්න.

මා මේ ගරු සභාවට දන්වන්න කැමැතියි, නිදහසින් පස්සේ අපේ රටට මානව සම්පත් පිළිබඳ ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ කියන කාරණාව. බොහෝ රටවල එවැනි ප්‍රතිපත්තියක් තිබෙනවා. අපි පළමුවැනි වතාවට රටට අවශ්‍ය වන මානව සම්පත් ප්‍රතිපත්තියක් සකස් කරලා, දැන් ඒක අනුමත කරගෙන තිබෙනවා. මම බලාපොරොත්තු වෙනවා, කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් පස්සේ එය මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න. අන් කවරදාටත් වඩා අද එය අවශ්‍යවන ප්‍රතිපත්තියක්.

නිදහසින් පස්සේ මෙතෙක් කල් අපි ඒ ඒ අමාත්‍යාංශවලට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළා. ඒවා ස්වාධීනව ක්‍රියාත්මක කරපු දේවල්. එහෙම නැතුව, සියලුම ප්‍රතිපත්ති ආවරණය වන ආකාරයේ පරිපූර්ණ ප්‍රතිපත්තියක් අපට තිබුණේ නැහැ. අද අපේ රටේ ආර්ථිකය තිබෙන මට්ටම අරගෙන බලනකොටත්, ලෝක ආර්ථිකය ගෝලීයකරණය වෙන වේගය අරගෙන බලනකොටත් තවදුරටත් එහෙම ප්‍රතිපත්තියක් නැතුව කටයුතු කිරීමට අපට පුළුවන්කමක් ඇත්තේ නැහැ. ඒ නිසා තමයි අමාත්‍ය මණ්ඩලයේ

[ගරු ඩිව් ගුණසේකර මහතා]

උපදෙස් පරිදි අපි මෙවැනි ප්‍රතිපත්තියක් සකස් කළේ. දැන් ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙළ සකස් කරලා, අදාළ අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා.

මම මේ ගරු සභාවට මේ කාරණය දන්වන්න කැමැතියි. අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තාම ප්‍රාථමික අධ්‍යාපනය, ද්විතීයික අධ්‍යාපනය, තෘතීය අධ්‍යාපනය තිබෙනවා. ඊ ළඟට නිපුණතා සංවර්ධනය පිළිබඳ කාරණාව තිබෙනවා. ඒ වාගේම ඵලදායකත්වය, රාජ්‍ය සේවාව ප්‍රතිසංස්කරණය කිරීමට ලක් කිරීම, ඒ මානව සම්පත් සංවර්ධනය කිරීම සිදු කළ යුතු වෙනවා.

ඒ වාගේම විදේශ රැකියා පිළිබඳව අලුතින් සිතා බැලීමට අවශ්‍ය වෙනවා. අපි ලෝක ආර්ථිකයේ තිබෙන ඉල්ලුමට අනුව සැපයීමක් කිරීම අවශ්‍යයි. ගම්බද කාන්තාවන් සියයට 70ක්, 80ක් පමණ විදේශ රැකියාවලට යවනවා වෙනුවට, ඊට වඩා උගත් අය, නිපුණත්වයක් තිබෙන අය පිට රට රැකියාවලට යවලා, අපට දැනට ලැබෙන බිලියන හතකට ආසන්න විදේශ විනිමය ප්‍රමාණය දෙගුණයක් කරගන්න පුළුවන් ආකාරයේ අංග සම්පූර්ණ වැඩ පිළිවෙළක් තමයි මේ ප්‍රතිපත්තිය තුළින් අප ඉදිරිපත් කර තිබෙන්නේ. ඉදිරි කාලයේදී අදාළ අමාත්‍යාංශ හරහා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අප බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීන් පෙර අප එක් එක් අමාත්‍යාංශවලට එක් එක් විෂයයන් වෙන් කළා. අධ්‍යාපන අමාත්‍යතුමා අධ්‍යාපනය, නැත්නම් ප්‍රාථමික අධ්‍යාපනය වෙනුවෙන් කටයුතු කළා. උසස් අධ්‍යාපන ඇමතිතුමා උසස් අධ්‍යාපන වෙනුවෙන් කටයුතු කළා. දැන් ඒ සියල්ලම ආවරණය වන, එකින් එක සම්බන්ධ වන පරිපූර්ණ වැඩ පිළිවෙළක් අප ක්‍රියාත්මක කරනවා.

ලක්ෂ හතරකට ආසන්න දරුවන් ප්‍රමාණයක් අද පාසල්වල්වලට ඇතුළු වෙනවා. පාසලක පළමුවෙනි පන්තියට ඇතුළු වීමේ සිට විශ්වවිද්‍යාලයෙන් පිට වීම දක්වා කාලය තුළ යම් දරුවන් ප්‍රමාණයක් අතරමඟ හැළෙනවා. අටේ පන්තිය වන විට දරුවන් කොටසක් අධ්‍යාපනයෙන් හැළෙනවා. GCE (O/L) Exam එකේදි තව දරුවන් කොටසක් අධ්‍යාපනයෙන් හැළෙනවා. GCE (A/L) Exam එකේදී තවත් දරුවන් කොටසක් හැළෙනවා. විශ්වවිද්‍යාලයට යන්නේ දරුවන් 25,000යි. අනික් සියලුම දෙනා අතරමඟ එක් එක් තැන්වලදී අධ්‍යාපනයෙන් හැළෙනවා. මේ හැළෙන අය ඔක්කොම එකතු වන්නේ අවිධිමත් ආර්ථිකයට. සමහර කොටස් රජයේ සේවාවට, නැත්නම් පෞද්ගලික අංශයේ රැකියාවලට සම්බන්ධ වෙලා විධිමත් ආර්ථිකයට එකතු වෙනවා.

අද අපේ ආර්ථිකය විධිමත් හා අවිධිමත් වශයෙන් දෙකට බෙදා තිබෙනවා. විධිමත් ආර්ථිකයට අයත් වන රාජ්‍ය අංශයත්, පෞද්ගලික අංශයත් සලකා බලමු. ඇත්ත වශයෙන්ම මේ පෞද්ගලික අංශය යටතට එන අවිධිමත් ආර්ථිකය වෙනම ගත්තොත්, එහි තමයි අපේ ශ්‍රමිකයන්ගෙන් සියයට 62ක් ඉන්නේ. මෙතෙක් කල් රජයේ අවධානයවත්, සමාජයේ අවධානයවත් මේ අවිධිමත් ආර්ථිකය කෙරෙහි හරියට යොමු වුණේ නැහැ. පදික වේදිකාවේ වෙළඳාම් කරන සාමාන්‍ය පුද්ගලයා, කඩයක තේ හදන පුද්ගලයා, සාප්පුවක වැඩ කරන පුද්ගලයා, අක්කර කාලක, භාගයක අයිතිකරුවන් දක්වා වූ මෙවැනි විශාල පිරිසක් අද සමාජයේ ඉන්නවා. ඔවුන්ට ක්‍රය ශක්තියක් නැහැ. ඔවුන්ට හෙට්ටු කිරීමේ ශක්තියක් නැහැ. ඔවුන්ට pension එකක් නැහැ. ඔවුන්ට අර්ථ සාධකයක් නැහැ. ඔවුන්ට වැඩ කරන්න බැරි වුණු දවසට ඔවුන් ගැන හොයා බලා ගැනීමේ වැඩ පිළිවෙළක් නැහැ. මේ විශාල පිරිසට සමාජයේ අවධානය අඩුවෙන් තමයි යොමු වෙලා තිබෙන්නේ.

පළමුවෙනි වතාවට අප ඒ කරුණ ප්‍රතිපත්තියකට අරගෙන ඇමති මණ්ඩලයෙන් අනුමත කරලා, ඒ ප්‍රතිපත්තිය රට හමුවේ තබනවා. ඒ සැලැස්මත්, ප්‍රතිපත්තියත් දෙකම ලබන මාසය වන විට මා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. මේ අය වැයෙන් ඒ කාරණා යම් ප්‍රමාණයකට සැලකිල්ලට ගැනීම පිළිබඳව මා සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම මෙවර අය වැයෙන් මේ අවිධිමත් ආර්ථිකයේ සංවර්ධනයට එක් එක් අමාත්‍යාංශ හරහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒක එක කාරණයක්. මෙය අපේ ගරු සභාවේ අවධානය යොමු කළ යුතු කාරණාවක්.

අපේ රටේ ශ්‍රම බල කායෙන් කොයි තරම් පිරිසක් විධිමත් ආර්ථිකයේ ඉන්නවා ද, කොයි තරම් පිරිසක් අවිධිමත් ආර්ථිකයේ ඉන්නවා ද කියලා අපි ඊළඟට බලමු. සමස්තයක් ලෙස බැලුවොත්, පාසලට ඇතුළු වීමේ සිට විශ්වවිද්‍යාලයෙන් පිට වීම දක්වා වන සමස්ත ශ්‍රම බල කායටම දැනුම හා හැකියාව සම්පාදනය කිරීමේ වැඩ පිළිවෙළක් තමයි මේ තිබෙන්නේ. එහෙම නැතිව, අපේ ආර්ථිකය නිදැල්ලේ යන ආර්ථිකයක් විධියට සකස් කරන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. මෙය ඇත්තටම කළ යුතුව තිබෙන්නේ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයකින්. අද ක්‍රම සම්පාදන අමාත්‍යාංශය කියලා එකක් නැහැ. ඒක නමින් තිබෙන්නේ. අද ඒක මුදල් අමාත්‍යාංශය. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය කියලා තිබෙන්නේ. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය වශයෙන් තිබුණු එකත් අද නැහැ. ඒ තිබුණු යම් සැලසුම් අද නැහැ. අපට දස අවුරුදු සැලැස්ම කියලා එකක් තිබුණා. ඒක අතරමඟ නැවතුණා. සය අවුරුදු වැඩසටහන් තිබුණා. ඒවාත් අතරමඟ නැවතුණා. එහෙම දීර්ඝ කාලීන දැක්මක් ඇතිව බලලා ආර්ථිකය මෙහෙය වන තත්ත්වයන් තිබුණේ නැහැ. ඒ නිසා තමයි අප 2006 සිට ඒ ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළවල්, ප්‍රතිපත්ති සියල්ලක්ම මහින්ද චින්තයට අනුකූලව අලුත් වැඩසටහන් සේ ක්‍රියාත්මක කරන්නේ. මෙය අංග සම්පූර්ණ, පරිපූර්ණ සැලැස්මක් යටතේ ක්‍රියාත්මක කර ගෙන යනවා.

අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනිකුත් අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධ වෙලා මනා සම්බන්ධීකරණයකින් මේ වැඩ කටයුතු කරගෙන යන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ සැලසුම ක්‍රියාත්මක කරන කොට තමයි අප හමුවේ තිබෙන අභියෝග අපට විශේෂයෙන් මතක් වන්නේ. අද අපේ රටේ අධ්‍යාපන මට්ටම අඩුයි කියලා චෝදනාවක් තිබෙනවා; විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුවක් තමයි, ගුරුවරුන් හිඟකමේ ගැටලුව. දක්ෂ ගුරුවරු ඇත්තේ නැහැ. ගුරුවරුන්ට නිසි පුහුණුවීම් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මානව සම්පත් සංවර්ධනය අද අතිශය ඉහළම ප්‍රමුඛත්වය සහිත ජාතික ප්‍රතිපත්තියක් වෙන්න ඕනෑ. නිදහසින් පස්සේ අපට ස්වාභාවික සම්පත් ප්‍රමුඛව තිබුණා. පසු ගිය අවුරුදු 6දී අප ලොකුම අවධානයක් යොමු කළේ භෞතික සම්පත්වලට; යටිතල පහසුකම්වලට. නමුත් අද අන් කවරදාටත් වඩා විද්‍යාව හා තාක්ෂණය දියුණු වෙනවා. ගරු තිස්ස විතාරණ ඇමතිතුමා නිරන්තරයෙන්ම, අවධාරණයෙන් කියන කාරණාවක් තමයි, "ගෝලීයකරණය වන ආර්ථිකයක් තියෙද්දී විද්‍යාව හා තාක්ෂණය මුළු ලොවම මවිත කරන ආකාරයට වෙනස් කරන තත්ත්ව යටතේ පැරැණි ආකාරයට කල්පනා කරන්න අපට පුළුවන්කමක් නැහැ, අලුත් ආකාරයට ආර්ථිකය මෙහෙයවීම අවශ්‍යයි." කියන එක. මානව සම්පත් සංවර්ධනය කිරීම තමයි ආර්ථිකයේ ඉහළම ප්‍රමුඛත්වය විය යුත්තේ. ඒ නිසා වැඩිපුර මුදල් වෙන් කරන්න ඕනෑත් ඒකටයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රාථමික පාසල්, තට්ටු හයේ හතේ ගොඩනැඟිලි හදනවාට මම නම් විරුද්ධයි. අපේ ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමාට මම පෞද්ගලිකවත් කිව්වා, එය තවත් අවුරුදු 10කට කල් දැම්මත් කමක් නැහැ කියලා. අවශ්‍ය වන්නේ ඒ සල්ලි ප්‍රමාණය යොදවා මානව සම්පත සංවර්ධනය

කිරීමයි; අපට අවශ්‍ය ගුරුවරුන් පුහුණු කිරීමයි; පොත් පත් අරගෙන දීමයි; libraries, විද්‍යාගාර ලබා දීමයි. අපි යටිතල පහසුකම්, එහෙම නැත්නම් භෞතික සම්පත් විශාල වශයෙන් දියුණු කරනවා. නමුත් මානව සම්පත් සංවර්ධනය සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය ඉතාම අඩුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ ආර්ථිකය ප්‍රාථමික මැද පන්තියේ ආර්ථිකයක තත්ත්වයකට පත් වී තිබෙන අවස්ථාවක් මෙය. අපේ රට සියයට 95ක සාක්ෂරතාවක් තිබෙන රටක්. ආසියාවේ රටවල් අතර අපි තමයි ඉහළම මට්ටමේ ඉන්නේ. පාසලෙන්, විශ්වවිද්‍යාලයෙන් පිට වන අයට රැකියා සම්පාදනය කරන්න බැහැ, අලුත් මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් අනුව ඒ සඳහා අතිවිශාල මුදලක් වෙන් කරන්නේ නැතිව. ඒ දෙස බලලා තමයි අපි මුදල් වෙන් කරන්න ඕනෑ. මේ පිළිබඳව භාණ්ඩාගාරය දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. භාණ්ඩාගාරය මේ ප්‍රශ්නය පිළිබඳව අවධානය යොමු කරනවා කියලා මම නම් හිතන්නේ නැහැ. මම ඒ ගැන සන්තෝෂයට පත් වන්නේ නැහැ. මම බලාපොරොත්තු වනවා විශේෂයෙන් මුදල් ඇමතිවරයා වන අතිගරු ජනාධිපතිතුමාගේ අවධානය මානව සම්පත් සංවර්ධනය කිරීම පිළිබඳව යොමු කරවන්න. මානව සම්පත් සංවර්ධනය කිරීම පිළිබඳ ඉහළම ප්‍රමුඛත්වය දෙන්න ඕනෑ; එය ප්‍රතිපත්තියක් කර ගන්න ඕනෑ. මේ කාරණා ඇමති මණ්ඩලයේදී ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. මේ ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, විශේෂයෙන් පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳ විවාදයක් ඇති කිරීමට මම උත්සාහ ගන්නවා. එහිදී විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් කියන දෙකෙහිම අදහස් ලබා ගැනීමට මම අපේක්ෂා කරනවා. අපේ රටේ ආර්ථිකය මෙහෙයවන ආකාරය පිළිබඳ යම් දැක්මක්, දැනුමක් ඇතිව ඒ දිශාව හරියට පෙනෙන ආකාරයට කටයුතු කරන්න ඕනෑ. එහෙම නැත්නම්, අවුරුද්දකට පාසල්වලට ඇතුළු වන සහ පිට වන විශාල පිරිසට -ලක්ෂ 4ක් පමණ වන පිරිසට- රැකියා සම්පාදනය කරන්න අපට පුළුවන් වන්නේ නැහැ. ලෝක ආර්ථිකයත්, ජාතික ආර්ථිකයත් කියන දෙකෙහිම අවශ්‍යතා සපුරාලීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම අවශ්‍යයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

The next speaker is the Hon. Vinayagamoorthi Muralidaran. You have 10 minutes.

[பி.ப. 1.17]

**ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා (නැවත පදිංචිකිරීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன் - மீள்குடியேற்ற பிரதி அமைச்சர்)
(The Hon. Vinayagamoorthi Muralidaran - Deputy Minister of Resettlement)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, மீள்குடியேற்ற அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். எங்களுடைய மீள்குடியேற்ற அமைச்சானது தனது பணியினை இதுவரையில் சிறந்த முறையில் மேற்கொண்டு வந்திருக்கின்றது என்றுதான் நான் நினைக்கின்றேன். கடந்த 30 வருட காலத்தில் இடம்பெயர்ந்த மக்களை மீளக்குடியேற்றுகின்ற பணியில் நாங்கள் ஈடுபட்டிருக்கின்றோம். இது தொடர்பான பிழையான புள்ளிவிபரங்களை அடிப்படையாகக்கொண்டு, இங்கு பலராலும் பல கருத்துக்கள் முன்வைக்கப்பட்டன. ஆகவே, அது தொடர்பான சரியான தகவல்களைப் புள்ளிவிபர ரீதியில் இங்கு நான் குறிப்பிட விரும்புகின்றேன்.

யுத்தத்துக்குப் பிற்பாடு மீள்குடியேற்றப்பட்டவர்களின் எண்ணிக்கையைப் பொறுத்தவரையில், கிழக்கு மாகாணத்தில் அம்பாறை மாவட்டத்தில் 337 குடும்பங்களைச் சேர்ந்த 1,175 பேரும், மட்டக்களப்பு மாவட்டத்தில் 37,273 குடும்பங்களைச் சேர்ந்த 126,766 பேரும், திருகோணமலை மாவட்டத்தில் 35,377 குடும்பங்களைச் சேர்ந்த 129,097 பேரும் மீள்குடியேற்றம் செய்யப்பட்டிருக்கின்றார்கள். அந்தவகையில், கிழக்கு மாகாணத்தில் மொத்தமாக 72,987 குடும்பங்களைச் சேர்ந்த 257,038 பேர் மீள்குடியேற்றப்பட்டிருக்கின்றார்கள்.

வட மாகாணத்தைப் பொறுத்தவரையில், யாழ். மாவட்டத்தில் 31,188 குடும்பங்களைச் சேர்ந்த 95,052 பேரும் மன்னார் மாவட்டத்தில் 24,022 குடும்பங்களைச் சேர்ந்த 90,957 பேரும் வவுனியா மாவட்டத்தில் 15,981 குடும்பங்களைச் சேர்ந்த 54,540 பேரும் முல்லைத்தீவு மாவட்டத்தில் 39,660 குடும்பங்களைச் சேர்ந்த 127,092 பேரும் கிளிநொச்சி மாவட்டத்தில் 40,594 குடும்பங்களைச் சேர்ந்த 131,116 பேரும் மீள்குடியேற்றம் செய்யப்பட்டிருக்கின்றார்கள். வட மாகாணத்தில் மொத்தமாக 151,445 குடும்பங்களைச் சேர்ந்த 500,757 பேர் மீள்குடியேற்றப்பட்டிருக்கின்றார்கள். இதுவரை ஒட்டுமொத்தமாக 224,432 குடும்பங்களைச் சேர்ந்த 757,795 பேர் மீள்குடியேற்றப்பட்டிருக்கின்றனர்.

இனிவரும் காலங்களில் மீள்குடியேற்றப்பட வேண்டியவர்களின் எண்ணிக்கையைப் பொறுத்தமட்டில், யாழ். மாவட்டத்தில் 1,228 குடும்பங்களைச் சேர்ந்த 4,410 பேர் முகாம்களில் வாழ்கின்ற அதேவேளை, 4,650 குடும்பங்களைச் சேர்ந்த 15,355 பேர் நண்பர்கள் மற்றும் உறவினர்களுடைய வீடுகளில் தங்கி வாழ்கின்றார்கள். கிளிநொச்சி மாவட்டத்தில் முகாம்களில் எவரும் இல்லை. எனினும், 374 குடும்பங்களைச் சேர்ந்த 1,140 பேர், நண்பர்கள் மற்றும் உறவினர்களுடைய வீடுகளில் தங்கி வாழ்கின்றார்கள். அவ்வாறே, திருகோணமலை மாவட்டத்தில் குறிப்பாக, மூதூர் பிரதேசத்தில் 281 குடும்பங்களைச் சேர்ந்த 871 பேர் முகாம்களில் வாழ்கின்ற அதேவேளை, 561 குடும்பங்களைச் சேர்ந்த 1,792 பேர் நண்பர்கள் மற்றும் உறவினர்களுடைய வீடுகளில் தங்கி வாழ்கின்றார்கள். மொத்தமாக 7,094 குடும்பங்களைச் சேர்ந்த 23,568 பேரை மீள்குடியேற்ற வேண்டும். இவை மிக அண்மையில் பெறப்பட்ட சரியான தரவுகளாகும். அந்த வகையில் நாங்கள் கிட்டத்தட்ட 98 வீதமான மக்களை மீள்குடியேற்றம் செய்திருக்கின்றோம்.

அதுமாத்திரமல்ல, அவர்களுக்கு அங்கு பல வசதிகள் செய்து கொடுக்கப்பட்டிருக்கின்றன. யுத்தத்தினால் கிட்டத்தட்ட 147,367 வீடுகள் முற்றுமுழுதாகச் சேதமடைந்திருந்தன. 39,794 வீடுகள் பகுதியாகச் சேதமடைந்திருந்தன. இவ்வளவு வீடுகளையும் கட்டிக்கொடுக்க வேண்டிய தேவை இருந்தது. முற்றாகச் சேதமடைந்த வீடுகளிலே 45,885 வீடுகள் கட்டிக்கொடுக்கப்பட்டிருக்கின்றன; 19,943 வீடுகள் கட்டப்பட்டுக்கொண்டிருக்கின்றன. பகுதியாகச் சேதமடைந்த வீடுகளிலே 10,700 வீடுகள் திருத்திக் கொடுக்கப்பட்டிருக்கின்றன; 890 வீடுகள் திருத்தப்பட்டுக்கொண்டிருக்கின்றன. இவை எங்களுடைய அரசாங்கத்தினாலும் அரச சார்பற்ற நிறுவனங்களாலும் இந்திய அரசாங்கத்தினாலும் மேற்கொள்ளப்பட்டு வருகின்ற நிர்மாணப் பணிகளாகும். மேலும், முற்றாகச் சேதமடைந்த வீடுகளில் 14,169 வீடுகளைக் கட்டுவதற்கும் பகுதியாகச் சேதமடைந்த வீடுகளில் 4,136 வீடுகளைத் திருத்துவதற்கும் ஏற்கெனவே திட்டமிடப்பட்டிருக்கிறது. எனவே, கட்டுவதற்கு எஞ்சியிருக்கின்ற வீடுகள் 67,370 ஆகும். திருத்தம் செய்யப்படவேண்டிய வீடுகள் 24,068 ஆகும். இதற்குரிய நிதிகளை இணை அமைச்சுக்களூடாகப் பெற்று இவற்றைச் செய்வதற்கான திட்டங்களை நாங்கள் தீட்டியிருக்கின்றோம்.

[ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා]

பொதுவாக மீள்குடியேற்றம் என்பது பற்றி உங்களுக்குத் தெரியும். எங்களுடைய அமைச்சால் மாத்திரம் அப்பணிகளைச் செய்ய முடியாது. மக்கள் இடம்பெயர்கின்றபோது அவர்களை முகாமில் வைத்துப் பராமரித்து, பின்னர் உரிய இடங்களில் தற்காலிக கூடாரங்களை அமைத்து அவர்களைத் தங்க வைப்பதே எங்களுடைய பணியாகும். அதன் பிற்பாடு, line Ministries என்று சொல்லப்படுகின்ற இணை அமைச்சுக் களைத் தொடர்புகொண்டு தேவையான கட்டுமானப் பணிகள், மின்சார விநியோகம், குடிநீர் விநியோகம், சுகாதார வசதிகள் என்பவற்றை ஏற்படுத்த வேண்டிய தேவைகள் எங்களுக்கு இருக்கின்றன. உண்மையில் நான் அந்த அமைச்சுக்களுக்கு நன்றி கூற வேண்டும். ஏனெனில் அந்த அமைச்சுக்கள் சிறந்த முறையில் எமக்குப் பூரண ஒத்துழைப்பைத் தந்துகொண்டிருக் கின்றன

நான் இன்னுமொரு விடயத்தை உங்களுக்குக் கூற வேண்டும். கடந்த வருடம் 1663 toilets - கழிவறைகளைக் கட்டிக்கொடுத்திருக்கிறோம். குறிப்பாக மட்டக்களப்பு மாவட்டத்திலே 400 கழிவறைகள் கட்டப்பட்டுள்ளன. ஏனைய மாவட்டங்களில் எஞ்சியவை கட்டப்பட்டுள்ளன. வருகிற வருடத்தில் நாங்கள் 2500 கழிவறைகளைக் கட்டிக் கொடுப்ப தற்குத் திட்டமிட்டிருக்கின்றோம். இதனை நாங்கள் மீள்குடியேற்ற அமைச்சினூடாக நேரடியாகச் செய்து கொடுப்பதற்குத் தீர்மானித்திருக்கின்றோம்.

இராணுவக் கட்டுப்பாட்டிலிருக்கும் சில பிரதேசங்களை விடுவிப்பது சம்பந்தமாக நாங்கள் இராணுவத் தளபதியுடனும் மேதகு ஜனாதிபதி அவர்களுடனும் கதைத்து, அப்பிரதேசங் களில் மக்களை மீள்குடியேற்றுவதற்குத் திட்டமிட்டிருக் கின்றோம். நான் இவ்விடயம் தொடர்பாக கிழக்கு மாகாண இராணுவத் தளபதி ஜெனரல் லால் பெரேரா அவர்களுக்குப் பாராட்டுத் தெரிவிக்க வேண்டும். மட்டக்களப்பு மாவட் டத்திலே இரண்டு முகாம்கள் அமைந்திருந்த இடத்திலிருந்து அம்முகாம்களைப் பின்னோக்கி நகர்த்தி அந்தப் பிரதேசத்தை அவர் எங்களுக்கு விடுவித்துத் தந்திருக்கின்றார். அதில் ஒன்று, கிரான் பிரதேசத்தில் அமைந்துள்ள கிட்டத்தட்ட 70 குடும்பங்கள் குடியிருக்கக்கூடிய கருங்காலியடிச்சேனை என்ற பகுதி. அங்கு மக்களைக் குடியேற்றுவதற்காக அப்பகுதியில் கண்ணிவெடிகளை அகற்றும் பணி நடைபெற்றுக் கொண்டிருக்கின்றது. அதேபோன்று புணானை இராணுவ முகாம் அமைந்திருந்த பகுதியில் கிட்டத்தட்ட 50 குடும்பங்களைக் குடியேற்றவேண்டியிருக்கிறது. அப் பிரதேசத்தில் இருந்த இராணுவ முகாமையும் அகற்றி அந்த மக்களைக் குடியேற்றுவதற்கான வசதிகளை ஏற்படுத்தித் தந்திருக்கின்றார். அதேபோன்று வட மாகாணத்திலும் கட்டம் கட்டமாகப் பாதுகாப்பு வலயங்கள் குறைக்கப்பட்டு, அங்கு கிடைக்கின்ற வாய்ப்புகளுக்கேற்ப மக்களைக் குடியேற்றுவதற் குத் திட்டமிட்டிருக்கின்றோம்.

கடந்த மாதம் நாங்கள் மூதூர் பிரதேசத்திலுள்ள கூனித்தீவு போன்ற இடங்களிலே கிட்டத்தட்ட 125 குடும்பங்களை மீள்குடியேற்றியிருக்கிறோம். அனேகமாக அடுத்த வருடத் துடன் மீள்குடியேற்றப் பணிகளைப் பூர்த்தி செய்ய முடியுமென நான் நினைக்கின்றேன். இதைவிட இடம் பெயர்ந்து இந்தியாவில் வாழ்கின்ற மக்களின் பிரச்சினை மேலதிகமான பிரச்சினையாக உள்ளது. மீள்குடியேற்றம் என்பது உண்மையிலே பலவந்தமாக ஏற்படுத்தக்கூடியதல்ல என்பதை நான் திட்டவட்டமாகத் தெரிவிக்கின்றேன். அவர்கள் விரும்பி மீள்குடியேறுவதற்காக வந்தால் நாங்கள் அவர்களுக்குத் தேவையான வசதி வாய்ப்புகளை ஏற்படுத்தி அவர்களின் மீள்குடியேற்றத்தைச் செய்ய முடியும் என்பதனை நான் இச்சந்தர்ப்பத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

எமது மீள்குடியேற்ற அமைச்சின் செயற்பாட்டு முன்னேற்றம் தொடர்பான விடயங்களை நான் இங்கு மிகத் தெளிவாகக் கூறியிருக்கிறேன். இது தொடர்பில் ஏதாவது சந்தேகம் ஏற்படுமிடத்து, எம்முடைய அமைச்சுடன் தொடர்பு கொண்டால் நாங்கள் அவர்களுக்குத் தேவையானவற்றைச் செய்து கொடுக்க முடியும்.

I really appreciate the Hon. Gunaratne Weerakoon, Minister of Resettlement and members of our staff, especially Mr. Janaka Sugathadasa, the Secretary and M.M. Nayemudeen, the Additional Secretary. Not only them, I also appreciate the minor staff because we have worked as a family. That is why we have achieved these targets.

I also appreciate His Excellency President Mahinda Rajapaksa, who has given proper advice to us from time to time regarding resettlement. At the same time, I really appreciate the Minister of Economic Development, Hon. Basil Rohana Rajapaksa, who has given the fullest support to this Ministry, which is why we have achieved our targets.

Everybody is aware that the UN Representative for IDPs, Dr. Beyani, came recently to meet our Ministers and also the people. He went to the North and appreciated the marvellous progress that we have achieved so far. Infrastructure activities are going on very well. We have already done the resettlement very well. But, there are still some small issues; we accept that. In future, we can solve those issues. Within a short period, we cannot do everything. We cannot bridge the 30-year gap within a matter of three or four years. We need time.

Thank you.

[අ.භා. 1.27]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින ගරු ඩිව් ගුණසේකර ජ්‍යෙෂ්ඨ ඇමතිතුමා මේ ගරු සභාවේ අවධානය යොමු කළා, මේ රටට ක්‍රම සම්පාදනය පිළිබඳව වගකියන අමාත්‍යාංශයක් නැත, සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකියන අමාත්‍යාංශයක් නැත කියලා. ඒක බරපතළ අඩු පාඩුවක් හැටියටත් ඒ නිසා මේ රටේ රාජ්‍ය පාලනය පිළිබඳ ප්‍රශ්න මතු වෙලා තිබෙන බවත් එතුමා කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද වන විට මේ රටේ අමාත්‍යවරු 67 දෙනෙක් ඉන්නවා. අමාත්‍යවරු හැටියටම 65 දෙනෙක් ඉන්නවා. බුද්ධ ශාසන හා ආගමික කටයුතු ඇමතිතුමා හැටියට අගමැතිතුමා සමඟ 66යි. ගරු ජනාධිපතිතුමාට අමාත්‍යාංශ විශාල ගණනක් තිබෙනවා. ඒ ඔක්කොමත් එක්ක ධුර වශයෙන් 67ක් තිබෙනවා. මේ මුළු ලෝක ඉතිහාසයේම; ප්‍රජාතන්ත්‍රවාදයේ ඉතිහාසය ගණන් බලන, වාර්තා ගත වෙලා තිබෙන ඉතිහාසයේම එක රටකට මෙහෙම කැබිනට් අමාත්‍යවරු 67ක් ඉඳලා නැහැ.

එහෙව් රටේ ඒ අමාත්‍ය මණ්ඩලයේම සාමාජිකයෙක් වන ඩිව් ගුණසේකර ඇමතිතුමා කියනවා, අත්‍යවශ්‍යම ක්ෂේත්‍ර දෙකක් දෙකක් වන ක්‍රම සම්පාදනයට සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ විෂයයට අමාත්‍යවරු නැත, ඒ නිසා වැඩේ අවුල්ය කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට අපේ රට ගැන දුකයි. මේ රටේ අහිංසක මිනිස්සු ඍජුව සහ වක්‍රව ගෙවන බදුවලින් කරන මේ නාස්තිය පිළිබඳව හොඳටම දුකයි. ඒ වාගේම තවත් බොහොම ජ්‍යෝෂ්ඨ, බොහොම  ශ්‍රේෂ්ඨ මහාචාර්ය තිස්ස විතාරණ ඇමතිතුමා කියනවා, එතුමා පත් වෙලා ඉන්න අසරණකම ගැන. එතුමාගේ අමාත්‍යාංශය විසින් සැලසුම් ක්‍රියාත්මක කරන කොට එක්තරා අමාත්‍යාංශ ලේකම්වරියක්, -එතුමා නම කියලාම කිව්වා ධාරා විජේතිලක මැතිනිය කියලා.- ඒවා ක්‍රියාත්මක නොකරනවා විතරක් නොවෙයි, ඒවා ක්‍රියාත්මක කිරීමට බාධා කරනවා කියලා. පුදුම රටක් නේ. මම එතුමාගෙන් විමසුවා, "ඔබතුමා මේ කාරණය ගැන ගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කළේ නැද්ද?" කියලා, එතුමා කිව්වා "දැන් මාස තුන හතරක් වෙනවා, තවමත් අපට රුස්වීමක් හම්බ වුණේ නැහැ"යි කියලා. මේ රටේ වැදගත්ම අමාත්‍යාංශයක් වන විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ බැරෑරුම් අර්බුදයක් වනවා, ලේකම්වරිය මේ ප්‍රතිපත්තිවලට බාධා කරන කොට. ගරු ජනාධිපතිතුමාගෙන් ඒ ගැන රුස්වීමක් ඉල්ලුවාම ඒක දෙන්න මාස තුනක් ගත වෙනවා. මේක ඉතාමත්ම බරපතළ කනගාටුදායක තත්ත්වයක්. අපි යහ පාලනය ගැන කථා කරනවා. අපි රාජ්‍ය සේවයේ කළමනාකරණය විධිමත් කිරීම ගැන කථා කරනවා. මේ තරම් ඇමතිවරු ඉන්න රටේ; මේ තරම් විශාල රාජ්‍ය සේවයක් තිබෙන රටේ, එක් එක් ඇමතිවරයාට තමන්ගේ රාජකාරි කර ගන්නට බැරි තත්ත්වයක්; නොහැකි තත්ත්වයක්; අවිධිමත් කළමනාකරණයක් ඇති වෙලා තිබෙනවා. අපි මේවා ගැන අඬනවා ද, අපි මේවා ගැන හිනා වෙනවා ද, එහෙම නැත්නම් අඬන්නේත් නැතිව, හිනා වෙන්නේත් නැතිව බුම්මා ගෙන ඉන්නවා ද, මොකක්ද කරන්නේ කියලායි මම මේ කල්පනා කරන්නේ. මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ ධනය; මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ බදු මුදල් නිකරුණේ නාස්ති වෙන එක ගැන විපක්ෂයේ නොවෙයි, ආණ්ඩු පක්ෂයේම ඇමතිවරු දෙදෙනෙක් මේ ශ්‍රේෂ්ඨ පාර්ලිමේන්තුවේ කිව්ව කරුණු අනුවයි මම මේ කියන්නේ. ඒ නිසා මේ රටේ දැවැන්ත අර්බුදයක් තිබෙනවා. මේ රටේ රාජ්‍ය සේවයේ කළමනාකරණය පිළිබඳව දැවැන්ත අර්බුදයක් තිබෙනවා. විවිධාකාර දේශප්‍රේමී කථා කියලා, අධිරාජ්‍ය විරෝධී කථා කියලා ජනතාවගේ හැඟීම් අවුස්සලා හංගා ගෙන හිටියාට ක්‍රමානුකූලව මේ රට විනාශය  කරා යමින් තිබෙනවාය කියලා කියන්නේ යන්තම් හරි හෘදය සාක්ෂියක් තිබෙන බොහොම ජ්‍යෝෂ්ඨ, පළපුරුදු වයෝවෘද්ධ මේ ඇමතිවරු. එතුමන්ලා කියන දේ අපි අනුමත කළාම, ඊළඟට කරන්නේ මොකක්ද කියලා මේ රටේ ජනතාව දැන ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මම අදට තිබෙන විෂයයක් සම්බන්ධයෙන් යම් අගය කිරීමක් කරන්න අවශ්‍යයි. එනම්, සමාජ සේවා අමාත්‍යාංශය පිළිබඳව. ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා සමාජ සේවා කටයුතුවලදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් කරන ඉල්ලීම් පිළිබඳව බොහොම කාරුණිකව සලකා බලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඒ ප්‍රතිපාදනවලින් යම් යම් සහන ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ කාරණය පිළිබඳව මම එතුමාව අගය කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යහපාලනය පිළිබඳව මේ රටේ වෙනම අමාත්‍යාංශයක් තිබෙනවා. ඇත්තම කිව්වොත් මේකට වෙනම අමාත්‍යාංශයක් අවශ්‍ය නැහැ. මේ රටේ තිබෙන සෑම අමාත්‍යාංශයක්ම යහපාලනය පිළිබඳව කටයුතු කළ යුතුයි. ඒ සෑම අමාත්‍යාංශයකම යහපාලනය පිළිබඳව තහවුරු කිරීම සඳහා වූ අංශයක් හෝ නිලධාරි සිටිය යුතුයි. කෙසේ නමුත් අපේ රටේ එහෙම අමාත්‍යාංශයක්ම තිබෙනවා. එහෙම ඇමති කෙනෙක්ම ඉන්නවා. මෙහෙම රටේ පසු ගිය දවස්වල අපට එක්තරා තොරතුරක් අහන්න ලැබුණා. ඒ තොරතුර මොකක්ද? මේ රටේ ප්‍රධාන පෙළේ වැදගත්ම දෙපාර්තමේන්තුවක් වන; මේ රටේ ජාතික ආදායමෙන් අතිවිශාල ප්‍රමාණයකට වග කියන රේගු දෙපාර්තමේන්තුවට අග්‍රාමාත්‍යතුමාගේ ලේකම්වරයෙකු ලිපියක් ලබා දෙනවා, එක්තරා කන්ටේනරයක් නිදහස් කර ගන්න. ඒ කන්ටේනරයට බදු සහනයක් ලබා ගන්න; ඉක්මනින් එය නිදහස් කර ගන්න කියලා තමයි ඒ ලිපියේ තිබෙන්නේ. දැන් මම මේ කියන්න යන්නේ මේ කන්ටේනරයේ හෙරොයින් තිබුණාය කියන පරණ කථාව නොවෙයි. මේකෙන් දැන් එක දෙයක් පෙනෙන්න තිබෙනවා. එනම්, අමාත්‍යවරුන්ගේ ලිපි අරගෙන ගියාම, එහෙම නැත්නම් අගමැතිතුමාගේ ලිපි අරගෙන ගියාම රේගු දෙපාර්තමේන්තුව අයථා සැලකිල්ලක් දක්වනවා කියන කාරණය. රේගු දෙපාර්තමේන්තුවෙන් භාණ්ඩ මුදා හැරීමේදී ඒ විධියට ඇමතිවරුන්ගේ ලිපිවලට සහන දෙනවා නම්, යහපාලනය කොහේද තිබෙන්නේ? අගමැතිතුමාගේ ලිපිවලට රේගු දෙපාර්තමේන්තුවෙන් බදු සහන දෙනවා නම්, යහපාලනයක් කොහේද තිබෙන්නේ? එහෙම නම්, අද රටේ තිබෙන නීතිය මොකක්ද? සාමාන්‍ය මිනිසුන්ගේ අයිතිය මොකක්ද? ඒ ගැන මම දැන ගන්න කැමැතියි. අතීතයේ නොවෙයි, ටික කාලයකට පෙර මේ රටේ සිදු වූ මෙවැනි සිද්ධීන් ගැන විෂයය භාර ඇමතිතුමාගෙන් මම ප්‍රශ්නයක් විධියට අහන්න කැමැතියි. එනම්, 2013 අවුරුද්දේ ඔය විධියේ ලිපි කීයක් රේගු දෙපාර්තමේන්තුවට ඇවිල්ලා තිබෙනවා ද? ඒ එක් එක් ලිපිය පිළිබඳව රේගු දෙපාර්තමේන්තුව දක්වා තිබෙන ආකල්පය මොකක්ද? "මේ ලිපි අපට එපා, අපි මේ ලිපි මත ක්‍රියා කරන්නේ නැහැ, රටේ නීතිය සහ දෙපාර්තමේන්තුවේ කාර්ය පටිපාටිය අනුවයි අපි ක්‍රියා කරන්නේ" කියලා මේ ලිපි ප්‍රතික්ෂේප කළා ද? නැත්නම්, ඒ එක් එක් ලිපි අනුව ඒ එක් එක් භාණ්ඩය සඳහා ලබා දුන් සහනය මොකක්ද කියලා පැහැදිලි කරන යුතුකමක් රේගුවට තිබෙනවා. මේක ඉතාම බරපතළ තත්ත්වයක්. රටේ රේගුව දේශපාලනඥයන්ගේ ලිපිවලට සහන දෙනවා නම්, මේ රටේ ක්‍රියාත්මක වන නීතිය මොකක්ද? සාමාන්‍ය මිනිහාගේ අයිතිය මොකක්ද? දේශපාලනඥයෙකු කෙරෙහි ප්‍රවේශ වන්නට බැරි, දේශපාලනඥයන් හම්බ වෙලා අයුතු උපකාර ලබා ගන්න අකමැති අහිංසක මිනිසුන්ගේ තත්ත්වය මොකක්ද? ඒ නිසා හෙරොයින් ප්‍රශ්නයට අතිරේකව මේ රටේ රාජ්‍ය පාලනය තුළ තිබෙන දේශපාලනඥයන්ට අයුතු බලපෑම් කරන්නට පුළුවන්ය කියන මේ සාධකය සනාථ කරන අවස්ථාවක් හැටියට මේ කාරණය මම පෙන්වන්න කැමැතියි. මේක රටට ඉතාම නරකයි. රටට ආදරය කරන මිනිසුන් මේවාට ඉඩ දෙන්නේත් නැහැ; රටට ආදරය කරන මිනිසුන් මෙහෙම ලියුම් දෙන්නේත් නැහැ; රටට ආදරය කරන මිනිසුන් මේවා ඉවසා ගෙන ඉන්නේත් නැහැ. දේශ ප්‍රේමීත්වය කියන්නේ යහපාලනය ස්ථාපනය කරන එක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ඉතාම වැදගත් ක්ෂේත්‍රයක් පිළිබඳව මම කරුණු කියන්නට කැමැතියි. ඒ තමයි තැපැල් ක්ෂේත්‍රය. අද දිනයේ විෂයය නොමැති වුවත්, මට හෙට දිනට කථාවක් නොමැති නිසා මට මේ කාරණය කියන්න අවශ්‍යයි. මොකද, මේ සම්පූර්ණ විවාදය අදාළ කාරක සභාවේ වාර්තාව සලකා බැලීමේ විවාදය නිසා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ තැපැල් කාර්යාල පිළිබඳව බැරෑරුම් ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ තැපැල් කාර්යාල අතර සම්බන්ධීකරණය පිළිබඳව ගැටලුවක් තිබෙනවා. මේ රටේ තැපැල් කාර්යාල හා සම්බන්ධ ඒ අදාළ ගණනය කිරීම් සහ ඒවා පිළිබඳ තොරතුරු හුවමාරු කිරීම පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේ ප්‍රශ්න නිසා මේ රටේ තැපැල් කාර්යාල පරිගණක ඇසුරෙන් ජාලගත කිරීමේ ව්‍යාපෘතියක් 2007 වර්ෂයේ ආරම්භ වුණා. හැබැයි, මේ ව්‍යාපෘතිය සඳහා මේ වන විට රුපියල් මිලියන

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

648ක් වෙන් කරලා තිබුණත්, මේ රටේ තැපැල් කාර්යාලවල මේ ජාල පද්ධතිය තවමත් ස්ථාපනය වෙලා නැහැ. මේක ඉතාම බරපතළ ප්‍රශ්නයක්. එක අතකින් නාස්තියක්. අනික් අතට මේ රට ඉදිරියට යන ගමනට ලොකු බාධාවක්. ඇත්ත වශයෙන්ම අද වන කොට ක්‍රියාත්මක වෙන්නේ විද්‍යුත් මුදල් ඇණවුම්, විදුලි බිල් පත් හා මොබිටෙල් බිල් පත් ගෙවීමේ ක්‍රමවේදය පමණයි. ඒකත් දෙපාර්තමේන්තුව ඇතුළේ නිලධාරියකු විසින් සකස් කර ගත්තු ක්‍රමයක්. රුපියල් මිලියන 648ක් තරම් අතිවිශාල මුදලක් වියදම් කරලාත් මේ ජාලය නිර්මාණය වෙලා නැත්නම් අපේ රටේ තැපැල් සේවය ඉතාම පසුපසට යන එක වළක්වන්න බැහැ. මේක ඉතා බැරෑරුම් ප්‍රශ්නයක්.

ඒ විතරක් නොවෙයි. අද වන කොට තැපැල් දෙපාර්තමේන්තුවේ නුවරඑළිය, සීගිරිය, ත්‍රිකුණාමලය, කරෙයිනගර්, අනුරාධපුර යන ප්‍රදේශවල තිබෙන තැපැල් ස්ථානාධිපතිවරුන්ගේ නිල නිවාස අද නිවාඩු නිකේතන බවට පත් කර තිබෙනවා. මේක බැලූ බැල්මටම හොඳයි කියා හිතුවත් මෙහි තිබෙන ගැටලුව තමයි, මේ ප්‍රදේශවල සිටින තැපැල් ස්ථානාධිපතිවරුන්ට නිල නිවාස නැතිකම. තැපැල් ස්ථානාධිපතිතුමාගේ නිල නිවාසය කියන්නේ එකක්. තැපැල් දෙපාර්තමේන්තුවේ සේවකයන්ට ඒ ප්‍රදේශවලට නිවාඩුව ගත කරන්න ගියාම එහෙම නැත්නම් රාජකාරි කටයුතුවලට ගියාම ඒ අයට ඉන්න නිවාඩු නිකේතන තිබෙන එක හොඳයි. හැබැයි, ඒ තැපැල් ස්ථානාධිපතිවරුන්ගේ නිල නිවාස අහෝසි කරලා ඒ කටයුත්ත කරන එක ලොකු ප්‍රශ්නයක්. ඒ වාගේම අනුරාධපුරයේ තිබෙන තැපැල් දෙපාර්තමේන්තුවේ නිල නිවාසය ඉතාම පැරණි එකක්. ඒක කඩා දමන්නය කියා නගර සභාව නිර්දේශ කර තිබෙනවා. එහෙම තිබියදීත් ඒක නවීකරණය කරන්න උත්සාහ කරනවා. මට ලැබී තිබෙන තොරතුරු අනුව ඒක නාස්තියක් වශයෙනුයි පෙනී යන්නේ. ඒ නිසා ඒ කාරණා පිළිබඳව මා විශේෂයෙන්ම අවධානය යොමු කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ තිබෙන ඉතා වැදගත්ම ක්ෂේත්‍රයක් තමයි, බලශක්ති ක්ෂේත්‍රය. විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ ඇමතිතුමාගේ කථාවට කිසියම් එකතු කිරීමක් කරන්න මා කැමැතියි. අපේ රටේ බලශක්ති උත්පාදනය පිළිබඳව ඉතා බැරෑරුම් අර්බුදයක් තිබෙනවා. මුළු ලෝකයෙන්ම විදුලි ඒකකයක් සඳහා වැඩිම මිලක් ගෙවන රටක් බවට අද අපේ රට පත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අප ගනු ලැබූ තීරණ සහ දිගින් දිගටම අප ගනිමින් සිටින තීරණ සමඟ අනාගතයේදී විදුලි ඒකකයක් සඳහා වන මිල වැඩි වනවා මිසක් අඩු වෙන්නේ නැහැ. සාම්පූර් බලාගාරය පිළිබඳව කථා කළොත්, ඉන්දියානු අගමැතිවරයා CHOGM එකට ගෙන්වා ගන්න දීපු කප්පමක් හැටියට හදිසියේම රටට අහිතකර, ඒකකයකට අධික මිලක් නියම වන එම ගිවිසුමට අත්සන් කළා. අන්තිමට ඉන්දීය අගමැතිතුමා CHOGM එකට පැමිණියේත් නැහැ; අපේ අහිංසක විදුලි පාරිභෝගිකයාගේ අනාගතයට බලපාන ගිවිසුමට එළඹෙන්නත් සිදු වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගල් අඟුරුවලින් විදුලිය නිෂ්පාදනය කිරීම ලාභදායී දෙයක් වශයෙන් අද සලකන්නේ නැහැ. මීට කලින්, ඒ පැවති මිලට සාපේක්ෂව ගල් අඟුරුවලින් විදුලිය නිෂ්පාදනය කිරීම ලාභදායී වශයෙන් සැලකුවා. හැබැයි අද ඒ තත්ත්වය වෙනස් වෙලා. ගල් අඟුරුවලින් විදුලිය නිෂ්පාදනය කිරීමත් එතරම් ලාභදායී නොවන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි, ජල විදුලිය පිළිබඳ ප්‍රශ්නය. අද අපේ රටේ ජලයෙන් විදුලිය නිෂ්පාදනය කිරීම පිළිබඳව උපරිම තත්ත්වයට අපි ළඟා වෙලා තිබෙනවා. මහා පරිමාණ ව්‍යාපෘති සඳහා අපට ඉඩ නැහැ. සුළු පරිමාණ ව්‍යාපෘති කිහිපයක් පමණයි, තව අපට කරන්න පුළුවන්කම තිබෙන්නේ. ඩීසල් සහ ගෑස් මඟින් විදුලිය උත්පාදනය කිරීම කවදත් මිල අධිකයි. ඒක දිගින් දිගට කරන්න පුළුවන් දෙයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මාගේ පෞද්ගලික මතය වන්නේ අප පරමාණු බලශක්තිය හරහා විදුලිය උත්පාදනය කිරීමේ ක්‍රියාදාමයකට යොමු විය යුතුයි කියන එකයි. මම මෙහෙම කියන කොට තමුන්නාන්සේලා එක පාරටම කියන්න පුළුවන්, චර්නබිල්වල සිදු වුණු දැවැන්ත ඛේදවාචකය ගැන. ඒ නිසා එවැනි ප්‍රශ්නයක් ඇති වුණොත් අපට මුහුණ දෙන්න පුළුවන් ද කියන ප්‍රශ්නය මතු වෙනවා. ඒ වාගේම ජපානයේ සිදු වුණු භූමි කම්පාවත් එක්ක ඇති වුණු ඛේදවාචකය තුළින් ජපානයටත් යම්කිසි ගැටලුවක් මතු වෙලා තිබෙනවා, කළමනාකරණය කර ගැනීම ගැන. ඒ වාගේම ජර්මනිය තමන්ගේ පරමාණු බලශක්ති බලාගාර වසා දමමින් සිටිනවා. හැබැයි මතක තබා ගත යුතු කාරණය තමයි, ඒ රටවල් පරමාණු බලශක්තිය හරහා ලබා ගන්න පුළුවන් වාසිය ලබා ගෙන අද හරිත තත්ත්වයක් පිළිබඳව ඔවුන් උත්සාහ කරද්දී අපි තවම පිටුපසින් ඉන්නවාය කියන කාරණය. ලෝකයේ දැවැන්ත ජාතීන් සමඟ එකතු වෙලා, පරමාණු බලශක්තිය පිළිබඳව ලෝකයේ දියුණු තාක්ෂණික රටවල් සමඟ එකතු වෙලා ඔවුන්ගේ සහාය ලබා ගෙන දියුණු තාක්ෂණය සහිත පරමාණු බලශක්තිය මත විදුලිය උත්පාදනය කිරීමේ ක්‍රියාදාමයකට අප යොමු විය යුතුය කියන කාරණයයි මාගේ පෞද්ගලික අදහස. ඒක මා නියෝජනය කරන පක්ෂයේ අදහස නොවෙයි. ඒක මගේ පෞද්ගලික අදහස. මේ පිළිබඳව මීට කලින් ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා අදහස් ප්‍රකාශ කර තිබුණා. ඒ පිළිබඳව දිගින් දිගට කථා කර තිබුණා. පරමාණු බලශක්තිය ඇසුරෙන් විදුලිය නිෂ්පාදනය කිරීම පිළිබඳව අප බරපතළ කතිකාවතකට යා යුතුයි. කෙටි කාලීන දෙයක් නොවුණත්, අපට තිබෙන අභියෝගය ජයගන්න දිගු කාලීනව අනිවාර්යයෙන්ම පරමාණු බලශක්තිය භාවිත කිරීම සුදුසුය කියන කාරණය පිළිබඳව මා මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අප කථා කරන අමාත්‍යාංශය යටතේ ජාතික උරුමයන් පිළිබඳව අපේ විශේෂ අවධානය යොමු කරන්නට ඕනෑ. අප කවුරුත් ශ්‍රී ලාංකිකයෝ හැටියට මේ රටට ආදරෙයි. මේ රටට ආදරය නොකරන කෙනෙක් ඉන්නවාය කියා මා කියන්නට ලැහැස්ති වෙන්නේ නැහැ. හැබැයි සමහර වෙලාවට අප පෞද්ගලිකව හා පොදුවේ ගන්නා ක්‍රියාමාර්ග හරහා මේ රටට ආදරය ද, නැද්ද කියන කාරණය පරීක්ෂාවට ලක් කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ කෞතුකාගාර කියා කියන්නේ අපේ රටේ ඉතිහාසය ලෝකයට කියන, අපේ රටේ ඉතිහාසය පිළිබඳව ඒ සාක්ෂි අනාගතයට ඉතිරි කරන ස්ථාන. ඒවා මේ රටේ සිංහල, මුස්ලිම්, දෙමළ ශ්‍රී ලාංකික අප හැමෝගේම ආඩම්බරයට කාරණයක් වන ස්ථාන.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ කෞතුකාගාරවල ආරක්ෂාව පිළිබඳව දැවැන්ත ප්‍රශ්නයක් මතු වුණා. කොළඹ කෞතුකාගාරයේ තිබුණු මිල කළ නොහැකි වටිනා දේවල් සොරකම් කිරීමත්, ඒ සොරකම් කිරීම්වලට පසු බිම් වුණු කාරණාත්, ඒ සොරකම් වසන් කිරීම නිසා හා ඒ සොරකම් කළ නියම සොරුන් ආරක්ෂා කිරීම උදෙසා ගෙන ගිය ක්‍රියා මාර්ගත් නිසා අපේ රටේ විශාල වශයෙන් එය කතිකාවතකට ලක් වුණා.

ගරු ඇමතිතුමනි, මේ සොරකමෙන් පසුව මේ රටේ කෞතුකාගාරවල ආරක්ෂාව තහවුරු කරන්න, කෞතුකාගාරවල තිබෙන ඒ වටිනා සම්පත් අරක්ෂා කරන්න ගෙන ඇති

වැඩිමනත් පියවර මොනවා ද කියා ඔබතුමාට පැහැදිලි කරන්නට පුළුවන් ද? අපි දන්නා සම්ප්‍රදායානුකූලව තිබෙන ආරක්ෂක වැඩ පිළිවෙළට අමතරව ගෙන තිබෙන පියවර මොනවා ද? ඒ වටිනා භාණ්ඩ ආරක්ෂා කරන්න, අපේ උරුමය ආරක්ෂා කරන්න ගෙන තිබෙන වැඩ පිළිවෙළ පිළිබඳව අපි දැන ගන්නට කැමැතියි.

ගරු ඇමතිතුමනි, මේ රටේ කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ වැදගත්, දක්ෂතා ඇති නිලධාරින් රාශියක් ඉන්නවා. හැබැයි මේ කෞතුකාගාර දෙපාර්තමේන්තුව සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කියන මේ දෙපාර්තමේන්තු යටතේ ඔවුන්ගේ කටයුතු කිරීමේදී ප්‍රායෝගිකව බැරෑරුම් ප්‍රශ්න කිහිපයක් මතු වෙනවා. විශේෂයෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඒ අදාළ යම් යම් ස්ථාන පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ සලකුණක් යොදා ලකුණු කර තිබෙනවා. ඒ අදාළ ස්ථානය පුරාවිද්‍යා වැදගත්කමක් ඇති ස්ථානයක් වශයෙන් සලකුණු කළාට ඒ අදාළ ස්ථානයේ ඇති වැදගත්කම, ඉතිහාසය පිළිබඳව නිල නාම පුවරුවක් එම ස්ථානවල ප්‍රදර්ශනය වන්නේ නැහැ. මම උදාහරණයක් ඔබතුමාට කියන්නම්. රඹුක්කන මගේ නිවසට ආසන්නයේ තිබෙනවා, රඹුක්කන පුරාණ රජමහා විහාරස්ථානය. ඒ විහාරස්ථානයේ තිබ් වසර දහසකටත් වඩා පැරණි සෙල් ලිපියක් හමු වුණා. එම ස්ථානය පුරාවිද්‍යා ස්ථානයක්ය කියන නාම පුවරුව තිබෙනවා.

රයිගම් කෝරළයේම මගේ නිවසට ආසන්නයේ වීදාගම රජමහා විහාරය තිබෙනවා. එතැනින් තව පොඩ්ඩක් එහා කොතලාවල රජමහා විහාරය තිබෙනවා; රයිගම් බණ්ඩාර රජ්ජුරුවන්ගේ මාළිගය තිබෙනවා. ගරු ඇමතිතුමනි, තිබෙන ප්‍රශ්නය මෙයයි. අර සලකුණු නිසා ඒවා පුරාවිද්‍යා ස්ථාන බව කාටත් තේරෙනවා. නමුත් රජයේ ස්ථාවරය හැටියට විශේෂයෙන් නිල වශයෙන් නාම පුවරුවක් ප්‍රදර්ශනය කිරීම අවශ්‍යයි. ඒ සඳහා වැඩි මුදලක් යන්නේ නැහැ. නොයෙක් කතන්දර තිබෙනවා. පන්සලට ගියාම එක ස්වාමීන් වහන්සේ නමක් එක කථාවක් කියනවා; ඊට පස්සේ තව ස්වාමීන් වහන්සේ නමක් තව කථාවක් කියනවා; ගමේ ඉන්න අය තව කථාවක් කියනවා. පිටස්තර කෙනෙක් මේ පුරාවිද්‍යා වැදගත් කමක් ඇති ස්ථානයකට ගියාම ඒ ස්ථානය පිළිබඳව රජයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ස්ථාවරය මොකක් ද, එහි තිබෙන ඓතිහාසික වැදගත්කම මොකක් ද, එය අයිති වන්නේ මොන කාලයකටද කියන ඒ කාරණා පිළිබඳව අවබෝධයක් ඇති වන ආකාරයේ අවම තොරතුරුවත් ඇතුළත් පුවරුවක් එම ස්ථානවල ප්‍රදර්ශනය කළ යුතුයි. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම මේ ප්‍රශ්නය තිබෙන්නේ මෙන්න මේ නිසායි. අනුරාධපුරය, පොළොන්නරුව ගත්තොත් අපි කවුරුත් ඒ ඉතිහාසය ඉගෙන ගෙන තිබෙනවා. ඒවා පිළිබඳව යම් යම් කරුණු දැන ගෙනෙයි යන්නේ. ඒ ගැන අපට පාසල්වල උගන්වනවා. ඒ පිළිබඳව තොරතුරු අපට පුවත් පත්වලින් වුණත් කියවන්නට පුළුවන්. නමුත් විශේෂයෙන් පහත රට ප්‍රදේශවල තිබෙන -සබරගමුවේ, දකුණේ තිබෙන- පුරාවිද්‍යා සථානවලට ගියාම ඒ තොරතුරු පිළිබඳව දැවැන්ත හිඟයක් තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමාගෙන් මා විශේෂ ඉල්ලීමක් කරන්නට කැමැතියි. රටේ ජනතාවගේ උනන්දුව ඇති වෙන්න, රටේ ජනතාවගේ විශ්වාසවන්තභාවය ඇති වෙන්න ඒ වාගේම ඒ පුරා විද්‍යා ස්ථාන ආරක්ෂා කිරීමට ඒ ප්‍රදේශවාසින්ගේ තිබෙන උනන්දුව වැඩිදියුණු කරන ආකාරයට රජයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ස්ථාවරය දැක්වෙන්නා වූ නාම පුවරුවක් ඒ සෑම ස්ථානයකම ප්‍රදර්ශනය කිරීම අවශ්‍ය වෙනවා. පුරා විද්‍යා ස්ථානයක් පමණක් කියනවාට වඩා වැඩි යමක් සඳහන් කිරීම අවශ්‍ය වෙනවා. ඒ කාරණය ගැන ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය මා යොමු කරනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ස්තුතියි. ගරු (ආචාර්ය) ජගත් බාලසූරිය අමාත්‍යතුමා.

[අ.භා. 1.46]

**ගරු (ආචාර්ය) ජගත් බාලසූරිය මහතා (ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஜகத் பாலசூரிய - தேசிய மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. (Dr.) Jagath Balasuriya - Minister of National Heritage)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ දැක්ම වන්නේ වර්ෂ 2025 දී ජාතික උරුම සංරක්ෂණයේ කලාපීය ප්‍රමුඛ අභිමානවත් ජාතියක් බවට පත් වීමයි. ඒ අමාත්‍යාංශයේ මෙහෙවර, ජාතියේ අනන්‍යතාව ලොවට විදහා පාමින් ශ්‍රී ලාංකීය ස්පර්ශ හා අස්පර්ශ උරුමයන් සංරක්ෂණය කොට, අනාගත පරපුර වෙත දායාද කිරීම සමඟ සමස්ත ආර්ථික හා සමාජීය සංවර්ධන ක්‍රියාවලියට ඵලදායි ලෙස දායක වීමයි.

අපේ අමාත්‍යාංශයට මූලික වශයෙන් දෙපාර්තමේන්තු තුනක් තිබෙනවා. ව්‍යවස්ථාපිත මණ්ඩල දෙකක් තිබෙනවා. ඒ දෙපාර්තමේන්තු තුන තමයි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කෞතුකාගාර දෙපාර්තමේන්තුව හා ලේඛනාගාර දෙපාර්තමේන්තුව. ව්‍යවස්ථාපිත මණ්ඩල දෙක තමයි ගාලු උරුමය සහ ජනකලා කේන්ද්‍රය.

දැන් මෙතැනදී අපි කල්පනා කළ යුතුයි අතිගරු ජනාධිපතිතුමා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයක් බිහි කළේ ඇයි කියලා. අපි දන්නවා, බොහෝ දුරට ලෝකයේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශ අල්පයි කියා. සංස්කෘතික අමාත්‍යාංශයක් තමයි තිබෙන්නේ. ජාතික උරුමයන් පිළිබඳ කටයුතුත් බොහෝ දුරට සංස්කෘතික අමාත්‍යාංශය තුළින් තමයි කෙරෙන්නේ. 1948 සිට 1956 වන තෙක් ජාතික උරුමයන් ගැන හෝ මේ රටේ සංස්කෘතික අනන්‍යතාව ගැන හෝ දේශප්‍රේමී හැඟීමක් ගැන හෝ ක්‍රියා කරන අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක් තිබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම අධිරාජ්‍යවාදීන්ට ගැති අනුකරණවාදී පිරිසක්, පිලිප් ගුණවර්ධන ඇමතිතුමාගේ වචනවලින් කියනවා නම් තුප්පහි සංස්කෘතියක් අනුකරණය කරපු පිරිසක් තමයි 1948 සිට 1956 දක්වා රජය මෙහෙයවූවේ. 1956 දී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා බලයට පත් වුණායින් පස්සේ තමයි සංස්කෘතික අමාත්‍යාංශය බිහි වන්නේ. සංස්කෘතික අමාත්‍යාංශයට පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාගාරය, කෞතුකාගාරය යන මේ සියල්ලම ඇතුළත් වනවා. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට පත් වුණායින් පස්සේ තමයි ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයක් පිහිටුවන්නේ. මා කලින් කී පරිදි, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශ ලෝකයේ අඩුයි. නමුත් මට ඉරානයේ රාජතාන්ත්‍රිකයකු කිව්වා, ඉතාම වැදගත් අමාත්‍යාංශයක් හැටියට ඔවුන්ට ජාතික උරුමය පිළිබඳ අමාත්‍යාංශයක් තිබෙනවා කියලා. ක්‍රි.පූ. 1600 දී සයිරස් අධිරාජ්‍යයා හිටියේ ඉරානයේ. ඉරානයේ අපට වාගේ ආරක්ෂා කළ යුතු උරුමයන් ගණනාවක් තිබෙනවා. ඒ නිසා තමයි ජාතික උරුම අමාත්‍යාංශයක් ඉරානය වැනි රටක ඇති කරලා තිබෙන්නේ. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා මේ ජාතික උරුමය කියන අමාත්‍යාංශය බිහි කිරීමෙන් එක්තරා වැදගත් කර්තව්‍යයක් ඉෂ්ට කළා. 1956 දී සංස්කෘතික දෙපාර්තමේන්තුවක් බිහි කළා. 2005 දී පමණ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය බිහි කරනවා. මේ අමාත්‍යාංශ බිහි කළේ වර්තමාන රජයට සම්බන්ධ ඉතිහාසයක් තිබෙන දේශපාලනඥයන් බව අමතක කරන්න එපා.

අපේ අමාත්‍යාංශය ගැන කථා කරන කොට දෙපාර්තමේන්තු තුනක හා ව්‍යවස්ථාපිත මණ්ඩල දෙකක කරුණු කියන්න මිනිත්තු 10ක් වැනි කාලයකදී බැහැ. නමුත් ඉතාම සරලව, කෙටියෙන් මේ ගැන මා කියන්න කැමැතියි.

[ගරු (ආචාර්ය) ජගත් බාලසූරිය මහතා]

අපි ඉදිරි කාලයේ කරන කටයුතු අතර මහමෙව්නා උයන සංවර්ධන ව්‍යාපෘතිය, නීලගිරි සෑය සංවර්ධන ව්‍යාපෘතිය, දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය හා මිහින්තලය කේන්ද්‍ර කර ගත් සංරක්ෂණ කටයුතු පිළිබඳ ව්‍යාපෘතිය, යාපනය පැරණි ඕලන්ද කොටුව සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය, ත්‍රිකුණාමලය ඕලන්ද නාවික හමුදා නිල නිවස්නය සංරක්ෂණය හා ජාතික සමුද්‍රික කෞතුකාගාරය ස්ථාපිත කිරීම, ආදිවාසී ජන උරුම සංරක්ෂණ ව්‍යාපෘතිය, ගාලු කොටුව සංවර්ධනය, ජන කලාවන් සංරක්ෂණය හා සංවර්ධනය, මුම්ටාස් මහල් ගොඩනැඟිල්ලේ උරුම තොරතුරු මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම, "දැයේ උරුමය දරුවන්ටයි" වැඩසටහන ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම, නැඟෙනහිර නවෝදය වැඩසටහන, මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලැබෙන සියයට 25ක ප්‍රතිපාදන යොදා කරන සංවර්ධන ව්‍යාපෘති, රජගලතැන්න සංරක්ෂණ ව්‍යාපෘතිය, දීඝවාපී සංරක්ෂණ ව්‍යාපෘතිය, මඩුවන්වල වලව්ව සංරක්ෂණය, තිවංක පිළිමගෙය සංරක්ෂණය, ලේඛන කළමනාකරණ ව්‍යාපෘතිය, අනුරාධපුර සංචාරක බංගලාව ඉදි කිරීම, රංචාමඩම ප්‍රාග් ඓතිහාසික කෞතුකාගාරය ස්ථාපනය කිරීම, යුදගනාව සංරක්ෂණ ව්‍යාපෘතිය, හම්බන්තොට උරුම කෞතුකාගාරය ස්ථාපනය කිරීම, අස්ගිරි මැදිරිය ස්ථාපනය කිරීම, රත්නපුර ජෛව විවිධත්ව උද්‍යානය ඉදි කිරීම, උරුම ප්‍රසාද ප්‍රණාම උළෙල පැවැත්වීම, ජනකලා කේන්ද්‍ර සංවර්ධනය, ගාලුකොටුව සංවර්ධනය, MCH ව්‍යාපෘතිය යන මේ කටයුතු ප්‍රධාන තැනක් ගන්නවා. අපට යම් යම් ප්‍රශ්න තිබෙනවා; බාධක තිබෙනවා; සීමා තිබෙනවා; තහංචි තිබෙනවා.

උදාහරණයක් හැටියට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ගත්තොත් අපේ අධ්‍යක්ෂ ජනරාල්තුමා අපට පෙන්නුම් කරනවා, එහි අධ්‍යක්ෂවරුන් 07ක්, උප අධ්‍යක්ෂවරුන් 28ක්, රාජ්‍ය නිලධාරින් 17ක්, තාක්ෂණික නිලධාරින් 40ක් වශයෙන් පුරප්පාඩු පවතින බව. නමුත් අභාග්‍යයකට, පවත්නා නීති රෙගුලාසි යටතේ Salaries and Cadre Commission එක, කළමනාකරණ කටයුතු පිළිබඳ උපදෙස් ලබා ගන්නා ආයතනය වැනි ආයතනවලින් යම් යම් තහංචි අපට පනවලා තිබෙනවා. අපි ළඟදී පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවලදී මේ ගැන සාකච්ඡා කරන විට - පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 281 වාර්තාව නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා විසින් අද ඉදිරිපත් කරලා තිබෙනවා- අපට දැන්වූයේ මේ වාගේ ආයතනයක් කර ගෙන යෑමට අවශ්‍ය සේවකයන් නොමැති නම් කැබිනට් මණ්ඩලයට ඉල්ලීමක් කරලා මේ කටයුතු කර ගෙන යෑමට ක්‍රියා මාර්ගයක් ගත යුතුයි කියලායි. ඒ මතය සියලුම ඇමතිවරු ඒ අවස්ථාවේදී ඉදිරිපත් කළා.

බොහෝ විට 250,000කට අධික රැක ගත යුතු පුරාවිද්‍යා වටිනාකමක් ඇති ස්ථාන මේ රටේ තිබෙනවා. වැඩිම පුරාවිද්‍යා වටිනාකමක් ඇති සංරක්ෂණය කළ යුතු ස්ථාන තිබෙන ලෝකයේ ප්‍රධාන රටවල් අතරට ලංකාවත් ඇතුළත් වෙනවා. මේ තත්ත්වය යටතේ අපට භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල, මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලැබෙන සියයට 20ක පමණ මුදල ප්‍රමාණවත් නැහැ. මේ මුදලින් කිසිම විධියකින් මේ සා ප්‍රමාණයක් නඩත්තු කිරීමට ශක්තියක් හැකියාවක් නැහැ. මෙවැනි පෞරාණික දේවල්, ආයතන සංරක්ෂණය කිරීමට ස්වේච්ඡාවෙන් මුදල් ප්‍රතිපාදන දෙන පිරිස් සිටියත්, ඒ මුදල් ප්‍රතිපාදනවලින් මේ කටයුතු කිරීමට රාජ්‍ය දෙපාර්තමේන්තුවකට අවසර නැහැ. එම නිසා මධ්‍යම සංස්කෘතික අරමුදල වාගේ වෙනත් ආයතනයක් සකස් කර ගැනීමට අපට අවසර ලබා දෙන ලෙස අපි කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කරනවා.

පුරාවිද්‍යා ආඥාපනතේ යම් යම් සංශෝධන කිරීමට අපි අපේක්ෂා කරනවා. ඊට අමතරව, පුරාවිද්‍යා සේවා ව්‍යවස්ථාව සකස් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. අපේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවකයන් අතර යම් යම් ප්‍රශ්න තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සුළු සේවකයන්ට ඇති වෙලා තිබෙන අසාධාරණකම් සොයා බලා ඒ පිළිබඳව කටයුතු කිරීමටත් අපි බලාපොරොත්තු වනවා.

අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා කරුණු දෙකක් ඉදිරිපත් කළා. එක කරුණක් තමයි කෞතුකාගාරයේ හොරකම සම්බන්ධ සිද්ධිය. කෞතුකාගාරය සම්බන්ධව දැන් වෙනත් චේතනාවක් ආරූඪ කිරීමට යනවා. නමුත් කෞතුකාගාරයේ හොරකම කළ පුද්ගලයාට විරුද්ධව දැන් මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුව ආරම්භ කර තිබෙනවා. හොරකම කළාය කියා ඒ පුද්ගලයා පිළිගන්නවා. ඒ වාගේම හොරකම් කළ භාණ්ඩ අප සොයා ගෙන තිබෙනවා. එතුමාගේ යෝජනාව අනුව අප උත්සාහ කරනවා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් අනාගතයේදී වැදගත් ස්ථානවල ඓතිහාසික පසු බිම සකස් කිරීමට දැන්වීම් පුවරු සකස් කර ඉදිරිපත් කරන්න. මේ අවස්ථාවේදී මීට වැඩිය දීර්ඝ ලෙස කථා කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මේ අවස්ථාවේදී මගේ අමාත්‍යාංශයේ ගරු ලේකම් නන්දා වික්‍රමසිංහ මැතිනියට සහ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අධ්‍යක්ෂ ජනරාල්තුමාට, කෞතුකාගාරයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියට, ජාතික ලේඛනාරක්ෂණ දෙපාර්තමේන්තුවේ - Department of National Archives - අධ්‍යක්ෂතුමිය ඇතුළු අතිරේක ලේකම්වරුන්ට මගේ අවංක ස්තුතිය හා කෘතඥතාවය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 1.58]

**ගරු ටී. බී. ඒකනායක මහතා (සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க - கலாசார, கலை அலுவல்கள் அமைச்சர்)

(The Hon. T.B. Ekanayake - Minister of Culture and the Arts)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව කාරණා රාශියක් කියන්න තිබුණත් කාලය ප්‍රමාණවත් නොමැති නිසා මගේ කථාව මා කෙටියෙන් කරන්නම්.

සාරධර්ම පිරි සමාජයක් බිහි කිරීම අරමුණු කර ගත් සංස්කෘතික මධ්‍යස්ථාන වැඩසටහන යටතේ මේ වන විට දිවයින පුරා සංස්කෘතික මධ්‍යස්ථාන 165ක් පිහිටුවා තිබෙනවා. 2013 වර්ෂයේ මධ්‍යස්ථාන 5ක් විවෘත කළා. දෙමළ හා මුස්ලිම් ජනතාව වෙනුවෙන්ම පිහිටුවන ලද අම්පාර කල්මුණේ දෙමළ හා මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථාන දෙක මින් විශේෂ වෙනවා. මේ වන විට තවත් සංස්කෘතික මධ්‍යස්ථාන 10ක ඉදි කිරීම් කටයුතු අවසන් කර තිබෙනවා. ඒ වාගේම තවත් සංස්කෘතික මධ්‍යස්ථාන 32ක ඉදි කිරීම් සිදු කෙරෙමින් පවතිනවා. උතුරු නැඟෙනහිරටත් සංස්කෘතික පුනරුදයක් ඇති කිරීම සඳහා මේ ප්‍රදේශවල සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාපෘතිය පුළුල් කිරීමට කටයුතු කර තිබෙනවා. 2013 වන විට තිබුණේ උතුරට සංස්කෘතික මධ්‍යස්ථානයක් හා නැඟෙනහිරට සංස්කෘතික මධ්‍යස්ථාන 13ක් පමණයි. නැඟෙනහිර සඳහා කල්මුණේ දෙමළ හා මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථාන දෙක අප විවෘත කළා. මේ වන විට යාපනයේ උඩුවිල් හා කරෙයිනගර් සහ මඩකලපුව එරාවූර් නගරය යන මධ්‍යස්ථානවලත් ඉදිකිරීම් අවසන්. ඒ වාගේම උතුරට 6ක් හා නැඟෙනහිරට 9ක් වශයෙන් උතුරු නැඟෙනහිර සඳහා ඉදි කෙරෙමින් පවතින සංස්කෘතික මධ්‍යස්ථාන ගණන 15ක් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උගත් පාඩම් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම යටතේ උතුරු නැඟෙනහිර සඳහා සංස්කෘතික මධ්‍යස්ථාන 7ක් ඉදි කිරීමට නියමිතයි. මින්

සංස්කෘතික මධ්‍යස්ථාන පහක ඉදි කිරීම් දැනටමත් ආරම්භ කර තිබෙනවා. මෙම දීපව්‍යාප්ත සංස්කෘතික මධ්‍යස්ථාන මඟින් සෞන්දර්යය විෂයයන් ප්‍රමුඛ කර ගත් පාඨමාලා පිළිබඳ පුහුණුව නොමිලේ ලබා දීම සිදු කරනවා. මේ වන විට සංස්කෘතික මධ්‍යස්ථාන මඟින් පුහුණුව ලබන සිසුන් සංඛ්‍යාව 48,000 ඉක්මවනවා. ඒ වාගේම සංස්කෘතික මධ්‍යස්ථාන මඟින් ලබා දෙන විශේෂිත සේවාවක් තමයි පුස්තකාල සේවාව. සෑම සංස්කෘතික මධ්‍යස්ථානයකම පුස්තකාලයක් ක්‍රියාත්මක වෙනවා. මෙමඟින් ග්‍රාමීය ප්‍රදේශවල සිටින ජනතාවට පොතපත කියවීමේ අවස්ථාව උදා වෙනවා. වාර්ෂිකව අමාත්‍යාංශය මඟින් උසස් සාහිත්‍ය කෘති මිලදී ගෙන සංස්කෘතික මධ්‍යස්ථානවලට බෙදා දීම සිදු කරනවා. මෙවර රුපියල් මිලියන 7.47ක වියදමින් පොත් 29,840ක් මිල දී ගෙන සංස්කෘතික මධ්‍යස්ථාන අතර බෙදා දීම සිදු කරනු ලැබුවා. ඒ වාගේම අතිදුෂ්කර ප්‍රදේශවල සිටින කියවීමට ඇදි පාඨකයින් වෙත පොත් ගෙන ගොස් දීමේ ජංගම පුස්තකාල සේවය ද මේ වන විට ක්‍රියාත්මක කර ගෙන යනවා. සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාල සේවය ලබා ගන්නා පාඨකයින් ගණන මේ වන විට 43,000 ඉක්මවනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාහිත්‍ය නිර්මාණවේදීන් හා කලාකරුවන් ඇගයීම ප්‍රධාන අරමුණ කර ගත් ජාතික සාහිත්‍ය කලා මහෝත්සවයක් වාර්ෂිකව තෝරා ගත් ප්‍රදේශයක් මුල් කර ගෙන පවත්වනු ලබනවා. මෙවර "ජාතික සාහිත්‍ය කලා ප්‍රසාදිනී" ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය මතුගම සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර ජාතික පාසලේදී 2013 ඔක්තෝබර් 18, 19 හා 20 යන දිනවල පැවැත්වුවා. මෙහිදී ශ්‍රී ලංකාවේ සාහිත්‍ය හා කලා ක්ෂේත්‍රයට සුවිශේෂී වූ මෙහෙයක් ඉටු කළ සාහිත්‍ය හා කලා ක්ෂේත්‍රවල ප්‍රවීණයින් 5 දෙනෙක් ඇගයීමට ලක් කරමින් සම්මාන පිරිනැමුවා. කළුතර දිස්ත්‍රික්කයේ සාහිත්‍ය හා කලා ක්ෂේත්‍රවල ප්‍රවීණයින් 10 දෙනෙක් සඳහා කාලතිර්ථාභිමානී සම්මානය පිරිනැමුවා. ඒ වාගේම නර්තන ප්‍රසංග, ළමා මණ්ඩපය, පොත් ප්‍රදර්ශනය, රස වින්දන වැඩසටහන, සංස්කෘතික ගුවන් විදුලි නාලිකාව, ශාන්තිකර්ම ජ්‍යෝතිශ් සේවා, උපන් දින ත්‍යාග වැඩසටහන් ආදිය තෙදින පුරාම පවත්වනු ලැබුවා. දෙස් විදෙස් සංස්කෘතික සබඳතා සවිමත් කර ගැනීමට නිරන්තරවම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබුවා. මේ වන විට රටවල් 55ක් සමඟ සංස්කෘතික අවබෝධතා ගිවිසුම්වලට එළඹ ඇති අතර මින් 31ක් බල පැවැත්වෙනවා. ඉදිරියේදී තවත් රටවල් 24ක් සමඟ ගිවිසුම්වලට එළඹීමට නියමිත අතර 2014 දී රටවල් 7ක් සමඟ ගිවිසුම්වලට එළඹීමට අදාළ මූලික කටයුතු දැනටමත් සිදු කර තිබෙනවා. මේ වර්ෂයේ විවිධ සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා විදේශ සංචාර 12ක් සිදු කර තිබෙනවා. එමෙන්ම විදේශීය සංස්කෘතික කණ්ඩායම්/දූත කණ්ඩායම්වල ලංකා සංචාර 13ක් සඳහා අප අමාත්‍යාංශයේ දායකත්වය ලබා දී තිබෙනවා. මේ අතරින් සුවිශේෂී වූ කාර්යයක් වන්නේ අප අමාත්‍යාංශය විසින් ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රදේශයේ හයිද්‍රාබාද්හි නාගර්ජුන සාගර්හි අන්තර්ජාතික බෞද්ධ මධ්‍යස්ථානයේ බෞද්ධ තේමා උයනට ශ්‍රී ලංකාවේ දායකත්වයෙන් ලංකාවේ අවුකන බුද්ධ ප්‍රතිමාවහන්සේගේ අනුරුවක් සහ පරිවාර අංග වශයෙන් සඳකඩ පහන, මුරගල, වලාකුළු බැම්ම, සිංහ රූප, කොරවක් ගල් හා සණ්ඨාරය නිර්මාණය කර එහි ස්ථාපනය කිරීමයි. මේ වන විට එහි සියලු ඉදි කිරීම් අවසන් කරලා තිබෙනවා. මේ සඳහා රුපියල් මිලියන 7.98ක් වැය කළා.

අමාත්‍යාංශයෙන් ක්‍රියාත්මක වන තවත් විශේෂ ව්‍යාපෘතියක් තමයි ආදිවාසී ජන සංස්කෘතිය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය. මේ යටතේ පර්යේෂණ ග්‍රන්ථ 03ක් එළි දක්වලා තිබෙනවා. ඒ සමඟම ආදිවාසීන් වෙනුවෙන් අම්පාර පොල්ලෙබැද්ද හා හෙනානිගල සඳහාත් මොරණරාගල - රතුගල සඳහාත්, වාකරේ - කංචකුලම් සඳහාත් නිවාස 100ක් ඉදි කරනවා. මින් නිවාස 86ක ඉදි කිරීම් දැනටමත් අවසන් කර තිබෙනවා.

හික්කඩුවේ ඉදි කෙරෙන සංස්කෘතික මධ්‍යස්ථානය හා සුනාමි පර්යේෂණ ආයතනය සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය උදෙසා ක්‍රියාත්මක තවත් විශේෂ ව්‍යාපෘතියක්. සංස්කෘතික මධ්‍යස්ථානයක්, පුස්තකාලයක්, පරිපාලන කාර්යාලයක්, ශ්‍රවණාගාරයක්, දෙස් විදෙස් සංචාරකයින් සඳහා නවීන පහසුකම් සහිත අංග සම්පූර්ණ ආපනශාලාවක්, අලෙවි කුටි හා නේවාසික පහසුකම්වලින් සමන්විත මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 353ක් වෙනවා. මේ වන විට සංස්කෘතික මධ්‍යස්ථානය, පුස්තකාලය පරිපාලන කාර්යාලය යන පළමු අදියරේ ඉදි කිරීම් සම්පූර්ණයෙන් නිමා කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මාතර, නාවිමන, මොරකැටියහේනේ ඉදි වන සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය තවත් විශේෂ ව්‍යාපෘතියක්. කලාපීය සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම හා නඟා සිටුවීමත් විවිධ සංස්කෘතීන් අතර සම්බන්ධතාවන් ගොඩනැඟීමත් සඳහා කලාපීය කලාකරුවන්ගේ ප්‍රධානතම රැස්වීම් මූලස්ථානය ලෙස මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වීමට නියමිතයි. මේ යටතේ ප්‍රධාන ගොඩනැඟිල්ල පුහුණු මධ්‍යස්ථානය, නේවාසිකාගාර, විද්වතුන් සඳහා වන නිල නිවාස සහ සාර්ක් රටවල් සඳහා වෙන වෙනම නිවාස ඉදි කෙරෙනවා. මේ සියලු ඉදි කිරීම් ආරම්භ කර ක්‍රියාත්මක කර ගෙන යනවා. මේ වන විට ප්‍රධාන ගොඩනැඟිල්ලේ කොන්ක්‍රීට් වැඩ අවසන් අතර බිත්ති බැඳීම සිදු කරනවා. 2011 ජූලි 21වන දින වැඩ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ නව ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 1,541ක් වෙනවා.

අප අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට, සංස්කෘතික මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලයට, සම්පත්දායකයින් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමට, දෙස් විදෙස් සංස්කෘතික ප්‍රසංග සඳහාත්, සංස්කෘතික මධ්‍යස්ථානයේ සිසු සිසුවියන් පුහුණු කිරීම සඳහාත් වේයන්ගොඩ පුහුණු මධ්‍යස්ථානය යොදා ගන්නවා. ඒ අසල ඇති වසා දැමූ කර්මාන්තශාලාවක් පවරාගෙන රංගශාලාවක් හා නේවාසිකාගාරයක් බවට වැඩිදියුණු කර වේයන්ගොඩ පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කර ගෙන යනවා.

අපේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවෙන් කලාකරුවන් හා ලේඛකයින්ගේ උසස් නිර්මාණකරණයට දිරි දීම සඳහා සුවිශේෂී වූ කාර්ය භාරයක් ඉටු කරනවා. 2012 අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ කලාකරුවන් හා ලේඛකයන් සඳහා පොලී රහිත වාහන ණය ලබා දීමට කටයුතු කළා. ඒ අනුව මේ වන විට 163 දෙනෙක් සඳහා වාහන ණය ලබා දී තිබෙනවා.

සරස්වතී විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කලාකරු රක්ෂණ ක්‍රමය, කලාදේවී රක්ෂණ යෝජනා ක්‍රමය, ජාතික කලාකරු භාරය, අගහිඟ කලාකරු ආධාර, වෛද්‍ය ආධාර, අවමංගල ආධාර ආදී සුභසාධන වැඩසටහන් යටතේ වාර්ෂිකව 1,000කට අධික කලාකරුවන් ප්‍රමාණයක් ප්‍රතිලාභ ලබනවා. ඒ වාගේම වාර්ෂිකව පවත්වනු ලබන කලාභූෂණ සම්මාන උළෙල මඟින් ශ්‍රී ලාංකික සංස්කෘතික අංගයන් රැක ගැනීම පිණිස පුරෝගාමී වූ තෝරා ගත් සිංහල, දෙමළ, මුස්ලිම් කලාකරුවන් සඳහා රුපියල් 10,000ක මූල්‍ය ත්‍යාගයක්, රිදී පදක්කමක් හා කලාභූෂණ සහතිකපතක් පිරිනමනවා. මේ වර්ෂයේ රුපියල් මිලියන 2.75ක මූල්‍ය ත්‍යාග කලාකරුවන් 275 දෙනෙක් සඳහා පිරිනමනු ලැබුවා. ඒ වාගේම ටවර් හෝල් රඟහල පදනම මඟිනුත් වාර්ෂිකව ටවර් හෝල් ශිල්පීන් සඳහා විශ්‍රාම දීමනා, අවමංගල්‍යාධාර, වෛද්‍ය ආධාර, දුම්රිය බලපත්‍ර ආධාර, අලුත් අවුරුදු තෑගි ආදී සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර 2013 වසරේ ප්‍රතිලාභී කලාකරුවන් ගණන 400ක් වෙනවා.

[ගරු ටී. බී. ඒකනායක මහතා]

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි දිවයින පුරා පවත්වාගෙන යන කලායතන සඳහා වාර්ෂිකව එම කලායතන පවත්වාගෙන යාම සඳහා ආධාර ලබා දෙනවා. මේ වර්ෂයේ කලායතන 48ක් සඳහා රුපියල් 492,300ක මුදලක් ආධාර වශයෙන් ලබා දී තිබෙනවා. ඒ වාගේම 2013 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව නැඟෙනහිර පළාතේ කලායතන 50ක් සඳහා රුපියල් මිලියන 1.4ක් වටිනා භාණ්ඩ ලබා දුන්නා. සංස්කෘතික දෙපාර්තමේන්තුව යටතේ ලියා පදිංචි කලායතන ගණන මේ වන විට 1,400 දක්වා වර්ධනය වී තිබෙනවා. මෙම කලායතන සඳහා සංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් ලියා පදිංචි සහතිකයක් හා විෂය නිර්දේශයක් ලබා දෙනවා. ඒ අනුව මෙම කලායතන තම පුහුණු පාඨමාලා ඇතුළු තවත් විශේෂ වූ කාර්යයන් රාශියක් මේ ස්ථානයේ ක්‍රියාත්මක කරගෙන යනවා.

ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ සංස්කෘතික පුනර්ජීවයක් ඇති කිරීම සඳහා ආරම්භ කරන ලද සුවිශේෂ වැඩසටහනක් තමයි සංස්කෘතික බලමණ්ඩල වැඩසටහන. මේ යටතේ ග්‍රාමීය සංස්කෘතික බලමණ්ඩල, ප්‍රාදේශීය සංස්කෘතික බලමණ්ඩල හා දිස්ත්‍රික් සංස්කෘතික බලමණ්ඩල පිහිටුවනු ලබනවා. ඒ අනුව ප්‍රාදේශීය සංස්කෘතික බලමණ්ඩල 217ක් හා දිස්ත්‍රික් සංස්කෘතික බලමණ්ඩල 18ක් පිහිටුවා තිබෙනවා. මෙම වර්ෂයේ මෙම සංස්කෘතික බලමණ්ඩල හරහා දේශීය ආහාර සංස්කෘතිය ප්‍රචලිත කිරීමේ හා ව්‍යාප්ත කිරීමේ වැඩසටහන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කළා. මෙහිදී ජනතාවට හිතකර දේශීය ආහාර රටාවන් පිළිබඳව සරල බසින් ලියන ලද "කෙතයි බතයි අපේකමයි" නමැති වටිනා ග්‍රන්ථය ජනතාව අතර බෙදා හැරියා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම සාහිත්‍ය හා ප්‍රකාශන සංවර්ධන කටයුතු වෙනුවෙන් ද සංස්කෘතික දෙපාර්තමේන්තුව සුවිශේෂී වූ කාර්ය භාරයක් ඉටු කරනවා. සිංහල විශ්ව කෝෂය, සිංහල ශබ්ද කෝෂය, මහාවංශය, මහාවංශ ගීතය ආදී සංස්කෘතික වටිනාකමක් සහිත පොත් මුද්‍රණය කිරීම සිදු කරනවා. ආධුනික ලේඛකයන් දිරිගැන්වීම පිණිස වාර්ෂිකව එක් ලේඛකයෙකුගෙන් පොත් 02ක් මිලට ගෙන දිවයින පුරා පිහිටි පාසල්, පිරිවෙන්, පුස්තකාල වෙත බෙදා දීම සිදු කරනවා. මෙම වර්ෂයේ ලේඛකයන් 86 දෙනෙකුගෙන් රුපියල් 531,476ක් වටිනා පොත් 2,502ක් මිල දී ගෙන නොමිලේ බෙදා හැරීම සිදු කළා. ඒ වාගේම ප්‍රාදේශීය සාහිත්‍ය කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රුපියල් 10,000 බැගින් ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට රුපියල් 25,000ක් බැගින්ද ප්‍රතිපාදන ලබා දෙනවා. ඒ අනුව 2013 වර්ෂයේ ප්‍රාදේශීය සාහිත්‍ය කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 3.71ක ප්‍රතිපාදන ලබා දී තිබෙනවා.

කලාකරුවන් හා ලේඛකයන්ගේ නිර්මාණ කටයුතු ප්‍රවර්ධනයටත්, ඔවුන් රාජ්‍ය මට්ටමින් ඇගයීමත් අරමුණු කරගෙන රාජ්‍ය සාහිත්‍ය උත්සවය, රාජ්‍ය ළමා නාට්‍ය උළෙල, රාජ්‍ය නාට්‍ය උළෙල, රාජ්‍ය කෙටි නාට්‍ය උළෙල, රාජ්‍ය ළමා චිත්‍ර උළෙල, රාජ්‍ය චිත්‍ර මූර්ති උළෙල, රාජ්‍ය නර්තන උළෙල, රාජ්‍ය මුද්‍රා නාට්‍ය උළෙල, රූපවාහිනී රාජ්‍ය සම්මාන උළෙල ආදී රාජ්‍ය උළෙළ රාශියක් වාර්ෂිකව ඉතා උත්කර්ෂවත් අයුරින් සිදු කරනවා. මෙහිදී එක් එක් අංශවලින් දීප ව්‍යාප්තව තරග පවත්වා ජයග්‍රාහකයන් තෝරා සම්මාන පිරිනැමීම සිදු කරනවා. මේ වන විට සාහිත්‍ය හා කලා යන සෑම අංශයකම රාජ්‍ය තරග සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීම වර්ධනය වී තිබෙනවා. 2008 වර්ෂයේ රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවය සඳහා භාෂාත්‍රයෙන්ම ඉදිරිපත් කර තිබුණේ නිර්මාණ 500ක් වැනි ප්‍රමාණයක්. නමුත් 2013 වර්ෂය වන විට එය නිර්මාණ 1,650ක් දක්වා වර්ධනය වී තිබෙනවා. විශේෂයෙන් උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ නව වර්ධනයක් පෙනෙන්නට තිබෙනවා.

කලාකරුවන්ගේ නිර්මාණ කටයුතු නිස්කලංක පරිසරයක සිට කිරීමට අවකාශ සලසනු වස් රුපියල් මිලියන 465ක වටිනාකමින් යුත් ජාතික කලා නිකේතනයක් මහනුවර කුණ්ඩසාලේ ඉදි කරනවා. මේ වන විට එහි කලා ශිල්පීන්ගේ හා ප්‍රභූ නිවාඩු නිකේතන, එළිමහන් රංග ශාලාව, සනීපාරක්ෂක පහසුකම්, පාරවල්, රැඳවුම් බැම්ම ආදී කටයුතු අවසන් කර තිබෙනවා. පුහුණු ශාලා දෙකේ මූලික ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබෙනවා. 2014 දී ආපන ශාලාව ද ඇතුළත්ව පරිපාලන ගොඩනැඟිල්ල, නේපථ්‍යාගාරය, ජල ටැංකිය හා භූමි අලංකරණය සිදු කිරීමට බලාපොරොත්තු වනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ඔබතුමාට නියමිත වෙලාව අවසානයි.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඒ සමඟම ජෝන් ද සිල්වා සමරු රඟහල වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සම්පූර්ණයෙන්ම නවීකරණය කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මේ වර්ෂයේ ආරම්භ කළා. මේ වන විට ජෝන් ද සිල්වා සමරු රඟහලේ පැරැණි ගොඩනැඟිල්ල සම්පූර්ණයෙන්ම කඩා ඉවත් කර ඇති අතර, නව ගොඩනැඟිලි සැලැසුම සකස් කරමින් පවතිනවා. නරඹන්නන්ට පහසුකම් සැපයීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 322.7ක් වෙනවා.

මෙවැනි කාරණා රාශියක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු පිළිබඳ කාරණා විශාල ප්‍රමාණයක් කථා කරන්න තිබුණත් කාල වේලාව සීමිත නිසා මම මේ කරුණු කීපය පමණක් සඳහන් කරනවා.

විශේෂයෙන් යාපනය, ත්‍රිකුණාමලය හා ගාල්ල දිස්ත්‍රික්කවල සංස්කෘතික මධ්‍යස්ථාන නවීකරණය කිරීම සඳහාත්, ලයනල් වෙන්ඩ්ට් රඟහල, ලුම්බිණි රඟහල හා ගාල්ල නගර ශාලා රඟහල නවීකරණය කිරීම සඳහාත් අතිගරු ජනාධිපතිතුමා මෙවර අය වැයෙන් මුදල් ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මහනුවර හා අනුරාධපුරයේ ප්‍රසංග කලා මධ්‍යස්ථාන සඳහා රුපියල් මිලියන 3,000ක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම කලාකරුවන් සඳහා නිවාඩු නිකේතන ඉදිකිරීමේ කාර්යය ක්‍රියාත්මක කරලා තිබෙනවා. "උතුරු මිතුරු" වැඩසටහන සඳහා රුපියල් මිලියන 12ක් අපි ලබා දී ඒ ගොඩනැඟිල්ල හදලා තිබෙනවා.

මේ අවස්ථාවේදී අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, අතිරේක ලේකම්තුමිය ඇතුළු සියලුම ලේකම්වරුන්ටත්, සංස්කෘතික අධ්‍යක්ෂතුමා ඇතුළු අපේ අමාත්‍යාංශයේ සියලු දෙනාටත්, ශ්‍රී ලංකා කලා මණ්ඩලය ඇතුළු අපේ ආයතනවල ආයතන ප්‍රධානීන්ටත්, අංශ ප්‍රධානීන් ඇතුළු සියලු දෙනාටත් මගේ ස්තුතිය පළ කරනවා. 2013 වසරේත්, එළැඹෙන ඉදිරි වසරවලත් අපේ ඉලක්කය රටේ, ජාතියේ කලා කෙත අස්වැද්දීම සඳහා අවශ්‍ය ශක්තිය ලබා දීමයි. බොහොම ස්තුතියි.

[பி.ப. 2.10]

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, தெரிகுழுவுக்கு ஆற்றுப்படுத்தப்பட்ட பல அமைச்சுக்களின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மிகுந்த மகிழ்ச்சியடைகின்றேன். இவ்வேளை, எந்தவொரு காலத்திலும் யாரும் எதிர்நோக்காத மதவாதச் செயற்பாடுகளும் பௌத்த ஆதிக்கமும் இவ்வரசாங்கம் ஆட்சியைப் பொறுப் பேற்ற காலம் தொடங்கி இடம்பெற்றுவருவதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். இந்நாடு இந்து, பௌத்த, இஸ்லாமிய, கிறிஸ்தவ மதம் சார்ந்த மக்களின் சொந்த நாடாக உள்ளது. ஆனால், இன்று அரசியலமைப்புத் தொடக்கம் அரசாங்கம் ஈறாக பௌத்த மதத்துக்குப் பூரண ஆதரவு கொடுக்கப்பட்டு ஏனைய சமயங்கள் அடிமைப்படுத்தப் படுகின்றன. ஆசியாவிலே அதிசயமிக்க நாடாக ஸ்ரீலங்காவை உருவாக்க வேண்டும் என்ற ரீதியில் இந்து, இஸ்லாமிய, கிறிஸ்தவ ஆலயங்களை இடித்தலும் இந்து சமய மக்களின் மத உரிமையைப் பறித்தலுமான நடவடிக்கைகள் எடுக்கப்படு கின்றனவா? என நான் கேள்வியெழுப்ப விரும்புகின்றேன். 82 வீதம் இந்துக்களைக் கொண்ட இந்தியா, அதனை ஓர் இந்து நாடு என வெளிப்படுத்தவுமில்லை, ஏனைய சமய மக்களை அச்சுறுத்தவுமில்லை. ஆனால், இந்தியாவில் தோன்றி, இன்று அங்கே இரண்டு வீதமாக இருக்கும் பௌத்த மதம், இலங்கையில் அரசாங்கத்தின் தலைமை மதமாகக் கொண்டு வரப்பட்டு, ஏனைய சமயங்களை அச்சுறுத்தி வருகின்ற நிலைமை அதிகரித்த வண்ணம் இருப்பதை நான் இச்சபையில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இந்துக்களைப் பொறுத்தவரை அவர்கள் கௌதம புத்தரைப் பெரிதும் மதிக்கின்றனர். வெளிநாடுகளிலும் பெரும்பாலான இந்துக்களின் வீடுகளில் கௌதம புத்தரின் திருவுருவச் சிலை உள்ளது. ஏனெனில் அவர் பிறப்பால் ஓர் இந்து. அவரது போதனைகளை இவர்கள் தர்ம போதனைகள் எனப் போற்றுகின்றனர். ஆனால், இன்று கௌதம புத்தரின் போதனையின் வாரிசுகள் எனக் கூறிக்கொள்ளும் பௌத்த துறவிகள் சிலர் எமது நாட்டில் ஏனைய சமய மக்களை அச்சுறுத்தி வருகின்றனர். தற்பொழுது

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

பல இந்துக் கோயில்கள் யுத்தத்தைக் காரணம் காட்டி உடைக்கப்பட்டுள்ளன. இன்னும் சில இந்துக் கோயில்கள் உடைக்கப்பட்டு அவ்விடங்களில் பௌத்த விகாரைகள் கட்டப்பட்டுள்ளன. வடக்கு, கிழக்கு மாகாணத்தில் சிங்கள மக்கள் எப்போதும் வாழாத பகுதிகளில், தற்போது பல புத்த விகாரைகள் தோன்றியுள்ளன; ஒவ்வோர் இராணுவ முகாமிலும் புத்த விகாரை தோன்றியுள்ளது. எமது நாட்டில் சமாதானத்தை உருவாக்க கௌதம புத்தர் வருகைதந்ததாக மகாவம்சம் கூறும்போது, அதற்கு எதிர்மாறாகச் சில பௌத்தர்கள் கௌதம புத்தரின் திருவுருவச் சிலையைக் கொண்டு ஏனைய சமயங்களைக் குழப்புவதும் அவர்களை வேதனைப்படுத்துவதும்

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ஏற்பட்ட ஒன்றா என்று நான் கேள்வி எழுப்புகின்றேன்.

வடக்கு, கிழக்கு மாகாணத்தில் இன்று பல இந்துக் கோயில்களில் களவுகள் நிகழ்ந்துள்ளன. மட்டக்களப்பு மாவட் டத்தில் வாழைச்சேனை, புதுக்குடியிருப்பு ஸ்ரீ பத்திரகாளி அம்பாள் ஆலயத்தில் கடந்த வருடம் களவாடப்பட்ட நகைகள் சார்பாகப் பொலிஸார் இதுவரை எந்த விசாரணையும் செய்யவில்லை. அதுதவிர கடந்த ஆனி மாதத்தில் குருக்கள் மடம் செல்லக் கதிர்காமர் ஆலயம், மாங்காடு சித்திவிநாயகர் ஆலயம் போன்றவற்றின் விக்கிரகங்கள் உடைக்கப்பட்டு அதன் கீழிருந்த யந்திரத் தகடுகள் களவாடப்பட்டன; 19 விக்கிரகங்கள் உடைக்கப்பட்டன. இந்த நடவடிக்கை சார்பாகப் பொலிஸார் அசமந்தத்தனமாக இருந்ததால், நாங்கள் தீவிர நடவடிக்கைகளில் இறங்கினோம். அதன் பின்னர் பொலிஸார் சம்பந்தப்பட்ட கள்வர்களைப் பிடித்துள்ள தாகவும் நீதிமன்றில் ஆஜர்படுத்தியுள்ளதாகவும் தகவல் கிடைத்தது. ஆனால், எனக்குக் கிடைத்த தகவலின்படி, செல்லக்கதிர்காமர் ஆலயத்தில் உடைக்கப்பட்ட 19 கருங்கல் விக்கிரகங்களின் கீழிருந்த யந்திரத் தகடுகளை ஒத்தவையாகப் பொலிஸார் காட்டிய யந்திரத் தகடுகள் இல்லை என்பதை இச்சபையின் கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

இன்று வட மாகாணத்தில் கொடிகாமம், வரணியிலுள்ள 300 ஆண்டுகள் பழைமைவாய்ந்த கண்ணகி அம்மன் ஆலயச் சிலை களவாடப்பட்டுள்ளது. பொன்னாலை வரதராஜப் பெருமாள் கோயிலில் 150 பவுண் நகைகள் கொள்ளையிடப் பட்டுள்ளது. வண்ணார்பண்ணை நாச்சிமார் கோயிலின் தேர்முட்டியில் கொலை இடம்பெற்றிருக்கின்றது. முல்லைத் தீவு மாவட்ட கொக்கிளாய் - கொக்குத் தொடுவாய்ப் பகுதியில் பல ஆலயங்களில் கொள்ளைகள் நடைபெற்றிருக்கின்றன. மட்டக்களப்பு மாவட்டத்தின் புணானை விநாயகர் ஆலய விக்கிரகம் களவாடப்பட்டுள்ளது. இவ்வாறு வடக்கு, கிழக்கு மாகாணத்தில் 26 க்கும் மேற்பட்ட கோயில்களில் கொள்ளைகள் இடம்பெற்றிருக்கின்றன. அதிலும் ஆலய விக்கிரகங்கள் உடைக்கப்பட்டு அதன் கீழுள்ள யந்திரத் தகடுகளே பெரும்பாலும் களவாடப்படுகின்றன. ஆனால், இதில் சம்பந்தப்பட்டவர்களைக் கண்டுபிடிப்பதில் பாதுகாப்புத் தரப்பினரோ அரசாங்கமோ கவனம் செலுத்துவது மிகக் குறைவாகவே உள்ளது.

சிங்கள மக்களுடன் ஒன்றாக வாழ்ந்து அவர்களுடைய உதவியுடன் தம்புள்ளையில் வாழ்ந்துவந்த தமிழ்க் குடும்பங் களால் 30 வருடங்களுக்கு முன் தாபிக்கப்பட்ட பத்திரகாளி அம்பாள் ஆலயமும் விக்கிரகமும் தம்புள்ளை விகாரையின் புனித பிரதேசம் என்ற ரீதியில் முற்றாக உடைத்தழிக்கப் பட்டுள்ளன. அங்கிருந்த 42 தமிழ்க் குடும்பங்கள் வெளியேற் றப்பட்டு இப்பொழுது அவ்விடத்தில் குளம் அமைக்கும் பணி நடைபெறுகின்றது. இந்த நாட்டில் தமிழர்களுக்கும் பௌத்தம் தவிர்ந்த ஏனைய சமயத்தினருக்கும் எதுவித பாதுகாப்பும் இல்லை என்பதை இது உறுதிப்படுத்துகின்றது.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இன்று வடக்கு, கிழக்கு மண்ணில் உள்ள இந்து மக்கள் தமது பூர்வீக வாழ்விடங்களை அமைப்பதிலும் ஆலயங்களைப் புனர மைப்பதிலும் இந்து சமய ஆன்மீகப் பணிகளை மேம்படுத்து வதிலும் கவனம்செலுத்தும் வேளையில், இவற்றைத் தடுக்கும் விதத்தில் இராணுவத்தினரினதும் இராணுவப் புலனாய்வுப் பிரிவினரினதும் அச்சுறுத்தும் நடவடிக்கைகள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. சிவில் நிருவாகத்தில் இவர்கள் அதிகமாகத் தலையிடுகின்றனர். சகல சிவில் பணிகளிலும் இராணுவத்தினர் தலையிடுவதால் அரச உயர் அதிகாரிகள் இராணுவத்தினருக்குப் பயப்பட வேண்டிய நிலைக்கு உள்ளாகியுள்ளனர். அண்மையில் மட்டக்களப்பு மாவட்டத்தி

[ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා]

லுள்ள வாகரைப் பிரதேசத்தில் இந்து கலாசாரத் திணைக் களத்தின்மூலம் நடத்தப்பட்ட ஸ்ரீலஸ்ரீ ஆறுமுகநாவலர் குருபூசையை இராணுவத்தினரும் அதன் புலனாய்வுப் பிரிவினரும் தடுக்க முற்பட்டுள்ளனர். அதுமட்டுமன்றி வாகரைப் பிரதேசத்தில் இந்துக் கோவில்களின் புனரமைப்பிலும் இராணுவத்தினர் தலையிட்டுள்ளனர்.

இலங்கையில் வடக்கு, கிழக்கு மாகாணங்களில் மாத்திரம் இராணுவ அதிகாரிகள் ஆளுநராக நியமிக்கப்பட்டிருப்பதைப் பார்க்கும்பொழுது இவ்விரு மாகாணங்களிலும் இராணுவ ஆட்சியை உருவாக்குவதுதான் மஹிந்த சிந்தனையின் நோக்கமா? என்ற கேள்வியைக் கேட்கத் தோன்றுகிறது. அதுமாத்திரமன்றி இராணுவத்தினர் வடக்கு, கிழக்கிலுள்ள பல ஆலயங்களில் தினசரி நடத்தப்படும் பூசைகளை கடந்த நவம்பர் மாதம் 26ஆம், 27ஆம் திகதிகளில் நடத்தவிடாது தடுத்து நிறுத்தியமை மத உரிமையைப் பறிக்கும் ஒரு செயற்பாடாகும்.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, கௌதம புத்தரின் பௌத்த தத்துவத்தைப் போதிக்கவேண்டிய பௌத்த துறவிகள் இன்று 'பொதுபலசேனா', 'இராவணாபலய' போன்ற தீவிரவாத பௌத்த அமைப்புக்களை ஏற்படுத்தி, ஏனைய சமய மக்களுடைய அடிப்படை மத உரிமைகளைச் சிதைக்கும் நடவடிக்கையில் ஈடுபட்டுள்ளனர். இவர்களின் பின்னணியில் அரசாங்கத்தினர் இருக்கின்றார்களா என்ற சந்தேகம் மக்கள் மத்தியில் தோன்றியுள்ளது.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා (මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா - மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Mervyn Silva - Minister of Public Relations and Public Affairs)

Sir, I rise to a point of Order.

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

தயவுசெய்து நீங்கள் மன்னிக்க வேண்டும். எங்களுக்கு ஒதுக்கப்பட்டுள்ள நேரத்தில் பேசுவதற்கு எங்களை அனுமதிக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Minister, what is your point of Order?

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා ඒ කාලයේ කථා කළා නම් ප්‍රභාකරන්ගේ මිතීමරු -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

That is not a point of Order. Hon. Seeniththamby Yoheswaran, you carry on with your speech.

**ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

அண்மையில் பாராளுமன்றக் குழு அறையில் நடைபெற்ற பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சின் ஆலோசனைக் கூட்டத்தில் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள மட்டக்களப்பு நகர விகாரையின் பிக்கு அவர்களின் நடவடிக்கை குறித்தும் வாழைச்சேனை விகாரையின் பௌத்த பிக்குவின் நடவடிக்கை குறித்தும் தெளிவாகச் சுட்டிக்காட்டி பௌத்த தர்மத்தைப் பாதுகாக்குமுகமாக குறிப்பிட்ட பிக்குகளை மட்டக்களப்பு மாவட்டத்திலிருந்து இடம்மாற்றி அவர்களுக்குப் பதிலாகப் புதிய பிக்குமாரை நியமிக்குமாறு எடுத்துக் கூறினேன். இன்று கௌரவ உறுப்பினர் அரியநேத்திரன் அவர்களும் இங்கு அதனைச் சுட்டிக்காட்டினார். அவர்களது குறைபாடுகள் சார்பான ஆதாரங்களைக்கூடத் தெளிவாக முன்வைத்தேன். ஆனால், அவ்விடத்தில் பிரசன்னமாகியிருந்த பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர், "உங்களது இந்து சமயக் குருமாரும் கொலைகளைச் செய்கின்றனர்; எனவே, நீங்கள் இது சார்பாகத் தலையிட வேண்டாம்" எனக் கூறினார். பாதுகாப்புத் தரப்பினரே இதன் சூத்திரதாரிகளென நான் சுட்டிக்காட்டியும் அது சார்பாக ஆராய்வதாகவோ அல்லது நடவடிக்கை எடுப்பதாகவோ கூறாது, பௌத்த குருமார் மட்டக்களப்பில் என்ன அடாவடித்தனம் புரிந்தாலும் நாங்கள் பார்த்துக்கொண்டிருக்க வேண்டுமென்றவாறான தமது கருத்தின்மூலம் மத அலுவல்களுக்குப் பிரதி அமைச்சராக இருப்பதற்குத் தான் பொருத்தமற்றவர் என்பதை இவர் வெளிக்காட்டியிருக்கிறார். கூடுதலான இந்து ஆலயங்கள் இடிக்கப்பட்டிருப்பதும் இந்து ஆலயங்களுள்ள இடங்களில் பௌத்த விகாரைகள் தாபிக்கப்பட்டிருப்பதும் இந்து ஆலயங்கள் தொல்பொருளாக உட்படுத்தப்பட்டதும் இவரது திருகோணமலை மாவட்டத்தில்தான். சகல இன மக்களின் மத உரிமைகளை மதித்து நடப்பதுடன் அவர்களின் மத உரிமை களைப் பாதுகாக்க வேண்டியதும் மத அலுவல்களுக்குப் பொறுப்பான இவ்வமைச்சர்களின் கடமையாகும்.

இதேபோன்று, இவ்வமைச்சின் இன்னுமொரு ஆலோ சனைக் கூட்டத்திலும் ஒரு விடயத்தைச் சுட்டிக் காட்டினேன். அதாவது, கதிர்காம ஆலயத்தின் உற்சவம் இவ்வருடத்தில் ஒரு மாதம் பிந்தி ஆரம்பிக்கப்பட்டது. ஆனால், செல்வச் சந்நிதி ஆலயத்திலிருந்து பாத யாத்திரையாகக் கதிர்காமம் செல்லும் அடியார்கள் இந்து கலாசார திணைக்களத்தின் பஞ்சாங்கத்தின் பிரகாரம் வழமைபோன்று உரிய காலத்தில் பாதயாத்திரையை ஆரம்பித்திருந்தனர். இதனால் அந்த ஒருமாத காலத்தை அவர்கள் உகந்தை போன்ற இடங்களில் கழிக்கவேண்டியுள்ள தென்பதைச் சுட்டிக்காட்டி இப்புனித யாத்திரை செல்லும் அடியார்களுக்கு உணவு உட்பட ஏனைய உதவிகளை வழங்க அமைச்சு முன்வர வேண்டுமெனக் கேட்டுக்கொண்டபோது, "அவ்வாறு எங்களால் சாப்பாடு கொடுக்க முடியாது" என இந்நாட்டின் பிரதமரான பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சர் அதை முற்றாக மறுத்துவிட்டார். அதன் பின்னர் கௌரவ உறுப்பினர் பொன். செல்வராசா அவர்கள் குருக்கள் மடம் செல்லக்கதிர்காமர் ஆலய விக்கிரகம் உடைக்கப்பட்டது பற்றிக் குறிப்பிட்டபோது, எக்காரணம் கொண்டும் சாப்பாடு வழங்க முடியாதென அதற்கும் அதே பதிலை அளித்தார். தமிழில் கூறியது அவருக்கு விளங்கவில்லையெனக் கருதி அதனை ஆங்கிலத்தில் கூறியும், அதே பதிலைத்தான் தொடர்ந்து தந்துகொண்டிருந்தார். இதனால் இவ்விடயத்தை மேலும் தொடராது நிறுத்திவிட்டோம். மத விவகாரங்களுக்குப் பொறுப்பான அமைச்சரின் நிலைப்பாடு இவ்வாறெனில், இவரால் ஏனைய மதத்தினரின் உரிமைகளை எவ்வாறு பாதுகாக்க முடியும்? என்று நான் கேள்வியெழுப்ப

விரும்புகின்றேன். இன்று அரசாங்கத்தின் பங்காளிக் கட்சியாக இருக்கின்ற ஹெல உறுமய கட்சி, போதைப் பொருள் கடத்தல்களுக்கு உதவியதாக குற்றஞ்சாட்டி பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமான வரைப் பதவி விலகுமாறு வேண்டியிருக்கின்றது. இவ்விடயம் ஆதாரபூர்வமாக உறுதிப்படுத்தப்படுமாக இருந்தால் அவர் பதவி விலகவேண்டுமென்பதனை இந்த இடத்தில் தெரிவித்துக்கொள்கின்றேன்.

இந்த அமைச்சில் ஒவ்வொரு மதம் சார்ந்த பணிகளைப் புரிவதற்கு அம்மதம் சார்ந்த உதவிச் செயலாளர் அல்லது உதவிப் பணிப்பாளர் ஒருவர் நியமிக்கப்பட வேண்டும். ஆனால், இன்று அத்தகைய அதிகாரி எவரும் இவ்வமைச்சில் இல்லையென்பதையும் அத்துடன் தமிழ் அதிகாரிகள் எவரும் இல்லை என்பதையும் இவ்விடத்தில் சுட்டிக்காட்டுகின்றேன். இவ்வமைச்சின் கீழுள்ள இந்து கலாசாரத் திணைக்களத்திலும் இலங்கை நிருவாக சேவையைச் சேர்ந்த உத்தியோகத்தர்கள் மிகக் குறைவாகவே இருக்கின்றார்கள். அக்குறைபாட்டை நிவர்த்தி செய்வதற்கு இவ்வமைச்சு நடவடிக்கையெடுக்க வேண்டுமென்றும் கேட்டுக்கொள்கின்றேன்.

மேலும், இந்து கலாசாரத் திணைக்களத்தின்கீழ் அறநெறி ஆசிரியர்களாகக் கடமையாற்றும் ஆசிரியர்கள் கல்வி அமைச்சின்கீழ் உள்வாங்கப்பட வேண்டும். இதை நீண்டகாலமாக இவ்வமைச்சுக்கு எடுத்துக்கூறியும் அதில் அசமந்தப்போக்கே காணப்படுகின்றது. ஏனெனில், தமிழர்கள் - இந்துக்கள் என்ற மனத்துவேசம் இருந்தால் இவ்வாறான நற்பணிகளைப் புரிவது கடினமாகும். கடந்த 20 வருடங்களுக்கு மேலாக எந்தவித மாதாந்த ஊதியமுமின்றி 1,500க்கும் மேற்பட்ட அறநெறிப் பாடசாலைகளில் எட்டாயிரத்துக்கும் மேற்பட்ட அறநெறி ஆசிரியர்கள் இவ்வகையில் இந்து ஆன்மீகம் போதிக்கின்றனர். இவ்வேளை பௌத்தம், இஸ்லாம் மதத்தைச் சேர்ந்தவர்களுக்கு அவர்களது மதம் சார்ந்த ஆசிரியர் நியமனம் அறநெறிக் கல்வியை அடிப்படையாகக்கொண்டு வழங்கப்பட்டுள்ளது. இவ்வாறு இந்து அறநெறி ஆசிரியர்களும் ஆசிரியர் நியமனத்தில் உள்வாங்க நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதனை இவ்விடத்தில் கேட்டுக்கொள்கின்றேன்.

இன்று வடக்கு, கிழக்கில் பெரும்பாலான ஆலயங்கள் யுத்தத்தால் பாதிக்கப்பட்ட நிலையில், சில ஆலயங்களுக்கு மாத்திரம் ஓரிலட்சம் ரூபாய் என்ற ரீதியில் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சு வழங்கும் நிதி தற்கால பொருட்களின் விலைக்கேற்ப போதுமானதாக இல்லை. அதுவும் 85,000 ரூபாயே ஆலயத்தைச் சென்றடைகின்றது. எனவே, இந்நிதியை அதிகரிக்க வேண்டும். இதுவரை உதவி கிடைக்காத பாதிக்கப் பட்ட ஆலயங்களுக்கும் உதவி சென்றடைய வேண்டும். பௌத்த ஆலயங்களின் புனரமைப்பு மற்றும் தாபிப்பு என்பனவற்றில் கவனம் செலுத்துவது போன்று, அரசாங்கம் என்ற வகையில் ஏனைய சமயத்தவர்களின் ஆலயப் புனரமைப்பு மற்றும் தாபிப்புக்களுக்கும் உதவ வேண்டியது அமைச்சின் கடமையென்பதை இங்கு கூற விரும்புகின்றேன். இவ்விடயத்தைச் செய்யத் தவறுவதானது, இந்துவாகப் பிறந்த கௌதம புத்த பகவானை அவமதிப்பதற்கு ஒப்பாகும். அத்தோடு, இந்து மதகுருமாருக்கான பயிற்சிக் கல்லூரி ஒன்றை மட்டக்களப்பு மாவட்டத்தில் தாபிக்க முன்வரவேண்டும் என்றும் இந்து அமைப்புக்களின் பணிகளை மேம்படுத்த நடவடிக்கை எடுக்கவேண்டும் என்றும் நான் இவ்விடத்தில் கேட்டுக்கொள்கின்றேன்.

இன்று நீதிமன்றத்துக்குச் செல்கின்ற இந்து ஆலயங்கள் சம்பந்தமான பிணக்குகள் பலவும் நீண்ட நாட்களாகத் தீர்க்கப்படாமல் இழுபட்டுக்கொண்டிருக்கின்றன. எனவே, வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள நீதிமன்றங்களின்கீழ், இந்தப் பிரச்சினைகளை விசாரிக்கக்கூடிய வகையில், அரசியல் சார்பின்றி நீதியைப் பேணக்கூடிய ஓர் ஆணைக் குழுவை ஒவ்வொரு மாவட்டத்திலும் நியமிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்பதையும் இச்சபையூடாக கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக்கொள்கின்றேன்.

இன்று மதகுருமார் எமது நாட்டின் இன்றைய நிலை மற்றும் மனித உரிமை மீறல்கள் பற்றித் தங்களைச் சந்திக்க வருபவர்களிடம் கூறும்போது, இவர்கள் இராணுவம் மற்றும் புலனாய்வுப் பிரிவினர்களால் அச்சுறுத்தப்படுகின்றனர். இதைத் தடுத்து நிறுத்த அமைச்சு நடவடிக்கை எடுக்க வேண்டும். அண்மையிலே மன்னார் ஆயர் அவர்கள் இவ்வாறு அச்சுறுத்தலுக்குள்ளானார். அதேபோன்று, திருகோணமலை மாவட்டத்தில் வணக்கத்துக்குரிய பங்குத்தந்தை ஒருவரும் அச்சுறுத்தலுக்குள்ளானார். எனவே, இவர்களுடைய பாதுகாப்பை அமைச்சு உறுதிப்படுத்த வேண்டும்.

அண்மையில் மத விவகார அமைச்சு 5,000 இந்து ஆலயங்களைப் பொறுப்பேற்று, அதனது கட்டுப்பாட்டில் வைத்திருக்க முயற்சிகளை மேற்கொண்டிருந்தது. ஆனால், மத விவகார அமைச்சின் ஆலோசனைக் குழுக் கூட்டத்தில் நான் வாதாடியமையால் தற்போது இந்த நடவடிக்கை நிறுத்தப் பட்டுள்ளது. அதுபோல், இன்று தொல்பொருள் என்ற வகையில், இந்து ஆலயங்கள் மற்றும் இந்துக்களின் புராதன அமைவிடங்கள் எல்லையிடப்படுகின்றன. அம்பாறை மாவட்டத்தில் தங்கவேலாயுதபுரம், சங்கமான்கண்டி போன்ற இடங்களில் இடப்பட்ட தொல்பொருள் பிரதேச எல்லையால் இந்துக்கள் தமது ஆலயங்களில் எவ்வித புனருத்தாரண நடவடிக்கையையும் மேற்கொள்ள முடியாதுள்ளது. சங்கமான் கண்டி மலையில் அகில இலங்கை இந்து மாமன்றத்தின் நிதி உதவியால் கட்டப்பட்ட விநாயகர் ஆலயத்தை கும்பாபிஷேகம் செய்யவிடாது, தொல்பொருள் திணைக்களப் பகுதியும் இராணுவமும் தடுத்துள்ளது. இது இந்துக்களின் பல நூற்றாண்டு கால வழிபாட்டுத் தலங்களின் உரிமையை மறுப்பதாகும்.

இதேபோன்று இராவணன் ஆட்சியுடன் அமைந்த கன்னியா வெந்நீரூற்றுப் பிரதேசத்தைத் தொல்பொருள் பகுதிக்குள் உள்ளடக்கி, அங்குள்ள இந்துக்களின் இந்து ஆலயப் புனரமைப்பு தடுக்கப்பட்டு, புதிதாக பௌத்த விகாரை தாபிக்கப்பட்டுள்ளது. தொல்பொருள் பகுதிகளில் பௌத்த ஆலயங்கள் தாபிப்பதற்கு அனுமதியுண்டு! ஆனால், அங்கு இடிந்திருக்கின்ற இந்து ஆலயத்தைப் புனரமைக்க முடியாது! இவ்வாறான செயற்பாடுகளை அரசாங்கம் தடுக்க முற்படாவிட்டால், இந்நடவடிக்கைகள் பற்றிச் சர்வதேசத்துக்கு கொண்டுசெல்வதனூடாக அஹிம்சை வழியில் மத உரிமை மீறல்கள் தொடர்பான போராட்டங்கள் உருவாவதைத் தடுக்க முடியாது என்பதை நான் இச்சபையிலே தெரிவித்துக் கொள்கின்றேன். பிக்குகளோ அல்லது இராணுவமோ மேற்கொள்ளுகின்ற, இந்து மக்களை மிகவும் வேதனைப் படுத்துகின்ற இவ்வாறான செயற்பாடுகளை இந்த அமைச்சு தடுத்து நிறுத்தவேண்டும். தொல்பொருள் பகுதியென்றால், அப்பகுதியில் பௌத்த மதத்தினருடைய நடவடிக்கை எதுவும் இடம்பெறலாம், ஆனால், ஏனைய மதத்தவர்களுக்கு உரிமை இல்லை! இது என்ன நியாயம்? முன்பு இந்து, பௌத்த மக்கள் ஒற்றுமையாக இருந்துள்ளனர். சில தமிழர்கள் பௌத்த சமயத்தைப் பேணிப் பாதுகாத்துள்ளனர். பௌத்த மன்னர்களும் இந்து, பௌத்த மதங்களைச் சமமாகப் பேணியுள்ளனர். ஆனால், இன்று அந்நிலையில் மாற்றம் ஏற்பட்டுள்ளது. எனவே, இந்து, இஸ்லாமிய, கிறிஸ்தவ மக்களுடைய உரிமைகளைப் பாதுகாப்பதில் மத விவகார அமைச்சு கவனம் செலுத்தவேண்டும்.

[ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා]

தற்பொழுது, கௌரவ பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தில் இருக்கும்வேளையில் நான் ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். இலங்கைப் பாராளுமன்ற வளாகத்தில் ஒரு பௌத்த வழிபாட்டுத் தலம் அமைக்கப்பட்டுள்ளது. இதேபோன்று இந்து, கிறிஸ்தவ, இஸ்லாமிய வழிபாட்டுத் தலங்களையும் அமைப்பதற்கு கௌரவ சபாநாயகர் அவர்களினூடாக நீங்கள் நடவடிக்கை எடுக்கவேண்டுமென்று வேண்டுகோள் விடுக்கின்றேன். கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாடு ஓர் இந்து நாடு! இதனை நான் உங்களுக்குத் தெளிவாகச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதாவது, இந்த நாட்டை முன்பு இராவணன் ஆட்சி செய்தான். அவன் ஓர் இந்து மன்னன்! அதற்கான பல ஆதாரங்கள் இருக்கின்றன. ஆகவே, இந்த நாட்டிலே இந்துக்களுடைய உரிமைகளைப் பாதுகாப்பது மிகவும் இன்றியமையாததாகும் என்பதை நான் இங்கு கூறிவைக்க விரும்புகின்றேன். இந்த நாட்டை ஆரம்பத்தில் தேவர்களில் ஒருவரான குபேரன் ஆண்டதாகவும் பின் -

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
What is the point of Order?

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
මේක හින්දු රටක් නොවෙයි, මේක සිංහල බෞද්ධ රටක්.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order. Hon. Member, you carry on.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இது இந்து நாடு! இதனை மகாவம்சம் உறுதிப்படுத்துகின்றது. இந்த நாட்டை ஆரம்பத்தில் தேவர்களில் ஒருவரான குபேரன் ஆண்டதாகவும் பின் அவனது சகோதரரான இராவணன் ஆண்டதாகவும் அதன் பின் விபீஷணன் ஆண்டதாகவும் இந்துக்களின் இதிகாசமான இராமாயணம் கூறுகின்றது. இராவணன் ஒரு சிவபக்தன் என்பதை இங்கு எடுத்துக்காட்ட விரும்புகின்றேன். இலங்கையின் வரலாற்றைப் பின்னோக்கிப்பார்த்தால், இலங்கையில் கண்டெடுக்கப்பட்ட தமிழ் பிராமிக் கல்வெட்டுக் களில் கி.மு. 3ஆம் நூற்றாண்டளவில் பொறிக்கப்பட்ட சிவ வழிபாடு பற்றிய செய்திகளும் சிவனைப் பற்றிய செய்திகளுமுள்ள கல்வெட்டுகள் காணப்படுகின்றன. அது மட்டுமன்றி சிவன் பற்றிய சுமார் 90 கல்வெட்டுக்களை டாக்டர் பரணவிதாரண அவர்கள் பதிவுசெய்துள்ளார். மேலும் கிறிஸ்துவுக்குப் பின்னர் இந்த நாட்டுக்குள் புகுந்த விஜயனும் அவனுடைய நண்பர்களும் இங்கிருந்த இயக்கர் குலப் பெண்களால் எச்சரிக்கப்பட்டதையும் அக்குலத்துப் பெண்ணான குவேனியை விஜயன் திருமணம் செய்ததையும் மகாவம்சம் எடுத்துக்காட்டியுள்ளது. அதுமட்டுமன்றி, மதுரை யிலிருந்து பாண்டிய இளவரசிகளை அழைத்துவந்து விஜயனும் அவனது நண்பர்களும் திருமணம் செய்துகொண்டதையும் மகாவம்சம் உறுதிப்படுத்துகிறது.

இவர்களுடைய வருகைக்கு முன்பு இந்நாட்டில் இயக்கர், நாகர் போன்ற வம்சத்தினர் இருந்தமை பல இடங்களில் உறுதிப்படுத்தப்பட்டுள்ளது. அதுமட்டுமன்றி 7ஆம், 8ஆம் நூற்றாண்டுகளில் தோன்றிய திருஞானசம்பந்தர், சுந்தரமூர்த்தி சுவாமிகள் போன்றோர் தென்னிந்தியாவிலிருந்து இலங்கை யிலுள்ள திருக்கேதீஸ்வரம், திருக்கோணேஸ்வரம் ஆகிய தலங்கள்மீது திருப்பதிகங்கள் பாடியுள்ளமையையும் சுட்டிக் காட்ட விரும்புகின்றேன். அத்தோடு, இலங்கையை ஆண்ட மூத்தசிவ என்ற இந்து மன்னன் தமது புதல்வனுக்குத் தேவநம்பியதீசன் என்னும் பெயரைச் சூட்டியமையையும் இச்சந்தர்ப்பத்தில் கூறுகின்றேன். பண்டுகாபய மன்னன் யக்ஷ வழிபாடு மற்றும் சிவ வழிபாடு போன்றவற்றைப் பேணி வந்துள்ளமையையும் மகாவம்சம் சுட்டிக்காட்டுகிறது. சோழர் காலத்தில் இலங்கையிலிருந்த இந்துக்கள் பலர் தற்போதைய சிங்கள மக்கள் குடியிருப்புக்களில் இந்து ஆலயங்களைத் தாபித்திருந்தமையையும் இங்கு சுட்டிக்காட்ட விரும்பு கின்றேன்.

மானாபரண மன்னன் தெவிநுவர விஷ்ணுவை வழிபட்டு வந்ததாகச் சூளவம்சம் கூறுகின்றது. முதலாம் பராக்கிரமபாகு சுமார் 79 இந்து ஆலயங்களைப் புனரமைத்ததுடன் புதிதாக 13 ஆலயங்களை அமைத்ததாகவும் சூளவம்சத்தின் 79ஆம் அத்தியாயத்தின் 19ஆம், 22ஆம் பிரிவுகள் கூறுகின்றன. தம்பதெனியாவை ஆண்ட விஜயபாகு மன்னன் தெவிநுவர விஷ்ணு ஆலயத்தைப் புனரமைத்ததோடு நெந்தோட்டையில் ஒரு காளி கோவிலையும் கட்டியதாக சூளவம்சமும் நோயல் ஆசிரியர் கழகத்தின் வரலாற்றுக் குறிப்பும் கூறுகின்றன. மன்னன் நிஸ்ஸங்க மல்லன் இராமேஸ்வர ஆலயத்தைத் திருத்தியதோடு, நிஸ்ஸ மகேஸ்வரன் என்னும் கோவிலையும் அங்கு தாபித்ததாக இலங்கைப் பல்கலைக்கழகம் வெளியிட்ட History of Ceylon என்னும் நூல் குறிப்பிடுகிறது. நான்காம் விஜயபாகு இந்துக் கோவில்களுக்கு ஆற்றிய பணிகள்பற்றி பௌத்த நூல்கள் கூறுகின்றன. நான்காம் பராக்கிரமபாகு, நான்காம் புவனேகபாகு, மூன்றாம் விக்கிரமபாகு, ஐந்தாம் புவனேகபாகு போன்ற மன்னர்கள் இந்துக் கோவில்களைக் கட்டினார்கள் என்றும் ஆறாம் விஜயபாகு முன்னேஸ்வரத்தைத் திருத்தியதோடு தனது இராச்சியத்தில் பல இந்துக் கோவில்களைக் கட்டினார் என்றும் நோயல் ஆசிரியர் கழகக் குறிப்புகள் சுட்டிக்காட்டுகின்றன.

இவ்வாறு ஆராய்ந்து பார்க்கும்பொழுது இந்து சமயமும் அதனைப் பின்பற்றுபவர்களான தமிழர்களும் இந்த நாட்டின் பூர்வீகக் குடிகளாக விளங்கியதை அனைவரும் உணரக் கூடியதாக உள்ளது. அக்காலத்தில் வாழ்ந்த தமிழ் மக்களும் பௌத்த மதத்தை நேசித்து வாழ்ந்துள்ளனர் என்பதும் சில தமிழர்கள் பௌத்தர்களாக வாழ்ந்தார்கள் என்பதும் வரலாறு. இந்த வகையில் கி.மு. 2ஆம் நூற்றாண்டு தொடக்கம், அதாவது துட்டகைமுனு அனுராதபுரத்தைக் கைப்பற்றுவதற்கு முன்பு, 32 தமிழ் அரசர்கள் இருந்தார்கள் என மகாவம்சத்தின் 25ஆவது அத்தியாயத்தின் 75ஆம் பிரிவில் சுட்டிக்காட்டப்பட்டுள்ளது. இதனை சீஹளவத்துப்பக்கரன என்ற நூலும் கூறுகிறது.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

இந்த அரசர்கள் மகியங்கனை தொடக்கம் அனுராதபுரம் வரை உள்ள பகுதியை ஆட்சி செய்தார்கள் என்றும் இவர்கள் அனைவரும் தமிழர்கள் என்றும் மகாவம்சம் கூறுகிறது. ஆனால் இவர்களுக்கும் எல்லாளனுக்கும் இடையில் உள்ள எந்தத் தொடர்பு பற்றியும் மகாவம்சம் கூறவில்லை.

புராதன இராசதானிகள் அடங்கிய வழிபாட்டுக் கட்டிடங்கள் உள்ள பகுதிகளை முன்பு ஐக்கிய தேசியக் கட்சி அரசாங்கம் கலாசார முக்கோணமாகப் பிரகடனப்படுத்தியது. அதற்கு வெளிநாடுகளிடமிருந்து கணிசமான மானியங்களும் கிடைத்தன. இத்தலங்களில் அரச ஆதரவுபெற்ற இந்துக் கோவில்களும் இருந்தன. இங்கு கிடைத்த வெண்கலச் சிற்பங்களில் பெரும்பாலானவை சைவசமயம் சார்ந்தவை. கலாசார முக்கோண நிருவாக சபையில் தற்பொழுது சைவர்கள் எவரும் உறுப்பினராக நியமிக்கப்படவில்லை. இதற்குக் காரணம் யார்? மத்திய கலாசார நிலையத்திலும் இதே நிலைதான்! ஆகவே, இங்கு வாழ்கின்ற இந்துக்கள் தேச பாரம்பரியமான விடயங்களிலிருந்து ஒதுக்கப்படுகின்றனர் என்பது தெரிகிறது. எனவே, ஒரு பூர்வீக இந்து நாடான இந்த இலங்கை நாட்டிலுள்ள இந்துக்களின் உரிமையும் ஏனைய மதத்தினருடைய உரிமைகளும் பாதுகாக்கப்படவேண்டும் எனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 2.33]

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා (මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா - மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Mervyn Silva - Minister of Public Relations and Public Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ද්‍රවිඩ සහෝදරයින්ට උත්තරයක් දෙන්නට ඕනෑ. viවෙනි පරාක්‍රමබාහු රජතුමාගේ දියණිය ලෝකනාථා දේවිය. [බාධා කිරීම්] කවුද කෑ ගහන්නේ? මාව ඔය පැත්තට ගෙන්වා ගන්න එපා කියලා, මම එක්සත් ජාතික පක්ෂයට බොහොම ගෞරවයෙන් කියනවා. දැහලුවොත් එනවා, ඇවිල්ලා දානවා එළියට. එන්නේ මර්වින් සිල්වා. වැදගත් විධියට ඉන්න.

ගරු මන්ත්‍රීවරුනි, ලෝකනාථා දේවිය කසාද බැන්දේ දෙමළ සෙන්පතියෙක්. viවෙනි පරාක්‍රමබාහු රජතුමා යාපනය සටන ජයග්‍රහණය කරලා, ලංකාවේ කෝට්ටේ යුගයේ රජ වුණා. යාපනය සටන ජයග්‍රහණය කළාම රජතුමාගෙන් සිංහල සේනාව ඇහුවා, "ඉතිරි දෙමළු ටිකත් මුහුදට දාමු ද?" කියලා. රජතුමා කිව්වා, "ඒක අපේ විධිය නොවෙයි; ඒක සිංහලකම නොවෙයි. ඒ උදවියත් අපේ උදවිය" කියලා. ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, අපි දෙන්නාගේම සම්බන්ධකම් තිබෙන මගේ නැන්දා කෙනෙක් යාපනයේ ප්‍රධාන පෙළේ දෙමළ කෙනෙක්ව කසාද බැඳලා ඉන්නවා. ඉතින් මම අයිති ද ඒ වර්ගයට? මම සිංහල, බෞද්ධයෙක්.

ලෝකනාථා දේවියට ප්‍රධාන දෙමළ සෙන්පතියාට පෙම් බැඳීමක් ඇති වුණා. යුද ජයග්‍රහණයට පසුව පියාගෙන් ඇහුවා, මම ඔහුව කසාද බඳින්නද කියලා. viවෙනි පරාක්‍රමබාහු රජතුමා කිව්වා බඳින්න කියලා. ඒ අනුව උලකුඩය දේවිය යන නමින් ඇයගේ නම වෙනස් වුණා. එක කථාවක් මේක.

දේවානම්පියතිස්ස රජතුමාගේ පියා තමයි මුටසීව. මුටසීව රජතුමාගේ මුණුපුරා තමයි දුටුගැමුණු. මහා රාවණා කියන්නේ ශ්‍රී ලංකාවේ හිටපු මහා සිංහල වීරවරයෙක්. රාමාත් එක්ක යුද්ධයක් ඇති වුණා කියලා සඳහන් වෙනවා. පොත් ලියන්නට පුළුවන් ඕනෑම විධියකට. එක එක්කෙනාට ඕනෑ විධියට පොත් හසුරුවනවා, පෑන හසුරුවනවා. සත්‍ය දැන ගන්න. [බාධා කිරීමක්] මොන point of Orderද? නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි ඉතිහාසය.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු යෝගේස්වරන් මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද? Please raise your point of Order.

**ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා**
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

இங்கு இராவணன் சிங்கள வீரரென்று குறிப்பிடப்பட்டது. துட்டகைமுனு மன்னனின் ஆட்சிக்கு முன்னரே இதிகாச காலம் என்பது பிழையான தகவல்.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

නැහැ, නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

I cannot entertain that. ගරු මර්වින් සිල්වා ඇමතිතුමා කථා කරන්න.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

රාවණා කියන්නේ මේ රටේ ප්‍රධාන පෙළේ සිංහල නරපතියෙක්. රාමාගේ නැඟණිය තමයි සුපුන්නිකා කියන්නේ. රාමාගේ ප්‍රේම සම්බන්ධයත් එක්ක ඇති වුණු කථාවේදී රාමාගේ මල්ලි ලක්ෂ්මන් ඒ නැඟණියගේ නහය කැපුවා. ඉන් පසුව ඇය ඇවිල්ලා රාවණාට කිව්වා, "අයියා මගේ නහය කැපුවා" කියලා. එතැනදී තමයි රාම - රාවණා සටන ඇති වුණේ. රාවණාගේ මල්ලි තමයි විභීෂණ විධියට ඉන්නේ. එක තාත්තයි, අම්මලා දෙන්නයි. මේක ඉතිහාසය. ගරු යෝගේස්වරන් මන්ත්‍රීතුමා කිව්ව එක දෙයක් හරි. මම පිළිගන්නවා. මොකක්ද ඒක? සිංහල රජවරු ඉන්දියාවෙන් කුමාරිකාවන් ගෙනාවා කසාඳ බඳින්න, තමන්ගේ රටේ ඉන්න කාන්තාවෝ හොඳ නැති නිසා. මහා පරාක්‍රමබාහු රජතුමාට කාන්තාවෝ 4 දෙනෙක් හිටියා. [බාධා කිරීමක්] කාන්තාවෝ 4 දෙනෙක් හිටියා. ඉන්දියාවේ අයත් හිටියා. කේරළයේ කෙනෙකුත් හිටියා. කාන්තාවෝ 4ක්. හැම රජ කෙනෙකුටම අන්තඃපුරයක් හිටියා. නැත්තේ නැහැ. ඒ නිසා ඒ කාන්තාවෝ ඉන්දියාවෙන් ගෙනැල්ලා, ඒ කාන්තාවන්ගේ ඕනෑකමට වඳින්නට, පුදන්නට හින්දු කෝවිලක් හැදුවා කියලා මේක හින්දු දේශයක් නොවෙයි.

ඊළඟ කථාව මෙයයි. දැන් මහා විෂ්ණු ගැන කථා කරනවා. මහා විෂ්ණු කියන්නේ උප්පලවර්ණ. උප්පලවර්ණ කියන්නේ දෙවුන්දර උපන්න, -අතිගරු ජනාධිපතිතුමාගේ ගමට ජේන තෙක්

[ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා]

මානයේ උපන්න- ශ්‍රී විෂ්ණු දෙවියෝ. ශ්‍රී විෂ්ණු නිල් පාටයි කියලා කියන්නේ, කළු නිල්වන් පැහැය. ඒ කියන්නේ ශ්‍රී විෂ්ණු උපන්නේ දෙවින්දර. කතරගම දෙවියෝ කියන්නේ කවුද? ශාක්‍ය වංශයේ බුදු හාමුදුරුවෝ කතරගම කිරි වෙහෙරට වැඩිය වෙලාවේ උවටැන් කළේ කතරගම දෙවියෝ. මොකද, කතරගම දෙවියෝ එදා යුව රජෙක්. යුව රජෙක් හැටියට උවටැන් කරලා ඒ පිනෙන් තමයි, රුහුණේ උපන්නේ. මේ වැරදි අර්ථකථන දෙන්නට එපා. හින්දු කෙනෙක් කසාද බැන්ද පමණින් ඒ දේශය හින්දු දේශයක් වන්නේ නැහැ. දැන් මගේ පුතා බඳින්න යන්නේ ඉරානෙ ළමයෙක්. ඉතින් මගේ පුතාගේ අයිති ඉරානයට ද? එහෙම නම් හරි වැඩක් නේ මේක. මමත් මුස්ලිම් කාන්තාවකට ප්‍රේම කළා. එයා කැමැති වුණා. [බාධා කිරීම්] ඔය හිනා වෙන කට්ටිය ප්‍රේම කරලා නැහැ. ඔබතුමන්ලා කළේ rape. මම ප්‍රේම කළා. මම rape කළේ නැහැ, ජීවිතේට. හැබැයි එතැනදී ඒ දෙමවුපියෝ අකමැති වුණු නිසා මට ඒ විවාහය කරන්න වුණේ නැහැ.

මගේ මිත්‍රයින්ට මම කියන්න කැමැතියි, - [බාධා කිරීම්] පොඩ්ඩක් මේක අහගන්න. මගේ අමාත්‍යාංශය ගැනයි, මේ කථා කරන්නේ. [බාධා කිරීම්] අපි ඔබතුමන්ලා එක්ක හබයක් නැහැ, ටීඑන්ඒ මන්ත්‍රීවරුනි. හබයක් වෙන්න ඕනෑත් නැහැ. වැඩේ කරලා ඉවරයි. දැන් අපත් එක්ක සහයෝගයෙන් ඉන්න. ගහන එක ගහලාත් ඉවරයි. කරන ඒවා කරලාත් ඉවරයි. සාමය ගෙනැල්ලත් ඉවරයි. දැන් කරන්න දෙයක් ඉතිරි වෙලා නැහැ. [බාධා කිරීමක්] ඒ නිසා අපි ඔබතුමන්ලාට වෛර කරන්නේ නැහැ. අපි ඔබතුමන්ලාත් එක්ක මිත්‍රයි. ඒ නිසා මිත්‍රකම තියාගෙන ඉන්න. වැඩියෙ දැඟලුවොත් හයවැනි පරාක්‍රමබාහු කළ දේ තමයි වෙන්නේ. ඊට එහා කියන්නේ නැහැ.

"The Immediate Tasks of the Soviet Government" කියන පොතේ ලෙනින් මෙහෙම කියලා තිබෙනවා:

"We must fully realize that in order to administer successfully, besides being able to convince the people, we must be able to do practical organizational work".

මේක ලෙනින් කියලා තිබෙන්නේ. මම නොවෙයි. මේ පොතේ 27වැනි කාණ්ඩයේ 242 - 243 පිටු බලන්න. සමාජවාදයේ පටන් ගැන්ම. මා මෙය දිගටම කියවා ගෙන යන්නේ නැහැ. මෙහි සිංහල තේරුම මම කියන්නම්. "සාර්ථක ලෙසින් පරිපාලනය කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීමට අමතරව, යුද්ධයක් ජයග්‍රහණය කිරීමට අමතරව, අපට ප්‍රායෝගික සංවිධාන කටයුතු කිරීමට අවශ්‍ය බව පැහැදිලිව තේරුම් ගත යුතුයි, ඉතාමත් අමාරු කාර්යද මෙයයි. මක්නිසාද දසලක්ෂ සංඛ්‍යාත ජනතාවකගේ ආර්ථික පදනම සහ ගැඹුරු ජීවන රටාව එම සංවිධානයට යටත් විය යුතුයි." මේක තේරුම් ගන්න. මේ කියන්නේලෙනින්.

ඊළඟට, මම සිංහල බෞද්ධයෙක් හැටියට සිඟාලෝවාද සූත්‍රයෙන් දක්වන්න කැමැතියි. සිඟාලෝවාද සූත්‍රයේ තිබෙනවා, සිඟාල ගෘහපතියාට එයාගේ පියා කියනවා, සය දිසා වන්දනා කරන්නය කියලා. සය වැනි දිසාව තමයි, පහළ. පහළ කියන්නේ යටි බඩෙන් පහළවත්, බුරියෙන් පහළවත්, කකුල් දෙක දිහා බැලීමවත් නොවෙයි. නායකයාට පහළින් සිටින උදවිය. බුදු හාමුදුරුවෝ දේශනා කරලා තිබෙනවා, සය දිශාව මොකක්ද කියලා. සය දිශාවෙන් එකක් තමයි, පහළ. ඒ කියන්නේ නායකයාට පහළින් සිටින මිනිස්සු දිහා බැලීම. ඒ කියන්නේ යටිතල පහසුකම්. මේක තමයි කියන්නේ. එතකොට මගේ මහජන සම්බන්ධතා හා මහජන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය හැදිලා තිබෙන්නේ මෙන්න මේ විධියටයි. ඒ කියන්නේ, අපට පහළ සිටින උදවිය මේ රටේ ඉහළ තලයේ නැතිව පහළ තලයේ ජීවත් වනවා. ප්‍රශ්න පිරුණු, ගැටලු පිරුණු, කාගේවත් ඇස ගැසෙන්නේ නැති, කවුරුවත් බලන්නේ නැති විශාල පිරිසක් මේ ලෝකයේම ඉන්නවා; මේ රටේත් ඉන්නවා. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් කියලා නැහැ, හැම ජාතියේම අය ඉන්නවා. අන්න ඒ උදවිය දිහා බැලීම තමයි අපේ යුතුකම වන්නේ. අපේ ලේකම් කැෂියන් හේරත් මැතිතුමාත්, මගේ අතිරේක ලේකම්තුමාත්, අපේ ගණකාධිකාරී සුබසිංහ මැතිතුමාත් ඇතුළුව අපි පොතක් සකස් කරලා තිබෙනවා. මමත් බෙලිඅත්ත ආසනයේ ගොඩේ කෙනෙක්.

මහින්ද චින්තනයේ මෙසේ සඳහන් වනවා:

"මාගේ ජීවිතය විකසිත වූයේ කුරහන් හේන් පිස හමා ආ ගැමි සුවඳිනි. ඒ නිසාම සොඳුරු බවින්, සෙනෙහසින් හා සෞන්දර්යයෙන් පිරුණු ගම පිළිබඳ මා දකින සිහිනය 'ගම නැඟුම' ලෙස යථාර්ථයක් බවට පත් කරමි. පසු ගිය දසක ගණනාව තුළ අපේ දෑස් ඉදිරිපිටදීම පිරිහීමට ලක් වූ ගම පුනර්ජීවනය කරමි."

එතකොට අපේ අදහසත් මේකයි. අපේ අමාත්‍යාංශය මඟින් මෙහි මෙහෙවර ඉදිරිපත් කරනවා. එහි මෙසේ සඳහන් වනවා.

"රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට ඉවහල්වන මහජන සම්බන්ධතා වර්ධනය හා මහජන කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා කැපවන රාජ්‍ය සේවයක් ඇති කිරීම."

ඊළඟට, එහි අරමුණ වශයෙන් මෙසේ සඳහන් කර තිබෙනවා.

"1. අමාත්‍යාංශය වෙත ලැබෙන මහජන පැමිණිලි පිළිබඳව අදාල අනෙකුත් අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණයකින් යුක්තව සහන සැලසීමේ යාන්ත්‍රණයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම. "

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
එහෙම නම් මා මේ පොත **සභාගත*** කරනවා.

මේ පොත බලන්න. අවසාන වශයෙන් මට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරන්න තිබෙනවා, මහජන සම්බන්ධතාව උඩ.

හින්දු ආගමේ තමයි තිබෙන්නේ "භගවත් ගීතා" කියන පොත. ඒ පොතේ තිබෙනවා, හරක් මරන්න එපා, සතුන් මරන්න එපා කියලා. තමුන්නාන්සේලා උතුරෙන් පටන් ගන්න හරක් මැරීම තහනම් කරන්න කියලා යෝජනාවක් ගෙනෙන්න. කතෝලික ආගමේ කිසිම තැනක සඳහන් වෙලා නැහැ, හරක් මරන්න කියලා. මා ඒ පොත කියෙව්වා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**** පොත ඉදිරිපත් නොකරන ලදී.***
*புத்தகம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Book not tendered.*

සතුන් මරන්න කියලා; හරක් මරන්න කියලා. මොකද, මුහම්මද්තුමා අරාබි දේශයේ සහරා කාන්තාරයේ යද්දී ඒ පිරිසට මහා බඩගින්නක් ආවා. සතකු පුච්චලා කන්න කියලා මුහම්මද්තුමාට කිව්වා. එතුමා මොකක්ද කළේ? එතුමා ඇඟිල්ලේ රෙදි පටි ඔතලා- ඔතලා සතාගේ මස්වලට ඇඟිල්ල ගහලා, ඊට පස්සේ රෙදි පටිය විසි කරලා ඇඟිල්ල ලෙව කෑවා. කිසිම ආගමක, කිසිම ධර්මයක සතුන් මරන්න කියලා නැහැ. නමුත් අරාබි දේශයේ ගහකොළ නැති නිසා එදා ඒ විධියට සතුන් කන්න සිද්ධ වුණා.

**ගරු හුනෛයිස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු හුනෛයිස් ෆාරුක් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු හුනෛයිස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
அரபு மொழி தெரிந்த, அல்குர்ஆனை நன்கு படித்து விளங்கியவர்களால் மாத்திரந்தான் அதற்கு விளக்கம் கொடுக்க முடியும். அல்குர்ஆனுக்குப் பிழையான அர்த்தத்தை கௌரவ அமைச்சர் அவர்கள் கொடுத்திருக்கிறார். எனவே, அதை 'ஹன்சாட்'இில் இருந்து நீக்குமாறு நான் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පල්ලියේ විශේෂ පූජකතුමෙක් තමයි ඒ පිළිබඳව මට කිව්වේ. ඒ කියන්නේ මුහම්මද්තුමාවත් කියලා නැහැ, සතුන් අනුභව කරන්න කියලා. දැන් අපේ අස්වර් මන්ත්‍රීතුමා ඉන්නවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීතින්ට අනුකූල නොවන සියල්ලක්ම හැන්සාඩ් වාර්තාවෙන් කපා හරිනවා. බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
කිසිම සතකු මරන්න කියලා නැහැ. අරාබි දේශයේ ගස් කොළන් නැති නිසා, ගෙඩි නැති නිසා, පලතුරු, එළවලු නැති නිසා එදා සතුන්ට -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථා කරන්න. [බාධා කිරීමක්]

[අ.භා. 2.47]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන්ගේ අමාත්‍යාංශ ඇතුළු අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂ සාකච්ඡා වන මේ අවස්ථාවේදී මටත් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හැටියට අමාත්‍යවරුන් පත් කිරීමේ බලය ජනාධිපතිතුමාට හිමි වෙලා තිබෙන බව. ඒ විතරක් නොවෙයි. ලංකාවේ අමාත්‍යාංශ ගණන තීරණය කර ගන්නට ඒ වාගේම මොන විෂය යටතේ අමාත්‍යාංශ පිහිටුවනවාද කියන එක ගැන තීරණය කරන්නට එතුමාට බලය පැවරී තිබෙනවා. නමුත් අවාසනාවකට අද වන කොට ලෝකයේ වැඩිම අමාත්‍ය මණ්ඩලය ලංකාවේ ස්ථාපිත කරලා තිබෙනවා. අපි මේක හැම දාම මේ පාර්ලිමේන්තුවේ කියන්නේ ඇයි? අපේ රටේ ඵලදායිතාව වැඩි කර ගැනීමට යම් අමාත්‍යාංශයක් පිහිටෙව්වත් නොයෙකුත් විෂයයන් සඳහා විශාල ඇමති මණ්ඩලයක් පත් කිරීම තුළින් ඇත්තටම මේ රටේ පාලනය අවුල් වෙලා තිබෙන බව අද මේ සභා ගර්භයේදීම අපට දැක ගන්න හැකි වුණා. අද ඔබතුමන්ලාගේම කැබිනට් මණ්ඩලයේ ඉන්න ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක් වන ආචාර්ය ගරු තිස්ස විතාරණ ඇමතිතුමා කිව්වා, එතුමා කරන වැඩවලට එක් අමාත්‍යාංශයක ලේකම්වරියක් බාධා කරනවාය කියලා. ඒක මේ රජයේ ඉන්න ඉහළම තැන්වලට ගිහිල්ලා වාර්තා කළත් අද වන තුරු කිසිම සහනයක් නැහැ කියලාත් ඒ ඇමතිතුමා අද මේ සභාවට මතක් කරලා දුන්නා. ඉතින් මේකෙන් අපට පේනවා, අද ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ට අත් වෙලා තිබෙන ඉරණම මොකක්ද කියන එක. අද වනකොට මිලියන 500ක් මේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් සඳහා අපි වියදම් කරනවා. නමුත් එතුමන්ලාට ඒ වැඩ ටික කරගෙන යන්නට අද හරි හැටි බලතල දීලා නැහැයි කියලා අද මේ ගරු සභාව තුළදී කියැවුණා. ඒ විතරක් නොවෙයි. සමහර ජ්‍යෙෂ්ඨ ඇමතිවරු කොයි තරම් කලකිරිලා තිබෙනවාද කියලා කිව්වොත් අද විවාදයටවත් කිහිප දෙනෙක් පැමිණිලා නැහැ. ඒ වාගේ දේවල් ගැන ලංකාව පුරාම ජනතාව දැනුවත් වෙලා ඉන්නවා.

මේ අමාත්‍යාංශ නිසා අතිවිශාල මුදල් ප්‍රමාණයක් නාස්ති වෙනවාය කියා ඉතාම සරලව අපට පෙනුණත් ඒ ගැන ක්‍රියා මාර්ගයක් මේ පාර්ලිමේන්තුවටවත් ඒ වාගේම ජනාධිපතිතුමාටවත් ගන්න බැරි වීම ගැන අපි විශේෂයෙන්ම කනගාටු වෙනවා. ජනතාවගේ බදු මුදල්වලින් යැපෙන පාර්ලිමේන්තුවත්, ජනාධිපති ක්‍රමයත් තුළින් අපේ ජනතාවට හරිහැටි සේවයක් ලැබෙන්නේ නැහැ කියන එක විශේෂයෙන්ම අපේ තරුණ පරපුරේ අදහස වෙලා තිබෙනවා. ඒ නිසා අද තරුණ පරපුර එන්න එන්නම දේශපාලනයෙන් ඈත් වෙන තත්ත්වයක් දකින්න තිබෙනවා.

ප්‍රාදේශීය සභාවේ සිට පාර්ලිමේන්තුව දක්වා මන්ත්‍රීවරුන්ගේ හැසිරීම අපට පෙනෙනවා. අද නීතිය මන්ත්‍රීවරුන්ට එක ආකාරයකිනුත්, රටේ ජනතාවට වෙනත් ආකාරයකිනුත් ක්‍රියාත්මක වෙන්න පටන් අරගෙන තිබෙනවා. අද උදේ විවාදයේදී විශේෂයෙන්ම අගමැතිතුමාගෙන් ප්‍රශ්න කළා, අගමැතිතුමාට සම්බන්ධ ලේකම්වරයෙක් කුඩු කන්ටේනරයක් නිදහස් කර ගන්න ලිපියක් දීපු එක සම්බන්ධව. එවැනි ලිපියක් නිකුත් කිරීමේ සදාචාරය ගැන අපි උදේ කථා කළා. මේ රටේ සාමාන්‍ය ජනතාවට ක්ෂණයකින් ක්‍රියාත්මක වන නීතිය මේ සම්බන්ධයෙන් මේ වන තුරුත් ක්‍රියාත්මක වෙලා නැහැ. තවම පරීක්ෂණ කරනවා කියලා ඒ ගැන හරි සොයා බැලීමක් අද වෙන කල් වෙලා නැහැ. ඒ වාගේම එතනෝල් ගෙන ඒමේ ජාවාරමට මේ පාර්ලිමේන්තුවේම

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

ඉන්න සමහර මන්ත්‍රීවරු හවුල් කියලා සාක්ෂි තියෙද්දීත් ඒ සම්බන්ධයෙන් අද හරිහැටි ක්‍රියාත්මක වීමක් සිදු වෙලා නැහැ. ඒ වාගේම කුඩු ජාවාරමට තව තවත් මන්ත්‍රීවරු, ඇමතිවරු සම්බන්ධයි කියලා තොරතුරු එළියට එද්දීත් ඒ පිළිබඳව පරීක්ෂණ කෙරෙන්නේ නැහැ. ඒ වාගේම එක් එක් ඇමතිවරුන්ට වංචා හා දූෂණ චෝදනා තිබෙනවාය කියලා සාක්ෂි තිබුණත් ඒවා විමර්ශනය කිරීම දිගින් දිගටම අද පරක්කු වෙලා තිබෙනවා. මා හිතන්නේ මේ තත්ත්වය උඩ පාර්ලිමේන්තුවේ පමණක් නොවෙයි

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අස්වර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය සඳහන් කරන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
අපේ හිතවත් නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා කියනවා මැති ඇමතිවරුන්ට චෝදනා තිබෙනවාය කියලා. එතුමාට එහෙම කියන්න බැහැ. විනිමය වංචා කරපු කෙනෙක් එතුමන්ලාගේ පැත්තේම ඉන්නවා. ඒකත් අපට කියන්න පුළුවන්. ඒවා මේ ගරු සභාවේ කියන්න බැහැ. It is about the conduct of the Ministers and Members.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අස්වර් මන්ත්‍රීතුමනි, කරුණාකරලා රීති ප්‍රශ්නයක් නඟනවා නම් ඒ නීතිවලට අනුව යන්න. ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. [බාධා කිරීමක්] Please do not disturb the Hon. Member.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
දූෂණය හා වංචාව ගැන කියන කොට එතුමාට ටිකක් රිදෙනවා. අප දන්නවා එතුමා මේ ගරු සභාවට එවා තිබෙන්නේ මොකටද කියලා. 2010 දී මේ පාර්ලිමේන්තුවට පටන් ගත්ත දා සිටම එතුමාට ඔය ආසනය දීලා තිබෙනවා. අනික් මන්ත්‍රීවරු එහාට මෙහාට මාරු වෙද්දී, එතුමාට ඔය පුටුව හැම දාම හම්බ වෙනවා. එතුමාට ඔය ආසනය දීලා තිබෙන්නේ එතැන ඉඳගෙන විපක්ෂයට බාධා කරන්නයි. රජයේ ප්‍රතිපත්තියක් හැටියට ඒක කරන්න තමයි එතුමාව ඔතැනට දමලා තිබෙන්නේ. ඒක තමයි එතුමා ඔය කරන්නේ. [බාධා කිරීමක්] ඇයි ඔබතුමා තොප්පිය දමා ගන්නේ? ගරු අස්වර් මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ නමක් සඳහන් කළේ නැහැ නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අස්වර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය සඳහන් කරන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, he cannot make accusations against me. His father knows me and his mother knows me very well than he does. එතුමා නවකයෙක් මේ පාර්ලිමේන්තුවට. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් කථා කරන්න. ගරු මන්ත්‍රීවරුනි, කරුණාකර සභාව ගෙන යන්න ඉඩ දෙන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට අලුත් ඇමතිකමක් දෙන්න පුළුවන් "බාධා ඇමති" කියලා. "බාධා කරන අමාත්‍යාංශය" කියලා 68වැනි අමාත්‍යාංශය හදලා එතුමාට ඒ ඇමතිකම දුන්නා නම් හරි. ඉස්සරහට තව ඇමතිකම් එයි. කුඩු ඇමති එයි; එතනෝල් ඇමති එයි; කැසිනෝ ඇමති එයි. නැත්නම් බල්ලන්ටයි, පූසන්ටයි තව අමාත්‍යාංශයක් හදලා ඒ ඇමතිකම මෙතුමාට දෙන්න පුළුවන්. මේ අය වැයෙන් සහන දීලා තිබෙන්නේ බල්ලන්ටයි, පූසන්ටයි. එහෙම අමාත්‍යාංශයක්වත් හදලා ඔබතුමා ඒකවත් අඩුම තරමේ භාර ගන්න. [බාධා කිරීමක්] ඔව්. "බලු ඇමති" කියලා හරි ඒ තනතුර භාර ගන්න. එච්චරයි. මේ ගරු සභාවට ඇවිල්ලා අපට කරදර කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නැත්නම් ජොෂ්ඨ ඇමතිකමක් දෙන්න පුළුවන්.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
ඔව්. නැත්නම් ඔබතුමාට ජොෂ්ඨ ඇමතිකමක් ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු කොරියාවේත් මේ ජොෂ්ඨ ඇමති තනතුරුවලට මොනවාද වෙලා තිබෙන්නේ කියලා පසු ගිය සුමානයේ අප දැක්කා. විශේෂයෙන්ම ඒ රෙජිමය හොඳට ආරක්ෂා කරපු ඒ රාජ්‍ය නායකයාගේ මාමාව එදා ප්‍රසිද්ධියේ එළියට අරගෙන ගිහිල්ලා මරලා දැම්මා. අද අපේ ඇමතිවරුන්ට ඒ තත්ත්වය ඇති වෙලා නැහැ. නමුත් කොහොමත් රාජ්‍ය උදහසට ලක් වෙලා ඉන්න පිරිසක් ඉන්නවා. ඒ අය ජොෂ්ඨ ඇමතිවරු කියලා අද අප හඳුන්වා දෙනවා. එතුමන්ලාට හරිහැටි වැඩ කර ගන්න දෙන්නේ නැතිව බැඳ දමලා තිබෙනවා. අඩු තරමේ අමාත්‍යාංශවල ලේකම්වරුන්වත් ගණන් ගන්නේ නැති ආකාරයකට එතුමන්ලාව අද පැත්තකට දාලා තිබෙනවා. ඒ ගැන මා විශේෂයෙන්ම කනගාටුව ප්‍රකාශ කරනවා. ජොෂ්ඨ අමාත්‍යවරු දහ දෙනෙක් ඉන්නවා. එතුමන්ලා දීර්ඝ කාලයක් තිස්සේ අපේ රටට හුඟක් වැඩ කරපු අය. ඒ ගැන අපට කිසිම වාදයක් නැහැ. එතුමන්ලා දීර්ඝ කාලයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වැඩ කරපු

අය. තවත් සමහර අය අනිකුත් පක්ෂවල ඉඳලා ආණ්ඩුව පැත්තට ඇවිල්ලා හුඟක් වැඩ කර තිබෙනවා. එතුමන්ලාට හොඳ පළපුරුද්දක් තිබෙනවා. ඒ ඇමතිතුමන්ලාගේ සම්පත් මේ රජය හරිහැටි පාවිච්චි නොකිරීම ගැන මේ අවස්ථාවේ මගේ කනගාටුව ප්‍රකාශ කරනවා. රුපියල් මිලියන 500ක් කියන්නේ පොඩි මුදලක් නොවෙයි. එවැනි විශාල මුදලක් එතුමන්ලාට වෙන් කර තිබුණත්, වැඩ කර ගන්න බැරි වන විධියට එතුමන්ලා හිර කරගෙන තිබෙන එක ගැනත් අප විශේෂයෙන්ම මේ අවස්ථාවේදී කනගාටු වෙනවා.

අප අද යහපාලනය ගැන කථා කරනවා. අද ප්‍රාදේශීය සභාවල ඉඳලාම යහපාලනය බිඳ වැටිලා තිබෙන ආකාරයක් අප දකිනවා. ඒ වාගේම රජය යටතේ ඇති ප්‍රාදේශීය සභාවල, නගර සභාවල අය වැය පරදිනවා. එසේ පරාජය වන්නේ කුමක් නිසාද කියලා මුළු රටම දන්නවා. ඒවායේ අය වැය පැරදෙන්නේ ඒ ප්‍රාදේශීය සභාවලින් කෙරෙන පාලනය ඒ පක්ෂවලම අයත් අනුමත කරන්නේ නැති නිසායි. ඒ වාගේ බරපතළ තත්ත්වයක් යටතේ අපේ සමහර මන්ත්‍රීවරු ඉල්ලා තිබුණා මම දැක්කා, මේ අය වැය විවාදය අවසාන වෙලා ඡන්දය ගන්න කොට රහස් ඡන්දයක් ගන්න කියලා. එහෙම රහස් ඡන්දයක් පැවැත්වුවොත් මේ ආණ්ඩුවටත් මොනවාද සිද්ධ වන්නේ කියලා අපට අනුමාන කරන්න පුළුවන්. මොකද, මේ ආණ්ඩුව ගැන කලකිරුණු ඇමතිවරු විශාල පිරිසක් ඉන්නවා. පුළුවන් නම් රහස් ඡන්දයක් තියන්න කියලා ඔබතුමන්ලාට මම අභියෝග කරනවා. රහස් ඡන්දයක් තියලා ඒ අභියෝගය භාර ගන්න කියලා මම කියනවා. ඒ වාගේම, මෙතරම් ලොකු ඇමති මණ්ඩලයක් තිබෙන්නේ මේ රෙජිමය ආරක්ෂා කිරීමේ පියවරක් වශයෙන්ය කියලාත් මේ අවස්ථාවේදී මම කියනවා.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
රහස් ඡන්දයක් තියලා බලන්න.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පවතින ආර්ථික ක්‍රමය ගැන බලන කොට අපට පෙනෙනවා යුද්ධයෙන් පස්සේ අපේ අපනයන වේගය එන්න එන්නම පහත වැටිලාය කියලා. යුද්ධය අවසන් වුණාට පස්සේ 2010 දී අපට සියයට 18ක අපනයන වර්ධන වේගයක් තිබුණා. නමුත් 2011 වෙද්දී එය සියයට 5.4 දක්වාත්, 2012 වෙද්දී සෘණ 7.7ක අගයක් දක්වාත් අඩු වෙලා අපනයන වර්ධන වේගය අඩාළ වෙලා තිබෙනවා. නමුත් අපත් එක්ක තරගකාරී අනෙක් රටවලට, විශේෂයෙන්ම ඉන්දියාව, බංග්ලා දේශය, වියට්නාමය ආදි රටවලට මේ අවස්ථාවේදී පුළුවන් වෙලා තිබෙනවා අපට වඩා විශාල වර්ධන වේගයක් අපනයන තුළ තියාගෙන අපට වඩා ඉදිරියට ඒ රටවල ආර්ථිකයන් ගෙන යන්න. ඒ හේතුව නිසා 2012 වන කොට රුපියල් මිලියන 9,000කට වඩා ආනයන අපනයන පරතරයක් අපට අත් වෙලා තිබුණා. ලෝකයේ ආනයන අපනයන පරතරවලින් විශාලතම පරතරය හිමි රටවල් 30න් එකක් බවට අපේ රට පත් වෙලා තිබෙනවා. ඒ වාගේ සංඛ්‍යා ලේඛන ගැන අපට දැන ගන්න ලැබුණේ අපේ ආර්ථිකය හරි හැටි මෙහෙය වන්නේ නැති නිසායි. මේ තත්ත්වය වසා ගන්න අප කරන්නේ මොකක්ද? අපේ තරුණ පිරිස්, අපේ කාන්තාවන් පිට රට යවලා, පිට රටවල තිබෙන ආර්ථික ක්‍රමය භාවිත කරලා, ඒ මඟින් අපේ රටට විදේශ විනිමය ගෙන ඒමයි. එසේ විදේශ විනිමය ගෙන ඒම මඟින් පවත්වාගෙන යන ආර්ථික ක්‍රමයක් තමයි අප මේ රටේ ඇත්තටම ක්‍රියාත්මක කරගෙන යන්නේ. අපට යහ පාලනයක් නැති නිසා අපේ රටට විදේශ ආයෝජකයන් එන එක එන්න එන්නම අඩු වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මේ රජය කැසිනෝ වැනි කර්මාන්ත මේ රටට ගෙනැල්ලා, ඒ මඟින් විදේශීය ආයෝජකයන් මේ රටට ගෙනැල්ලා, අපේ සංස්කෘතිය විනාශ කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට සැරසුනේ. අපි උදේ ගරු අගමැතිතුමාගෙන් ඇහුවා, බුද්ධ ශාසන ඇමතිතුමා හැටියට එතුමා මේ කැසිනෝ ව්‍යාපාරය අනුමත කරනවාද කියලා. එතුමාට අද මේ සභාවේදී උත්තරයක් දෙන්න බැරි වුණා, කැසිනෝ මේ රටේ ස්ථාපිත කරනවාද නැද්ද යන්න සම්බන්ධයෙන්. ඒ නිසා අපට මේ අවස්ථාවේදී හැඟෙන්නේ මේ රජය ප්‍රතිපත්තියක් හැටියට තවම ඒ තීරණවල ඉන්නවා කියන එකයි. ඒ වාගේම අද අපේ රටේ නිෂ්පාදන වියදම එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක වෙළඳ පොළේ ඉන්ධන මිල ඉහළ ගියා, තෙල් සංස්ථාව පාඩු ලැබුවා කියලා එදා ඉන්ධන මිල ඉහළ දැම්මා. නමුත් අද වන කොට තෙල් සංස්ථාව ඒ පාඩුව අඩු කරගෙන තිබෙනවා. ඒ වාගේම අද ලෝක වෙළඳ පොළේ ඉන්ධන මිල අඩු වෙලා තිබෙනවා. නමුත් මේ රජය එන්න එන්නම අපේ ජනතාවට බදු පටවමින්, ඒ වාගේම බර පටවමින් තිබෙනවා. ජනතාවගේ ජීවන වියදම අඩු කිරීමට කිසිදු ක්‍රියා මාර්ගයක් ගන්නේ නැහැ. අද වන කොට අපේ බලාගාර ආශ්‍රිතව විශාල වශයෙන් වැසි ලැබිලා ඒවා ක්‍රියාත්මක වන තත්ත්වයක් තුළ විදුලිබල මණ්ඩලයත් මේ වන කොට රුපියල් බිලියන 21ක ලාභයක් ලබාගෙන තිබෙනවා. නමුත් මේ රජය සියයට 40ක් වන තෙක් ඉන්ධන ගැළපුම් ගාස්තුවක් තවමත් අපේ ජනතාවගේ විදුලි බිලට එකතු කරනවා. ජනතාවට සහන දෙන්නේ නැතිව, ඒ සහන තමන්ගේ හිත මිතුරන්ට, තමන්ගේ වටේ ඉන්න ඥාතීන්ට දෙන ආර්ථික ප්‍රතිපත්තියක් හැටියට තමයි අපි ඔබතුමන්ලාගේ රජයේ ආර්ථික ප්‍රතිපත්තිය දකින්නේ. පසු ගිය අය වැයේදී අපි දැක්කා ඔබතුමන්ලා racing carsවලට බදු නැති කළා. ගිය සුමානයේ Colombo Night Race එක තිබුණා. ඒ night race එක සඳහා නගර සභාවෙන් අය කළ යුතු විනෝද බද්ද බස්නාහිර පළාතේ මහ ඇමතිතුමාගේ නියමයකින් අඩු කරලා තිබුණා. ගිය සුමානයේ මම දැක්කා මේ පාර්ලිමේන්තුව ඉස්සරහා ඒ racing car එකක් අරගෙන ගියා. STF guard එකක් පවා ඒ racing car එකට දීලා තිබුණා. ජනතාව ඉදිරියේ කිසිම ලජ්ජාවකින් තොරව අපේ සම්පත් මේ වාගේ විනාශ කරලා, ඒ සම්පත්වලින් තමන් ප්‍රයෝජන ගන්න එක ගැන අපි ඔබතුමන්ලාට පෙන්නා දෙනවා. කොතරම් පෙන්නුවත් මේ තත්ත්වය එන්න එන්නම වැඩි වෙනවා මිසක් අඩු වන ආකාරයක් නම් අප දකින්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா )
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ කොළඹ කොටස් වෙළඳ පොළේ විශාල ගනු දෙනු කිපයක් සිදු වුණා. ඒවායේදී වංචා හා දූෂණ සිදු වුණා කියලා ලිඛිතව පැමිණිලි ලැබුණත් ඒ පැමිණිලි අද වන කල් නිසි පරිදි පරීක්ෂා කරලා නැහැ. ඔබතුමන්ලා දන්නවා කොළඹ කොටස් වෙළඳ පොළ කියන්නේ අපේ ලංකාවට විදේශ ආයෝජන ගෙනෙන ප්‍රධාන ස්ථානයක් බව. එහෙම ස්ථානයක්වත් ඔබතුමන්ලාට හරිහැටි පාලනයක් කර ගන්න බැරි වුණොත්, ඒ ස්ථානවලත් මේ වාගේ හොරකම් සිදු වෙනවාය කියලා විදේශ ආයෝජකයන් දැන ගත්තොත්, අපේ ලංකාවට විදේශ ආයෝජන එන එක අඩු වෙනවාය කියලා මම හිතනවා.

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

ඒ වාගේම අපේ ගරු මහාචාර්ය තිස්ස විතාරණ ඇමතිතුමා කිව්වා, "අපි උසස් තාක්ෂණයක් සහිත ආර්ථිකයකට යන්න ඕනෑ" කියලා. නමුත් අද වන විටත් ඔබතුමන්ලාගේ උසස් තාක්ෂණය සහිත අපනයන තිබෙන්නේ සියයට 2ක් වාගේ ඉතාම සුළු ප්‍රමාණයක්. මේ තත්ත්වය වෙනස් කර ගන්න වැඩ කරන කොට ඒකටත් බාධා ඇති වෙනවාය කියලා එතුමා සඳහන් කළා. ඉතින් මේ වැරදි නිවැරදි කර ගන්නේ නැතිව ඒවා තුළින් යැපෙමින්, දේශපාලනමය වශයෙන් ආරක්ෂා වීමට කටයුතු කරනවා මිස, අපේ ලංකාවේ ආර්ථික සංවර්ධනයත්, සමාජ සංවර්ධනයත් ඇති කරන්න මේ රජය කටයුතු කරන්නේ නැති බව කියන අතර, සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

[අ.භා. 3.05]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම වෙනත් දේවලට උත්තර දෙන්නේ නැතිව අපේ අමාත්‍යාංශයේ විෂය පථය පිළිබඳව පමණක් කථා කරන්නට තීන්දු කළා.

ඇත්ත වශයෙන්ම කියනවා නම් අපේ අමාත්‍යාංශය අතිවිශාල පුළුල් පරාසයක පැතිරී තිබෙනවා. කාන්තාවන් සඳහා වෙනම අමාත්‍යාංශයක් තිබුණත්, තනි මව් පිය පවුල්වල කාන්තාවන් පිළිබඳ අයිතියක් සහ වග කීමක් අපේ අමාත්‍යාංශයට පැවරී තිබෙනවා. ළමුන් සඳහා වෙනම අමාත්‍යාංශයක් තිබුණත් ආබාධිත ළමුන් අපේ භාරයේ තබා තිබෙනවා. ඒ වාගේම විවිධ ආබාධ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ප්‍රතිකාර කළත්, ආබාධිතයන් අපේ අමාත්‍යාංශයට අයිති පිරිසක්. ඒ වාගේම අධ්‍යාපනය බැලුවත්, අධ්‍යාපන අමාත්‍යාංශයෙන්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒ සේවාව ඉටු කරනු ලැබුවත් අපේ අමාත්‍යාංශයත් ඒ කාර්යය ඉෂ්ට කරන්න බැඳිලා ඉන්නවා. සෞඛ්‍ය අමාත්‍යාංශය, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ආදී ආයතන උපදේශන සේවා පැවැත්වුවත් අපේ අමාත්‍යාංශයත් උපදේශන සේවා පවත්වනවා. බලන්න, කොහෙන් හරි අපටත් link එකක් තිබෙනවා නේ. ඒ නිසා අපේ අමාත්‍යාංශය විශාල පරාසයක් තුළ විහිදී තිබෙන අමාත්‍යාංශයක් විධියටයි අප දකින්නේ. එහෙම විහිදිලා තිබෙනවා පමණක් නොවෙයි, පක්ෂ භේද, කුල භේද, ජාති භේද නැතිව බොහොම විවෘත මනසකින් තමයි මාත් අපේ දක්ෂ නියෝජ්‍ය ඇමතිතුමාත් මේ කටයුතු මෙහෙයවන්නේ කියන එක ප්‍රකාශ කරන්න ඕනෑ. අපි දෙදෙනාම එකතු වෙලා තමයි මේ වැඩ කරන්නේ. එතුමාටත් මම පූර්ණ බලතල දීලා තිබෙනවා. ඕනෑම වෙලාවක මැදිහත්වෙලා තීන්දු තීරණ ගන්න පවා එතුමාට ඉඩ දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වැඩිහිටියන්ගේ අහිංසක හිත්වලට, ආබාධිතයන්ගේ අහිංසක හිත්වලට අපි කොන්ක්‍රීට් වත්කරන්නේ නැහැ. අපි දෙන්නාටම අවස්ථාව තිබුණා ආබාධිත නිවාස හදලා එලක ගහගන්න. නමුත් අපි එහෙම ගැහුවේ නැහැ. ඒ වෙනුවට අපි කළේ මොනවාද? අපි ආබාධිත නිවාස හදනවා වෙනුවට, ආබාධිත ඒ පවුල්වලට මූල්‍යමය ශක්තිය ලබා දෙන්න කටයුතු කළා. ආරම්භයක් වශයෙන් ලංකාවේ හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ආබාධියන් පණස් දෙනකුට රුපියල් 3000 බැගින් මාසිකව ලබා දෙනවා. ඒ ගැන අපි සන්තෝෂ වෙනවා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ආණමඩුවේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහක් තිබෙනවා. බලන්න, කොහොමද තත්ත්වය කියලා. ඉතින් ඒක තමයි අපේ ප්‍රතිපත්තිය.

ඉස්සර මහජන ආධාරය දුන්නේ රුපියල් 100යි, 200යි. පවුලක පස් දෙනෙක් සිටියා නම්, රුපියල් 500යි ලැබුණේ. ඒක රුපියල් 1000 දක්වා වැඩි කරලා, දැන් 1,79,000කට මහජන ආධාරය දෙනවා.

මම, "මම" කියන වචනය පාවිච්චි කරන්නේ නැහැ. සමහර ඇමතිවරු ඉන්නවා, "මම" කියලා තමයි කියන්නේ. "මම හරි උගතා, මම හරි ජගතා" කියන කට්ටියත් ඉන්නවා. නමුත් අපි එහෙම කියන්නේ නැහැ. හැම වෙලාවේම "අපි" කියන වචනය තමයි මම භාවිත කරන්නේ. මම, "අපි" කියන වචනය භාවිත කරන ගමන් ලබන වර්ෂයේ 2,21,000කට රුපියල් 1000 බැගින් මහජන ආධාරය දෙනවා. ඒ මුදල තවත් වැඩි කළා.

අපි ආබාධිත නිවාස හදුවා. ඒවා හැදීමේදී කිසිම කොන්ත්‍රාත් දීමක් නැත; සමරු එලක නැත. මහජනයාත් එක්ක එකතු වෙලා ශ්‍රමය යොදවලා තමයි අපි ඒවා හැදුවේ. යම්කිසි ගොඩනැඟිල්ලක් හදන්න ගියාම ඒකේ BOQ එක හැදුවාට පස්සේ, භාණ්ඩවලට සියයට 60ක් යන කොට, ශ්‍රමයට සියයට 40ක් යනවා. එතකොට අපි මේකට අපේ ශ්‍රමය එකතු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතකොට අපට වටිනාකම එකතු කළ - value-added - නිවසක් හදන්න පුළුවන්. ඒ විධියට ලක්ෂ දෙකහමාරක් තුනක් වැය කරලා ලක්ෂ පහක් හයක් වටිනා නිවාසයක් හදන්න පුළුවන්. ඒ අපේ ප්‍රතිපත්තියක්. අපේ ප්‍රතිපත්ති අනුව, අපි කවදාවත් ජනමාධ්‍ය එක්ක තරහ වුණේ නැහැ. අපි ජනමාධ්‍ය සැලකුවේ අපේ මහ පෙන්වන්නෙක් විධියට. ඊට හොඳම උදාහරණයක් කියන්නම්. අපට ජනමාධ්‍යයෙන් පෙන්නුම් කරලා දුන්නා, අවුරුදු 116ක කාන්තාවක්. අපි ඇය හොයා ගෙන ගියා. අන්න අහවලා, අහවලා අතන ඉන්නවා කියලා ජනමාධ්‍යයෙන් අපට පෙන්වනවා. එතකොට ඔවුන් හොයා ගෙන අපි යනවා. අපේ නිලධාරි මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු අපි ඔක්කෝම ඒ අය හොයා ගෙන ගිහිල්ලා උදවු කරනවා.

අපි මේ වෙද්දී ආසන 175ක අපේ ජංගම සමාජ සේවා වැඩසටහන පවත්වා තිබෙනවා. මාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, නිලධාරි මණ්ඩලයත් මේ වැඩසටහන පවත්වා තිබෙනවා. අපි මේ සඳහා ජනමාධ්‍යයෙන් සහයෝගය ඉල්ලනවා. ජනමාධ්‍ය තමයි අපට මේ තොරතුරු පෙන්නුම් කරලා දෙන්නේ. ඒ වාගේම මේ සඳහා අපි විපක්ෂයෙනුත් උදව් ගන්නවා. ඊයේ පෙරේදා අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා අපට කිව්වා, වැඩිහිටි සමථ මණ්ඩලය ගැන. දරුවන් තම දෙමව්පියන්ට යම් කිසි දෙයක් කරන්නේ නැත්නම්, ඒක සමථ මණ්ඩලයකට ඉදිරිපත් කරලා ඒගොල්ලන්ගේ දුක කිව්වාම, උසාවියකට නොගිහිල්ලා සමථයකට පත් කරලා ඒ පවුල ස්ථාපිත කරනවා. මේ වැඩසටහන තිබුණේ කොළඹ පමණයි. එතුමා අපේ Consultative Committee එකට ඇවිල්ලා කිව්වා, අපි මේ වැඩසටහන විමධ්‍යගත කරමු කියලා. ඊට පස්සේ අපි ඒ සඳහා Cabinet Paper එකක් දාලා ඒ වටිනා අදහස අපේ ප්‍රතිපත්තිවලට එකතු කරලා අපේ ප්‍රතිපත්ති යථාවත් කරන්න කටයුතු කළා. අපි ඒ විධියට තමයි කටයුතු කරන්නේ. මේක තමයි ඇත්ත.

අපි වැඩිහිටියන්ටත් දිවා සුරැකුම් මධ්‍යස්ථාන හැදුවා; ඒවාට ආධාර දුන්නා. ඒ ස්ථානවලට ඇවිල්ලා තමුන්ගේ වයසේ පැරණි මිතුරන් ඇසුරු කරන්න, පැරණි මිතුදම් අලුත් කරගන්න, සාකච්ඡාවක් කරන්න, කැරම් ගහන්න, අදහස් හුවමාරු කර ගන්න වැනි නොයෙකුත් දේවල් කරන්න ඒ ගොල්ලන්ට පුළුවන්. වැඩිහිටියන් කියන්නේ වැඩිය ජීවත් වන කට්ටිය. විශ්‍රාම ගියත් වැඩිහිටියන් ඇතුළේ උපදේශකයන් සිටිනවා. ඒ නිසා ඒ අය විශ්‍රාම යන්නේත් නැහැ, ඒ අයගේ මනස විශ්‍රාම යන්නේත් නැහැ. දැන් අලුත්ම ප්‍රවණතාව තමයි, pension ගිය අය පෞද්ගලික අංශයට වැඩියෙන් බඳවා ගැනීම. මොකද, ඒගොල්ලන්ට

experience එක, විනය කියන මේ ඔක්කෝම තිබෙන නිසා. ඔවුන් විශ්‍රාම යෑමට පෙර අපි උපදේශනයක් දෙනවා, මේ විධියට කටයුතු කරන්න ඕනෑ, දැන් ඒකට ලෑස්ති වෙන්න ඕනෑ කියලා. ඒ වැඩසටහනත් අපි කරනවා. උදාහරණයක් කියන්නම්. අපි විවාහයකට ඉස්සෙල්ලා ලෑස්ති වෙන හැටි බලන්න. මඟුල් ගේ ගන්න හෝටලය book කරනවා, photographs ගන්න එක කාට හරි භාර දෙනවා. ඒ විධියට විවාහ උත්සවයකට බොහොම ලස්සනට ලෑස්ති වනවා. ඒ විධියට අපේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම සුවය සාර්ථකව විඳින්න පුළුවන් වන විධියට අපේ අමාත්‍යාංශයත් වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමටත් ඒ විශ්‍රාමිකයන්ගේ සමිතිවලට අපි අවසර දීලා තිබෙනවා. යම් කොන්ත්‍රාත්තුවක් කරලා ඒ මුදලින් සියයට පහක් ලබා ගන්න දැන් ඒ වැඩිහිටි සමිතිවලට පුළුවන්. ඒ හරහා මූල්‍යමය ශක්තිය ඇති කිරීම තුළින් ඒ අයට අභිමානයෙන් යුතුව ජීවත් වන්න පුළුවන් ක්‍රමවේදයකුත් අපි හදා ගෙන යනවා. ඒ අනුව ඒගොල්ලන්ට trip එකක් යන්න, වන්දනා ගමනක් යන්න දැන් අවස්ථාව තිබෙනවා. බොහෝ දෙනෙක් දැන් ඒක කර ගෙන යනවා. ඒ වාගේම වාර්ෂිකව පවත්වන වැඩිහිටි සමිති එකමුතුවක් තිබෙනවා.

ආබාධිතයන් වෙනුවෙන් අපේ ජාතික විශ්වවිද්‍යාලය - NISD එක- තිබෙනවා. මේකෙන් අපි ආබාධිත අයට උපාධිය දෙනවා; ඩිප්ලෝමාව දෙනවා. ඒක කොළඹ තමයි තිබුණේ. දැන් ඒකත් විමධ්‍යගත කරන්න යනවා. අපි මේ ගොඩනැඟිල්ල සඳහා රුපියල් ලක්ෂ 15ක් වාර්ෂිකව ගෙව්වා. අවුරුදු 60කට පස්සේ අපි ඉඩමක් හොයා ගෙන එතැන ඒ ආයතනය ස්ථාපිත කළා. මේ උපාධිය ගත් අයට වෙනත් රටවල කොපමණ ඉල්ලුමක් තිබෙනවාද කියලා තමුන්නාන්සේලා දන්නවා ද? ඔවුන්ට දෙන වැටුප රුපියල් ලක්ෂ කීයක්ද? මේ පුහුණුවට උපදේශනය අවශ්‍යයි. උපදේශනය නැතිව කිසි දෙයක් කරන්න බැහැ. වෛද්‍යවරයෙකු ළඟට යන්නේ ලෙඩක් දුකක් හැදුණාම. අද ආතතිය, විශාදය වැනි රෝග තුළින් මේ සමාජය කොපමණ විපරීත වෙලා තිබෙනවාද? මේ විපරීතභාවය නැති කරන්න උපදේශනය කොපමණ වැදගත් වනවාද කියන එක පිළිගෙන තිබෙන නිසා, අපි ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනවා.

සමහර අය මිථ්‍යා මතවල ඉන්නවා. බොහෝ පිරිස් ඒවාට භය වෙලා ඉන්නවා. ඒ තත්ත්වය නැති කරන්නත් අපි project එකක් හදලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වැඩිහිටි අයගේ නිෂ්පාදන, ආබාධිත අයගේ නිෂ්පාදන විකුණා ගන්න පුළුවන් වන්නේ කොහේද? ජපානයේ නම් එක එක දේවල් pack කරන්න ඒගොල්ලන්ට අයිතිය දීලා තිබෙනවා. ස්වයං ශක්තියෙන් ආර්ථිකය ගොඩ නඟන්න කටයුතු කරන අයට විශාල මුදලක් දෙනවා. නමුත් අපට ප්‍රශ්නය තිබෙන්නේ, ඒ අය නිපදවන ඒවා විකුණා ගන්නේ කොහේද? ඊයේ කැබිනට් පත්‍රිකාවක් දමා සම්මත කර ගත්තා. මම ඒ ගැන සන්තෝෂ වෙනවා. ජාතික වගකීම යටතේ CSR වැඩසටහනක් දෙන්නය කියා අපි ඉල්ලුවා. වැඩිය නොවෙයි supermarket එක දාගන්න අපට රාක්කයක් දෙන්න කියා අපි ඉල්ලුවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තව විනාඩි දෙක, තුනක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
රාක්කයක් දෙන්නය කියා අපි ඉල්ලුවා. රාක්කයක් දුන්නාම තමන්ගේ නිෂ්පාදන එතැන තියාගෙන අලෙවි කර ගන්න පුළුවන්. මැදිහත්කරුවෙක් නැතිව කෙළින්ම චෙක් එක ඔහුට යවන්න පුළුවන්. නිෂ්පාදන ක්‍රියාවලියටත් ඒ අය ලෑස්ති කර ගත්තා.

ඊළඟට, ශ්‍රවණාබාධිත අයගේ භාෂාව පිළිගත් භාෂාවක් බවට පත් කළා විතරක් නොවෙයි, පිටුපසින් බෝඩ් එකක් ගහලා ඒ අයට driving licence එකක් දෙන්න පුළුවන්ද කියාත් අපි සොයා බලනවා. මොකද, ඒ ගොල්ලන් ඒක ඉල්ලනවා. මොකද, air-conditioned වාහනවල යනකොට ඇහෙන්නේ නැහැ. ඒ අයට ඒ ශක්තිය තිබෙනවාය කියලා ඒ අයටත් ඒ සඳහා අවස්ථාවක් දෙන්නය කියා ඒ අය ඉල්ලනවා. ඒ වාගේම, ඒ අයට identity card එකක් දෙන්නය කියාත් ඉල්ලනවා. ඒකත් අපි කර ගෙන යනවා. ඒ විධියට අපි බොහෝ වැඩ කර ගෙන යනවා.

ජාතික සංවර්ධන ලොතරැයිය, සුපිරි වාසනා සම්පත ලොතරැයිය යන ඒවායේ අනුග්‍රහයෙන් ගෙවල් 2,000ක් හදා තිබෙනවා. තමුන්නාන්සේලාත් ඒ ටිකට් පත් මිල දී ගන්න. ඒ ටිකට් පත් මිල දී ගන්න, ගන්න ගෙවල් හැදෙනවා. හැබැයි එලකයක් නැහැ. අපි දෙදෙනාගේ කිසිම එලකයක් නැහැ. අපි රුපියල් ලක්ෂ දෙක හමාරක් දෙනවා. ඉස්සර දුන්නේ රුපියල් පනස් දාහක්, හැත්තෑ පන්දාහක් වාගේ මුදලක්.

ඊළඟට අපි Superstar තෝරනවා. අපි ඒ ගැන කල්පනා කර බැලුවා. මාධ්‍ය ජාලයත් එක්ක සාකච්ඡා කරලා, ඒ අය අතරින් ස්වේච්ඡාවෙන් වැඩ කරන අය අගය කිරීමකට ලක් කරලා, අවුරුදු දෙකෙන් දෙකට Superstar කෙනෙක් තේරුවා. ගිය වතාවේ autism රෝගීන් 35,000ක් එයට සහභාගි වුණා. ගිය වතාවේ autism රෝගයෙන් පෙළෙන අයෙක් Superstar වුණා. මෙවර ශ්‍රවණාබාධිත කෙනෙක් Superstar වුණා. ඒ විධියට අපි ඒ අයගේ සේවය අගය කරනවා. එහෙම සේවය අගය කළාම තවත් පිරිස් ස්වේච්ඡාවෙන් මේකට බැඳෙනවා. ඇත්තෙන්ම කියනවා නම් මේක මහා පුළුල් පරාසයක පැතිරී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කොච්චර පිරිසිදුව මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කළාද කියන එක ගැනත් මා කියන්න ඕනෑ. මම මේ අමාත්‍යාංශය භාර අරගෙන අවුරුදු තුන හමාරක්, හතරක් පමණ වෙනවා. මම තවම අමාත්‍යාංශයේ සල්ලි සත පහක්වත් වියදම් කරලා රට ගිහින් නැහැ. ඒ විධියටයි අපි මූල්‍ය විනය ආරක්ෂා කරන්නේ. ඒ නිසා අපි සන්තෝෂ වෙනවා, අපේ ජනාධිපතිතුමා අපට දීපු ප්‍රතිපාදන බොහොම ප්‍රවේසමෙන් වියදම් කරමින් අමාත්‍යාංශයේ අපිත් නිලධාරි මණ්ඩලයත් මේ කටයුතු කර ගෙන යන එක ගැන. ගිය වතාවේ "දැයට කිරුළ" වැඩසටහනේදී අපි වියදම් කළේ රුපියල් ලක්ෂ තුන හමාරයි. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් කවදාවත් resthouse එකකවත් නවතින්නේ නැහැ. වෙන කොහේ හරි නැවතිලා ඉඳලා තමයි අපි මේ කටයුතු කර ගන්නේ. අපි දන්නවා, හැම කෙනෙක්ම මිය යන බව. "සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යයි" කියන එක බුද්ධ ධර්මයේත් කියා තිබෙනවා. "දුවිල්ලෙන් සෑදුණු දෙය දුවිල්ල බවටම පරිවර්තනය වෙනවා"ය කියා අපේ ආගමේත් කියලා තිබෙනවා. නමුත් එක දෙයක් ඉතුරු වෙනවා. මොකක්ද ඒ? කළ

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

හොඳ, නරක පමණයි ඉතුරු වෙන්නේ. හොඳ දෙය කරලා, හොඳ දෙය මිනිස්සුන්ට ලබා දුන්නොත් එයින් මානසික තෘප්තියක් ලැබෙනවා. ඒ මානසික තෘප්තිය ලබා දෙන්න අපි කටයුතු කරනවා.

ඊළඟට විසාදය ගැනත් ටිකක් කියන්න ඕනෑ. විසාදය කියන්නේ පොඩි දෙයක් නොවෙයි. අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ විශාල සංඛ්‍යාවක් විසාදයට පත් වෙලා තිබෙනවා. ඒක නැති කරන්න අපි කටයුතු කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, ඒ ගොල්ලන් වෙනුවෙන් උපදේශන ලැස්ති කරන්නය, අපට උදව් වෙන්නය කියා මම ජන මාධ්‍යයෙනුත්, සියලු දෙනාගෙනුත් ඉල්ලා සිටිනවා. ඒ උදවු තුළින් තමයි අපේ ගමන සාර්ථක කර ගන්න පුළුවන් වන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
**(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)**
(The Hon. Felix Perera)
මගේ කථාව අවසන් කරන්නය කියනවා. කොපමණ හොඳ කළත් විනාඩි 12ක් තමයි දෙන්නේ. හැබැයි, මෙතැනදී අපේ වෙලාව විනාඩි 12කට සීමා කළත් අපේ ව්‍යාපෘති ප්‍රමාණය 12කට සීමා කරන්නේ නැහැ කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.18]

**ගරු අශෝක් අබේසිංහ මහතා**
**(மாண்புமிகு அசோக் அபேசிங்க)**
(The Hon. Ashok Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 අය වැය කාරක සභා අවස්ථාවේදී ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු සහ විශේෂ අමාත්‍යාංශ කිහිපයක් සම්බන්ධයෙන් කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම, වනජීවී සම්පත් සංරක්ෂණ ඇමතිතුමාත් සිටියදී, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට මට කථා කරන්නට අවස්ථාවක් ලැබීම හොඳයි කියා මා හිතනවා. මොකද, විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කය වන අලි තර්ජනවලට මුහුණපාන දිස්ත්‍රික්කයක්. කුරුණෑගල දිස්ත්‍රික්කය ඇතුළු වයඹ පළාතත් මේ වන අලි තර්ජනවලට නිරන්තරයෙන්ම මුහුණ දෙනවා.

2013 වසරේ මේ වන කොට කුරුණෑගල දිස්ත්‍රික්කයේ විතරක් වන අලි පහරදීම්වලින් 15කට වැඩි සංඛ්‍යාවක් මරණයට පත්වෙලා තිබෙනවා. 2000 වසරේ සිට මේ දක්වා, ඒ කියන්නේ 2013 වසරේ මේ දක්වා අපේ රටේ වන අලි පහරදීම්වලින් මිනිස් ජීවිත 900කට ආසන්න සංඛ්‍යාවක් බිලිගෙන තිබෙනවා. ඒ වාගේම 2000 සිට 2012 දක්වා කාලය තුළ අලින් 2,350ක් පමණ මැරිලා තිබෙනවා. මේක අපේ ප්‍රදේශවලට ඉතා විශාල තර්ජනයක්. වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට මූලධන වියදම් වශයෙන් රුපියල් කෝටි හැටදෙලක්ෂ පණස්දහසක මුදලකුයි මෙවර වෙන් කර තිබෙන්නේ.

අය වැය කථාවේදී ජනාධිපතිතුමා කිව්වා, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම රුපියල් මිලියන 10ක් දෙනවා කියලා. ඒ කියන්නේ රුපියල් කෝටියක්. ඒ වාගේම වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට වාහන මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කරනවාය කිව්වා. ඒ කියන්නේ, රුපියල් කෝටි 20ක මුදලක්. හැබැයි, අය වැයේ කිසිම තැනක සඳහන් වෙලා තිබුණේ නැහැ, මේ වන අලි තර්ජනය යම් කිසි දුරකට වළක්වා ගැනීමට අවශ්‍ය අලි වැට ඉදි කිරීම සඳහා මුදල් වෙන් කිරීමක් ගැන. නමුත්, ළඟදී පුවත් පත්වලත් සඳහන් වුණා, සමස්ත ලංකාව තුළ කිලෝමීටර් 3,600ක පමණ දුර ප්‍රමාණයකට අලි වැට අවශ්‍යයි කියා. ඒ වාගේම අලි වැටේ එක කිලෝමීටරයක් ඉදි කරන්න රුපියල් ලක්ෂ පහක පමණ මුදලක් වියදම් වන බවත් සඳහන් වනවා මා දැක්කා. කිලෝමීටර් 3,600ට රුපියල් ලක්ෂ පහ ගණනේ ගණන් බැලුවොත්, රුපියල් කෝටි 180යි උවමනා වන්නේ. රුපියල් කෝටි 180ක මුදලකින් ඒ අවශ්‍ය සම්පූර්ණ අලි වැට ඉදි කරන්න පුළුවන්. නමුත් අවාසනාවකට වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාට මෙවර මූලධන වියදම් වශයෙන් වෙන් කර තිබෙන්නේ, රුපියල් කෝටි හැටදෙකහමාරක මුදලක්. නමුත් අය වැයෙන් කිසිම අවස්ථාවක මේ අලි වැටවල් සඳහා මුදලක් වෙන් කරලා නැහැ. වාහනවලින් ගිහිල්ලා අලින්ව අල්ලන්න අමාරුයි. ඒ නිසා වාහන ගත්තාට ඒ අලි මිනිස් ගැටුම පිළිබඳ ප්‍රශ්නය විසඳා ගන්න අමාරුයි කියා මා හිතනවා.

විශේෂයෙන්ම මේ අලි වැටවල් ඉදි කිරීමෙන් පමණක් මේ වැඩේ කරන්න බැහැ. අලි මංකඩ හදන්න ඕනෑ; කැලයේ කුඩා වැව් හදන්න ඕනෑ. ඒ දේවල් කරන්න ඕනෑ. අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයට අලුතින් පත් වුණු මහ ඇමතිතුමාත් අලි වැටවල් ගැන කථා කළා. ඒ නිසා පළාත් සභාවට හෝ මුදල් ලබා දීලා අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිබෙන මේ වන අලි තර්ජනය නැති කිරීම සඳහා ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් යම් කිසි වැඩ කොටසක් කරනවා නම් ඉතා හොඳයි. මා හිතන්නේ නැහැ කුරුණෑගල දිස්ත්‍රික්කයේත් කිලෝමීටර් තුන්හාරසියයකට වැඩි ප්‍රමාණයකට අලි වැට අවශ්‍ය වේවිය කියා. ඒ නිසා ඔබතුමා අමාත්‍ය ධුරය දරන කාලයේ මේ කටයුත්ත සිද්ධ කරනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා.

අද අපේ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ගරු එස්.බී. නාවින්න ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. මේ ගරු සභාවේ ඉදිරිපස පේළියේ ඔක්කෝම ඉන්නේ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුයි. ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු කියන්නේ මේ රටට ඉතා විශාල සේවයක් කරපු අමාත්‍යවරුයි. අපේ හිටපු අග්‍රාමාත්‍ය ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා ඉන්නවා; අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩු පක්ෂයේ නායකයා ගරු එස්.බී. නාවින්න ඇමතිතුමා ඉන්නවා. මේ ඇමතිවරුන්ට මෙවර වෙන් කරලා තිබෙන්නේ රුපියල් කෝටි පණහක වාගේ මුදලක්. අමාත්‍යවරු 11දෙනාටම මූලධන වියදම් වශයෙන් වෙන් කර තිබෙන්නේ රුපියල් කෝටි දහතුනහමාරයි. සමහර ඇමතිවරුන්ට වෙන් කරලා තිබෙන්නේ, රුපියල් තිස්නවලක්ෂ පණස්දහසයි, හතළිස්නවලක්ෂ පණස්දහසයි, විසිපන්ලක්ෂයයි, නවලක්ෂ පණස්දහසයි වාගේ පොඩි පොඩි ගණන්. අපේ සංස්කෘතික හා කලා කටයුතු ඇමතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථානවලට රුපියල් මිලියන හයහමාරක වැඩ කොටසක් කළාය කියලා. මේ රටට මෙපමණ විශාල සේවයක් කරපු මේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ට අපේ ජනාධිපතිතුමා මෙහෙම සලකන්නේ ඇයි? ජනාධිපතිතුමා එතුමාගේ වැය ශීර්ෂයට මූලධන වියදම් වශයෙන් රුපියල් කෝටි 865ක මුදලක් වෙන් කර ගෙන තිබෙනවා. එතකොට දවසකට රුපියල් දෙකෝටි පණස්ලක්ෂයක් වෙනවා. අපේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරු 11දෙනාටම අවුරුද්දටම රුපියල් කෝටි දහතුනහමාරයි වෙන් කර තිබෙන්නේ. අපේ නාවින්න ඇමතිතුමාට මූලධන වියදම් සඳහා වෙන් කරලා තිබෙන්නේ රුපියල් විසිපන්ලක්ෂයයි.

මා හිතන විධියට එතුමන්ලාට තිබෙන එකම සහනය ජ්‍යෙෂ්ඨ ඇමතිවරු වශයෙන් ඉස්සරහ පේළියේ වාඩි වෙන එක පමණයි.

මේ ආණ්ඩුවෙන් එතුමන්ලාට දීලා තිබෙන්නේ එපමණයි. [බාධා කිරීමක්] අපේ හිතට අමාරුයි. අපේ දිස්ත්‍රික්කයේ ඇමතිවරුන්ට එහෙම වුණාම අපේ හිතට අමාරුයි. ඒකයි අපි මේ ගැන කථා කරන්නේ. මීට වඩා මා ඒ ගැන කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. [බාධා කිරීමක්] අප ගරු කරන ඇමතිවරු නිසා කථා කරන්නේ. මා මේ ගැන කියන්නේ නැතිව ඉන්නයි හැදුවේ. දැන් කියන්න වෙනවා. අපේ දිස්ත්‍රික්කයේ ගරු ජොෂ්ඨ ඇමතිතුමා සහභාගි වූ වැඩ සංවර්ධන සටහන් මම කියන්නම්. ජාතික ගොවි සතිය කෘෂිකර්ම ප්‍රදර්ශනයට සහභාගි වීම, මුල්ගල තැබීම සඳහා සහභාගි වීම, විශේෂ සාකච්ඡාවට සහභාගි වීම, දැදුරු ඔය නිරීක්ෂණ චාරිකාවට සහභාගි වීම. මෙන්න මේවා විතරයි එතුමාට කරන්නට වෙලා තිබෙන්නේ. ඇත්තටම කියනවා නම්, මේක හරි කනගාටුදායක තත්ත්වයක්. අපේ ජොෂ්ඨ ඇමතිවරුන්ට මේ විධියට කරන්නට එපා. මොකද, එතුමන්ලා අප හුඟක් ගරු කරන ඇමතිවරුන්.

මා ඒ ගැන ඊට වඩා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. හෙට දවසේත් මේ විවාදය පැවැත්වෙනවා. නමුත් මට හෙට කථා කරන්නට බැරි වෙන නිසා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මට පොල් කර්මාන්තය ගැනත් කථා කරන්නට වෙනවා. ගරු ඇමතිතුමා නැති වුණත් මා ඒ ගැන වචන ස්වල්පයක් කථා කරනවා. [බාධා කිරීම්]බොහොම හොඳයි ඒක හැම තැනම ක්‍රියාත්මක කරන්න.

අප ඉස්කෝලයේ යන කාලයේ අපේ ප්‍රධාන අපනයන භෝග වශයෙන් තිබුණේ මොනවා ද? තේ, පොල්, රබර් කියා තමයි අප ඇහුවේ. නමුත් අද වෙකොට ඒ අපනයන තත්ත්වය එන්න, එන්න අඩු වෙලා. 2011 වසරේ අපගේ පොල් අපනයනය තිබුණේ, ඩොලර් මිලියන 266යි. 2010 ඩොලර් මිලියන 209 ට පහත වැටිලා තිබුණා. මේ අවුරුද්දේ ඒක තවත් සියයට 15.8 දක්වා අඩු වී තිබෙනවා. පොල් කර්මාන්තයේ සියලුම ක්ෂේත්‍රයන් සියයට 20 සිට සියයට 15 දක්වා අපනයනය අඩු වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ අපට පොල් පිටරටින් ගේන්න වෙයි ද කියන්නත් බැහැ. අපේ රටේ 2013 අවුරුද්දේ පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 2668යි කියා පොත්වල සඳහන්වෙලා තිබෙනවා මම දැක්කා. 2009 සිට මේ දක්වා පොල් ගෙඩි මිලියන 200ක් අඩු වෙලා තිබෙනවා. එන්න එන්නම අඩු වෙලා. සාමාන්‍යයෙන් මා බැලුවා, අපේ රටේ නිවාස කොපමණ තිබෙනවාද කියා. 51,51,000ක් තිබෙනවා. 50,00,000ක් කියා සාමාන්‍යයෙන් ගත්තොත්, ගෙදරක දවසකට පොල් ගෙඩියක් පාවිච්චි කළොත් අවුරුද්දකට පොල් ගෙඩි මිලියන 1825ක් පාවිච්චි කරනවා. අපේ පොල් නිෂ්පාදනය පොල් ගෙඩි මිලියන 2668යි. පොල් ගෙඩි දෙක ගණනේ වාගේ පාවිච්චි කළොත් නම් අපට පොල් පිට රටින් ගේන්න සිද්ධ වෙයි. මොකද, දවසකට පොල් ගෙඩිය ගණනේ පාවිච්චි කළත් අවුරුද්දකට පොල් ගෙඩි 1825ක් පාවිච්චි වෙනවා. මෙවැනි තත්ත්වක් තුළ පොල් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් අය වැයෙන් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. නමුත් පොල් නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා වෙන් කර තිබෙන්නේ මිලියන 73යි. ගරු ඇමතිතුමා නැතත් මා ඒ කාරණය මතක් කරන්නට ඕනෑ.

විශේෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ තවත් එක් ඛේදවාචකයක් තිබෙනවා. ඒ තමයි පොල් තෙල් නිෂ්පාදනයේ කඩා වැටීම. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල් තෙල් නිෂ්පාදන කර්මාන්ත ශාලා 80 ක් තිබුණා. දැන් ඒ 80ම වැහිලා ගිහිල්ලා. අපේ රටට පොල්තෙල් මෙට්‍රික් ටොන් එක්ලක්ෂ හැටදාහක් අවුරුද්දකට අවශ්‍යයි. නමුත් අද කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්තෙල් කර්මාන්තය සම්පූර්ණයෙන්ම වැටිලා තිබෙනවා. මොකද මේ palm oil ප්‍රශ්නය නිසා. Palm oil ඇවිල්ලා තිබෙන නිසා අපේ පොල් තෙල් කර්මාන්තය නැත්තටම නැතිවෙලා ගිහින් තිබෙනවා. ඒ වාගේම කපාපු පොල් -desiccated coconut- සම්බන්ධයෙනුත් ප්‍රශ්නයක් තිබෙනවා. කපාපු පොල් නිෂ්පාදනය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිබුණු සියලුම කර්මාන්තශාලා වැහිලා ගිහින් තිබෙනවා. Palm oil ලංකාවට ගෙනැල්ලා පොල්තෙල් සමඟ මිශ්‍ර කරලායි දෙන්නේ. ලංකාවේ දැන් පිරිසිදු පොල්තෙල් ගන්න බැහැ. Palm oil එක්ක එකතු වෙච්ච තෙල් තමයි ගන්න වෙන්නේ.

තවත් ජාවාරමක් ගැන මා මතක් කරන්න ඕනෑ. Crude coconut oil විධියට පිරිසිදු නොකළ palm oil ලංකාවට ගෙනැල්ලා ලංකාවේ පිරිසිදු කරන - refine කරන- තත්ත්වයක් තිබෙනවා. මොකද එහෙම ගේන්නේ? බදු අඩුයි. Crude coconut oil ගෙනාවාම බදු අඩුයි. එම නිසා බදු අඩුවෙන් ගෙනැල්ලා අධික ලාභ ලබන තත්ත්වයක් තිබෙනවා. Palm oil සහ පොල් තෙල් මිශ්‍ර කිරීමේ ජාවාරම ඉතා දිගටම මේ රටේ සිද්ධ වෙනවා. ගරු ඇමතිතුමා අද මේ ගරු සභාවේ සිටියා නම් හොඳයි. මට හෙට කථා කරනනට බැරි නිසා තමයි අද මා කථා කළේ. ගරු ඇමතිතුමා මේ ගැන විශේෂ අවධානය යොමු කරාවිය කියා බලාපොරොත්තු වෙනවා.

කාබනික පොහොර යොදා කරන ගොවිතැන ගැනත් කියන්න ඕනෑ. මගේ මිත්‍රයෙක් ඉන්නවා, කුරුණෑගල. එතුමා පසු ගිය අවුරුද්දේ අක්කරයකින් පොල් ගෙඩි 6,000ක් අරගෙන තිබුණා. ඒ කාබනික කෘෂිකර්මයෙන්. එතුමා ඩොලමයිට්, - ඩොලමයිට් දිගන තිබෙනවා - rock phosphate, කුකුළු පොහොර, කොම්පෝස්ට් පොහොර සහ ඇල්බීසියා කොළ දාලා, කිසිම රසායනික පොහොරක් භාවිත නොකොට අක්කර විසිපහක් තිහක් වගා කරනවා. එක අක්කරයකින් පොල් ගෙඩි 6,000ක් ගන්නවා. අවුරුද්දකට අට වාරයක් පොල් කඩනවා. එක ගහකින් ගෙඩි සීයක් විතර ගන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කොහෙද?

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
කුලියාපිටියේ.

කාබනික පොහොර යොදලා පොල් අස්වැන්න වැඩියෙන් නෙළා ගන්න පුළුවන්. ඒ සඳහා රජයෙන් අක්කරයකට රුපියල් 100ක දීමනාවක් දෙනවා කියලා තිබෙනවා. හැබැයි දෙන්නේ පොල් ගස් 600කට පමණයි. හැබැයි ඒ මුදලත් මෙවර ඒ ගොල්ලන්ට ලැබිලා නැහැ. නමුත් එහෙම දෙනවා කියලා කියනවා. ඒ මුදල දීලා ඒ අය දිරි ගන්වන එක හොඳයි. මොකද, කාබනික පොහොර යොදලා මේ පොල් වගාව කරන නිසා. කුලියාපිටියේ තිබෙනවා, සෙරන්ඩිබ් පොල් ආයතනය. ඒ ආයතනය විතරයි මේ ගොල්ලන්ට උදවු කරන්නේ. පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් කිසිම උදව්වක් මේ ගොල්ලන්ට කරන්නේ නැහැයි කියලා කියනවා. ඒ නිසා කාබනික කෘෂිකර්මය මේ රටේ දිරි ගැන්වීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් කරනවා නම් හොඳයි කියලා මා අවස්ථාවේදී යෝජනා කරනවා.

විශේෂයෙන්ම අපේ කෘෂිකර්ම අමාත්‍යතුමා මේ අවස්ථාවේදී සභා ගර්භයේ සිටියා නම් හොඳයි. අඩු ගණනේ කාබනික පොහොර සංවර්ධන අධිකාරියක්වත් පිහිටුවලා, කාබනික පොහොර රටේ ප්‍රචලිත කරලා, අපේ කෘෂි කර්මාන්තය සඳහා, අපේ තේ, පොල්, රබර් සඳහා කාබනික පොහොර යොදන වැඩ

[ගරු අශෝක් අබේසිංහ මහතා]

පිළිවෙළක් සකසනවා නම් එය ඉතා හොඳ බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

අපේ ප්‍රදේශවල පොල් එලදාව ශීඝ්‍රයෙන් අඩුවන තත්ත්වයක් තිබෙනවා. ඒ තත්ත්වය තුළ මේ පොල් එලදාව ඉදිරියේදී දියුණු කර ගන්නට නම් අනිවාර්යයෙන්ම එය කළ යුතු වනවා. නැත්නම් මම මුලින් කිව්වා වාගේ ඉදිරියේදී පොල් ආනයනය කරන්නට සිදු වෙයි. මොකද, පොල් අවශ්‍යතාව, එක ගෙදරක දවසකට එක ගෙඩියක් කෑමට ගත්තත් අවුරුද්දකට පොල් ගෙඩි මිලියන 1825ක් ඕනෑ. පොල් ගෙඩි මිලියන 2,600 ගණනයි අවුරුද්දකට නිෂ්පාදනය කරන්නේ. ඒ නිසා පොල් නිෂ්පාදනය වැඩි කෙරුවේ නැත්නම් අපට මුල සිටම තිබුණු තේ,පොල්, රබර් අපනයනය නැතිව ගිහිල්ලා, ඒ අපනයන භෝගවලින් කිසිම ආදායමක් ගන්න බැරි තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මේ ගැන කථා කරන්න නොසිටියත්, අපේ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය මේ අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නා නිසා මම මේ කරුණ කියන්න ඕනෑ. අපේ මේ පාර්ලිමේන්තුවේ ඉන්න නිලධාරි මහත්වරුන්, අපේ මේ සේවක මහත්වරුන් අපට ඉතා හොඳ විශේෂ සේවාවක් කරනවා. විශේෂයෙන්ම අය වැය තිබෙන දවස්වල පාර්ලිමේන්තුවේ ඉන්න සේවක මහත්තුරුන්ට 6.30 පහු වුණාම විශේෂ දීමනාවක් ගෙවනවා. ඒ වාගේම මට දැන ගන්නට ලැබුණා, මේ පාර්ලිමේන්තුවට අනුයුක්තව පොලිස් නිලධාරින් 290ක් පමණ සේවය කරන බව. ඒ පොලිස් නිලධාරින්ට මේ දීමනාව දෙන්නේ නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුවට අනුයුක්තව සේවය කරන ඒ පොලිස් නිලධාරින්ටත් සවස 6.30ට පසුව ලබා දෙන දීමනා ලබා දීමට යම්කිසි වැඩ පිළිවෙළක් කරනවා නම් හොඳයි. පොලිස් නිලධාරින්ට විශේෂයෙන්ම කුඩම්මාගේ සැලකිලියි මේ ආණ්ඩුවෙන් දක්වන්නේ. පසු ගිය දිනවල පැවැත්වුණු CHOGM එකට පොලිස් නිලධාරින් ගෙන්වලා පුහුණුවක් කෙරුවා. මුලින්ම එය පටන් ගත්තු දවසේ, කළුතරට ආපු අයට රුපියල් 2,000 ගණනේ ගේන්න කියලා, කෑම දෙන්න. එවැනි අඩු සැලකිලියි මේ පොලිස් නිලධාරි මහත්තුරුන්ට තිබෙන්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තුවට අනුයුක්ත වෙලා ඉන්න 290 ක් වූ පොලිස් නිලධාරින්ටත් මේ පාර්ලිමේන්තු සේවකයන්ට සවස 6.30න් පසුව ලබා දෙන දීමනාව ලබා දෙන්න යම් කිසි වැඩ පිළිවෙළක් යොදනවා නම් හොඳයි කියලා මා යෝජනා කරනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
පොලිස් නිලධාරින් ගේ වැටුප් විෂමතා ඉවත් කර තිබෙනවා. Rank එක අනුව පොලිස් නිලධාරින්ගේ වැටුප් වැඩිවීමකට Cabinet Paper එකක් ඊයේ දාලා තිබෙනවා.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඔව්, එහෙම කරනවා නම් හොඳයි.

මොකද, පොලිස් නිලධාරින්ට හැම වෙලාවේම කුඩම්මාගේ සැලකිලි ලැබෙන්නේ. ඒ නිසා 6.30න් පසුව පාර්ලිමේන්තු සේවකයන්ට ලබා දෙන දීමනාව පාර්ලිමේන්තුවට අනුයුක්තව සේවය කරන පොලිස් නිලධාරින්ටත් ලබා දෙන්න කටයුතු කරනවා නම් වඩා හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම තව කරුණක් කියන්න ඕනෑ. පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යවරයා මේ අවස්ථාවේදී ගරු සභා ගැබේ නැහැ. හෙට දවසේ කථා කරන්නට හම්බ වෙන්නේ නැති නිසායි මම මෙය කියන්නේ. අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේත් පශු සම්පත් වැඩ සටහන් ක්‍රියාත්මක වෙනවා. අපේ රටට අවුරුද්දකට කිරි ලීටර් මිලියන 750ක් විතර අවශ්‍යයි. අපේ රටේ නිෂ්පාදනය කරන්නේ කිරි ලීටර් මිලියන 250යි. ඒ තත්ත්වය තුළ කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමට අපට අවශ්‍යතාවක් තිබෙනවා. කිරි එළදෙනුන් 20,000ක් පමණ මේ රට ගෙන්වන බව මෙවර අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී දැන ගත්තා. නමුත් මම මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ, ඕස්ට්‍රේලියාවෙන් කිරි එළදෙනුන් මේ රටට ගෙන්වලා මේ රටට ඔරොත්තු දෙන්නේ නැති බව. අපේ රටේ තිබෙන දේශගුණික තත්ත්වයට ඕස්ට්‍රේලියාවේ එළදෙනුන් ඔරොත්තු දෙන්නේ නැහැ. ඉන්දියාව වාගේ අපේ රටේ දේශගුණයට සමාන දේශගුණයක් තිබෙන රටකින් මේ එළදෙනුන් ගෙන්වා මේ කටයුත්ත සිද්ධ කළා නම් වඩා හොඳයි කියා මා සිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම දියර කිරි, පිටි බවට පත් කරන කිරිපිටි කම්හලක් -මිල්කෝ සමාගම- තිබෙනවා. මම දැක්කා, 2012 විගණකාධිපති වාර්ෂික වාර්තාවේ සඳහන් කර තිබෙනවා, "පසු ගිය අවුරුද්දට රුපියල් කෝටි 12ක් වෙන් කර තිබෙනවා, ඒකේ කිරිපිටි නිෂ්පාදන ධාරිතාව වැඩි කරන්නට. නමුත් ඒකෙන් රුපියල් කෝටි 3ක් විතරක් යොදවලා තිබෙනවා, යම්කිසි වැඩක් සඳහා. නමුත් කිරිපිටි නිෂ්පාදන ධාරිතාව වැඩි කර ගැනීම සඳහා කිසිම වැඩක් කරලා නැහැ." කියලා. එම නිසා මම විශේෂයෙන්ම මේ ගැන මතක් කරනවා.

අපේ උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා ඉන්නවා, කුරුණෑගල ආසනයේ. එතුමා මගේ දේශපාලන ගුරුවරයා. විශේෂයෙන්ම මම ගරු ජයරත්න හේරත් මැතිතුමාටත් කියනවා, එතුමා දැන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ උද්භිද උද්‍යානයක් හදන්නත් වැඩ පටන් ගනිවි. මොකද, ඒ දිස්ත්‍රික්කයට උද්භිද උද්‍යානයක් නැහැ. විශේෂයෙන්ම අපේ ප්‍රදේශවල ස්වභාව සෞන්දර්යෙන් අනූන තැන් තිබෙනවා. ඔබතුමා උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු ඇමතිතුමා නිසා පුළුවන් නම් අඩු ගණනේ ඒ ප්‍රදේශයේ night safari සඳහා ස්ථානයක් ඇති කරන්න. මොකද, රජය 2016 දී විදේශ සංචාරකයෝ ලක්ෂ 25ක් ගෙන්වන්න බලාපොරොත්තු වෙනවා. එවැනි තත්ත්වයක් තුළ ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ අපි night safari වැනි විනෝද කටයුතු සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒ වාගේ ස්ථානයක් ස්ථාපිත කළොත් හොඳයි. මොකද, ඔබතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කළ සේවය වෙනුවෙන් ඔබතුමාට අලුතින් අමාත්‍යාංශයක් ලැබී තිබෙනවා. ඒ නිසා මම කියපු කාරණය වෙනුවෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. එතකොට කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සංචාරක ක්ෂේත්‍රය දියුණු කරන්නත් පුළුවන්; අපේ තරුණ තරුණියන්ට රැකියා ලබා දෙන්නත් පුළුවන්. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නවතිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.34]

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා (බුද්ධ ශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன - பௌத்த சாசன, மத அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.K.A.D.S. Gunawardana - Deputy Minister of Buddha Sasana and Religious Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ 9වැනි අය වැය ලේඛනය පිළිබඳ විවාදයේදී බුද්ධශාසන හා

ආගමික කටයුතු අමාත්‍යාංශයේ විශේෂ කාරක සභා වාර්තාව පිළිබඳව මෙම සභාවේදී අද පවත්වනු ලබන විවාදයට සහභාගි වෙමින් කථා කරන්නට ලැබීම ගැන මා විශේෂයෙන් සන්තෝෂයට පත් වෙනවා.

මට කෙටි වේලාවක් ලැබී තිබුණත්, මම පැහැදිලිව ප්‍රකාශයක් කරන්නට ඕනෑ. මීට පෙර අදහස් ප්‍රකාශ කළ ගරු යෝගේස්වරන් මන්ත්‍රීතුමා ආගම සම්බන්ධයෙන් බොහොම නිපුණ කෙනෙක්. එතුමා පූසාරි කෙනෙක් වාගෙයි. නමුත් මේ ගරු සභාව නොමඟ යවන අසත්‍ය ප්‍රකාශ තමයි, මේ ගරු සභාව තුළ දී කළේ. සභාව විතරක් නොමඟ ගියා නම් කමක් නැහැ, මුළු හින්දු ජනතාවම නොමඟ යවන විධියේ කැත කථාවක් තමයි එතුමා මේ පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශයට පත් කළේ.

එතුමා කිව්වා, උතුරු නැඟෙනහිර හින්දු දේවස්ථානවලට මේ ආණ්ඩුවෙන් කිසිවක් දුන්නේ නැහැ කියලා. මා විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ අපි බෞද්ධ සිද්ධස්ථාන 842ක් සඳහා රුපියල් මිලියන 240ක් ඒ වාගේම හින්දු සිද්ධස්ථාන 545ක් සඳහා රුපියල් මිලියන 72ක්, මුස්ලිම් සිද්ධස්ථාන 350ක් සඳහා රුපියල් මිලියන 26ක්, ක්‍රිස්තියානි සිද්ධස්ථාන 62ක් සඳහා රුපියල් මිලියන 22ක් වෙන් කර ලබා දී තිබෙනවා. ඒ අතර තුර නැඟෙනහිර පළාතේ හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට මම විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ, හින්දු දේවස්ථාන වෙනුවෙන් මට අයත් වන දිස්ත්‍රික්කයක් හැටියට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සඳහා මාගේම නියෝගයෙන් විශාල සේවාවක් කරලා තිබෙන බව. විශේෂයෙන් අපේ අමාත්‍යාංශයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ආගමික ස්ථාන සඳහා යම් කිසි වෙක්පතක් දුන්නා නම්, අපි ඒ ආගම් තුන සඳහාම එක හා සමානව ඒ මුදල් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම යුද්ධයෙන් පසු කිසිවක් වුණේ නැහැ කිව්වා. යුද්ධයෙන් ඒ ආගමික ස්ථාන අපි කැඩුවේ නැහැ, ඒ ගොල්ලෝ කඩා ගත්තා. ඉතින් අපට කරන්න දෙයක් නැහැ. නමුත් යුද්ධයෙන් පස්සේ උතුරු නැඟෙනහිර කෝවිල්වලට, හින්දු සිද්ධස්ථානවලට රුපියල් මිලියන 210ක් ලබා දුන්නා. ඒ වාගේම නැඟෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තිබුණු "දැයට කිරුළ" යටතේ අපි ඊටත් වැඩි මුදල් ප්‍රමාණයක් ලබා දී තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මම එක කාරණයක් පැහැදිලිවම කියනවා. නිදහස ලැබූ දින සිට අතිගරු ජනාධිපතිතුමා පත් වන තෙක් තිබුණු කවර ආණ්ඩුවකින්වත් ආගම්වලට මේ වාගේ උදව් කළේ නැහැ. ඒ වාගේම මෙතෙක් එවැනි කිසිම ආණ්ඩුවක් තිබුණේ නැහැයි කියන එක මම ඉතාමත් පැහැදිලිවම කියනවා. එතුමා හැම තිස්සේම අපට කියන්නේ, "ආගම් 4ටම එක හා සමානව සලකන්න, ජාතීන් 5ටම එක හා සමානව සලකන්න, කිසි අඩුවක් කරන්න එපා" කියායි. සමහර අය අපට දොස් කියනවා, බෞද්ධ සිද්ධස්ථානවලට වැඩිපුර මුදල් දෙනවා කියලා. නමුත් කරන්න දෙයක් නැහැ, බෞද්ධ සිද්ධස්ථාන 10,920ක් අපේ අමාත්‍යාංශය තුළ දැනට ලියා පදිංචි වෙලා තිබෙනවා. ස්වාමීන් වහන්සේලා 37,691 දෙනෙක් ඒවායේ වැඩ වාසය කරනවා. ඒ වාගේම සිල් මෑණි ආරාම 639ක් තිබෙනවා. සිල් මෑණිවරු 1,263 නමක් ඒවායේ වැඩ වාසය කරනවා. ඒවායේ කටයුතු අපි පුළුවන් පුළුවන් විධියට කරනවා. ඔය එක් එක්කෙනා කියන විධියට, දේශපාලනය පුම්බා ගන්න විධියට ඒ ගොල්ලන්ගේ පොරොන්දුවලට අපිට මේ කටයුතු කරන්න අමාරු බව අපි කියනවා. දහම් පාසල් 9,534ක් තිබෙනවා; බෞද්ධ ශිෂ්‍යයින් 1,935,966ක් ඉන්නවා; ගුරුවරු 121,932ක් ඉන්නවා. අපි ඒ අයට නිල ඇඳුම් ලබා දෙනවා. ඒ වාගේම ලියා පදිංචි දහම් පාසල්වලට පුස්තකාල දීමනාව හැටියට රුපියල් 2,000ක් දෙනවා. ශාසනාරක්ෂක බලමණ්ඩලයේ අරමුදලින් දහම් පාසල් ගුරුවරුන්ගේ සැත්කම් වාගේ ඒවාට ආධාර ලබා දෙනවා. ගුරුවරුන් සේ සලකලා සිල් මෑණිවරුන්ටත් ඒ ආධාරය අපි ලබා දෙනවා. ඒ අතරතුර යුද්ධයෙන් විනාශ වුණු උතුරු නැඟෙනහිර බෞද්ධ සිද්ධස්ථාන තව විශාල වශයෙන් අලුත්වැඩියා කරන්නට තිබෙනවා. විනාශ කරපු ලංකා පටුන අතිගරු ජනාධිපතිතුමාට පින් සිද්ධ වෙන්න දැන් තමයි අළුත්වැඩියා කර ගෙන යන්නේ. විනාශ කරපු සේරුවාවිල ප්‍රදේශයේ අනික් විහාර, චෛත්‍ය දැන් තමයි අලුත්වැඩියා කර ගෙන යන්නේ. මුහුදු මහා විහාරය, මංගල විහාරය වාගේ ඒවා වුවමනාවෙන් විනාශ කළා. යුද්ධය නැති කාලයේදීත් ඒවා විනාශ කළා. අතිගරු ජනාධිපතිතුමා ආවාට පස්සේ තමයි, ඒවා අලුත්වැඩියා කර ගෙන යන්නේ. ඕනෑම කෙනෙකු ඕනෑම තර්කයක් ඉදිරිපත් කරන්න, මොනම රජයකින්වත් මේ වාගේ කටයුතු කර තිබෙනවාද කියලා. අපේ ආණ්ඩු තිබුණා. අපේ රජයන් කීප සැරයක් බලයට පත්ව තිබුණා. 1956 දී බුද්ධ ශාසනයට විශාල ධෛර්යයක් ලැබුණා. ඒක ඇත්ත. ආරම්භයත් ඒකයි. සංස්කෘතික අමාත්‍යාංශය පිහිටුවලා දිවංගත අග්‍රාමාත්‍ය එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් සංස්කෘතියට, ආගම්වලට සැලකුම් කරන්නට එතැනින් තමයි පටන් ගත්තේ. ඒ කටයුතු එහෙම කෙරුණු අතරේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවක් තිබුණා. ඒ කාලයේ විධියට එතුමියත් ඒ කටයුතු කර ගෙන ගියා. නමුත් කවර කාලයකවත් නොමැති විධියට, කවර කාලයකවත් නොලැබුණු විධියට, කිසි කෙනෙකු නොහිතපු විධියට මේ රටේ මහජනතාවගේ ජන ජීවිතයේ අවශ්‍යතාවන් සඳහා විශාල වශයෙන් යටිතල පහසුකම් ඉදි කරද්දී, මාර්ග පද්ධති, ජල පද්ධති, ජල යෝජනා ක්‍රම, ගොවි ජනපද, වී ගබඩා, අධිවේගී මාර්ග, ගුවන් තොටුපොළවල්, වරායවල්, රජයේ සේවකයින් බඳවා ගැනීම ආදී අනික් සියලුම කටයුතු ඒ විධියට කරද්දී තමයි අපේ රජය මේ විධියට ආගම්වලට සලකන්නේ. කවුරු හෝ කියනවා නම් අපේ ආගමට සැලකුවේ නැහැ කියලා ඒක ද්වේශසහගතව කරන කථාවක්; ඒක දේශපාලන වශයෙන් ජනාධිපතිතුමාට විරුද්ධව ඇඟිල්ල දිගු කිරීමක්. ඒ කාරණය විශේෂයෙන් කියන්නට ඕනෑ.

ඒ විතරක් නොවෙයි. බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය භාර දි.මු. ජයරත්න මැතිතුමා -ගරු අග්‍රාමාත්‍යතුමා- සියලුම ආගම් වෙනුවෙන් කිසිම භේදයකින් තොරව ඉතාමත් හොඳ පාලනයක් ගෙන යනවා. ඒක දැන ගන්නට පුළුවන් වන්නේ ඕනෑම වෙලාවක අතිගරු ජනාධිපතිතුමා හින්දු ජනතාව සිටින ප්‍රදේශයකට ගියත්, නැඟෙනහිර පළාතේ මුස්ලිම් ජනතාව ළඟට ගියත්, දකුණේ බෞද්ධ ජනතාව ළඟට ගියත් විශාල පිබිදීමකින්, කැමැත්තකින් ඒ ජනතාව එතුමාව පිළිගන්නා නිසායි.

ඔය එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ද මොකේද ඉන්න හාමුදුරුවරු කීප දෙනා හැර, ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න හාමුදුරුවරු දෙදෙනා, තුන් දෙනා හැර සියලුම ස්වාමීන් වහන්සේලා අතිගරු ජනාධිපතිතුමාට ගෞරව දක්වනවා; සැලකිල්ල දක්වනවා. මොකද, එතුමා නිසා තමයි මේ රට, ජාතිය, ආගම බේරුණේ. මේක දැන් කාටවත් මතක නැහැ. අපි එකතු වෙලා එතුමා බලයට පත් කළේ නැත්නම් අද රට නැහැ; ජාතිය නැහැ; ආගම නැහැ. මේ රට නැති වුණා නම් එක ජාතියක එක් කෙනෙකුටවත් මේකේ ජීවත් වෙන්න හම්බ වෙන්නේ නැහැ. එක ආගමක්වත් ඉතුරු වන්නේ නැහැ. මොකද ආගම අනුව ක්‍රියා කරපු අය හිටියා නම් ඒ අය කවදාවත් මේ වාගේ යුද්ධ ආරම්භ කරන්නේ නැහැ. ආගමට පිටුපාමින් තමයි, මේ කටයුතු කරලා තිබෙන්නේ. ඒ තත්ත්වයෙන් මේ රට නිදහස් කර ගත්තේ අතිගරු ජනාධිපතිතුමායි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා**
(மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)

මේ රටේ ආගම් තුන, හතරටම අයත් සියලුම ජාතීන්ට එකට සමාදානයෙන් ජීවත් වෙන්න අවස්ථාව ලබා දුන්නේ අතිගරු ජනාධිපතිතුමායි. අතිගරු ජනාධිපතිතුමාගේ නියෝග මත සහ අගමැතිතුමාගේ මෙහෙය වීම් මත අපේ අමාත්‍යාංශයෙන් සියලුම ආගම්වලට ඉතාමත් සාධාරණය ඉෂ්ට කරනවාය කියන කාරණය මා මේ අවස්ථාවේදී වග කීමෙන් කියනවා. ඒ කාරණය සඳහන් කරමින්, ඉදිරියටත් ඒ විධියට කටයුතු කරන බව දන්වා සිටිමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි පහළොවක කාලයක් තිබෙනවා.

[3.43 p.m.]

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

Hon. Presiding Member, yet today, we are debating on the Ninth Budget that was presented by His Excellency the President in this Parliament. We have analysed it in many ways and ultimately the findings maybe that this Budget is not a people-friendly Budget, but can be termed as an "enemy Budget" for the people. There are many factors to come to this conclusion.

We have ended the war and by next May, five years would have lapsed. We have spent a lot and won this war with great hardship and we must congratulate the Government and the armed forces for having done so. Sir, after the five years of war, this amount of expenditure that has been incurred as far as the defence is concerned - [*Interruption.*] Yes, it is being more expended; the cost of defence is increasing every year. Five years ago it was said that after the war, all monies that were spent on the war would be given for the development of this country, but, today, we see that none of these promises that had been given by the Government in favour of this country have been fulfilled. It is a very serious matter to be considered because even lately, I saw a notification in the newspapers, that the Government is calling upon for semi -skilled people to join the army and is willing to pay them Rs. 37,000 a month as salary. What is the Government trying to do? Are they trying to militarize the entire country? Is that what they want to do? Certainly, the armed forces will have to be looked after because they have won the war. There is a great amount of credibility as far as they are concerned and it is the duty of the Government to look after them. I totally accept that position. But, this is not the position today. The position is that every year the defence expenditure is being increased and ultimately that money which could have been expended for the development of this country has not been properly channelled. So, this will have very serious repercussions as far as this country is concerned and I am sure the Government of Sri Lanka, the Ruling Party, will have to take cognizance of these facts.

Today, the people are faced with many problems. We are happy that infrastructure development is taking place in this country. It has been a great success; we accept it. But, is the infrastructure development of this country going to give any sort of relief to the people? Is it giving a better life to the people who are suffering? Is the income of the people being increased? Is the education system of this country being improved? Are more buildings being built for schools? Are university buildings being built? I am sorry to say that although there is infrastructure development taking place, the normal day-to-day needs of the people have not been looked into by this Government, especially in this Budget.

I am just giving you one example. Today, the people are faced with the high cost of living. Today, a trader with over Rs. 250 million turnover is levied 12 per cent VAT and 2 per cent NBT. So, that comes to 14 per cent. Today, definitely many traders of this country who are the major importers and exporters of food production are having a turnover of more than Rs. 250 million per quarter. Now, all these traders are going to be taxed at 12 per cent VAT and 2 per cent NBT. Ultimately, who is going to bear the cost? This cost will have to be borne by the people of this country; the poor citizens of this country will have to bear the cost. Is this what the Government is intending to do to bring down the cost of living for the people?

There is also a special commodity levy tax of 15 to 30 per cent at the time of import. Pharmaceutical retail outlets will also face the same situation because out of the Rs. 250 million turnover, only the first 25 per cent is exempted from tax and the balance 75 per cent is subject to NBT and VAT payment. Ultimately, what is the position? The pharmaceutical items are being affected. A poor man cannot buy his medicines at the cost rate; he cannot buy his food; he cannot buy his commodities. What are you trying to do in this Budget? Is this Budget going to cause a better living standard for the people of Sri Lanka? You are burdening the people on the purchase of pharmaceutical items, which is a very important factor and a necessity to the people of this country.

The banks are being levied another 2 per cent more as NBT on the turnover. Therefore, the interest rates as far as the banking sector is concerned, will also increase very soon.

Then, we also have to consider the exemption of tax for strategy development projects. These are huge projects running into billions. I think our Minister is here and he has been very helpful as far as projects are concerned. In one project where his help was sought, he

was very good and kind enough in giving that project a start. But, that is not sufficient. The position is that these are big strategic projects which are running into billions of rupees and these projects are handled by huge multi-national companies in the world. They are investing in this country. I think there must be, at least, some sort of taxation for these projects, which can contribute towards the development of this country. We cannot allow them a full tax holiday or tax relief. What should be looked into is to get some income generated into this country.

With regard to Small and Medium Enterprises, there is a 12 per cent income tax and a 2 two per cent levy of tax more than last year. So, there is a 2 per cent increase on Small and Medium Enterprises compared to last year's Budget. What is the reason for that? Those are Small and Medium Enterprises, not multi-national companies or a multi-national projects; those are small and medium projects.

You gave incentives to companies to expand their businesses up to March 2015. This Budget has reduced that exemption and made it up to the end of 2014; that is, one year. I mean, they could have given this up to March, 2015. Why do they want to bring it down to 2014? How does it qualify? Is there a continuity, a clarity or a consistency in your Budget Proposals? These are the three "C"s that you have to consider; the Continuity, the Clarity and the Consistency of this Budget. I personally feel it is not so.

You spend Rs. 500 billion today on salaries and pensions to Government servants. Are we getting the true fruits of the payment of Rs. 500 billion that you are giving the Government servants and the pensioners? I must say that many departments today, although they are working, are not putting the maximum effort that they should put in. I think it is the duty of the Government to see that they reduce the cost of Government departments. Many Government departments have got more people than expected to do the work. You make political appointments. By making those appointments, ultimately the burden is on the people and the people will have to pay for it. Therefore, the Rs. 500 billion worth of money which is spent on Government servants should be reduced to a great extent so that that money could be turned into the society at large.

Today, the Government is borrowing money at 7 per cent over LIBOR. The corporate sector of this country - the companies are borrowing foreign exchange at less than 4 per cent over LIBOR. So, why are we paying 3 per cent more? We have discussed this many a time in this Chamber and I do not see the great necessity for us to do this.

When the United National Party Government was in power, we also borrowed money, we also got foreign loans. But, they were long-term loans, 30-year loans with a very reasonable interest payable. But, today the loans are not of that nature. Today, you get short-term loans and for that you have to pay high rates of interest, causing a tremendous burden as far as the economy of the country is concerned.

Today, we are also faced with a major crisis in this country as far as narcotics is concerned. Internationally, there have been many queries raised that a lot of Sri Lankan nationals are being introduced into narcotics and that we are introducing narcotics into this country. It is a very serious matter. Sri Lanka is a small island. If they go to bring in narcotics to Sri Lanka making it a major hub, I must say that it is going to be the end of the society in Sri Lanka. We have to take immediate measures to see that narcotics raids are carried out, and humanely, politically, and physically all steps should be taken to curtail narcotics. Today, our younger generation is merely living a normal way of life. But, if narcotics are going to be introduced in school premises or outside school premises and if children are going to use narcotics, I must say the entire society will collapse and the fabric of society will also collapse. Therefore, it is a very important factor that we have to consider. For that purpose, we have to have a strong and independent judiciary, a strong and independent police. These are some factors which should be taken into account, but unfortunately, the police and the judiciary are not independent as they were 15 years ago. Therefore, it is very important that we look into this factor.

The final and most important issue that I want to bring to your attention today is the casinos. Casinos are being brought into this country even without a proper system of getting licences. They are not allowing the casinos to come in the normal way like in any other part of the world where casinos are allowed. There are tender procedures followed when casinos are brought in. But, there again in foreign countries, casinos are located in a different atmosphere: in a separate island, in a separate state where people do not have direct contact with the casinos. Today, we are trying to have casinos in close proximity to Colombo and we will have to face the repercussions. If casinos are going to be brought in and if casino kings are going to run this country, there will be complete pollution as far as the administration of this country is concerned. Casinos mean huge money, big kings and they are not levied the proper taxes that should be levied. They are given tax exemptions and I do not see why casinos should be given tax exemptions. We should really tax them as much as possible. If they want to come into this country, let them pay taxes and come into this country, if necessary. But, we, the United National Party, are totally opposed to it. Even the clergy of this country are concerned about it. They have also made it very clear that if casinos are brought into this country, it will create the utmost confusion because we are a small island. We are not like the United States of America or it maybe Singapore, where they have stringent rules as far as

[ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා]

casinos are concerned, and there is total independence as far as the judiciary and the police are concerned. But, we do not have such a situation here. We have a tremendous amount of political interference in all these fields. Ultimately, if these two factors, narcotics and casinos, also come into this country, I must say, with due respect to the Chair of this august Assembly, we are going to face tremendous hardships society-wise and also in terms of our future generation.

Then, look at the Law College. The Principal of the Law College has given favourable marks to his own son for him to pass the Law College Examination. If the younger generation, the students of this country, are habituated in such a manner, how can we have discipline as far as the legal profession is concerned? I, as a lawyer, have a right to say this. I got through that examination 43 years ago, and today I am a practising. But, today, the Principal of the Law College himself gives marks to his own son to get him through the examination.

So, Sir, these are some of the major factors that we have to consider and we respectfully move that the Government take these facts into consideration and bring some sanity to this country through a better project.

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.59]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - வனசீவராசிகள் வளப் பேணுகை அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Minister of Wildlife Resources Conservation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ඩී.එම්. ස්වාමිනාදන් මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ කථා කරන්න ලැබීම ගැන මා සතුටු වනවා. එතුමාගේ කථාවට ඇමතිවරයකු හැටියට මා පිළිතුරු දිය යුතුයි. නමුත් මට තිබෙන්නේ අලි ප්‍රශ්නයක්. ඉතින් මේ අලි ප්‍රශ්නය තිබෙන නිසා මට ලැබී තිබෙන විනාඩි 10න්, 12න් එතුමාගේ කථාවලට, අතුරු කථාවලට උත්තර දෙන්න පුළුවන්කමක් නැහැ. මා මේ ගරු සභාවට යම් කිසි අවබෝධයක් ලබා දෙන්න බලාපොරොත්තු වනවා.

වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට දැඩි රක්ෂිත තුනක්, ජාතික උද්‍යාන 22ක්, ස්වාභාවික රක්ෂිත 5ක්, අභය භූමි 62ක්, ඒ වාගේම නන්දිකඩාල්, මුතුරාජවෙල ඇතුළු තෙත් බිම් 6ක්, හික්කඩුව සහ Pigeon Island කොරල් පර, මුහුදේ සතුන්ගෙන් නිල් තල්මහ, ඩොල්ෆින්, කැස්බෑවා, මුහුදු ඌරන් ආදී සතුනුත් අයත් වනවා. ඒ වාගේම මේ රටේ භූමියෙන් සියයට 14ක වපසරියක කටයුතු අපට කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමා මේ රටේ සෑම ක්ෂේත්‍රයකම අය අරලියගහ මන්දිරයට සහ ජනාධිපති ලේකම් කාර්යාලයට කැඳවා, මේ අමාත්‍යාංශය ගැන පමණක් නොවෙයි, සියලුම අමාත්‍යාංශ ගැන දීර්ඝ සාකච්ඡාවන් කරලා තමයි එතුමා මේ අය වැය ලේඛනය සකස් කළේ. එහිදී බොහෝ ගම් වැසියන් ඔවුන්ට අවශ්‍ය ජල පහසුකම් සඳහා කුලු වැව් අලුත්වැඩියා කිරීමටත්, වන සතුන් ගම්වලට හා ගොවි පොළවල්වලට පැමිණීම වළක්වා ගැනීමටත් කටයුතු කරන ලෙස එතුමාගෙන් ඉල්ලා සිටියා. එතුමා මේ ප්‍රශ්නය තේරුම් ගෙන, විශේෂයෙන් වින්දිතයාට -මේ ප්‍රශ්නයට ගොදුරු වන මේ ප්‍රශ්නයෙන් බැට කන අයට- මේ කටයුතු කර ගෙන යෑම සඳහා එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට රුපියල් මිලියන 10 බැගින් වෙන් කළා. අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා කිව්වා නේ, සල්ලි වෙන් වෙලා නැහැයි කියලා. ගරු මන්ත්‍රීතුමනි, රුපියල් මිලියන 250ක් අපේ අමාත්‍යාංශයේ අලි වැට සඳහා වෙන් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. රාජ්‍ය නොවන සංවිධාන සහ ශුභ පතන්නන්ද මේ සඳහා එකතු කර ගන්නවා. ඒ වාගේම විදේශ ආධාර ලබා ගැනීමටත් අපි බලාපොරොත්තු වනවා.

අලි ප්‍රශ්න ආවාම, අලි එළවන්න සහ නොයෙකුත් කාරණාවලදී බොහෝ වෙලාවට අපේ නිලධාරින් කියන්නේ වාහන නැහැයි කියලායි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය වාහන ගන්න අතිගරු ජනාධිපතිතුමා මේ අය වැයෙන් රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ජීවිත හා දේපොළවලට වන්දි ගෙවීම පිළිබඳවත් කියන්න ඕනෑ. 2013 අය වැයෙන් ක්‍රියාත්මක කළ රක්ෂණ ක්‍රමය මඟින් වගා හානිවලටත් වන්දි ගෙවීමට යෝජනා කර තිබෙනවා. අපි ආඩම්බරයෙන් මතක් කරන්න ඕනෑ, දෙසැම්බර් මාසයේ ගරු බැසිල් රාජපක්ෂ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා සමඟ ගිහින් මේ රටේ ගොවි ජනතාවගේ අලාභ හානි වුණු කුඹුරුවලට වන්දි ගෙව්වාය කියලා. අපට වෙන් වෙලා තිබෙන මුදල්වල මුළු එකතුව රුපියල් මිලියන 1,315යි. අපට රුපියල් මිලියන 824ක ආදායමක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වනජීවී වැනි ක්ෂේත්‍ර මට්ටමින් කටයුතු කරන නිලධාරින්ට රුපියල් 300ක දීමනාවක් සූදානම් කර තිබෙනවා. ඒ වාගේම වනජීවී ක්ෂේත්‍රයේ වැඩ කරන නිලධාරින්ට වසර 5ක කල්බඳු ක්‍රමය යටතේ පාපැදි ලබා දීමට යෝජනා කරලා තිබෙනවා. ඒ වසර 5 අවසානයේදී ඔහුට ඒ පාපැදිය ලැබෙනවා. ඒ වාගේම අපේ පශු වෛද්‍යවරුන් ඉන්නවා. රටේ සියලුම පශු වෛද්‍යවරුන්ට රුපියල් 7,500ක දීමනාවක් රජයෙන් යෝජනා කර තිබෙනවා. මීට අමතරව අපි මේ ප්‍රශ්නය හරියාකාරව තේරුම් ගෙන තිබෙනවා. අපි කුරුණෑගල දිස්ත්‍රික්කයේ සාකච්ඡා විශාල ප්‍රමාණයක් නියම කර තිබුණා. 2013.09.24වන දින අපි කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී සාකච්ඡාවක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ආනමඩුවේදී, තාරානාත් බස්නායක මන්ත්‍රීතුමාගේ ගල්ගමුව ආසනයේදී, ටී.බී. ඒකනායක ඇමතිතුමාගේ ආසනයේදීත් අපි සාකච්ඡා කළා. තාක්ෂණික සහාය සහ අනෙකුත් සහාය ලබා දීලා අලි වැට සකස් කිරීමේ කටයුතු කොහොමද කරන්නේ කියලා අපි දැනටමත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. මේ වන විටත් අප ඒ සඳහා මුදල් වෙන් කර තිබෙනවා. [බාධා කිරීමක්] ගියා, ගියා. නිකවැරටිය පැත්තේත් ගියා. ඒ අනුව මේ ප්‍රශ්නයට තිරසාර විසඳුමක් ලබා දෙන වැඩ පිළිවෙළකට අපි අවතීර්ණ වෙලා තිබෙනවාය කියන එක මා සතුටින් මතක් කරනවා.

ජනතා විමුක්ති පෙරමුණේ අනුර දිසානායක මන්ත්‍රීතුමා හැම දාම කපුටෝ වාගේ කුණු අවුස්සන එක නේ කරන්නේ. ඒකට කමක් නැහැ. එතුමා කියපු, උඩවලව මව්ආර ජලාශයේ මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් මා මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කරලා තිබෙනවා. අංගම්මැඩිල්ල ප්‍රදේශයේ අනවසර මැණික් ගැරීමේ කටයුතු ගැන මේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කරලා තිබෙනවා. මාදුරුඔය ප්‍රදේශයේ අනවසර ගවයන් සම්බන්ධයෙනුත් ප්‍රකාශයක් කරලා තිබෙනවා. කුමන, යාල හරහා කැබලිත්තට පාරක් කැපීම ගැනත් එතුමා කිව්වා. මේ මාර්ගය ඈත කාලයේ ඉඳන් තිබුණු මාර්ගයක්. ඒක අලුත්වැඩියා කරනවා විතරයි. ඒ හැර අලුතින් පාරක් කපන්නේ නැහැ.

මාගා ආයතනය විසින් විල්පත්තුවේ කරන පස් පැටවීම අප තහනම් කරලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ වැව් තුනක් හදන්න අප අවසර දීලා තිබෙනවා. දැනට ඒ වැව් තුන හදලා අවසන් කරලා තිබෙනවා.

අලි මිනිස් ගැටුම සම්බන්ධයෙන් අපේ ජනතාව, ඒ වින්දිතයන් කල්පනා කරනවා, මේක වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට පැවරෙන කාර්යභාරයක් පමණයි කියලා. ඇත්තටම ඒක වැරදියි. අපට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ අමාත්‍යාංශ රාශියක් සමඟ අන්තර් සම්බන්ධතාවකින්. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය වාගේම වන සංරක්ෂකගේ සහායත් අපට අවශ්‍ය වෙනවා. මේ වාගේ අමාත්‍යාංශ රාශියක් ඒකාබද්ධ වෙලා මේ ප්‍රශ්නය ජාතික ප්‍රශ්නයක් හැටියට සැලකිල්ලට අරගෙන තේරුම් අරගෙන කටයුතු කරන්න ඕනෑ. අලි මිනිස් ගැටුම නිසා මේ රටේ මිනිහෙක් මැරුණාම එහෙම නැත්නම් අලියෙක් මැරුණාම වන ජීවී අමාත්‍යාංශයට පමණක්, අපේ නිලධාරින්ට පමණක් ඇඟිල්ල දික් කරලා අපට අත සෝදා ගන්න පුළුවන් කමක් නැහැ. ඒ නිසා අපි සියලු දෙනා ඒකාබද්ධව මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්න අපි දැනට සැලසුම් සහගතව කටයුතු කරලා තිබෙනවා.

විශේෂයෙන්ම මා මතක් කරන්න ඕනෑ, මේ ප්‍රශ්නයට අලි වැට ප්‍රත්‍යක්ෂ ඖෂධයක් නොවෙයි කියන එක. ඒක සියයට 100ක් සාර්ථකයි කියා මා විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා ඉන් ඔබ්බට ගිය ක්‍රියා මාර්ග අපි මේ වන විට අරගෙන තිබෙනවා. හෙක්ටයාර් 2000ක තිබෙන ලැන්ටානා, කළපු අන්දර වාගේ ආක්‍රමණික ශාක ඉවත් කරලා, අලින්ගේ විල්ලු ටික නිර්මාණය කරන්න, අලින්ට අවශ්‍ය තෘණ වර්ග වගා කරන්න, ඒවා වගාවෙන ආකාරයට පරිසරය සකස් කරන්න අපි කටයුතු කර තිබෙනවා. මේ වන විට හෙක්ටයාර් 2000ක අපි මේ කටයුතු ආරම්භ කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම, වන ජීවීන් ජීවත් වෙන ලුණුගම්වෙහෙර, යාල, උඩවලව, විල්පත්තුව යනාදී ප්‍රදේශවල වතුර වළවල් ටික හදලා, වැව් හතක් හදන ඒ කටයුතුත් මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතිනවා. අලියාගේ සුපෝෂණය සහතික කරනවාය කියන්නේ මේ රටේ සිටින සියලු සතුන්ගේ සුපෝෂණය සහතික වෙනවාය කියන එකයි. අලි වන ජීවී ප්‍රදේශයෙන් වන සංරක්ෂක ප්‍රදේශයටත්, ඉන් නොනැවතී සංවර්ධිත ප්‍රදේශයටත් එන්නේ ඇයි කියන එක අප හොයන්න ඕනෑ.

මා මේ කාරණය විශේෂයෙන් කියන්න ඕනෑ. මිනිසුන්ට කලින් ශිෂ්ටාචාර වුණේ සත්තු. ඒ අතින් අලියා ප්‍රධාන තැනක් ගන්නවා. අලියා තමන්ගේ රැහෙන් ආවාහ විවාහ වන්නේ නැහැ. ඒ නිසා තරුණ ජවය තිබෙන අලි අනිවාර්යයෙන් රැහෙන් එළවා දමනවා. එහෙම එළවා දැම්මාම ඒ අලියා වෙනත් රැහැකට යන්න ඕනෑ. නමුත් අද අභාග්‍යයකට වාගේ අලි මංකඩවල් අහුරා තිබෙනවා. තමුන්නාන්සේලාගේ දිස්ත්‍රික්කයේ එක අලිමංකඩක කුකුල් ෆාම් එකක් දමලා. පැල්වත්ත සීනි සමාගම අලිමංකඩක් අහුරා තිබෙනවා. මේ විධියට රටේම අලින්ට යන්න තිබෙන අලිමංකඩවල්, රැහෙන් රැහේට තමන්ගේ ජාන බෙදාගෙන යන්න තිබෙන අලිමංකඩවල් අහුරා තිබෙනවා. හිතා ගන්න පුළුවන් නේ තරුණ ජවය තිබෙන අලියෙක් තමන්ගේ සහකාරිය නැත්නම් ආදරවන්තිය සොයා ගෙන යනකොට මොන තරම් ආවේගශීලීව යනවාද කියලා. මූලාසනයේ සිටින අපේ මන්ත්‍රීතුමාට ඒක අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ඔබතුමාට මේක ඉන්ද්‍රියගෝචර ප්‍රත්‍යක්ෂ කාරණාවක්. අපේ වපසරිය තුළ කළ යුතු දේවල් මැනවින් හඳුනා ගෙන තිබෙනවා. ඒ නිසා අපි මේ වන විට GPS එක බලලා සම්පූර්ණයෙන්ම අලි මංකඩවල් හඳුනාගෙන තිබෙනවා. අපි අලි වැටවල් අවශ්‍ය ප්‍රදේශ හඳුනා ගෙන තිබෙනවා. ඒ අනුව වනාතවිල්ලුව, ආනමඩුව වාගේ හැම තැනටම ගිහින් සාකච්ඡා පවත්වලා අලි වැටවල් නිර්මාණය කිරීමේ වැඩ සටහනට අවශ්‍ය සියලු කටයුතු සූදානම් කරලා තිබෙනවා.

අපි අපේ රට ගැන ආඩම්බර වෙනවා. ලෝකයේ අශ්වයන් සිටින රටවල් තිබෙනවා. ඒ වාගේම අපේ රටේත් අශ්වයන් සිටිනවා. නමුත් අපි කවුරුත් ඒ ගැන වැඩිපුර දන්නේ නැහැ. Delft Island එකේ අශ්ව සංරක්ෂණය කිරීම ගැන අපි සාකච්ඡා කළා. ඒ වාගේම අපි Chundikulam Park එක ආරම්භ කළා. ඩෙල්ෆ් දූපතේ අශ්ව සංරක්ෂණය සිදු කරනවා.

ඒ වාගේම අපි කැස්බෑ සංරක්ෂණය සිදු කරලා තිබෙනවා. මම කියලා තිබෙනවා, විශාල ජාන මං කොල්ලයක් මේ රටේ තිබෙන බව. අද අපේ ඇළි කැස්බෑවෙක් නැති වෙලා. ඒ සතා රුපියල් කෝටි හතරහමාරකට මිල කරලා තිබෙනවා. ඒ වාගේම අපේ වනෝද්‍යාන 19 සඳහාම ජාත්‍යන්තර මට්ටමේ පිවිසුම් නිර්මාණය කරන්නට කටයුතු කරගෙන යනවා. ඒ වාගේම වනෝද්‍යානවල සිදු වන සියලුම අනවසර ක්‍රියා නවත්වන්නට අපි කටයුතු කරලා තිබෙනවා.

ශ්‍රී පාදය ලෝක උරුමයක්. ශ්‍රී පාදය ප්‍රදේශයේ නියමාකාර කැළි කසළ අපහරණ පද්ධතියක් නැහැ. අපි එය සකස් කරලා තිබෙනවා. මෙය ලෝක උරුමයක් වුණත් අපි විදේශකයින්ගෙන් ශත පහක්වත් අය කරන්නේ නැහැ. වෙනත් ස්ථානවලදී විදේශකයන්ගෙන් අය කරනවා. ඒ වාගේම අපි විශේෂයෙන් Galway's Land National Park එක ගැන සොයලා තිබෙනවා. විනාශ වන සතුන් ගැන සොයලා තිබෙනවා. විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමා ගේ කුරුල්ලා ආරක්ෂා කරන ලෙස අපෙන් ඉල්ලා තිබෙනවා. අපි ඒ සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

මම පුංචි කවියක් කියලා මගේ කථාව අවසන් කරනවා. [බාධා කිරීමක්] නැහැ, නැහැ මේක කවියක් නොවෙයි නිසඳැසක්.

"සතා සිවුපාවා ගහ කොළ නොතිබෙන්ට  
වැව ඇළ ආර අමුණත් නොම නැතිවෙන්ට  
සිවු පා උරග බිඟුන්ගේ හඬ නොඇසෙන්ට  
මිනිසාට හැකිද මහ පොළොවේ රැඳෙන්නට"

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**  
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**  
(The Presiding Member)  
මීළඟට, ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ කථාව. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.10]

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. සංස්කෘතිය හා කලා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කථා කිරීම කලාකරුවෙක් හැටියට මගේ යුතුකමක් හැටියට මම කල්පනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි 20ක කාලයක් තිබෙන නිසා මම කෙළින්ම කාරණාවට එන්නම්. උත්තර දීම සඳහා විෂය භාර අමාත්‍යවරයා සභා ගර්භයේ සිටියා නම් හොඳයි කියලා හිතෙනවා. එතුමා ළඟ පාතක ඉන්නවා ද දන්නේ නැහැ, උත්තර දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලාකරුවන් සහ ආණ්ඩුවල ඉතිහාසය ගැන කෙටියෙන් කථා කිරීමේදී, බොහෝ ආණ්ඩු කලාකරුවන් පාවිච්චි කරන්නේ මැතිවරණයක් කිට්ටු වෙද්දී කියන රාවය හැම තැනම තිබෙනවා. එය ප්‍රසිද්ධ රහසක්. එක එක ආණ්ඩු ඉතිහාසය පුරාම අඩු වැඩි වශයෙන් බලයට එන්න කලාකරුවන් පාවිච්චි කළා. නමුත් බලයට ආවාට පසුව, -හොද්ද රස වෙන්න දාන රම්පේ, කරපිංචා පසුව විසි කරනවා වාගේ- විසි කරලා දැම්මා. අපි පක්ෂ භේද, පාට භේදවලින් තොරව කථා කරනවා නම්, ඉතිහාසය දිහා බැලීමේදී, ලෝකයේ ප්‍රථම අගමැතිනිය වන සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය කලාකරුවන් වෙනුවෙන් ජාතික චිත්‍රපටි සංස්ථාව ඇති කළා. අපි ඇත්ත කථා කරන්න ඕනෑ. ඒ වාගේම ආර්. ප්‍රේමදාස මහත්මයා, හිටපු ජනාධිපතිතුමා කලාකරුවන්ට බෙහෙවින් ආදරය කළා; ඒ අයට උදවු වුණා. ඒක ඉතිහාසයේ තිබුණු දෙයක්. ඒ කාලයේ සිටි කලාකරුවෝත් එහෙමයි.

ඔය කථානායක පුටුවේ වාඩි වෙලා සිටියා අපේ සිනමා සක්විති ගාමිණී ෆොන්සේකා මහත්මයා. එතුමා කවදාවත් දේශපාලනඥයන් ඉදිරියේ වැඳ වැටුණේ නැහැ. එතුමාට භාෂා 3ක් පුළුවන්. එතුමා අපේ සිනමා සක්විති. එතුමා කලාකරුවන්ගේ ප්‍රෞඪත්වය, ඒ අයගේ dignity එක, ඒ අයගේ අභිමානය නියෝජනය කළා. මගේ මාමා වන විජය කුමාරතුංග මහත්මයාත් කලාකරුවන්ගේ අභිමානය නියෝජනය කළා. එතුමා කලාකරුවන්ට ආඩම්බරයක් වුණා. නමුත් දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ රජය කලාකරුවන් බලයෙන් වන්දිභට්ටයන් කරගෙන තිබෙනවා. ඒක කියන්න දුකයි. ඒ කාලයේ විජය කුමාරතුංගලා කවදාවත් එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධන මහත්මයාටවත් second වුණේ නැහැ; ඒ අයටත් අභියෝග කළා. ඒ ශ්‍රේෂ්ඨ නළුවෝ. ගාමිණී ෆොන්සේකා මහත්මයාත් එහෙමයි. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාත් නළුවෙක්. අපේ සිනමා සක්විති ගාමිණී ෆොන්සේකා මහත්මයා අධ්‍යක්ෂණය කළ "නොමියෙන මිනිස්සු" කියන චිත්‍රපටයේ එතුමා රඟපා තිබෙනවා. මා කියන්නේ අන්න ඒ වාගේ තමයි ඉස්සර හිටපු කලාකාරයෝ කලා ක්ෂේත්‍රයේ අභිමානය, ආඩම්බරකම, ශ්‍රේෂ්ඨත්වය පෙන්නුවේ. නමුත් දැන් සිටින කලාකාරයන්ව අපේ මේ රජය වන්දි භට්ටයන්, රජයේ හොරණෑ බවට පත් කරගෙන තිබෙනවා. ඒ ගැන කියන්න දුකයි. මැතිවරණයක් ළං වනකොට සිංදු කියන්න ගන්නවා. මොනවාද සිංදු? "ආයුබෝ වේවා, මහ රජාණෙනි" කියලා සිංදු කියනවා. ඊළඟට "පණ ඇති මිනිහෙක්" කියලා සිංදු කියනවා. ඊට පස්සේ ඒගොල්ලන් ඒකෙන් කඩ කාමර ගන්නවා. අතිගරු ජනාධිපතිතුමා ශාක්‍ය වංශයේ බුදු හාමුදුරුවන්ගේ නෑදෑයෝ කියලාත් අපේ සමහර කලාකරුවෝ කියනවා. ඒ වාගේ අන්දගෙන වැඩ ගන්නා ක්‍රමයක් තිබෙනවා. ඒවා ගැන අපි කනගාටු වනවා.

නමුත් මෙහෙම වැඩ අරගත් කලාකාරයන්ට අද මොකද කරලා තිබෙන්නේ? ඒ කාලයේ එක දිගටම mobile phonesවලින් වාදනය වෙන්න සැලැස්සුවේ මොකක්ද? "ආයුබෝ වේවා මහ රජාණෙනි" කියන සිංදුව තමයි ඒ කාලේ mobile phonesවල ringing tone එක වුණේ. ඒ ringing tone එක දැන් අහන්නවත් නැහැ. මොකද වෙලා තිබෙන්නේ? ඒ කියන්නේ කලාකාරයෝ රජයෙන් ඈත් වෙලා තිබෙනවා. ඒ ඈත් වෙලා තිබෙන්නේ ඇයි කියලා අපි සොයන්නට ඕනෑ. වැඩ ගන්නවා විතරයි, අන්තිමට මොකක්ද වෙන්නේ? ඒ අයට අවශ්‍ය දේ සිදු වන්නේ නැහැ. කලාවට සෙතක් වෙලාත් නැහැ. අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? මේ වන්දි භට්ට කලාකාරයන්ට විතරක්, ප්‍රශස්ති ගී ගායනා කරන කලාකරුවන්ට විතරක් -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

කලාකරුවන්ට අවනම්බු කරන්න එපා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

නැහැ, නැහැ, ඔබතුමාත් එක්ක කථාවක් නැහැ. ඔබතුමා represent කරන්නේ මුස්ලිම් ජනතාව. මුස්ලිම් ජනතාවටම නින්දාවක්. [බාධා කිරීමක්] නැහැ, නැහැ, මම කිව්වේ කලාකරුවන් ඉතාම අනභිභවනීයයි, ගෞරවනීයයි කියන එකයි. ඒ අයගේ ආත්මගෞරවය - dignity එක- මේ රජය විසින් නැති කරලා තිබෙනවා, ඒ අයව බලෙන් කඩේ යවලා. සමහර අය කිව්වා, ගෝනි අරන් කඩේ යනවා කියලා. සමහර අය කිව්වා, "අපි wholesale කඩේ යනවා" කියලා. ඒ කියපු අයටත් හරි දෙයක් ඉෂ්ට වුණේ නැහැ. දැන් මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? පසු ගිය අගෝස්තු හය වැනිදා අපේ හිටපු ජනාධිපති උපදේශකවරුන් දෙදෙනෙකුයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුයි රජ ගෙදරට ගිහිල්ලා අපේ අතිගරු ජනාධිපතිතුමා හමුවෙලා කලා ක්ෂේත්‍රයේ සිදු වන ව්‍යසනයන් ගැන පැහැදිලි කළා; ලිඛිතව ඉදිරිපත් කළා. ඒ ලියුම්වල මොනවාද තිබුණේ? මම කියන්නම්. මේක මඩගැහිල්ලක් නොවෙයි. මේක කලා ක්ෂේත්‍රයේ භයානක ආරංචියක්. අද මේ සභාවේ ගැලරියේත් කලාකරුවෝ සිටිනවා. මේක කියන්න කියලා ඒ අයත් මගෙන් ඉල්ලීමක් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත කථාව මේකයි. අද මොකක්ද සිදු වෙලා තිබෙන්නේ? අද ටෙලි නාට්‍යයක් විකාශය කරවා ගන්න අපේ කලාකරුවන් කොපමණ මහන්සි වෙනවාද? කලාකරුවන් කියන අය සුපිරි ධනපති පන්තියේ අය නොවෙයි. අව්වේ පිච්චෙමින්, වැස්සට තෙමීගෙන වැඩ කරලා, වැඩ කරලා ගිහින් ඒ අයගේ ටෙලි නාට්‍යයක් විකාශය කරවා ගන්න අද ඇමතිවරුන්ට අල්ලස් දෙන්නට සිදු වෙලා තිබෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

තමුන්නාන්සේවත් හැමදාම ටෙලි නාට්‍යවලින් පෙනෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

තමුන්නාන්සේ දන්නේ නැති වුණාට මට ටෙලි නාට්‍ය තහනම් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය ගැන අපේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සභාපතිත්වය දරන සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ දී දෙවතාවක්ම කිව්වා. මාලනී ෆොන්සේකා කියන නිළි රැජිණත් සිටි අවස්ථාවේ දී කිව්වා. දෙවතාවක්ම කිව්වා. මොකක්ද මම කිව්වේ? මේ කියන්න යන භයානක ආරංචිය මොකක්ද? භයානක ආරංචිය තමයි, අද කලාකරුවන්ගෙන් මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දඩ මස් සහ නිළි මස් කියන දේ බලාපොරොත්තු වනවා කියන එක. මේ දඩ මස් කියන්නේ මොනවාද? නිළි මස් කියන්නේ මොනවාද? දඩ මස් කියන්නේ, episode එකට රුපියල් 50,000 ගණනේ දඩ මුදලක් අරගෙන නුවර

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පදනම කියලා ගිණුමකට දමන්න කියලා තිබෙනවා. මේක මම බොහොම වග කීමෙන් කියන්නේ. නුවර ගිණුමේ නම

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පදනම. දැන් මේ පදනමට රුපියල් 50,000 ගණනේ දමන්න ඕනෑ. නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමනි, මේක හරි කැත වැඩක්. මේක නවත්වන්න ඕනෑ. මේක අතිගරු ජනාධිපතිතුමාත් දන්නවා. මාලනී ෆොන්සේකා මහත්මියත් දන්නවා. ජනාධිපති උපදේශක රවින්ද්‍ර රන්දෙණිය මහත්මයාත් දන්නවා, රෝහණ වීරසිංහ මහත්මයාත් දන්නවා, අපේ සුරේෂ් අබේසේකර මහත්මයාත් දන්නවා. මේ මැති ඇමතිවරුනුත් දන්නවා. සියලු දෙනාම දන්නවා. ඇයි මේ අහිංසක කලාකරුවන්ගෙන් episode එකට රුපියල් 50,000 ගණනේ ගන්නේ? ඇයි මේ දඩ මස් ගන්නේ? ඇයි මේ නිළි මස් ගන්නේ? දඩ මස් ගන්නවා මදිවාට [බාධා කිරීමක්] නිළි මස් කියන්නේ ප්‍රධාන නිළියවත් Jaic එකට ගෙනෙන්න කියලා කියනවා. මේක පුදුම තත්ත්වයක්.

ප්‍රධාන නිළියවත් ඉල්ලනවා. රුපියල් 50,000කුත් ඉල්ලනවා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඔබතුමාට දියවැඩියාව. ඔබතුමා ඉල්ලුවේ නැහැ. ඔබතුමාට දියවැඩියාව තිබෙනවා කියලා අපි දන්නවා. ඔබතුමා නොවෙයි ඉල්ලුවේ. බොහොම නිරෝගී ඇමතිවරයෙක් ඉල්ලුවේ. ඔබතුමා කෑ ගහන එක නවත්වන්න. මෙන්න මේකයි අලුත්ම තත්ත්වය.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, he is taking my time. I need my time.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අස්වර් මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා නම් කරුණාකර රීති ප්‍රශ්නය මොකක්ද කියලා සඳහන් කරන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
මේ ගරු සභාවේ ඉතාම අශික්ෂිත වචන පාවිච්චි කරන එක බොහොම කැතයි. අපි එය හෙළා දකිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. [බාධා කිරීමක්] කරුණාකරලා මට මේ ගරු සභාව ගෙන යන්න ඉඩ දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා කථා කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මේක මම නියෝජනය කරන කලා ක්ෂේත්‍රයට සිදු වන අසාධාරණයක්. මේ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. මේ ගැන අතිගරු ජනාධිපතිතුමා දන්නවා. මේ ගැන ජනාධිපති උපදේශකවරු දන්නවා. මේ ගැන පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් දන්නවා. නමුත් ඒ අය කථා කරන්නේ නැහැ. ඒ අය නිහඬ වෙලා ඉන්නවා. සංස්කෘතික හා කලා කටයුතු භාරව ඉන්න ටී.බී. ඒකනායක මැතිතුමාට උපදේශක කාරක සභාවේදී මම මේ ගැන කිව්වා. නමුත් කිසිදු පියවරක් අරගෙන නැහැ. තවමත් මේ අහිංසක ටෙලි නාට්‍යකරුවන්ගෙන්, නිර්මාණශීලී අධ්‍යක්ෂවරුන්ගෙන් මේ අය episode එකට රුපියල් 50,000 ගණනේ අරගෙන පැත්තක ඉඳන් කෝටි ගණන් උපයනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර මේක නවත්වලා දෙන්න කියලා මම අපේ ගරු ටී.බී. ඒකනායක මැතිතුමාගෙනුයි, අපේ ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාගෙනුයි ඉල්ලා සිටිනවා. ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති ඇමතිවරයා මේ ගැන දන්නවා නම්, එතුමාගේ නම විකුණලා කවුරු හරි මේක ගන්නවා නම් ඒක නවත්වන්න. ඒක අපි දන්නේ නැහැ නේ. මම කියන්නේ නැහැ, එතුමා ගන්නවා කියලා.[බාධා කිරීමක්] නිළිය ගන්නේත් ඒ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා ද කියලා මම දන්නේ නැහැ. මේක

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කරනවා ද,

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කරනවා ද කියලා දන්නේ නැහැ. ඒක අහන්න වෙන්නේ කලා ක්ෂේත්‍රයේ ඉන්න කට්ටියගෙන් තමයි. මේක කවුරුත් දන්න තිත්ත ඇත්ත. මේ තිත්ත ඇත්ත ගැන ගරු තිලංග සුමතිපාල මහත්මයෝ කවුරුත් කථා කරන්නේ නැහැ. එතුමා හොඳ චිත්‍රපට නිෂ්පාදනය කරපු -අපේ විජය කුමාරතුංග මහත්මයාවත් දාලා ගහ අද්දර චිත්‍ර පටිය නිෂ්පාදනය කරපු- මගේ මිත්‍රයෙක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

*අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්,* ***නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு,* மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* பிரதிச் சபாநாயகர் அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. UDITH LOKUBANDARA *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Petroleum Industries)
ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු සභාපතිතුමනි, මගේ රීති ප්‍රශ්නය මෙයයි. මෙතුමා මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙකුගේ නමක් සඳහන් කරනවා නම් ඒකට එතුමාට පිළිතුරු දෙන්න පුළුවන් විධියට වෙනත් ආකාරයකට ඉදිරිපත් කරන්න ඕනෑ, substantive Motion එකකින්. එහෙම නැතුව මන්ත්‍රීවරයෙකුට චෝදනාවක් කරන්න බැහැ, කථාවකදී. ඒ නිසා ඒ සම්බන්ධයෙන් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනනුකූල ආකාරයෙන් යම් ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් සඳහන් කර ඇත්නම් පාර්ලිමේන්තු නිල වාර්තාවෙන් එකී නම් ඉවත් කිරීමට නියෝග කරනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු සභාපතිතුමනි, අද සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන්න තිබෙනවා. මම දන්නා විධියට ඒ ඇමතිවරයා මේ ගරු සභාවට එන්න බැඳී සිටිනවා. එතුමා එන්නේත් නැත්නම් එතුමාගේ නම අපි කොයි අවස්ථාවේදීද කියන්නේ, ගරු සභාපතිතුමනි? මට ඒකට උත්තරයක් දෙන්න. එතුමා අද සංස්කෘතික හා කලා කටයුතු-

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග තිබෙනවා. පාර්ලිමේන්තුවේ කටයුතු ක්‍රියාත්මක වෙන්නේ ස්ථාවර නියෝග අනුවයි. පාර්ලිමේන්තුවේ විනය පවත්වා ගෙන යාම සඳහා ස්ථාවර නියෝගවලට අනුකූල වන ආකාරයෙන් කථා කිරීම සියලු මන්ත්‍රීවරුන්ගේ වග කීමක්. ඒක ඔබතුමාගේ පමණක් නොවෙයි, මන්ත්‍රීවරු 225 දෙනාගේම වග කීමක් හැටියට සලකන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු සභාපතිතුමනි, සමාවෙන්න. කලා ක්ෂේත්‍රයේ තිබෙන මේ ප්‍රශ්න මම කාටද ඉදිරිපත් කරන්නේ, ගරු සභාපතිතුමනි? නම කියන්නේ නැතුව සැඟවුණු අමුත්තෙකුගේ නමක් කියන්නද? මොකද සංස්කෘතික හා කලා කටයුතු ගැන අද කථා කරන්නේ. ඒ අමාත්‍යාංශයේ ඇමතිවරයා අද නැත්නම් ඔහුගේ නම කියන්නත් බැරි නම් මොකක්ද මේ අසාධාරණය? මම කවදාද මේ ගැන කථා කරන්නේ? මම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කිච්චාට කමක් නැද්ද? මම කෙටියෙන් කියන්නම්,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මූලාසනයෙන් ප්‍රශ්න කරන්න අවසර නැහැ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මට සමාවෙන්න. මගේ අවස්ථාව දෙන්න.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අධ්‍යයනය කිරීමෙන් අනතුරුව කථාව පවත්වන්නේ නම් මේ කාරණයත් පැහැදිලි කිරීම මම කළ යුතු වන්නේ නැහැ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු සභාපතිතුමනි, කලා ක්ෂේත්‍රයේ විවිධ ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නේ කවුද? ඒ අය ප්‍රශ්න අහන දවස්වලට හැංගෙනවා. ඊට පස්සේ ඒ විෂයය ආපු දවසට හැංගෙනවා. ඉතින් කවුද මේකට උත්තර දෙන්නේ? උපදේශක කාරක සභාවේ දෙවතාවක් කිව්ව දේටත් උත්තරත් නැහැ. අද එන්නේත් නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් ඉන්නවා. ඒ අය මේ ගැන කථා කරන්නේත් නැහැ. ජනාධිපති උපදේශකවරු ගොඩක් ඉන්නවා. ඒ අය කථා කරන්නේත් නැහැ. එතකොට මේවාට මොකක්ද වන්නේ? එතුමා ගැන මොනවා හරි කිව්ව ගමන් අපේ තිලංග සුමතිපාල මහත්මයාට තර්ජනය කරනවා; පුවත් පත්වලට තර්ජනය කරනවා. මේ වාගේ දේවල් වෙනවා. මේක හරි කනගාටුදායක තත්ත්වයක්. ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය ඔබ්බු දුවනවා. මේ ක්ෂේත්‍රයේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් වන මේ අල්ලස් ගැනීම කරුණාකර නවත්වලා දෙන්න කියලා මම අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ අහිංසක කලාකරුවන්ගේ කර පිටින්, ඒ අයගේ ශ්‍රමය, ආඩිය පිටින් රජයක් පිහිටුවලා අන්තිමට ඒ අයගෙන්ම අල්ලස් ගන්නා තත්ත්වයක් මේ රජය උදා කර තිබෙනවා. ඒ නිසා කරුණාකරලා අහිංසක කලාකරුවන්ට මේ දෙය කරන්න එපාය කියලා මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, කලාකරුවන් කියන්නේ හැම දාම අපව විනෝදමත් කරන, අපේ මනස සුවපත් කරන මුනිවරු වාගේ කට්ටියක්. දොස්තරවරු පවා කියනවා යම් ප්‍රශ්නයක්, ආතතියක් ඇති වූ විටක සින්දුවක් අහන්න, චිත්‍රපටියක් බලන්න, නාට්‍යයක් බලන්න, කවියක් අහන්න කියලා. ගරු සභාපතිතුමනි, මේ අයගේ ජීවිතයේ අවසාන කාලය කොහොමද ගෙවෙන්නේ? අපේ රුක්මනී දේවිය, මගේ මාමා වන විජය කුමාරණතුංග මහත්මයා ගැන බලන්න. ඒ අය පුළුවන් තරම් ජනතාව වෙනුවෙන් වියදම් කරලා කරලා අන්තිමට account එකේ සල්ලි නැතිව තමයි මේ ලෝකය හැරලා ගියේ. ගාමිණී ෆොන්සේකා මහත්මයා තමුන්ගේ දේවල් වියදම් කළා. නමුත් මේ කලාකරුවන්ට රටෙන් මොනවාද ලැබුණේ? ඔවුන්ට විශ්‍රාම වැටුපක් ලැබුණාද? ඒ අයට බෙහෙත් හේත් ගන්න දෙයක් දුන්නාද? නැහැ. කවදාවත් එහෙම දෙයක් වුණේ නැහැ. හැම දාම ඔවුන් ප්‍රයෝජනයට අරගෙන, සූරා ගෙන කාලා, කරපිංචා වාගේ වීසි කළා. කලාකරුවන්ට හැම දාම කළේ ඒකයි. මම කෙළින් කථා කරන මිනිහෙක්. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සහ අපේ ප්‍රේමදාස මහත්තයාවත් ඒක කළේ නැහැ. අද

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇතුළු මේ ආණ්ඩුව කරන්නේ ඒ අයව පාවිච්චි කරලා වීසි කරන එකයි කියලා මා කියනවා ගරු සභාපතිතුමනි. ඒක තමයි අද වෙලා තිබෙන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Hon. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
He is violating the Standing Orders. He cannot make a remark in that fashion about His Excellency the President. I would also quote Standing Order No. 73. It states, I quote:

"Mr. Speaker, after having called the attention of Parliament to the conduct of a member who persists in irrelevance or tedious repetition either of his own arguments or of the arguments used by other members in debate may direct the member to discontinue his speech."

There is power vested in you by the Standing Orders to stop this.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
If there is any statement contrary to the Standing Orders, such portion will be expunged.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු සභාපතිතුමනි, මේ වාගේ දේවල් වෙනවාය කියලා මම අතිගරු ජනාධිපතිතුමාට යෝජනාවක් කළේ. Standing Orders අනුව ඉවත් කරන්න තරම් වැරැදි දෙයක් මගේ අතින් කියැවුණා කියලා මා හිතන්නේ නැහැ. ඔබතුමා මගේ මිත්‍රයෙක් ගරු සභාපතිතුමනි. මම හිතන්නේ නැහැ ඒ වාගේ නරක දෙයක් කියැවුණා කියලා. සමස්ත කලාකරුවන් වෙනුවෙන් මම කථා කළේ. මොකද සමස්ත කලාකරුවන්ගේ චෝදනාවක් තිබෙනවා කලාකරුවන් හැටියට අප පාර්ලිමේන්තුවට ගිහිල්ලා ඒ අය ගැන කථා කරන්නේ නැහැය කියලා. ඒ අය ගැනයි මම කථා කළේ. මා හිතන්නේ නැහැ ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධී දෙයක් කියලා. මෙතුමන්ලාට මම යෝජනා කරනවා මේ වයෝවෘද්ධ කලාකරුවන්ට, විශ්‍රාම යන කලාකරුවන්ට මහලු නිවාසයක් හරි හදන්න, අඩු ගණනේ බෙහෙත් හේත් ගන්න විශ්‍රාම ක්‍රමයක්වත් හදන්න කියලා. නමුත් මෙවර අය වැයෙන් අපේ කලාකරුවන් මොනවාද යෝජනා කළේ? නිවාඩු නිකේතන පහක්. බොරු වැඩක් නේ. නිවාඩු නිකේතනවලට යන්න තවත් සල්ලි ඕනෑ; transport ඕනෑ. ඒවාට ගිහිල්ලා කෑම බීමට වියදම් කරන්න ඕනෑ. ඒ සියල්ලටම මුදල් ඕනෑ. ඊට වඩා ප්‍රායෝගිකයි ඒ කලාකරුවන්ගේ උන්නතිය සඳහා, අනාගතය තකා විශ්‍රාම වැටුපක් දෙන එක. එසේ කරන්න කියලා මා යෝජනා කරනවා. අද කලාකරුවන්ගේ නම් විකුණලා ආපු බොහෝ කලාකාර මන්ත්‍රීවරුන්ගේ තත්ත්වය ඒකයි. ඒ අය තමුන්ගේ වැඩ කර ගන්නවා මිසක්, සමස්ත කලාව ගැන හිතන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේ කලාකරුවන් මට තවත් ඉල්ලීමක් ඉදිරිපත් කළා. අද මගේ කථාව තිබෙනවා කිව්වාම ඒ අය මගෙන් මේ ඉල්ලීමත් ඉදිරිපත් කරන්න කිව්වා. ගරු සභාපතිතුමනි, අද මුළු ලෝකයේම සිනමාව ඩිජිටල්කරණය වෙලා තිබෙන්නේ. අප පාවිච්චි කරන්නේ පරණ සෑලෝලයිඩ් පටි. ඒකෙන් copy එකකට 175,000ක් වැනි මුදලක් යනවා. මේ ඩිජිටල් copy එකකට යන්නේ රුපියල් 10,000යි. නමුත් ඒ පනත් කෙටුම්පත pass කර ගන්නට අප 2005 ඉඳලාම මහන්සි වෙනවා. මේ වෙන තුරු ඒක pass කළේ නැහැ. ඒ කාට කොමිස් කුට්ටියක් යන්නද කියන එක මම මේ අවස්ථාවේ මේ ගරු සභාවෙන් අහනවා. කාගේද ඒ නීතිය? මුළු ලෝකයේම සිනමාව දියුණු වෙලා, බොලිවුඩ්, හොලිවුඩ් සිනමා දියුණු වෙද්දි අප විතරක් මේ පරණ විදියට කරන්නේ ඇයි කියන එක මම තමුන්නාන්සේලාගෙන් අහනවා. ගරු සභාපතිතුමනි, මෙවැනි විශාල ප්‍රශ්න ගොන්නක් අද මේ කලා ක්ෂේත්‍රය පුරාම විසිරිලා තිබෙනවා.

අද කලාකරුවෙකුට තමන්ගේ ටෙලි නාට්‍යයක් කරලා, එය ජාතික නාලිකාවක ප්‍රචාරය කර ගන්න පෝලිමේ ඉන්න සිද්ධ වෙනවා. ඉස්සර ජාතික නාලිකාවක් කිව්වාම, එහි ටෙලි නාට්‍යයක් ශ්‍රේණිගත කරන්න යම්කිසි ක්‍රමවේදයක් තිබුණා. ඉස්සර 8.30 වාගේ peak hoursවල belt එක දුන්නේ රටේ හිටපු ප්‍රතිභා පූර්ණ, ඉතාම දක්ෂ අධ්‍යක්ෂවරුන්ගේ නිර්මාණවලටයි. නමුත් අද මොනවාද වෙලා තිබෙන්නේ? අද හිතවත්කමට, යාළුකමට, අල්ලසට, තිළි මස්වලට, දඩ මස්වලට ඒ belt එක - 8.30 belt එක - පාවා දීලා තිබෙනවා. ජනතාව ගෙදර ඉඳන් වැඩිපුරම රූපවාහිනිය නරඹන peak hours - 8.30 to 9.30 - අද වෙන වෙන දේවලට පාවා දීලා තිබෙනවා. ඒ නිසා අද රටේ ඉන්න ප්‍රතිභා පූර්ණ, දක්ෂ අධ්‍යක්ෂවරුන් -පරාක්‍රම නිරිඇල්ල, බර්ට්‍රම් නිහාල්, ප්‍රසන්න විතානගේ, සුරේශ් අබේසේකර, සුදත් රෝහණ වාගේ අය - අතර මං වෙලා ඉන්නවා. නමුත් වැඩ බැරි අධ්‍යක්ෂවරුන්ගේ ඉතාම අවර ගණයේ ටෙලි නාට්‍යවලට අල්ලස සහ අර මා කියපු මස් වර්ගය හින්දා 8.30 belt එක දීලා තිබෙනවා. ඒක ඉතාම ශෝචනීය තත්ත්වයක්. ඒ හින්දා අද කලාකරුවන් පස්සට ගිහිල්ලා තිබෙනවා. කලාකරුවන් ආපස්සට ගිහිල්ලා, නැවත නැවත ශෝචනීය තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ටෙලි නාට්‍යයකට ගෙවන්නේ 175,000යි.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා, තවත් විනාඩියක් තිබෙනවා ඔබතුමාට.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය අනුව අද කලා ක්ෂේත්‍රය ඉතාම දරුණු තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඉතින් මේ සම්බන්ධයෙන් නිවැරැදි දේ කරලා, සුදුසු උපදේශකවරුන් අරගෙන, නිසි පරිදි දැනුවත් වෙලා කටයුතු කරන්න කියලා මම කියනවා. අතිගරු ජනාධිපතිතුමා ඇතුළු මේ ආණ්ඩුව තමන්ව බලයට පත් කරපු, තමන්ව ඔසවාගෙන ගිහිල්ලා "ආයුබෝ වේවා, මහ රජාණනි!" "පණ ඇති මිනිහෙක්!" කියලා සින්දු කියපු, තමන්ව කරේ තියාගෙන ගිය අය මැතිවරණවලට විතරක්, මැතිවරණ වේදිකාවට විතරක් පාවිච්චි නොකර සමස්ත කලාව වෙනුවෙන්ම ජාතික ප්‍රතිපත්තියක් ඇති කරලා, ගජ මිතුරු සංකල්පය නැති කරලා, තමුන්ට හිතවත් කියන ටික දෙනකුට විතරක් 8.30 belt එක දෙන්නේ නැතිව, විශේෂත්වයක් කරන්නේ නැතිව සමස්ත ජනතාවටම, සමස්ත කලාකරුවන්ටම යහපතක් කරනවා නම් හොඳයි කියලා මම හිතනවා.

ගරු සභාපතිතුමනි, අපේ විමල් වීරවංශ මැතිතුමාත් දැන් මේ ගරු සභාවට ආවා. මම මේ අවස්ථාවේ එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා අර ජගත් චමිල කියන, ඇමෙරිකාවේදී සම්මානය ගත්තු අපේ නළුවාට ගෙයක් ප්‍රදානය කරලා තිබුණා. ඒ වෙනුවෙන් බොහොම ස්තුතියි ඇමතිතුමාට. මම යෝජනා කරනවා වයෝවෘද්ධ කලාකරුවන් ගැනත් ඒ වාගේම හිතලා ඒ අයටත් ගෙවල් ලබා දෙන්න, විශ්‍රාම වැටුප් ලබා දෙන්න, සියලු පහසුකම් ලබා දෙන්න කියලා.

[பி.ப. 4.32]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ தவிசாளர் அவர்களே, தெரிகுழுவுக்கு ஆற்றுப்படுத்தப்பட்டுள்ள பல்வேறு அமைச்சுக்களின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்திலே பேசுவதற்கு எனக்கும் சந்தர்ப்பம் வழங்கியமைக்காக நன்றி தெரிவிக்கின்றேன். இந்தக் குறுகிய நேரத்துக்குள் சகல அமைச்சுக்கள் தொடர்பாகப் பேச முடியாவிட்டாலும் முக்கியமான சில அமைச்சுக்கள் பற்றி நான் எனது கருத்துக்களை முன்வைக்க விரும்புகின்றேன். குறிப்பாக பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சின் விடயத்திலே நான் ஒருசில விடயங்களைக் குறிப்பிட வேண்டும்.

மத நல்லிணக்கத்தை இந்த நாடு பாதுகாக்க வேண்டும். மதங்களுக்கிடையிலே இருக்கக்கூடிய முரண்பாடுகள் தீர்க்கப்படாதவிடத்து ஓர் இன நல்லிணக்கம் உருவாகுவதென்பது மிகவும் கடினமானதாக இருக்கும். இன்று மதங்களுக்கிடையிலான முரண்பட்ட நிலைமைகள் அதிகரித்துச்செல்வதை நாங்கள் அவதானிக்கின்றோம். ஆனால், இலங்கையைப் பொறுத்தவரையில், இங்கு வாழும் சகல மத மக்களும் எல்லா மதப் போதனைகளையும் ஏற்றுக் கொள்கின்றார்கள்; அந்தப் போதனைகளைத் தங்களது வாழ்வில் இணைத்துக்கொண்டிருக்கின்றார்கள். ஆனால், மதங்களுக்குத் தலைமைதாங்குபவர்கள் - மதத் தலைவர்களாக இருப்பவர்கள் - சிலர் துரதிருஷ்டவசமாக மதங்களுக்கிடையில் புரிந்துணர்வற்ற ஒரு நிலைமையை உருவாக்குவதற்காக முயற்சித்துக் கொண்டிருக்கின்றார்கள். இந்த நிலைமை நீக்கப்பட வேண்டும். இன்று மக்கள் எல்லோரும் மதங்களை நேசிக்கின்றார்கள். ஒரு பௌத்தனாக இருந்தால் என்ன, ஒரு கிறிஸ்தவனாக இருந்தால் என்ன, ஓர் இந்துவாக இருந்தால் என்ன, ஓர் இஸ்லாமியனாக இருந்தால் என்ன, அவன் எல்லா மதங்களையும் நேசிக்கின்றான். ஆனால், இன்று அடிப்படை மதவாதம் பேசும் ஒருசிலர் மதங்களுக்கிடையே முரண்பாடுகளை ஏற்படுத்தும் விதமாகவும் வணக்கஸ் தலங்களை மதிக்காத விதத்திலும் செயற்பட்டுக் கொண்டிருப்பதனால் நிலைமை மேலும் மோசமாகின்றது. ஆகவே, மதத் தலைவர்கள் தங்கள் மதங்களை வளர்ப்பதிலும் மதம் சம்பந்தப்பட்ட நல்ல கருத்துக்களை மக்களிடம் கொண்டு செல்வதிலும்தான் அக்கறை செலுத்தவேண்டுமே தவிர, அரசியலில் மதத்தைக் கலப்பதையும் மதத் தலைவர்கள் அரசியலில் ஈடுபடுவதையும் தவிர்த்தல் வேண்டும்; மத அடிப்படைவாதம் பேசுவதையும் அவர்கள் நிறுத்திக்கொள்ள வேண்டும்.

அண்மையிலே நடந்த பல சம்பவங்களைப் பொறுத்தவரையில், மக்கள் தாங்கள் நேசிக்கும் மதத்துக்கெதிராகக் கட்டவிழ்த்துவிடப்படும் வன்முறைகளை வெறுக்கின்றார்கள்; கவலையடைந்திருக்கின்றார்கள். இந்த நிலைமையைப் போக்குவதற்கு நாங்கள் எல்லோரும் இணைந்து மதங்களுக்கிடையே முரண்பாடுகள் வராமல் பாதுகாக்க வேண்டும். அது அரசியல்வாதிகளின் மிகப் பெரிய கடமை என்பதை நான் இந்த அவையிலே குறிப்பிட விரும்புகின்றேன். அண்மையிலே முஸ்லிம் மக்களின் பல பள்ளிவாசல்கள் திட்டமிட்ட முறையில் தகர்க்கப்பட்டன. இதை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். அதுபோலவே இந்து ஆலயங்களும் திட்டமிட்ட முறையில் சிலரினால் அடித்து நொருக்கப்பட்டன. தம்புள்ளயில், அந்தப் பகுதியின் இந்து மக்கள் நேசிக்கும் ஒரு காளி கோயில் இரவோடிரவாகத் தரைமட்டமாக்கப்பட்டது. இந்த விடயங்கள் இன்று ஓர் ஆபத்தான நிலைமையை எட்டியுள்ளன. மதங்களுக்கிடையில் முரண்பாடுகளை ஏற்படுத்தினால் அது தேசிய நல்லிணக்கத்துக்கும் இன ஒற்றுமைக்கும் பாதகமான சூழலை விளைவிக்கும் என்பதை நான் இங்கு தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றேன். ஆகவே, மத அலுவல்களுக்குப் பொறுப்பான அமைச்சு மத நல்லிணக்கத்தைப் பேணுவதில் அதிக அக்கறை எடுத்துச் செயற்பட வேண்டும் என்பதை நான் இந்த அவையிலே வலியுறுத்துகின்றேன்.

அடுத்ததாக, சமூக சேவைகள் அமைச்சு தொடர்பான சில விடயங்களைக் குறிப்பிட விரும்புகின்றேன். வடக்கு, கிழக்கிலே குறிப்பாக யுத்தம் மிகவும் கொடிய வேதனைகளைத் தந்த வன்னி மாவட்டத்திலே ஆயிரக்கணக்கானவர்கள் அங்கவீனமுற்றார்கள்; ஆயிரக்கணக்கானோர் விதவைகளாக்கப்பட்டார்கள். யுத்தம் காரணமாக இன்று பெண்களைத் தலைமைத்துவமாகக்கொண்டு இயங்கும் குடும்பங்கள் வன்னி மாவட்டங்களின் விகிதாசாரத்திலே பாரிய செல்வாக்கைச் செலுத்துகின்றன. இன்று அவர்களுக்குப் பல்வேறு விதமான உதவித்திட்டங்கள் அவசரமாகத் தேவைப்படுகின்றன. அவர்களுடைய விடயங்கள் மட்டுமல்ல, வயோதிபர்களின் விடயங்களும் கவனிக்கப்பட வேண்டும். எங்களது கலாசார முறையின்படி வயதுமுதிர்ந்த பெற்றோரைப் பிள்ளைகள்தாம் பராமரிப்பார்கள். துரதிருஷ்டவசமாக இவ்வாறு பேணக்கூடிய நிலை இன்று அங்கில்லை. ஏனென்றால், பிள்ளைகளே தங்களது குடும்பங்களைப் பராமரிக்க முடியாத இக்கட்டான நிலைமையில் வறுமைக்கோட்டின்கீழ் இருக்கும்போது, வயதான பெற்றோரைப் பராமரிப்பதென்பது அவர்களுக்கு மிகவும் கடின பணியாகும். ஆகவே, வயோதிபர்கள்,

விதவைகள் மற்றும் மாற்றுத்திறனாளிகளுக்காக விசேட திட்டங்களைச் செயற்படுத்துவதற்குச் சமூக சேவைகள் அமைச்சு நடவடிக்கை எடுக்க வேண்டும். இதன்மூலம்தான் நல்லதொரு சமுதாயத்தைத் தோற்றுவிக்கலாம்; யுத்தத்தால் பாதிக்கப்பட்ட அந்த மக்கள் யுத்தக் கொடுமையிலிருந்து விடுபடுவதற்குரிய சூழலை உருவாக்கலாம். இதற்கான திட்டங்களை வகுப்பதற்கு இவ்வமைச்சு விசேட செயற்றிட்டங்களை நடைமுறைப்படுத்த வேண்டும். ஏனெனில், பொதுவான செயற்றிட்டத்துக்குள் இவர்களையும் உள்ளடக்கினால் பெரிய பிரச்சினைகளைத் தீர்க்க முடியாதுபோகும். ஆகவே, விசேட அடிப்படையில் இவர்களுக்குக் கரிசனை காட்டவேண்டுமென்று வலியுறுத்து கின்றேன்.

வன்னி மாவட்டங்களில் மேற்கொள்ளப்படும் வீட்டுத் திட்டத்தில் குறிப்பாக, இரண்டு அங்கத்தவர்களை அல்லது ஒருவரைக்கொண்ட குடும்பமாக இருந்தால், குறிப்பாக வயோதிபர்கள் அதற்குத் தகைமையுடையவர்களாக உள்வாங்கப்படுவதில்லை. ஆகவே, அவர்களுக்கும் நிரந்தரத் தீர்வு பெற்றுக்கொடுப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். ஏதோ ஒரு வகையில் அவர்களுக்கும் இருப்பிட ஏற்பாட்டைச் செய்துகொடுப்பதற்கான ஒரு வீட்டுத் திட்டத்தை மேற்கொள்வதற்குச் சமூக சேவைகள் அமைச்சுடன் இணைந்து செயற்பட ஏனைய அமைச்சுக்கள் முன்வர வேண்டும்.

தேசிய மரபுரிமைகள் அமைச்சு சம்பந்தமாகச் சில விடயங்களைக் குறிப்பிட வேண்டும். வடக்கு, கிழக்கிலே தமிழரின், தமிழ் மன்னர்களின் வரலாறுகளை ஆய்வுசெய்யும் நடவடிக்கைகளை ஆரம்பிக்க வேண்டும். தொல்பொருள் ஆய்வு விடயத்தை இனரீதியாகப் பார்க்கக்கூடாது. எந்தப் பிரதேசங்களில் என்னென்ன வரலாறுகள் கடந்த நூற்றாண்டு காலமாக இருந்திருக்கின்றனவோ, அத்தனை வரலாறுகளும் மறைக்கப்படாமல் வெளிக்கொணரப்படுவதற்குப் பாரபட்ச மற்ற முறையில் தொல்லியல் ஆய்வுகள் மேற்கொள்ளப்பட வேண்டும். குறிப்பாக நான் ஒரு விடயத்தைக் குறிப்பிடுகின்றேன். வன்னியிலே வெள்ளையரின் ஆட்சிக்கெதிராகப் போராடிய பண்டாரவன்னியன் என்ற ஒரு மகத்தான வீரரின் வரலாறு இன்று மறக்கடிக்கப்பட்டுக் கொண்டிருக்கின்றது. அவரின் காலத்திலிருந்த நினைவுச் சின்னங்களெல்லாம் யுத்தத்தினால் அழிவுற்றிருக்கின்றன. ஆகவே, பண்டாரவன்னியனின் வரலாறு மீள ஆய்வு செய்யப்பட்டு அது நிலைநாட்டப்பட வேண்டுமென்பதை வலியுறுத்துகின்றேன். அதேநேரத்தில், மிகவும் பாரம்பரியமிக்க பூநகரியிலே இருக்கும் ஒல்லாந்தர் கோட்டை யுத்தத்தினால் அழிவுற்ற நிலையில் காணப்படுகின்றது. அதை மறுசீரமைப்பதற்குரிய நடவடிக்கையை இந்த தேசிய மரபுரிமைகள் அமைச்சு மேற்கொள்ள வேண்டும்.

தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சு தொடர்பாகவும் இங்கு கூற வேண்டும். உண்மையிலேயே இந்த அமைச்சை வழிநடத்தும் கௌரவ அமைச்சர் வாசுதேவ நாணாயக்கார அவர்களைப் பாராட்ட விரும்புகின்றேன். அவர் துணிச்சலாகப் பல நடவடிக்கைகளை முன்னெடுத்திருக்கிறார். அரசியலமைப்பில் தேசிய மொழிகள் தொடர்பில் கொடுக்கப்பட்டிருக்கும் அதிகாரங்களை அவர் முறையாகச் செயற்படுத்த முனைகின்றார். இது அவரின் சொந்தக் கொள்கைத்திட்டம் அல்ல. என்றாலும், இதன்போது அவர் சந்திக்கும் சவால்களை நான் அறிவேன். அவரது நல்ல திட்டங்களை நடைமுறைப்படுத்துவதில் அவர் மிகுந்த சிக்கல்களையும் சவால்களையும் எதிர்கொள்கின்றார். பல்வேறு அமைச்சுக்கள்கூட அவருக்கு ஒத்துழைப்பதில்லை. ஆனால், அதை மறுப்பது என்பது அரசியலமைப்புக்கு எதிராகச் செயற்படுவதற்கு ஒப்பாகும். ஆகவே, அவர் முன்னெடுத்திருக்கும் மொழிக் கொள்கையை - அரசியலமைப்பினூடாக வழங்கப்பட்டுள்ள அந்த ஆணையைச் சிறந்த முறையில் செயற்படுத்துவதற்கு அனைவரும் ஒத்துழைக்க வேண்டும். அரசியலமைப்பின்படி, எந்தவொரு மொழியையேனும் தாய்மொழியாகக் கொண்ட ஒருவர், இலங்கையின் எப்பாகத்துக்குச் சென்றாலும், அதேமொழியில் கருமமாற்றக்கூடிய சூழல் உருவாக்கப்பட வேண்டியது மிக முக்கியமானது. LLRC அறிக்கையில்கூட இவ்விடயம் வலியுறுத்திக் கூறப்பட்டுள்ளது. எனவே, இதனை அமுல்படுத்துவதற்கு எல்லோரும் ஒத்துழைக்கவேண்டுமென நான் இங்கு வலியுறுத்துகின்றேன். இதற்கு ஒத்துழைக்க மறுப்பவர்கள் அரசியலமைப்புக்கு எதிராகச் செயற்படுகின்றார்கள் என்பதன் அடிப்படையில், அவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுப்பதற்கு கௌரவ அமைச்சர் அவர்கள் முன்வரவேண்டுமென நான் இவ்விடத்தில் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, அனர்த்த முகாமைத்துவ அமைச்சு தொடர்பாகவும் ஒரு சில விடயங்களைக் கூறவேண்டும். இன்று உலகிலே காலநிலை மாறிக்கொண்டிருக்கின்றது. மழை பெய்கின்ற பருவப்பெயர்ச்சிக் காலத்தில் மிகவும் வெப்பமான காலநிலை நிலவுகின்றது. அவ்வாறே, வரட்சியான காலத்தில் மழைவீழ்ச்சி அதிகமாக இருக்கின்றது. இதனால், எங்களுடைய எதிர்பார்ப்புக்களையும் மீறி, அனர்த்தங்கள் நடந்தேறிவிடுகின்றன. ஆகவே, இன்று உலக நாடுகள் அனைத்தும் இவ்வனர்த்தங்களுக்கு முகம்கொடுக்கும் வகையில், அதிகளவு நிதியை ஒதுக்கீடு செய்து, தயார் நிலையில் இருக்கவேண்டியதன் அவசியத்தை உணர்ந்துள்ளன. இதன் அடிப்படையில், இலங்கையிலும் இதற்கு அதிகளவு நிதியை ஒதுக்கீடு செய்து, அதனூடாக எந்நேரத்திலும் அனர்த்தங்களுக்கு முகம்கொடுப்பதற்கு அரசாங்கம் தயாராக இருக்கவேண்டும். கடந்த மூன்று ஆண்டுகளில் வன்னி மாவட்ட மக்கள் இயற்கையின் சீற்றத்தால் பல்வேறு பாதிப்புக்களைச் சந்தித்திருக்கின்றார்கள். அவர்கள் யுத்தப் பாதிப்புக்களிலிருந்து மீண்டுவந்தபோதிலும்கூட, இயற்கையும் அவர்களுக்கு ஆபத்துக்களையும் நெருக்கடிகளையும் ஏற்படுத்தும் வகையில் பல இன்னல்களைக் கொடுத்துள்ளது. இவர்களுடைய நிவாரண நடவடிக்கைகளுக்கு அனர்த்த முகாமைத்துவ அமைச்சானது கணிசமான உதவிகளைச் செய்திருக்கின்றது; நட்டஈடுகளை வழங்கியிருக்கின்றது. இதற்காக நான் அனர்த்த முகாமைத்துவ அமைச்சர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்வதோடு, எதிர்வரும் காலங்களிலும் இவ்வாறான அனர்த்தங்கள் ஏற்படும்போது எமது மக்களுக்கு உடனடியாகச் சேவைசெய்வதற்கு முன்வரவேண்டுமென்று கேட்டுக்கொள்கிறேன்.

அடுத்ததாக, இன்று மீள்குடியேற்றப் பிரதி அமைச்சர் அவர்கள் உரையாற்றும்போது மீள்குடியேற்றம் தொடர்பிலான பல்வேறு தரவுகளைக் குறிப்பிட்டார். யுத்தத்துக்குப் பின்னர் கணிசமான அளவு மக்கள் மீள்குடியேற்றப்பட்டுள்ளனர் என்ற விபரத்தை அவர் புள்ளிவிபர ரீதியாகக் குறிப்பிட்டார். உண்மையிலே மீள்குடியேற்ற நடவடிக்கைகள் எதிர்பார்த்ததைவிட, அல்லது விமர்சனங்களைவிட வேகமான முன்னேற்றத்தைக் கண்டிருக்கின்றது. எனினும், கௌரவ பிரதி அமைச்சர் அவர்களுடைய புள்ளிவிபரங்களின் அடிப்படையில் இன்னமும் கிட்டத்தட்ட 7,094 குடும்பங்களைச் சேர்ந்த 23,568 பேர் மீள்குடியேற்றப்படவேண்டி உள்ளனர். மீள்குடியேற்ற

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

நடவடிக்கைகளை அடுத்தாண்டுக்குள் நிறைவு செய்வதற்கான அனைத்து நடவடிக்கைகளையும் முன்னெடுத்திருப்பதாக கௌரவ பிரதி அமைச்சர் அவர்கள் குறிப்பிட்டார். நல்ல விடயம்! பாராட்டுகின்றேன். எனினும், யாழ்ப்பாணத்திலே அவருக்குச் சவால் இருக்கின்றது. அங்கே அவருடைய புள்ளிவிபரத்தின் பிரகாரம் 5,878 குடும்பங்களைச் சேர்ந்த 19,765 பேர் மீள்குடியேற்றப்படாமல் இருக்கின்றார்கள். இவர்களில் 95 வீதமானவர்கள் வலி. வடக்கைச் சேர்ந்தவர்கள். அவருடைய தரவுகளின்படி 1,228 குடும்பங்களைச் சேர்ந்த 4,410 பேர் 32 முகாம்களில் - நலன்புரி நிலையங்களில் மிகவும் அவலங்களுடன் வாழ்கின்றார்கள். ஆகவே, இவர்களையும் மீள்குடியேற்றம் செய்வதில்தான் மீள்குடியேற்றத்தின் வெற்றி இருக்கின்றது என்பதை நான் வலியுறுத்திக் கூற விரும்புகின்றேன். தொடர்ந்தும் இவர்கள் நலன்புரி நிலையங்களில் அவல வாழ்க்கை வாழ்ந்துகொண்டிருக்கும் நிலைமையானது, மீள்குடியேற்றத்தில் நீங்கள் ஏற்படுத்திய சாதனைகள் அனைத்தையும் முறியடித்துவிடும். ஆகவே, அரசாங்கமும் மீள்குடியேற்ற அமைச்சும் இவ்விடயம் தொடர்பாகப் பேசித் தீர்க்கமான ஒரு முடிவை எடுக்க வேண்டும். இவ்விடயம் பல அரசியல் தரப்பினராலும் தொடர்ந்தும் வலியுறுத்தப்பட்டு வருவதுடன் மட்டுமல்லாது சர்வதேசத்தின் கவனத்தையும் ஈர்த்திருக்கின்றது. ஆகவே, சர்வதேசத்தின் கரங்கள் எங்களை நோக்கிவராமல் பாதுகாப்பதற்காக இந்த மக்கள் மீள்குடியேற்றப்பட வேண்டியது அவசியம்.

வனசீவராசிகள், வளப் பேணுகை அமைச்சு தொடர்பாக மிக முக்கியமான ஒரு விடயத்தைக் குறிப்பிடவேண்டியுள்ளது. அண்மையில் யானைகளின் அட்டகாசம் விவசாயிகளுக்கு மிகப்பெரிய சவாலாக மாறியிருக்கிறது. நேற்றைய தினமும் ஓமந்தைப் பிரதேசத்திலுள்ள பல விவசாயக் காணிகளை யானைகள் அழித்திருக்கின்றன.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Hon. Member, please wind up now.

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் )
(The Hon. Murugesu Chandrakumar)
Sir, please give me one more minute.

யானைகளின் பாதிப்பிலிருந்து அவ்விவசாயிகளைப் பாதுகாப்பதற்கு வனசீவராசிகள், வளப் பேணுகை அமைச்சு உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். இந்த அமைச்சுக்குரிய எந்தச் செயற்றிட்டமும் வட பகுதியிலே இல்லை. நாங்கள் எத்தனையோ தடவைகள் இந்தப் பாராளுமன்றத்திலும் பல்வேறு சந்திப்புக்களிலும் இவ்விடயம் தொடர்பாக வலியுறுத்தியிருக்கிறோம். ஆயினும், யானைகளின் தொல்லை அதிகரித்து வருகிறதே தவிர, முடிவுறுவதாக இல்லை. அதேபோன்றுதான் அப்பிரதேசங்களில் குரங்குகளின் தொல்லையும் அதிகரித்துள்ளது. அப்பிரதேசங்களிலுள்ள மா, பலா, வாழை போன்ற நல்ல பழவகை மரங்களைப் பயிரிட்டிருக்கும் விவசாயிகள் குரங்குகளின் தொல்லைகளுக்கு உள்ளாகின்றார்கள். அதுமட்டுமல்ல, அவர்களுடைய குடியிருப்புக்களின் கூரை ஓடுகளையும் குரங்குகள் சிதைத்துக்கொண்டிருக்கின்றன. எனவே, இந்த அமைச்சானது, குறிப்பிட்ட விலங்குகளின் தொல்லைகளிலிருந்து மக்களைப் பாதுகாப்பதற்கு உரிய நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டு, சந்தர்ப்பம் தந்தமைக்கு மீண்டும் நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். வணக்கம்.

[பி.ப. 4.49]

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)
கௌரவ தவிசாளர் அவர்களே, இன்று தெரிவுக்குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட்ட பல்வேறு அமைச்சுக்களின் வரவு செலவுத் திட்ட நிதி ஒதுக்கீடுகள் தொடர்பான குழுநிலை விவாதம் இடம்பெற்றுக்கொண்டிருக்கிறது. இதில் ஒரு சில அமைச்சுக்களின் ஒதுக்கீடுகள் தொடர்பாக நானும் சில கருத்துக்களைத் கூறலாமென எண்ணுகின்றேன். முக்கியமாக good governance, infrastructure, resettlement போன்ற விடயங்கள் தொடர்பாக நான் சில கருத்துக்களைக் கூற விழைகின்றேன். இந்த நாட்டில் நல்லாட்சி நடைபெறுகின்றதென நாங்கள் எதன் அடிப்படையில் குறிப்பிடமுடியும்? ஏனென்றால், இன்று இலங்கையில் நடைபெறுகின்ற பல விடயங்கள் தொடர்பாக உலக நாடுகள் ஆலோசனை சொல்கின்ற ஒரு நிலைமை இருக்கின்றது. அதாவது, இலங்கையில் மனித உரிமைகள் பாதுகாக்கப்படவேண்டும்; சுதந்திரமான நீதித்துறை இருக்க வேண்டும்; சுதந்திரமான தேர்தல் Commission இருக்க வேண்டுமென்று அவை கூறுகின்றன. இலங்கையில் Public Service Commission, National Police Commission போன்றவை இன்று மேதகு ஜனாதிபதி அவர்களின் நேரடிக் கண்காணிப்பின்கீழ் அவரால் உருவாக்கப்பட்டுள்ள ஆணைக்குழுக்களாக விளங்குகின்றன. இத்தகையதொரு சூழ்நிலையில் இலங்கையில் எவ்வளவுதூரம் ஒரு நல்லாட்சி நடைபெறலாம்? இலங்கையில் பொலிஸ்துறை, நீதித்துறை, தேர்தல் ஆணையகம் ஆகிய அனைத்துத் துறைகளும் அரசியல்மயப்படுத்தப்பட்டு மேதகு ஜனாதிபதி அவர்களின் நேரடிக் கட்டுப்பாட்டுக்குள் இருக்கின்ற சூழ்நிலையில் நாங்கள் நல்லாட்சி பற்றிப் பேசுவது சரியாக இருக்காது.

அதுமாத்திரமல்ல, இலங்கையிடம் யப்பான், கனடா, ஐக்கிய இராச்சியம், இந்தியா ஆகிய நாடுகள் குறிப்பாக 2-3 விடயங்களை மீண்டும் மீண்டும் கோரி வருகின்றன. அதாவது, இங்கு மனித உரிமைகள் பேணப்பட வேண்டும்; யுத்த காலத்தில் காணாமற்போனவர்களும் இராணுவத்திடம் சரணடைந்தவர்களும் எங்கு இருக்கிறார்கள் என்பது கண்டுபிடிக்கப்பட வேண்டும்; இவர்களுக்கு என்ன நடந்தது என்பது பற்றி அவர்களுடைய உற்றார் உறவினர்களுக்குத் தெரிவிக்கப்பட வேண்டும். இவை யாவும் மூடி மறைக்கப்படவேண்டிய விடயங்களல்ல என உலக நாடுகள் மீண்டும் மீண்டும் தெரிவித்துள்ளன. அதேபோல, பல இடங்களில் - அது கொழும்பாக இருக்கலாம்; யாழ்ப்பாணமாக இருக்கலாம்; மட்டக்களப்பாக இருக்கலாம் - வெள்ளை வான்களில் வந்தவர்களால் பல நூற்றுக்கணக்கானோர் அநியாயமாகச் சுட்டுக்கொல்லப்பட்டார்கள்; அவர்களுடைய இருப்பிடங்கள் இருந்த இடம் தெரியாதவாறு அழிக்கப்பட்டிருக்கின்றன. அவர்கள் தொடர்பாக என்ன விதமான ஆய்வுகள் மேற்கொள்ளப்பட்டன? என்ற கேள்விக்குக்கூட இதுவரை பதில் இல்லை. இந்தச் சூழ்நிலையில் எவ்வாறு நாங்கள் நல்லாட்சி பற்றி இங்கு பேச முடியும்? என்பதைத் தயவுசெய்து சிந்தித்துப் பார்க்க வேண்டும்.

யாழ்ப்பாணத்தை எடுத்துக்கொள்ளுங்கள்! அங்கு மாகாண சபைத் தேர்தல் நடைபெற்றது. யுத்தம் முடிவடைந்து 4 வருடத்திற்கு பின்பு நடைபெற்ற அத்தேர்தலில் 83 சதவீதமான தமிழ் மக்கள் தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கு வாக்களித்தார்கள். தமிழ்த் தேசியக் கூட்டமைப்பு 30 ஆசனங்களை வென்றது. அங்கு ஒரு மாகாண அரசு உருவாக்கப்பட்டது. ஆனால், இன்றுவரை அந்த மாகாண முதலமைச்சரால் தனது Chief Secretary யினை மாற்ற முடியவில்லை; அந்த நிலைமைகூட அங்கில்லை. Chief Secretary ஒருவரை நியமிப்பதாக இருந்தால், 13ஆவது திருத்தச் சட்டத்தின்படி அவர் முதலமைச்சருடைய அங்கீகாரத்துடன்தான் நியமிக்கப்பட வேண்டும். தேர்தல் முடிந்து 3 மாதமாகியும் அவ்வாறான ஒரு சூழல் அங்கில்லையென்றால், எவ்வாறு நாங்கள் நல்லாட்சியைப் பற்றிப் பேச முடியும்? அதுமாத்திரமல்ல, ஒரு மாகாணத்துக்கு Deputy Inspector-General ஒருவரை நியமிக்கும்பொழுதுகூட மாகாண முதலமைச்சருடைய அங்கீகாரத்துடன்தான் - with the concurrence of the Chief Minister - நியமிக்கப்பட வேண்டும். இப்பொழுது வடக்கு மாகாணத்தில் நியமிக்கப்பட்டிருக்கின்ற DIG அவ்வாறு நியமிக்கப்படவில்லை. ஜனாதிபதியாக இருக்கலாம், IGP ஆக இருக்கலாம், முதலமைச்சரின் எந்தவிதமான அங்கீகாரமுமின்றியே அவரை நியமித்திருக்கிறார்கள். நாங்கள் அவருக்கு எதிரானவர்கள் அல்லர். அவர் நியமிக்கப்பட்ட முறையைத்தான் பிழை என்கிறோம். இலங்கையின் அரசியல் சாசனத்திற்கு முரணாக - அரசியல் சட்டங்களுக்கு முரணாக எவ்வளவுதூரம் இந்த அரசாங்கம் செயற்படுகின்றது என்பதைத் தயவுசெய்து சிந்தித்துப் பார்க்க வேண்டும். அவ்வாறான நிலைமைகள் இருக்கின்ற பட்சத்தில் நாங்கள் எவ்வாறு நல்லாட்சியைப் பற்றிப் பேச முடியும்? என்பதை இங்கிருக்கின்ற அமைச்சர்கள் தயவுசெய்து புரிந்துகொள்ள வேண்டும்.

அண்மையில் கௌரவ சபாநாயகர் அவர்கள், யாரும் நேரடியாகவே இங்கு வந்து பாராளுமன்ற அமர்வுகளைப் பார்த்துச் செல்ல முடியுமென்றும் அமர்வுகளைப் பார்ப்பதற்கு பாராளுமன்ற உறுப்பினர்கள்மூலம் permission எடுக்கவேண்டிய தேவை இல்லையென்றும் கூறினார். ஆனால், யாழ்ப்பாணத்தில் வலிகாமம் வடக்கிலுள்ள காங்கேசன்துறை, பலாலி போன்ற பிரதேசங்களைப் பாராளுமன்ற உறுப்பினராகிய நான் சென்று பார்க்க முடியாது. எனக்கு அதற்கான அனுமதி இல்லை. அந்த மாவட்டப் பாராளுமன்ற உறுப்பினராகிய எனக்கு அந்த அதிகாரம் கிடையாது. நான் அங்கு சென்றால் இராணுவத்தினரால் தடைசெய்யப்படுவேன். அங்கு என்னென்ன விடயங்கள் நடைபெறுகின்றன என்பதைக்கூட என்னால் சென்று பார்க்க முடியாது. எனக்கு மாத்திரமல்ல, தமிழ்த் தேசியக் கூட்டமைப்பைச் சேர்ந்த எந்தப் பாராளுமன்ற உறுப்பினருக்கும் அவ்வாறு அங்கு சென்று பார்க்க முடியாத நிலைமையுள்ளது. அண்மையில் வலிகாமம் வடக்கிலுள்ள பாடசாலைகள், கோவில்கள், கட்டிடங்கள், வீடுகள் எல்லாம் இடித்தழிக்கப்பட்டன என்பது உங்களுக்குத் தெரியும். அப்பொழுது அதைப் பார்ப்பதற்குச் சென்ற முதலமைச்சர்கூட திருப்பியனுப்பப்பட்டார். அவரால்கூட அங்கு சென்று அதனைப் பார்க்க முடியவில்லை. பயங்கரவாதம் தலைவிரித்தாடுகின்றது என்று சொன்னவர்கள் இன்று அவை எல்லாம் நீங்கிவிட்டன என்று சொல்கின்றனர். ஆகவே, யாரும் எந்தவிதமான சோதனையுமின்றிப் பாராளுமன்றத்துக்கு வந்து 'கலரி'யில் அமர்ந்து அமர்வின் நிகழ்வுகளைப் பார்த்துவிட்டுப் போகலாம் என்று சபாநாயகர் அறிவித்திருக்கிறார். இப்படியான சூழ்நிலையில், எமது பிரதேசத்தை - எமது சொந்த மண்ணை - இராணுவம் இருக்கின்ற அந்தப் பிரதேசத்தை நாங்கள் போய்ப் பார்ப்பதற்குத் தடைவிதிப்பதாக இருந்தால், இங்கே எவ்விதமான நல்லாட்சி நடைபெறுகின்றது? என்பது பற்றித் தயவுசெய்து சிந்தித்துப் பாருங்கள்!

இந்த யுத்தத்தில் எமது மக்கள் எல்லாவற்றையும் இழந்தார்கள் என்பது உங்கள் எல்லோருக்கும் தெரியும். இருந்தாலும், வன்னியில் தப்பி நின்ற தமது சொந்த ஆடு, மாடுகளை இன்று அவர்களால் மீட்க முடியாதுள்ளது. ஏனென்றால், அது இராணுவக் கட்டுப்பாட்டுப் பிரதேசம். ஆனால், இராணுவத்தினர் அங்கு அந்த ஆடு, மாடுகளை வைத்திருக்கின்றார்கள். வலிகாமம் வடக்குப் பிரதேசத்தில் இரண்டாயிரத்துக்கும் மேற்பட்ட மாடுகள் இருக்கின்றன. அந்த மாடுகளைப் போய்ப் பார்க்க, மீட்டுக்கொண்டு வரமுடியாத ஒரு சூழ்நிலையில் அந்த மக்கள் இருக்கின்றார்கள். இவற்றைக்கூட நாங்கள் அந்த மக்களுக்காகச் செய்துகொடுக்க முடியாத சூழ்நிலையில் இருக்கிறோமென்றால், நல்லாட்சி தொடர்பாக அரசு என்ன விடயங்களை மேற்கொள்கின்றது? என்பது பற்றி நீங்கள் தயவுசெய்து சிந்தித்துப் பாருங்கள்!

கௌரவ தவிசாளர் அவர்களே, மீள்குடியேற்றப் பிரதி அமைச்சர் அவர்கள் இப்பொழுது இங்கிருக்கின்றார். மீள்குடியேற்றம் பற்றி ஜனாதிபதி அவர்களாலும் அமைச்சர்களாலும் வெளிநாடுகளுக்குப் பிரசாரப்படுத்தப்படுகின்றது. அதாவது, "மீள்குடியேற்றம் என்பது முடிவடைந்துவிட்டது; இங்கு எந்த முகாம்களும் கிடையாது" என்ற விடயம் உலகம் பூராவும் சொல்லப்படுகின்றது. ஆனால், கௌரவ சந்திரகுமார் அவர்கள் இன்று உரையாற்றியபோது பல உண்மைகளைப் பேசியிருக்கின்றார். "இன்று யாழ்ப்பாணத்தில் 32 முகாம்களில் மீளக் குடியேறாத மக்கள் இருக்கின்றார்கள்" என்று கூறினார். "இன்று அமைச்சருக்கு ஒரு சவால் காத்திருக்கின்றது!" என்றும் அவர் சொன்னார். இந்த அரசாங்கம் செய்ய வேண்டிய சில காரியங்களை முதன்முறையாக எடுத்துரைத்திருக்கின்றார்; இன்று அவர் சற்றுச் சுதந்திரமாகப் பேச முற்பட்டிருக்கின்றார். எனவே, அவரை நான் இச்சந்தர்ப்பத்தில் பாராட்ட வேண்டும். இன்று வலிகாமம் வடக்கில் 6,500 ஏக்கர் நிலப்பரப்பு இராணுவக் கட்டுப்பாட்டில் இருக்கின்றது. ஆனால், அது பொதுமக்களுக்குச் சொந்தமான மண். இந்த மக்களை மீளக் குடியேற்றுகின்ற விடயம் என்பதுதான் அந்தச் சவால். நான் அறிகின்ற வரையில் வலிகாமம் வடக்கில் இருக்கின்ற மக்கள் ஏறத்தாழ 35 ஆயிரம் பேர் அங்கு மீளக் குடியேற வேண்டியிருக்கின்றது. அந்த மக்கள் மீளக் குடியேற வேண்டுமாக இருந்தால், அந்த நிலங்கள் விடுவிக்கப்பட வேண்டும். ஆனால், இன்று அங்கு வீடுகள், கோயில்கள், பாடசாலைகள் யாவுமே அநியாயமாக உடைக்கப்படுகின்றன. அப்படியாயின், அந்த மீள்குடியேற்றம் எவ்வாறு நடக்க முடியும் என்று யோசித்துப் பாருங்கள்!

மயிலிட்டியில் மிகவும் நல்லதொரு மீன்பிடி இறங்குதுறை இருக்கின்றது. சீனாவுக்கோ, ஜப்பானுக்கோ, தாய்லாந்துக்கோ அங்கு மீன்பிடிப்பதற்கு 'லைசன்ஸ்' கொடுக்கப்படவிருப்பதாகவும் அதன்மூலம் அவர்கள் அந்தத் துறைமுகத்திலிருந்து வெளிநாடுகளுக்கு மீனை ஏற்றுமதி செய்யலாம் என்றும் இப்பொழுது பேசப்படுகின்றது. ஆனால், அங்குள்ள மீனவர்கள் இன்னும் வெவ்வேறு இடங்களில் தங்கியிருக்கின்றார்கள்; தமது சொந்தக் கடற்பரப்பிலேயே மீன்பிடிக்க முடியாத துர்ப்பாக்கிய சூழ்நிலையில் இருக்கின்றார்கள். ஆகவே, எவ்வளவு மோசமான ஒரு சூழ்நிலையில் தமிழ் மக்கள் வைக்கப்பட்டிருக்கின்றார்கள் என்பதைப் புரிந்துகொள்ளுங்கள்!

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Hon. Member, you have one more minute.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)
Okay, Sir.

ஆகவே, இந்த விடயங்களையும் நீங்கள் கவனத்தில் எடுக்க வேண்டும். இறுதியாக நான் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, யாழ்ப்பாணத்தில் old park - பழைய பூங்கா என்று ஓர் இடம் இருக்கின்றது. அங்கு நூற்றுக்கணக்கான வருஷங்கள் பழமைவாய்ந்த மரங்கள் இருந்தன. ஆனால், இன்று வட மாகாண ஆளுநர் அந்தப் பூங்காவிலுள்ள மரங்களை இல்லாமல் செய்து அவருக்கு அங்கு ஒரு மாளிகை கட்டியிருக்கின்றார். அங்கிருக்கின்ற GA அவர்களுக்கும் ஒரு மாளிகை கட்டப்பட்டுள்ளது. இன்று நீங்கள் மரபுரிமைகள் பற்றிப் பேசுகின்றீர்கள், பூங்காக்கள் பற்றிப் பேசுகின்றீர்கள். ஆனால், யாழ்ப்பாண நகரத்தில் பச்சை நிறத்திலிருந்த ஒரேயொரு இடமான அந்தப் பூங்கா இன்று மிக மோசமாகக் காட்சியளிக்கின்றது. அதாவது, அந்த இடம் இன்று ஒரு concrete jungle ஆக - மாளிகைகள் கட்டப்படுகின்ற ஓர் இடமாக மாற்றப்பட்டிருக்கின்றது.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Chairman -

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Yes, Hon. Azwer?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
இந்த உறுப்பினர் அந்த பகுதிக்கு - யாழ்ப்பாணத்துக்கே செல்லவில்லை. There is a very beautiful park the Governor has created by the side of his residence. It is a very beautiful park. It proves that this Hon. Member has never gone to Jaffna. அங்கே அவர் ஒரு நாளும் போகவில்லை. He is misleading the House.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)
அவ்வாறு பூங்காக்களைத் துஷ்பிரயோகம் செய்யக்கூடிய ஓர் ஆளுநரைத்தான் அங்கு தொடர்ந்தும் வைத்திருக்கின்றார்கள். நான் இறுதியாக ஒன்று கூற வேண்டும். அதாவது, போதைவஸ்து இன்று கொழும்பில் மாத்திரமல்ல, எந்தக் காலத்திலும் இல்லாத வகையில் யாழ்ப்பாணத்துக்குக்கூட அனுப்பப்படுகின்றது.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Hon. Member, please wind up now.

**ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මහතා**
(மாண்புமிகு சுரேஷ் பிரேமச்சந்திரன்)
(The Hon. Suresh Premachandran)
Sir, I am finishing up.

அங்கு ஓர் இலட்சத்து ஐம்பதாயிரம் இராணுவம், புலனாய்வுப் பிரிவினர் மற்றும் பொலிஸார் என்று பல்வேறுபட்ட பாதுகாப்புத் தரப்பினர் இருந்தும்கூட, இந்தப் போதைவஸ்துகள் வருகின்றன என்றால் நிச்சயமாக அதற்கு ஓர் அரசியல் பின்னணி இருக்க வேண்டும். எனவே, அந்த நிலைமையை மாற்றியமைக்க வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[5.02 p.m.]

**ගරු බශීර් සෙගු ඩාවුඩ් මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பசீர் சேகு தாவூத் - உற்பத்தித்திறன் ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Basheer Segu Dawood - Minister of Productivity Promotion)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Chairman, the Ministry of Productivity Promotion is a new Ministry established in 2010. I am proud to be the Minister of Productivity Promotion because only Sri Lanka has a separate Cabinet Ministry for productivity promotion. So, I take this opportunity to thank His Excellency the President for affording me the chance to serve the nation as a Minister of his Cabinet and also to thank him for appointing Dr. (Mrs.) Damitha de Zoysa as Secretary to my Ministry, an able administrator who knows the subject assigned to my Ministry.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Order, please! The Hon. Janaka Bandara will now take the Chair.

*අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* ගරු ජානක බණ්ඩාරමහතා *මූලාසනාරූඪ විය.*

*அதன் பிறகு,* பிரதிச் சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு ஜானக பண்டார அவர்கள் *தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, you may carry on.

**ගරු බශීර් සෙගු ඩාවුඩ් මහතා**
(மாண்புமிகு பசீர் சேகு தாவூத்)
(The Hon. Basheer Segu Dawood)
Sir, I am confident that I can discharge my duties to the satisfaction of the people.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய நிகழும் பத்தாண்டு கால அபிவிருத்தியின் பிரதான இலக்கு, இந்த நாட்டின் உற்பத்தித்திறனை 5 - 6 வீதமாக உயர்த்துவதாகும். மேதகு ஜனாதிபதி அவர்களுடைய இந்த இலக்கை அடைவதற்கான வழிமுறைகளில் எமது அமைச்சானது மிகவும் மும்முரமாகச் செயற்பட்டு வருகின்றது. இப்புதிய அமைச்சானது 2010ஆம் ஆண்டு உருவாக்கப்பட்டபோதிலும், 2013ஆம் ஆண்டு ஜனவரி மாதம் இரண்டு அமைச்சுக்களாகப் பிரிக்கப்பட்டு, அதில் உற்பத்தித்திறன் ஊக்குவிப்பு அமைச்சை நான் பொறுப்பேற்றேன். கடந்த ஜனவரி மாதம் 28ஆம் திகதியளவில் இவ்வமைச்சை இடமாற்றுவதற்கு ஒரு குறிப்பிட்ட காலம் தேவைப்பட்டது. அதன் பின்னர், நாங்கள் இவ்வமைச்சிலே சுமார் 9 - 10 மாத காலம்தான் இயங்கியிருக்கின்றோம். இவ்வமைச்சுக்கு நானும் புதியவன். Our Secretary is also new to the Ministry. இருப்பினும், மேதகு ஜனாதிபதி அவர்களுடைய இலக்கின் அடிப்படையில், 2020ஆம் ஆண்டு GDPயை 60 பில்லியனிலிருந்து 120 பில்லியனாக அதிகரிப்பதற்காகவும் unemployment - வேலைவாய்ப்பின்மையை 4 வீதத்திலிருந்து 3 வீதமாகக் குறைப்பதற்காகவும் poverty headcount ratioஐ 6 வீதத்திலிருந்து 2 வீதமாகக் குறைப்பதற்காகவும் labour productivityஐ 2.9 வீதத்திலிருந்து 9.25 வீதமாக அதிகரிப்பதற்காகவும் நாங்கள் இவ்வமைச்சினூடாக மிக மும்முரமாக இயங்கிக் கொண்டிருக்கின்றோம்.

2015ஆம் ஆண்டளவில் இலங்கையை "Poverty Free Sri Lanka'' என்னும் நிலைக்கு உயர்த்துவதற்காக எமது செயற்பாடுகள் விஸ்தரிக்கப்பட்டிருக்கின்றன. Poverty free என்று சொல்லும்பொழுது, வறுமையற்ற ஓர் இலங்கையை உருவாக்குகின்ற முயற்சியில் நாங்கள் அனைவரும் அரசியல் கலப்படமற்ற தன்மையுடன் செயற்படவேண்டியது மிக முக்கியமானது. இந்த நோக்கத்தின் அடிப்படையில்தான் இவ்வமைச்சு உருவாக்கப்பட்டுள்ளது. எனவே, இந்த இலக்கை அடைவதற்காக நாங்கள் மும்முரமாகச் செயற்பட்டுக்கொண்டிருக்கின்றோம். இவ்வமைச்சானது உற்பத்தித்திறனை ஊக்குவிப்பதற்காக இடைக்கால உபாயத்திட்டம் ஒன்றை வகுத்துச் செயற்படுகின்றது. 2013-2016 வரையான காலப்பகுதிக்குள் என்னென்ன செயற்பாடுகளைச் செய்யவேண்டும் என்பதில் இவ்வமைச்சானது திட்டங்களை வகுத்துச் செயற்பட்டுக் கொண்டிருக்கின்றது. அரச துறையிலும் தனியார் துறையிலும் உற்பத்தித்திறனை அதிகரிப்பதென்றும் தேசிய மனித வளம் மற்றும் வேலைவாய்ப்புக் கொள்கையை நடைமுறைப்படுத்துவ தென்றும் development of competitive, skilled and flexible Sri Lankan workforce என்னும் நடவடிக்கையைத் துரிதமாக மேற்கொள்வதென்றும் நாங்கள் முடிவெடுத்துள்ளோம்.

உண்மையிலே, நாங்கள் எமது அபிவிருத்தி இலக்கை அடைவதாக இருந்தால், எமது நாட்டிலுள்ள மனித வளத்தைச் சரியாகப் பயன்படுத்த வேண்டும். மனித வளம் மிகவும் முக்கியமானது. உலகத்திலே நெருப்பு கண்டுபிடிக்கப்பட்டதன் பின்னர் மிக முக்கிய கண்டுபிடிப்பு நிகழ்ந்ததென்றால், அது மனித வளம் பற்றிய கண்டுபிடிப்புத்தான். அந்த மனித வளம் இல்லையென்றால் இந்த உலகத்திலே என்னதான் கருவிகள் கண்டுபிடிக்கப்பட்டாலும் அந்தக் கருவிகளால் எந்தவித பயனும் இல்லை; வளர்ச்சியும் இல்லை; அபிவிருத்தியும் இல்லை. எனவே, மனித வளத்தைச் சரியான முறையில் பயன்படுத்துவதற்குச் சரியான skilled தேவை. இதனை உரிய முறையில் வழங்கவேண்டிய பாரிய பொறுப்புடன் எமது அமைச்சு செயற்பட்டுக்கொண்டிருக்கின்றது. உதாரணமாக இந்தப் பாராளுமன்றக் கட்டிடத்தை எடுத்துக்கொண்டால், இங்கு மனித உழைப்பு - மனித வளம் இல்லையெனில், இக்கட்டிடத்தில் இருக்கின்ற செங்கற்களும் உபகரணங்களும் மரத்துண்டுகளும்தான் எஞ்சியிருக்கும். ஆகவே, இவற்றுடன் மனித வளமும் இணைந்தால்தான் இதனுடைய உற்பத்தியும் உற்பத்தித்திறனும் அதிகரித்து, அதன்மூலம் நாட்டை அபிவிருத்தி செய்யமுடியும். எனவே, அந்த வகையிலே இந்த அமைச்சின் செயலாளர் அவர்களும் நானும் உத்தியோகத்தர்களும் ஜனாதிபதி செயலகத்தில் இயங்குகின்ற உற்பத்தித்திறனுக்கான பிரிவும் மேதகு ஜனாதிபதி அவர்களுடைய guidance - வழிகாட்டலின் அடிப்படையில் செயற்பட்டு வருகின்றோம் என்பதையும் இங்கு குறிப்பிட விரும்புகின்றேன்.

அதேபோன்று 2013ஆம் ஆண்டிலே இந்த அமைச்சு சிறப்பாகச் செயற்பட்டுள்ளது என்பதை இச்சந்தர்ப்பத்தில் நான் குறிப்பிட்டுக்காட்ட வேண்டும். இது உற்பத்தித்திறன் தொடர்பான ஒரு புதிய அமைச்சு என்பதாலும் பொருளாதாரம் சம்பந்தப்பட்ட விடயம் என்பது முக்கியமாகப் பொருளாதார அபிவிருத்தி சம்பந்தமாக எதிர்கால இலக்குகளை நிர்ணயித்துச் செயற்படுகின்ற விடயவிதானம் என்பதாலும், சாதாரண மக்களுக்கு உற்பத்தித்திறன் பற்றிய விளக்கம் சரியான முறையில் சென்றடையவில்லை என்ற கவலை இந்த அமைச்சுக்கும் மேதகு ஜனாதிபதி அவர்களுக்கும் இருக்கிறது. எனவே, அந்தக் கவலையைப் போக்கவேண்டியது மிக முக்கியமானது. சாதாரண மக்களுக்கு உற்பத்தித்திறன் பற்றிய விடயங்களைச் சரியான முறையில் awareness - விளங்கப்படுத்துவதற்காக நாங்கள் **'சப்பலை'** என்ற பெயரிலே news bulletin ஒன்றை வெளியிட்டிருக்கின்றோம். அது ஒரு பெரிய சாதனை என நினைக்கின்றேன்.

அதேபோன்று 2013-2016 வரையான இடைக்கால உபாயச் செயற்றிட்டத்தைத் தயாரித்திருக்கின்றோம். மிக முக்கியமாக graduate trainees - பட்டதாரிப் பயிலுனர்களிலிருந்து தேர்ந்தெடுக்கப்பட்ட 542 பேருக்கு Productivity Development Officers என்ற பெயரில் நியமனம் வழங்கப்பட்டிருக்கிறது. எந்தத் திணைக்களமும் செய்திராத வகையிலே எங்களுடைய அமைச்சிலுள்ள National Productivity Secretariat எனப்படும் தேசிய உற்பத்தித்திறன் செயலகம் இந்த நடவடிக்கையை மேற்கொண்டுள்ளது. இந்தச் செயலகத்துக்குள் 542 பட்டதாரிகளை உள்ளீர்த்து ஒவ்வொரு பிரதேச செயலகப் பிரிவிலும் இருவர் என்ற அடிப்படையிலும் அனைத்துக் கச்சேரிகளிலும் ஆகக்குறைந்தது 4 பேர் என்ற அடிப்படையில் நியமித்து, அவர்கள் மூலமாக மக்களுக்கு உற்பத்தித்திறன் பற்றி விளக்கமளிப்பதன்மூலம் அபிவிருத்திப் பணியிலே அவர்களை முறையாக ஈடுபடுத்தும் வேலைத்திட்டத்திலும் வெற்றிகரமாக நாங்கள் செயற்பட்டுவருகிறோம் என்ற செய்தியையும் இச்சபையிலே தெரிவிப்பதில் நான் மகிழ்ச்சியடைகின்றேன்.

அத்துடன், சிரேஷ்ட அமைச்சர்களின் செயலகத்துடன் இணைந்து தேசிய மனித வளங்கள் மற்றும் வேலைவாய்ப்புக் கொள்கை - National Human Resources and Employment Policy - NHREP - யின் master plan தயாரிக்கப்பட்டுள்ளது என்பதையும் உற்பத்தித்திறனை அதிகரிப்பதற்கான steering committee ஒன்றை அமைச்சு உருவாக்கியுள்ளது என்ற நற்செய்தியையும் தெரிவிக்க விரும்புகின்றேன்.

மேலும், உற்பத்தித்திறன் award ceremony நடத்தப்பட்டுள்ளது. அதைவிட National Quality Circle Convention held in June 2013, APO Knowledge

[ගරු බෂීර් සෙගු ඩාවුඩ් මහතා]

Management and Social Innovation and Training Programme held in 2013, APO Training Course on Knowledge Management and Innovation in public sector organizations held in December 2013. அத்துடன், strengthening the internal audit system, continuous auditing confirmed with Treasury guidelines.

அடுத்ததாக, first GNH Survey - Gross National Happiness Survey - in Sri Lanka was conducted. இது மிக முக்கியமான ஒரு விடயம். நாங்கள் Gross National Happiness Survey மூலம் எமது நாட்டு மக்கள் பரிபூரண சந்தோஷமாக இருப்பதாகத் தெரிவித்திருக்கிறார்கள். இதனை, இந்தச் சபையிலே Budget விவாதத்தின்பொழுது எதிர்க்கட்சி உறுப்பினர்கள் "எமது மக்கள் மிக மோசமான நிலையில் இருக்கிறார்கள்" எனத் தெரிவித்த குற்றச்சாட்டுக்குப் பதிலாகக் கூறி, எமது அமைச்சு செய்த Survey யை நான் அவர்களுக்குச் சமர்ப்பணம் செய்கின்றேன். அதுமாத்திரமல்ல, யுத்தம் முடிவடைந்த பின்னர் எமது மக்கள் மகிழ்ச்சியாக இருக்கிறார்கள் என்ற செய்தியை இந்த அமைச்சின் மூலமாகத் தெரிவித்ததையிட்டு நான் மகிழ்ச்சியடைவதுடன், இதற்காக மேதகு ஜனாதிபதி அவர்களுக்கு எனது நன்றியையும் தெரிவித்துக்கொள்கிறேன்.

Sir, finally, I will take this opportunity to thank my Secretary and the other staff of the Ministry.

Thank you very much.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු දුනේෂ් හර්ෂ ගන්කන්ද මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.14]

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය විශේෂ කාරක සභාවට යොමු කළ අමාත්‍යාංශ කිහිපයක් පිළිබඳව, මට ලැබී තිබෙන සීමිත කාලය තුළ අවධානය යොමු කරන්න මා බලාපොරොත්තු වනවා. රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මැණික් පතල් කර්මාන්තය ආශ්‍රිත ගැටලු කිහිපයක් ගැන මෙම ගරු සභාවේ අවධානය යොමු කිරීම මගේ යුතුකමක් හැටියට මා මේ අවස්ථාවේ සලකනවා.

සාම්ප්‍රදායික පතල් කර්මාන්තයේ රඳා පැවැත්ම මුළුමනින්ම තීරණය වන්නේ පතල් කම්කරුවන්ගේ කැපවීම මතයි. රටට විශාල විදේශ විනිමයක් උපයන්න දායක වන පතල් කම්කරුවා ගැන ප්‍රමාණවත් අවධානයක් මේ දක්වා යොමු වෙලා නැහැ. ඒ නිසා ඇඟේ පතේ සවිය තිබෙන තාක් කල් වැඩ කරන්න පුළුවන් වුණත් වයස්ගත කාලයේදී පතල් කම්කරුවන්ට ජීවත් වෙන්න ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන අවස්ථා බොහොමයි. ඒ නිසා ලක්ෂයකට වැඩි පිරිසක් සිටින අපේ රටේ පතල් කම්කරුවන් වෙනුවෙන් දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දිය යුතු යැයි මා මේ ගරු සභාවට යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැහෙන කාලයක් රත්නපුර හිදැල්ලන තිබුණු මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය දැනට මාසයකට කලින් මාලබේට ගෙන ගොස් තිබෙනවා. මට ලැබිලා තිබෙන තොරතුරු අනුව, රත්නපුරයේදී තට්ටු තුනක ගොඩනැගිල්ලකට මාසයකට රුපියල් ලක්ෂයක් කුලිය වශයෙන් ගෙවා තිබෙනවා. නමුත් අද මාසයකට මේ ආයතනයේ කුලිය රුපියල් ලක්ෂ හතයි. ඒ අනුව ගොඩනැඟිල්ලේ කුලිය වශයෙන් අවුරුද්දකට රුපියල් ලක්ෂ හැත්තෑ දෙකක් වැඩිපුර ගෙවනවා. මැණික් කර්මාන්තයේ හදවත රත්නපුරයයි. ඒ නිසා මේ ආයතනය තිබෙන්න ඕනෑ රත්නපුරයේයි. නමුත් රත්නපුරයේ තිබිය යුතු ආයතන මාලබේට ගෙනැල්ලා මේ විධියට මහජන මුදල් කාබාසිනියා කරන්නේ කාගේ උවමනාවට ද කියලා අපි අහනවා. මේ ආයතනයේ සේවකයෝ වැඩි පිරිසක් රත්නපුරයේ සහ ඒ අවට ප්‍රදේශවල පදිංචි අයයි. නමුත් අද මේ සියලු දෙනාට රැකියාව සඳහා දිනපතා මාලබේට එන්න සිදු වෙලා තිබෙනවා. මේ ක්‍රියාවලිය නිසා ආයතනයේ සේවකයන් අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ආණ්ඩුව මේ ආයතනයෙන් බලාපොරොත්තු වන ප්‍රතිලාභ ළඟා කර ගැනීමටත්, සේවකයින් මුහුණ දෙන අපහසුතාවන් අවම කිරීමටත් මෙම ආයතනය නැවතත් රත්නපුරයේ ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කරන්නැයි කියා අපි රජයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මතක් කර දෙන්න කැමැතියි, මැණික් කර්මාන්තය සඳහා වෙන් වූ ආයෝජන කලාපයක් රත්නපුරයේ ආරම්භ කරනවා කියලා 2005 මහින්ද චින්තනයෙන් පොරොන්දු වෙලා තිබුණු බව. කියන්නත් කනගාටුයි, අවුරුදු නවයක් ගත වෙලාත් අද වනතුරු ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න මේ ආණ්ඩුව කිසිම උත්සාහයක් ගන්නා බවක් අපට පෙනෙන්න නැහැ. එහෙම පොරොන්දුවක් දුන්නා ද කියලාවත් මේ ආණ්ඩුවට මතකයක් නැති වීම අපට තවත් ප්‍රශ්නයක්. අද වන විට සුළු මැණික් ව්‍යාපාරිකයින්ට ඒ අයගේ මැණික් ගල් ටික සංචාරකයින්ට විකුණන්න මහනුවරට යන්න වෙලා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නවලට විසඳුමක් විධියට හොඳ හෝටල් සංකීර්ණයක් රත්නපුරයේ ආරම්භ කරලා සංචාරකයින් වැඩිපුර ගෙන්වා ගන්න කටයුතු කළ යුතුයි කියන එකයි මගේ මතය. එහෙම වුණොත් මේ කර්මාන්තයෙන් රටට ලැබෙන ආදායම වැඩි කර ගන්න පුළුවන් කියන එක මගේ විශ්වාසයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ සහෝදර ගරු මන්ත්‍රීවරුන්ට මතක ඇති, අපේ ජාතික උරුමයන්වල හදවත වැනි ජාතික කෞතුකාගාරය මීට අවුරුද්දකට උඩදී කඩලා වටිනා කියන කෞතුක භාණ්ඩ රැසක් රැගෙන ගොස් තිබෙන බව. එම භාණ්ඩ සම්බන්ධයෙන් යම්කිසි තොරතුරු වගයක් අද පත්තරයකත් පළ කරලා තිබුණා. අද වන තුරු ඒ සිද්ධියට සම්බන්ධ සැබෑ සැකකරුවන් අත් අඩංගුවට අරගෙන නැහැ. ඒ වෙනුවට "කන්ගැට්ටා" නමැත්තෙක් සොයා ගෙන ඇවිල්ලා උසාවියට ඉදිරිපත් කළා. අද වෙන කොට කන්ගැට්ටාටත් වෙච්ච දෙයක් නැහැ. ඒ වාගේම CCTV කැමරා off කරලා "කුඩුකාරයෙකුට ජාතික කෞතුකාගාරය කඩන්න පුළුවන්" කියන මතයක් සමාජය තුළ ඇති කරන්න ආණ්ඩුව වෙනුවෙන් පොලීසිය උත්සාහ කළාට මේ වාගේ පට්ටපල් බොරු පිළිගන්න මේ රටේ බුද්ධිමත් ජනතාව සූදානම් නැහැයි කියන එක මම පැවසිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කඩු ඇතුළත් පින්තූරයක් පසු ගිය දවසක Facebook එකේ පළ කරලා තිබුණා. මම මේ අවස්ථාවේදී එය මේ ගරු සභාවට පෙන්වන්න කැමැතියි. මේ පින්තූරයේ තිබෙනවා, ඒ කෞතුක භාණ්ඩ ලෙසට තිබුණු කස්තාන කඩු. මේ රටේ මහ රජතුමාත්, යුව රජතුමාත් දෙපාර්ශ්වය කඩුව අසල සිටින, Facebook එකේ පළ වුණු පින්තූරය මම **සභාගත*** කරන්න කැමැතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

හැබැයි ඒ පින්තූරය පළවෙලා පැය කීපයකට පස්සේ එය අයින් කළා. අපි චෝදනා කිරීමක් නොවෙයි මේ කරන්නේ. විශේෂයෙන්ම මේ වාගේ දේවල් සමාජගත වෙලා තිබෙන මොහොතක, සමාජය තුළ සාධාරණ සැකයක් තිබෙනවා, මේ කඩු මහ රජතුමාත්, යුව රජතුමාත් පාවිච්චි කරනවා ද කියලා. කඩු අටක් නැති වෙලා තිබෙනවා. ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය මහාචාර්ය ජගත් බාලසූරිය මැතිතුමා 'ලංකාදීප' පත්තරයට ප්‍රකාශයක් කරලාත් තිබුණා, කටුගෙයින් කඩු අටක් නැති වෙලා තිබෙනවා කියලා. කොහොම නමුත් ඒ අදහස ඇතිව මේ පින්තූරය අපේ මන්ත්‍රීවරුන්ට මම පෙන්වන්න කැමැතියි. එය දැක්කේ නැති බොහොමයක් අය ඉන්න පුළුවන්. මේ වාගේ දේවල් ගැන අද සමාජය ඇතුළේ සාධාරණ සැකයක් තිබෙනවා, මේ කඩු රජ පවුලට ගෙන ගිහිල්ලා ද කියලා. මම කැමැතියි, ඒ පින්තූරය ඉදිරිපත් කරන්න. ඒ අදහස වැරදි නම් නිවැරදි කරන්න කියලාත් මම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම අදාළ ගරු ඇමතිවරයාගෙනුත් කාරුණිකව ඉල්ලීමක් කරනවා, පොලීසියට ඒ තොරතුරු ටික භාර දීලා එය සැබෑ තොරතුරක්ද නැද්ද කියන එක ජනතාවට පැහැදිලි කරන්නය කියලා.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු මන්ත්‍රීතුමා, ඒ පින්තූරය අපට බලන්න එවනවා ද?

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
හොඳයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න ඔබතුමාගේ වෙලාව.

**ගරු දුනේෂ් ගන්කන්ද මහතා**
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට මාස පහකට උඩදී රතුපස්වල වුණ සිද්ධිය අපි හැමෝම දැක්කා. බොන්න වතුර ඉල්ලලා පාරට බැහැපු මිනිසුන්ට අමානුෂික විධියට ආණ්ඩුවෙන් වෙඩි තිබ්බා. පාසල් ළමයින් දෙදෙනෙකුයි, තාත්තා කෙනෙකුයි ඝාතනය වුණා; 50කට වැඩි පිරිසක් තුවාල වුණා. නමුත් අද වන තුරු වෙඩි තියපු පුද්ගලයන්ව අත් අඩංගුවට ගන්න බැරි වුණා. රතුපස්වල ගැටුම ඇති වුණේ පරිසරය හා සම්බන්ධ ගැටලුවක් මුල් කර ගෙනයි. නමුත් ඒ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වෙන්න පරිසර හා පුනර්ජනනීය බලශක්ති ඇමතිතුමාටවත්, කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමාටවත් බැරි වුණා. ඒ ප්‍රශ්නය විසඳන්න මැදිහත් වුණේ ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන්ය කියන එක මම මතක් කරන්න කැමැතියි. ඇමතිවරු ඒ වෙලාවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වුණා. නමුත් අද තිබෙන ප්‍රශ්නය ඒ ඝාතනවල වග කීම භාර ගන්න කෙනෙක් නැති එකයි. මේ උද්ඝෝෂණයට හමුදාව වෙඩි තිබ්බේ ඒ ස්ථානයේ හිටපු කඩාකප්පල්කාරීන් කලහකාරී ලෙස හැසිරුණු නිසාය කියලා ආණ්ඩුව දිගින් දිගටම කිව්වා. නමුත් අපි අහනවා, මේ සිද්ධිය වෙලා අද වන කොට මාස ගණනක් ගත වෙලා තිබියදීත් ඒ කඩාකප්පල්කාරීන් කවුද කියා හඳුනා ගන්න බැරි වීමෙන් තහවුරු වෙන්නේ සාමකාමී අහිංසක මිනිසුන්ගේ උද්ඝෝෂණයකට ආණ්ඩුව වෙඩි තිබ්බාය කියන එක නේද කියලා. ඒ වාගේම අපි අහනවා, මේ උද්ඝෝෂණය වාර්තා කරන්න ගිහින් හිටපු මාධ්‍යවේදීන්ට පහර දීලා, කැමරා කුඩු කළේ, ඒ අවස්ථාවේ ඇති වුණ සත්‍ය තත්ත්වය රටට එළි කරන්න යන එක වළක්වන්න නෙවෙයි ද කියලා. ඒ ස්ථානයේ මාධ්‍යවේදීන්ට තමන්ගේ රාජකාරිය නිදහසේ කරන්න ඉඩ දුන්නා නම් ඇත්තටම කඩාකප්පල්කාරීන් හිටියාද නැද්ද කියලා බලා ගන්න තිබුණා. නමුත් මාධ්‍යවේදීන්ගේ රාජකාරියට ආණ්ඩුව බාධා කරපු නිසා රටේ ජනතාවට සත්‍ය තත්ත්වය දැන ගන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ නිසා මේ සිද්ධියේ සම්පූර්ණ වග කීම ආණ්ඩුව භාර ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා උද්ඝෝෂණයක්, විරෝධතාවක් විසුරුවා හරින්න මුලින්ම හමුදාව කැඳවන්නේ නැහැයි කියා. පොලිස් කැරලි මර්දන ඒකකයටත් පාලනය කරන්න බැරි නම්, අවසාන පියවර ලෙසට හමුදාව කැඳවීමයි සාමාන්‍යයෙන් සිද්ධ වන්නේ. නමුත් රතුපස්වල සිද්ධියේදී අන්තිමට කැඳවන්න ඕනෑ හමුදාව මුලින්ම එතැනට කැඳවලා අහිංසක මිනිසුන්ට වෙඩි තබන්න අණ දුන්නේ කවුද කියලා මේ දක්වා හෙළිදරවු නොකිරීම රටේ තිබෙන බරපතළ තත්ත්වයක්. පොලිස්පතිවරයා මාධ්‍යයට පැහැදිලි ප්‍රකාශයක් කරලා, වැලිවේරියේ උද්ඝෝෂණය විසුරුවා හැරීමට ඔහු යුද හමුදාවේ සහාය ඉල්ලා නොමැති බව පැහැදිලි කළා. එහෙම නම් අපි අහනවා, පොලීසියේ ඉල්ලීමක් නැතිව හමුදාව ඒ ස්ථානයට යැව්වේ ජනාධිපතිවරයාද, එහෙම නැත්නම් ආරක්ෂක ලේකම්වරයාද කියලා. ඒ නිසා අපි කියනවා මේ නීති විරෝධී නියෝගය හමුදාවට දීලා අහිංසක මිනිසුන්ට වෙඩි තබන්න අණ දීපු කෙනා කවුද කියලා මේ රටට දැන්වත් හෙළිදරවු කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කැමැතියි අද ප්‍රවාහන ක්ෂේත්‍රය ගැනත් වචන කීපයක් කථා කරන්න. පෞද්ගලික ප්‍රවාහන සේවාව සම්බන්ධයෙන් වෙනම අමාත්‍යාංශයක් දැනට ක්‍රියාත්මක වන නිසා පෞද්ගලික ප්‍රවාහන ක්ෂේත්‍රයේ පැහැදිලි වෙනසක් ඇති විය යුතු කාලය දැන් එළඹිලා තිබෙනවා. මගේ මතකයට එනවා ගරු සී.බී. රත්නායක මැතිතුමා අර්ධ සුඛෝපභෝගී බස් සේවාව පිළිබඳව මීට පෙර කරලා තිබුණු ප්‍රකාශයක්. මේ semi-luxury සේවාව මඟීන් සූරා කන, ගන්න මුදලට සරිලන සේවාවක් මඟීන්ට ලබා නොදෙන සේවාවක් නිසා මෙය අහෝසි කරන්න රජයේ අවධානය යොමු වෙලා තිබෙන බව එතුමා කියා තිබුණා. නමුත් ඒ ප්‍රකාශය ප්‍රකාශයකට පමණක් සීමා නොකර මේ සේවාව අහෝසි කරන්න ප්‍රමාද නොවී පියවර ගත යුතුයි කියලා මා විශ්වාස කරනවා. මේකෙන් වෙන්නේ සාමාන්‍ය බස් ගාස්තුවට වඩා වැඩිපුර මුදලක් ගෙවන්න බස් මඟියාට සිද්ධ වෙන එකයි. මේ ක්‍රමය අහෝසි කිරීමෙන් මඟීන්ට විශාල සහනයක් සැලසෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ප්‍රධාන නගරවල ඉඳලා බොහොමයක් අතුරු මාර්ගවල දුවන private buses බහුතරයක් රාත්‍රී 6.30න්, 7.00න් පස්සේ ඒ මාර්ගවල ධාවනය නොකිරීමෙන් මඟී ජනතාව දැඩි අපහසුතාවයකට පත් වෙනවා. මෙන්න මේ තත්ත්වය වෙනස් කිරීමටත් අවධානය යොමු කළ යුතුයි. දහවල් දවසේම මේ මාර්ගවල දුවලා ලාභ ලබන මේ අයට රාත්‍රී 6.30,7.00 වෙන කොට ධාවනය නතර කරන්න ඉඩ දෙන්න බැහැ. තිබෙන නීති ප්‍රමාණවත් නැත්නම්, නව නීති ගෙනැල්ලා අවම වශයෙන් රාත්‍රී 8.00-8.30 දක්වා අවසාන ගමන් වාරය ධාවනය අනිවාර්ය කරන්න කියා අපි ඉල්ලනවා. එහෙම නොකරන බස් හිමියන්ට විරුද්ධව තදින් නීතිය ක්‍රියාත්මක කරලා හෝ මඟී ජනතාවට හොඳ ප්‍රවාහන සේවාවක් නිර්මාණය කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට ගරු ජයරත්න හේරත් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.27]

**ගරු ජයරත්න හේරත් මහතා (උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத் - தாவரவியல் பூங்காக்கள், பொதுப் பொழுதுபோக்கு அலுவல்கள் அமைச்சர்)
(The Hon. Jayarathne Herath - Minister of Botanical Gardens and Public Recreation)
මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය මේ අවුරුද්දේ මුල පිහිටු වූ අලුත් අමාත්‍යාංශයක්. කලක් මෙම අමාත්‍යාංශයට විෂයගත දෙපාර්තමේන්තු සහ ආයතන තිබුණේ විවිධ අමාත්‍යාංශවලට අයත්වයි. විශේෂයෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටත්, අතිගරු ජනාධිපතිතුමා යටතටත් අනුයුක්තව තමයි සමහර කොටස් තිබුණේ. මේ සියල්ලම ඒක රාශි කරලා 2005 අවුරුද්දේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ විෂය පිළිබඳව තිබෙන උනන්දුවත්, එයින් සංචාරක ව්‍යාපාරයට ලැබෙන ඵලදායිකත්වයක් සලකා බලා එම විෂයය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අනුයුක්ත කළා. ඊට පසුව 2013 වර්ෂයේ අලුත් අමාත්‍යාංශයක් විධියට මෙය ආරම්භ කළත් මුදල් වියදම් කරන්න අපට වැය ශීර්ෂයක් තිබුණේ නැහැ. ඒ ඒ දෙපාර්තමේන්තුවලට වෙන් වුණු මුදල්වලින් තමයි අපි ඒ අමාත්‍යාංශයේ වැඩ කටයුතු පවත්වා ගෙන ගියේ.

2014 වර්ෂය සඳහා මේ අමාත්‍යාංශයට මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒවා විධිමත් සැලැස්මක් යටතේ ඒ ඒ දෙපාර්තමේන්තුවල සංවර්ධන කටයුතු සඳහා ඒ මුදල් වියදම් කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට උද්භිද උද්‍යාන කිහිපයක් අයිති වෙනවා. විශේෂයෙන්ම පේරාදෙණිය, හග්ගල වාගේම පැරණි ඒවා විධියට ගම්පහ හෙනරත්ගොඩ උද්‍යානයත් අයිති වෙනවා. ඒ වාගේම අලුතින් උද්‍යාන දෙකක් ආරම්භ කරන්නට දැනට නියමිතව තිබෙනවා. විශේයෙන්ම කොළඹට කිට්ටුව අවිස්සාවේල්ල ප්‍රදේශයේ ශීත කලාපීය උද්භිද උද්‍යානයක් මේ අවුරුද්දේ ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම සත්ව උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ මිරිජ්ජවිල සෆාරි උද්‍යානය මේ අවුරුද්දේ ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. අක්කර 300ක විතර බිම් ප්‍රමාණයක් ආවරණය වන විධියට ආරම්භ කළ හම්බන්තොට උද්භිත උද්‍යානයත් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයින්ට රුක් රෝපණය කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව සලසමින් විවෘත කරන්නට යෙදුණා. ඒක ඉතාම දර්ශනීය වියළි කලාපීය උද්භිද උද්‍යානයක්.

ඊට අතිරේකව ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකටම හෝ පළාතකටම එක උද්භිද උද්‍යානය බැගින් ආරම්භ කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අදහස්වලට අනුව අපි උතුරු ප්‍රදේශයේ කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ උද්භිද උද්‍යානයක් අලුතින් ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා. මේ විධියට සෑම දිස්ත්‍රික්කයකම අපි උද්භිද උද්‍යාන අලුතින් ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ රටේ සංචාරක ව්‍යාපාරයට අපේ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සත්වෝද්‍යාන සහ උද්භිද උද්‍යාන වැඩ පිළිවෙළ විශාල මෙහෙයක්, එහෙම නැත්නම් පිටිවහලක්, අස්වැසිල්ලක් වනවා. ඒ කාර්යය සඳහා තමයි අපි මේ සියල්ල සූදානම් කරන්න බලාපොරොත්තු වන්නේ. ඒ අනුව පින්නවල, වාගොල්ල ප්‍රදේශයේ අලුතෙන් සත්වෝද්‍යානයක් ආරම්භ කරන්න අපි සියලු කටයුතු සූදානම් කරලා තිබෙනවා. මේ අවුරුද්දේ අපට එක සත්වෝද්‍යානයක් විවෘත කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම පිළියන්දල, කහපොළ ප්‍රදේශයේත් අපි අලුතෙන් සත්වෝද්‍යානයක් ආරම්භ කරන්න දැනට මූලික වශයෙන් බිම් හඳුනා ගෙන, ඒ සඳහා සැලැස්මක් හදා ගෙන තිබෙනවා. මේ අවුරුද්දේ අපි එහි ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන්නත්, ලබන අවුරුද්ද මුල වන කොට ඒකේ කොටසක්වත් විවෘත කරන්නත් අපි බලාපොරොත්තු වනවා. මේ විධියට පුළුල් පරාසයක් තුළ මේ ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු රාශියක් කරන්න අපි බලාපොරොත්තු වනවා කියන එක මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අතිරේකව අපේ අමාත්‍යාංශයට අයිති තවත් විෂයයක් විධියට "ලක්සල" හස්ත කර්මාන්ත ආයතනය ගැනත් සඳහන් කරන්න ඕනෑ. අද උදේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මේ ලක්සල ආයතනය පිළිබඳව යම් යම් කරුණු කාරණා ගණනාවක් පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරලා තිබුණා. මම හිතන හැටියට එතුමාට ලැබී තිබුණු වැරදි තොරතුරු ඔස්සේයි එතුමා ඒ කරුණු කාරණා සඳහන් කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්සල ආයතනය පිළිබඳව සුළු හැඳින්වීමක් කරනවා නම්, මේ ආයතනය 2008 වර්ෂය පමණ වන කොට පාඩු ලබන අක්‍රිය ආයතනයක් විධියට පැත්තකට දැමූ ආයතනයක්. අතිගරු ජනාධිපතිතුමාගේ මඟ පෙන්වීම සහ උපදෙස් මත ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ යටතේ මේ ආයතනය නැවතත් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වුණා. මේ ආයතනයේ පරිපාලනයේ යම් යම් අකාර්යක්ෂමතා තිබුණා. ඒ වාගේම මේ ආයතනයේ තවත් විවිධ ගැටලු රාශියක් තිබුණා. අපි ඒ සියල්ල බැහැර කරලා ලක්සල අලුත් මුහුණුවරකින් ආරම්භ කරපු නිසා 2008 වර්ෂයේ පාඩුවට ගිය, වසා දමා පැත්තකට විසි කරපු ලක්සල 2010 වර්ෂය වන කොට රුපියල් මිලියන 6ක ලාභයක් පෙන්වූවා. 2011 වර්ෂය වන කොට රුපියල් මිලියන 50ක ලාභයක් පෙන්වූවා. 2012 වර්ෂය වන කොට රුපියල් මිලියන 73ක ලාභයක් පෙන්වූවා. අද වන කොට රාජ්‍ය භාණ්ඩාගාරයට කිසිම වැය බරක් නැතිව ඉතාම සාර්ථක ව්‍යාපාරයක් විධියට මේ ව්‍යාපාරය අපි පවත්වා ගෙන යනවා. ඒ නිසා ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා මොන විධියේ අර්ථ කථන දුන්නත්, මේ ලාභදායී ව්‍යාපාර අද රටට, ලෝකයට ගැළපෙන විධියට සකස් කරන්නේ නැතිව, මේ ආයතනයට ව්‍යාපාරික මුහුණුවරක් දෙන්නේ නැතිව මේ ආයතනවලින් ලාභයක් ලබා ගන්න අපට පුළුවන්කමක් නැහැ.

මට මතක් වනවා, ජනතා විමුක්ති පෙරමුණ මේ වාගේ ලාභදායී ව්‍යාපාර එහෙම නැත්නම්, විශාල පිරිසකට රැකියා ලබා දීපු මෙවැනි ආයතන ගණනාවක් අස්ථාන චෝදනා දමා වසා දැමූ අවස්ථා ගණනාවක් තිබුණු බව. විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ තුල්හිරිය පෙහෙ කම්හල ඉතාම සාර්ථක ව්‍යාපෘතියක්. අක්කර 300ක පමණ විශාල භූමි භාගයක තිබුණු මේ ව්‍යාපාරය 1965 දී ඩඩ්ලි සේනානායක මහත්තයාගේ ආණ්ඩුවෙන් තමයි ආරම්භ වන්නේ. 1970 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවෙන් මේක ශක්තිමත් වුණා. පසුව මේක ඉතාමත් සාර්ථක ව්‍යාපාරයක් වුණා. පසු ගිය එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ මේ ආයතනය කඩා ගෙන වැටුණා. විවෘත ආර්ථිකයත් එක්ක මේ ආයතනයට වෙළෙඳ පොළක් නැති වුණා.

වහලා තිබුණු මේ ආයතනය නැවතත් අතිගරු ජනාධිපතිතුමා විවෘත කළා. ඊට පස්සේ ජනතා විමුක්ති පෙරමුණ විසින් අස්ථාන චෝදනා දාලා, වැඩ වර්ජන ක්‍රියාත්මක කරලා ඒ ආයතනයට ආයෝජනය කරපු කොරියන් ව්‍යාපාරිකයෝ අධෛර්යවත් කරලා ඒ ආයතනය නැවත වසා දමන තැනට කටයුතු කළා. ඒ නිසා ඒ පළාතේ විශාල පිරිසකට රැකියා නැති වුණා.

රතුපස්වල සිද්ධිය පිළිබඳව අපේ ගරු දුනේෂ් ගන්කන්ද මන්ත්‍රීතුමා දැන් කථා කළා. ඒකට කියන්න තිබෙන්නේත් ඔවැනිම කථාවක්. රතුපස්වල සිද්ධියට සම්බන්ධ ආයතනය හේලීස් සමූහ ව්‍යාපාරයේ ආයතනයක්. මේ ආයතනයේ 800කට වැඩි පිරිසක් රැකියාවල නිරත වුණා. මේක ඊයේ පෙරේදා ආරම්භ කළ ආයතනයක් නොවෙයි. මේක අවුරුදු 8ක්, 10ක් පමණ පවත්වා ගෙන ගිය ආයතනයක්. නමුත් එහි ඇති වූ මතභේදාත්මක සිද්ධියට ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු වෙලා ඒකට දේශපාලන මුහුණුවරක් දුන් එකේ ප්‍රතිඵල තමයි රතුපස්වල තිබෙන ඒ කර්මාන්තශාලාව අද ඒ ප්‍රදේශයෙන් ඉවත් කරන්න තීන්දු කරලා, අද එහි කොටස් කොටස් ගළවා ගෙන යන තත්ත්වයට පත් වී තිබෙන්නේ.මේ නිසා ඒ පළාත්වල මිනිස්සු තමයි, අසරණ වෙන්නේ. රැකියා නැති ඒ මිනිස්සුන්ට තවත් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මේ සියලු තත්ත්වයන් මැද්දේ අපේ රජය ඉතා සාර්ථක ව්‍යාපෘති රාශියක් කර ගෙන යනවා. අවුරුදු 30ක් තිස්සේ පැවති යුද්ධය හේතු කොට ගෙන අපේ රටේ සාමකාමී වාතාවරණයක් නොතිබුණු නිසා උද්භිද උද්‍යාන, සත්වෝද්‍යාන හෝ වෙනත් පොදු පහසුකම් ලබා දෙන ස්ථාන සංවර්ධනය කරන්න අපට පුළුවන්කමක් තිබුණේ නැහැ. මොකද, අවුරුදු 30ක්ම අපි යුද්ධයකට මැදි වෙලා, පැටලිලා තමයි හිටියේ. අපේ සම්පූර්ණ සේසතම වියදම් කළේ යුද්ධයටයි. එවැනි තත්ත්වයකටයි අපි මුහුණ පෑවේ. ඒ නිසා තමයි, යුද්ධයෙන් පීඩා විඳි ඒ මිනිස්සුන්ට මානසික සුවයක් ලබා දෙන්න, ඒ මිනිසුන්ට නිදහසේ කටයුතු කරන්න, දේශීය සංචාරකයන්ට නිදහසේ එහාට මෙහාට යන්න අවස්ථාවක් ලබා දෙන්න අතිගරු ජනාධිපතිතුමා කටයුතු කළේ; ඒ වාගේම විදේශීය සංචාරකයන්ට අපේ රටේ දැක බලා ගන්න පුළුවන් ස්ථාන මේ විධියට ආරම්භ කරන්නත් බලාපොරොත්තු වුණේ.

මේ අලුත් අමාත්‍යාංශය තුළින් කෙටි කාලයකදී අපට ප්‍රාතිහාර්යයක් පාන්න බැරි වේවි. නමුත් විධිමත් සැලැස්මක් යටතේ මේ අමාත්‍යාංශය යටතේ තිබෙන දෙපාර්තමේන්තු ඉතාමත් සාර්ථකව, මනා කළමනාකාරිත්වයක් යටතේ ඉදිරියට පවත්වා ගෙන යන්නට අවශ්‍ය සියලු විධිවිධාන සහ වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවාය කියන එක මා ඉතා සතුටින් මතක් කරන්න ඕනෑ. ඒ නිසා 2014 අවුරුද්දේදී අපට ඉතා සාර්ථක ගමනක් යන්නට පුළුවන් වේවි. 2013 අවුරුද්දේදී අපට නියමිත සැලැස්මක් යටතේ අපට අපේ ගමන යන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අපට වියදම් කරන්න වැය ශීර්ෂයක් තිබුණේ නැහැ. ඒ දෙපාර්තමේන්තුවල මුදල් තමයි, අපි පරිහරණය කළේ, පාවිච්චි කළේ. නමුත් 2014 අවුරුද්ද එහෙම නොවෙයි. 2014 දී අපට ඊට වඩා ලොකු වැඩ පිළිවෙළකට යන්න පුළුවන්කමක් තිබෙනවා. ඒ තුළින් සංචාරක ව්‍යාපාරයට තවත් ශක්තියක් දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම විදේශ සංචාරකයන්ගෙන් සියයට 60කට වැඩි පිරිසක් අනිවාර්යයෙන්ම මහනුවර දළදා මාළිගාව දැක බලා ගන්න, වැඳ පුදා ගන්න යනවා. මහනුවරට යන සංචාරකයන්ගෙන් සියයට 40කට වැඩි පිරිසක් අනිවාර්යයෙන්ම පින්නවල අලි අනාථාගාරයට ගිහින් එය දැක බලා ගෙන තමයි යන්නේ. ඒ නිසා විදේශ සංචාරකයන්ට මේක හොඳ තෝතැන්නක්. මේක වැඩිදියුණු කළොත් විදේශීය මුදල් උපයා ගන්නට අපට තිබෙන ඉතාම පහසුම ස්ථානයක් විධියට අපි මේක හඳුනා ගෙන තිබෙනවා. ඒ නිසා තමයි අපි මේක අලි අනාථාගාරයට පමණක් සීමා කරන්නේ නැතිව ඊට යාබදව තිබුණු වාගොල්ල ගොවිපළේ බිම් ප්‍රදේශයත් පවරා ගෙන ඒ ස්ථානයේ අලුතින් සත්වෝද්‍යානයක් ඉදි කර ගෙන යන්නේ. මේ වන කොට ඒ ඉදි කිරීම් කටයුතුවල සියයට 85ක පමණ භෞතික ප්‍රගතියක් පෙනෙන්නට තිබෙනවා. 2014 අප්‍රේල් මාසයට කලින් රඹුක්කන, පින්නවල සත්වෝද්‍යායනය විවෘත කරන්න අපට පුළුවන්කමක් ලැබේවිය කියා අපි විශ්වාස කරනවා.

මගේ මිත්‍ර ගරු අශෝක් අබේසිංහ මන්ත්‍රීතුමා උද්භිද උද්‍යාන පිළිබඳවත්, night safari පිළිබඳවත් හොඳ අදහසක් පළ කළා. නමුත් අපි සැලැස්මක් විධියට තීන්දු කර තිබෙනවා, ලංකාවේ ඒ ඒ කලාපවල දේශගුණික තත්ත්වයන්ට ආවේනික ශාක රෝපණය කරලා, සෑම දිස්ත්‍රික්කයකම උද්භිද උද්‍යාන ඉදි කරන්න. එහිදී අප උතුරු ප්‍රදේශයට ප්‍රමුඛතාව දී තිබෙනවා. දෙවැනි ස්ථානය නැඟෙනහිර පළාතට දී තිබෙනවා. ඒ වාගේම වයඹ පළාතේ බිංගිරිය ප්‍රදේශයේ අලුතින් උද්භිද උද්‍යානයක් ඉදි කරන්න ස්ථානයක් හඳුනා ගෙන තිබෙනවා. ඒ නිසා 2014 අවුරුද්දේදී අපට ඒ සියලු දේ සැලසුම් කරන්න පුළුවන් වේවිය කියා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සියල්ලට අතිරේකව අපේ අමාත්‍යාංශයේ විෂය පථය තුළ වන ඖෂධ උයනක් පිහිටුවීමට නියමිතව තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල මැතිවරණ බල ප්‍රදේශයේ, ගනේවත්ත නමැති ස්ථානයේ එය පිහිටුවන්න අපි බලාපොරොත්තු වෙනවා. ඉතා දුර්ලභ ගණයේ ඖෂධ රෝපණය කර තිබෙන ඒ බිමේ අවුරුදු 65, 70 පමණ වයස් ප්‍රමාණයේ ඉතා දුර්ලභ ගණයේ ශාක තිබෙනවා. ඒ අතින් බලන කොට ගනේවත්ත ඖෂධ උයන ඉතා සාර්ථක ඖෂධ උයනක්. 2014 අවුරුද්දේදී එයට සංචාරකයන්ට එන්න පුළුවන් විධියට, ඒ සඳහා ප්‍රවේශයක් ලබා ගන්න පුළුවන් විධියේ මූලික පහසුකම් සලස්වන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද වෛද්‍යවරුන්ට මේ වන ඖෂධ දැක බලා ගන්නට, පර්යේෂණ කරන්නට, ඒවා අධ්‍යයනය කරන්නට සහ ඉගෙන ගන්නට නිශ්චිත තැනක් නැහැ. මේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය කේන්ද්‍ර කර ගෙන ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසමින් සිය දෙනෙකුට දේශනා ශාලා සහිතව, නේවාසික පහසුකම් සහිතව ඒ සඳහා අවස්ථාව ලබා දීමට 2014 දී අප වැඩ කටයුතු ආරම්භ කරන්නට බලාපොරොත්තු වෙනවාය කියන එක මා මතක් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු අමාත්‍යතුමා ඔබතුමාට තව විනාඩි 2 කාලයක් තිබෙන්නේ.

**ගරු ජයරත්න හේරත් මහතා**
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අපේ අමාත්‍යාංශයේ විෂය පථය තුළ අපට මේ කටයුතු ටික ඉදිරියේදී කර ගෙන යන්නට පුළුවන්කම ලැබෙයි. විපක්ෂය යම් යම් කරුණු කාරණා පිළිබඳව දිගින් දිගටම රජයට චෝදනා එල්ල කළත්, සමස්තයක් විධියට ගත්තොත් මේ අය වැය රටේ සමස්ත ජනතාවටම අපහසුතාවයක් නැතිව සංවර්ධනය ගෙන එන්නට පුළුවන් අය වැයක් හැටියට අපට හඳුන්වා දෙන්නට පුළුවන්කම තිබෙනවා. විශේෂයෙන් ගොවි ජනතාවට අප රුපියල් 1250ක විශ්‍රාම වැටුපක් දෙනවා. සියයට 65 ක රාජ්‍ය ණයක් අනුමත කර තිබෙනවා. කාන්තා ව්‍යවසායකයින්ට රුපියල් දෙලක්ෂ පනස්දාහක් බැගින් දෙන්නට

[ගරු ජයරත්න හේරත් මහතා]

සාකච්ඡා කර තිබෙනවා. සරසවි ආචාර්යවරුන්ගේ ප්‍රශ්නය දිගින් දිගටම ගැටලුවක් වුණු මාතෘකාවක්. සියයට 5ක වැටුප් වැඩිවීමක් ඔවුන්ට ලබා දෙනවා. පශු වෛද්‍ය ක්ෂේත්‍රයට රුපියල් 7,000ක දීමනාවක් දෙන්නට යෝජනා කර තිබෙනවා. කුඩා තේ වතු හිමියන්ට රුපියල් 5,000ක දීමනාවක් ලබා දීමටත් යෝජනා කර තිබෙනවා. උතුරු මැද පළාතේ ජල පවිත්‍රාගාර සඳහා මිලියන 900ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම "දිවි නැගුම" වැඩ පිළිවෙළ යටතේ සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකම හෝ දම දිවි නැඟුමේ පවුල් 5කට රුපියල් 10,000 බැගින් දීමනාවක් ලැබෙන පරිදි ග්‍රාමීය මට්ටමටත්, ප්‍රාදේශීය මට්ටමටත් පහසුකම් ලැබෙන විධියට අය වැය වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ගරු ඇමතිතුමා කථාව අවසාන කරන්න.

**ගරු ජයරත්න හේරත් මහතා**
**(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)**
(The Hon. Jayarathna Herath)
අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු දෙපාර්තමේන්තු ප්‍රධානීන් සියලු දෙනාම අපේ අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළට සහයෝගය දීම ගැන මා ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද උදේ "ලක්සල" පිළිබඳව මත භේදාත්මක චෝදනා ඉදිරිපත් කළ ගරු අනුර කුමර දිසානායක මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී ගරු සභාවේ නැහැ. එම නිසා එතුමාට බලා ගැනීම සඳහා "ලක්සල" පිළිබඳව එතුමා මතු කළ ප්‍රශ්නවලට පිළිතුරු සහිත ඒ වාර්තාව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ අවස්ථාවේදී **සභාගත*** කරන අතර මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා මගේ කථාව අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට ගරු ගුණරත්න වීරකෝන් අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.42]

**ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)**
**(மாண்புமிகு குணரத்ன வீரகோன் - மீள்குடியேற்ற அமைச்சர்)**
(The Hon. Gunaratne Weerakoon - Minister of Resettlement)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 වර්ෂයේ අය වැය කාරක සභා අවස්ථාවේදී නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය පිළිබඳ වැය ශීර්ෂය සම්බන්ධයෙන් සාකච්ඡා කරන මේ වෙලාවේ මීට පෙර අපේ නියෝජ්‍ය අමාත්‍ය ගරු විනායගමූර්ති මුරලිදරන් මැතිතුමා කථා කරමින් බොහෝ සංඛ්‍යා ලේඛන සභාගත කළා. එම නිසා මා කෙටියෙන් ඒ සංඛ්‍යා ලේඛන ගැන කථා කරන්නට බලාපොරොත්තු වෙනවා.

2013 කාර්ය සාධන වාර්තාව අනුව, අපේ අමාත්‍යාංශයට අයිති සියලු අංශ සඳහා ප්‍රතිපාදන වශයෙන් රුපියල් මිලියන 331.45ක් වෙන් කර තිබෙනවා. විශේෂ නිවාස ව්‍යාපෘති හැටියට හඳුන්වන්නට පුළුවන් මුලතිව්, කේපාපිලව් නිවාස ව්‍යාපෘතියට මිලියන 32ක් සහ වැලි ඔය නිවාස ව්‍යාපෘතියට මිලියන 117ක් වැය කරමින් ඒ කටයුතු සිදු කළා. ඒ වාගේම තාවකාලික නිවාස ආධාර සඳහා ත්‍රිකුණාමලය, මඩකලපුව, අනුරාධපුරය, වවුනියාව යන දිස්ත්‍රික්කවල පවුල් 2350ක් සඳහා මිලියන 41.75 ක් අපි වැය කරනු ලැබුවා. දැනට නැවත පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව නැඟෙනහිර පළාතේ පවුල් 72,987යි. උතුරු පළාතේ 1,51,425යි. මුළු පවුල් සංඛ්‍යාව 2,24,423යි. මෙහිදී මන්ත්‍රීවරුන් සඳහන් කළ නිසාම කියන්නට ඕනෑ, යාපනය දිස්ත්‍රික්කයේ පවුල් 6252ක් නැවත පදංචි කිරීම සඳහා -ස්ථානගත කිරීම සඳහා- ඉතිරි වෙලා සිටින බව. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පවුල් 842ක් සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පවුල් 374 ක් ස්ථාන ගත කිරීමට තිබෙනවා. නැවත පදිංචි කිරීමට ඇති මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 85ක සියයට 90ක ප්‍රමාණයක් මේ වන විට නැවත පදිංචි කර ඒ කටයුතු අවසන් කර තිබෙනවා. මේ අමාත්‍යාංශයේ වැදගත්කම සලකා අතිගරු ජනාධිපතිතුමා 2014 වර්ෂය සඳහා මුළුමනින්ම වැය කිරීම සඳහා අපට මිලියන 204ක් ලබා දී තිබෙන බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ. විශේෂයෙන් කේපාපිලව් නිවාස ව්‍යාපෘතිය, සුබසාධන මධ්‍යස්ථානයන් නඩත්තුවට සහ විශේෂයෙන් සනීපාරක්ෂක කටයුතු සඳහා ඒ මුදල් ලබා දී තිබෙනවා. සනීපාරක්ෂක කටයුතුවලට බොහෝ සෙයින් අදාළ වන්නේ නිවාසවලට අවශ්‍ය වැසිකිළි, කැසිකිළි ඉදි කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමයි.

ඒ සඳහා රුපියල් මිලියන 150ක් වැය කරලා තිබෙනවා. ඉදිරි කාලය තුළ -2014 වසරේදී- මේ ලැබෙන මුදල් ප්‍රතිපාදන මඟින් නැවත පදිංචි කිරීමේ කටයුතු සහ එසේ පදිංචි කරන ජනතාවගේ ශුභසාධනය පමණක් නොව ජන ජීවිතය ගොඩ නැඟීම සඳහා අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නටත් අපි බලාපොරොත්තු වෙනවා. මීට අමතරව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකට අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් මඩකලපුව දිස්ත්‍රික්කයේ නිවාස 800ක් -අපේ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ දිස්ත්‍රික්කයේ- වැසිකිළි සහිතව ඉදි කරන්නට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන අනුමත කරලා දුන්නා. 2014 වසරේ අපි එය ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගරු සභාවේ අසුන් ගෙන නොසිටියත් ගරු විජයකලා මහේස්වරන් මන්ත්‍රීතුමිය ගැන කථා කළ යුතුයි. එතුමිය යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරියක්. එතුමිය අපේ අමාත්‍යාංශයට ඇවිල්ලා අපේ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරලා යෝජනා කිහිපයක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමම් ප්‍රදේශයේ මහ ජනතාවට අදාළ ප්‍රශ්න ගණනාවක් ගැන එතුමිය කථා කළා. අපි විජයකලා මහේස්වරන් මන්ත්‍රීතුමිය සමඟ සාකච්ඡා කරන කොට එතුමිය යෝජනා කළ වලිකාමම් ප්‍රදේශයේ නැවත පදිංචි කිරීමේ කටයුතු සහ ඒ ජනතාවගේ ජන ජීවිත ගොඩ නැඟීමේ කටයුතු ඉදිරි කාලය තුළ එතුමියවත් සම්බන්ධ කර ගෙන ක්‍රියාත්මක කළ යුතු බවට අපි අතිගරු ජනාධිපතිතුමාට යෝජනා කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ වෙලාවේ මේ ගරු සභාවේ නොසිටියත් ගරු අරියනේත්‍රන් මන්ත්‍රීතුමා ගැනත් කියන්න ඕනෑ. එතුමා මහා බොරු ගණනාවක් මේ සභාවේදී කිව්වා. ඒ විතරක් නොවෙයි මේ ගරු සභාව සම්පූර්ණයෙන්ම නොමඟ යැව්වා. ඒකත් සඳහන් කරන්න ඕනෑ. එතුමා කිව්වා ඉන්දියාවේ ඉඳලා එන සරණාගතයින් ගුවන් තොටුපොළට ආවාම ඔවුන්ගෙන් කප්පම් ගන්නවා කියලා. මේ මනුස්සයා කිව්වේ පට්ටපල් අසත්‍යක්. ඉන්දියාවේ ඉඳලා එන සරණාගතයින් එක්සත්

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ කොමිසමේ නිලධාරින් සමඟ තමයි පැමිණෙන්නේ. ඒ අය භාර ගන්නට අපේ අමාත්‍යාංශය නියෝජනය කරමින් අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා අවස්ථා ගණනාවක්ම ගුවන් තොටුපළට ගියා. ඒ අයට ආධාර දෙනවා. ඒ අයව පිළිඅරගෙන ඒ අය නැවත පදිංචි කිරීම පිළිබඳ කටයුත්ත අපේ අමාත්‍යාංශය මඟින් කර ගෙන යනවා. ඒ නිසා අරියනේත්‍රන් මන්ත්‍රීතුමා ඉතාම වැරදි ප්‍රකාශයක් තමයි මේ ගරු සභාවේදී කළේ. එතුමා මේ ගරු සභාවේ නොසිටියත් මම මේ වෙලාවේ ඒක කියනවා. දෙමළ ජාතික සන්ධානය තුළ බොහොම ශ්‍රේෂ්ඨ දේශපාලනඥයෝ ඉන්නවා. මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා කවදාවත් ඒ වාගේ අසත්‍ය ප්‍රකාශ කරන කෙනෙක් නොවෙයි. අරියනේත්‍රන් මන්ත්‍රීතුමාට මම කියනවා, මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමාගෙන් ඉගෙන ගන්න කියලා.

මට මතකයි 2010 මහා ගංවතුර ආපු වෙලාවේ මුළු උතුරු පළාතම මහා ව්‍යසනයකට ගොදුරු වුණු බව. ඒ වෙලාවේ පවුල් 10,000කට ආහාර ද්‍රව්‍ය සපයන්නට අතිගරු ජනාධිපතිතුමා රුපියල් මිලියන 45ක් ලබා දුන්නා. මමත්, විනායගමූර්ති මුරලිදරන් නියෝජ්‍ය අමාත්‍යතුමාත් එකතු වෙලා දවස් 8ක් තිස්සේ ඒ කටයුතු කළා. අපි මැණික්ෆාම්වල තිබෙන කඳවුරුවල ඉඳලා ඒ කටයුතු පටන් ගත්තා. අපි ගියේ අපේ අමාත්‍යාංශයේ නිලධාරින් සහ නියෝජ්‍ය ඇමතිතුමා එක්කයි. මරදන්කර්නි දක්වා ගිහිල්ලා පවුල් 10,000කට අවශ්‍ය සලාක ද්‍රව්‍ය ලබා දුන්නා. ඒ වෙලාවේ මාවෛ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා අපිත් එක්ක සම්බන්ධ වුණා. අරියනේත්‍රන් මන්ත්‍රීතුමන්ලා ඒවා දන්නේ නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අපත් සෑහෙන ආධාර ප්‍රමාණයක් දුන්නා.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමාගේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙනම සහනාධාර දුන්නා. ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමාත් මේ කටයුතුවලට සහභාගි වුණා. එතුමා අපේ අමාත්‍යාංශයට ඇවිල්ලා අපත් එක්ක ගියා. විනායගමූර්ති මුරලිදරන් නියෝජ්‍ය අමාත්‍යතුමාත් සහභාගි වුණා. අපි බඩු බෙදන කොට ගරු විජයකලා මන්ත්‍රීතුමිය එතැනට ඇවිල්ලා ඒ කාර්යයට සහභාගි වුණා. නමුත් අරියනේත්‍රන් මන්ත්‍රීතුමාලාට තිබෙන්නේ වැරදි දෘෂ්ටියක්. ජ්‍යෝෂ්ඨ මන්ත්‍රීවරු අපි සමඟ එකතු වෙලා මේ අවාසනාවන්ත තත්ත්වයට පත් වුණු ද්‍රවිඩ ජනතාවගේ ජීවිත ගොඩ ගන්න කථා කරන කොට, නැවත ගිනි අවුළුවන දේවල් තමයි අරියනේත්‍රන් මන්ත්‍රීතුමා වගේ කට්ටිය කථා කරන්නේ. එතුමා විතරයි එහෙම කිව්වේ.

ඊළඟට මම තවත් කාරණයක් කියන්නට කැමැතියි. සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මන්ත්‍රීතුමා යාපනය දිස්ත්‍රික්කයේ අවතැන් වුණු පවුල් ගැන කිව්වා. අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළා, පවුල් 6,000කට සමාන සංඛ්‍යාවක් ඉන්නවා කියලා. ඒ අය නැවත පදිංචි කරන්නට අවශ්‍ය කටයුතු සිදු කර ගෙන යනවා. මම මේ වෙලාවේ ඉතාම සතුටින් කියන්නට ඕනෑ, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මැදිහත් වෙලා අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි නැවත පදිංචි කිරීම සඳහා පලාලි අධි ආරක්ෂිත කලාපයේ අක්කර 600ක් දැන් නිදහස් කරලා තිබෙන බව. ඊළඟට ඒ ඉඩම් කැබලි කරලා නිවාස 1,000ක් හදන්නට 2014 වර්ෂයේදී මුදල් ලබා දෙන්න අතිගරු ජනාධිපතිතුමා තීන්දු කරලා තිබෙනවා. යාපනය අධි ආරක්ෂිත කලාපයට අයිති වෙලා තිබුණු මුළු ඉඩම් අක්කර 600 නිදහස් කරලා තිබෙන වෙලාවේ මේ කටයුත්ත ඉස්සරහට ගෙන යන්නට අපට පුළුවන්කම තිබෙනවා. ඒකත් සඳහන් කරන්නට ඕනෑ ගරු සුරේෂ් ප්‍රේමචන්ද්‍රන් මන්ත්‍රීතුමාට. ඒ ගෙවල් හදන විට එතුමන්ලාටත් ඇවිත් පොඩ්ඩක් බලන්න කියලා අපි ආරාධනා කරනවා. මේ ගොල්ලෝ යන්නේ නැතුව මෙතැනට ඇවිත් අසත්‍ය ප්‍රකාශ කරනවා. එහේ යන්න මේ ගොල්ලන්ට කිසිම තහනමක් නැහැ. මේ ගොල්ලන් බොරු කෙළින්නේ. අප එහේ බඩු බෙදන විට ආවේ නැහැ. පවුල් 10,000ක් අසරණ වෙලා කඳවුරුවල ගාල් කරලා ඉන්නකොට ආවේ නැහැ. අඩු ගණනේ ඒ අයට ආහාර ද්‍රව්‍ය බෙදන විට ආවේ මාවෛ සේනාධිරාජා මන්ත්‍රීතුමා වාගේ උදවිය විතරයි. අනෙක් මන්ත්‍රීතුමන්ලා ආවේ නැහැ. ඒ අය මේ ගරු සභාවට ඇවිත් අසත්‍ය ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ විශේෂ නියෝජිත ආචාර්ය බෙයානි මහත්මා පසු ගිය දවස්වල ලංකාවට පැමිණියා. එතුමා පැමිණ දවස් හය හතක් ලංකාවේ සංචාරය කළා. එපමණක් නොවෙයි, විදේශ කටයුතු ඇමතිතුමා, හිටපු මානව හිමිකම් අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමා, හිටපු නැවත පදිංචි කිරීමේ අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා, ඒ වාගේම අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා, ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා හමු වෙලා මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් සකස් කරන්න බෙයානි මහත්මා කටයුතු කළා. අවසාන වාර්තාව එතුමා ඉදිරිපත් කරාවි. නැවත පදිංචි කිරීමේ කටයුතු සහ මානව හිමිකම් ආරක්ෂා වීමේ කටයුතුවල ප්‍රගතියක් දකින්න තිබෙනවාය කියන කාරණය එතුමා සඳහන් කර තිබුණා. ඉදිරි කාලය තුළ අපේ අමාත්‍යාංශයත් අනෙකුත් අමාත්‍යාංශත් සම්බන්ධ වෙලා යුද්ධයෙන් අවතැන් වූ ලක්ෂ සංඛ්‍යාත පවුල් සංඛ්‍යාව නැවත පදිංචි කරලා ඒ අයගේ ජීවිත ගොඩ නැඟීමේ කටයුත්ත ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙයි කියා විශ්වාසය පළ කරනවා.

මම මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුයි, අපේ අමාත්‍යාංශය තුළ අපේ අමාත්‍යාංශයට කළ නොහැකි කාර්යයන් -ජල සම්පාදනය, සනීපාරක්ෂක පහසුකම් සැපයීම වාගේ දේවල්- අපේ මහින්ද අමරවීර අමාත්‍යතුමාගේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයත්, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ අමාත්‍යාංශයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක් වෙලා නැවත පදිංචි කරන ජනතාවට පමණක් නොව උතුරු නැගෙනහිර සියලුම ජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු කරනවා. මේ සඳහා රේඛීය අමාත්‍යාංශ සමඟ එකතු වෙලා අප කටයුතු කරන බව සඳහන් කරන්න කැමැතියි. අපේ අමාත්‍යාංශය 2013 දී ලබා ගත් කාර්ය සාධනය, සාර්ථකත්වය ඉදිරි 2014 වසර තුළත් ලබා ගැනීමට කටයුතු කරනවා. විශේෂයෙන් අවුරුදු 30ක් තිබුණු යුද්ධයෙන් උතුරු නැගෙනහිර පළාත විනාශ වුණා. එතුමන්ලා කිව්වා, උතුරු පළාතේ ජනතාවට විතරයි මේ විනාශය සිදු වුණේ කියා. නැහැ. මුළු ලංකාවම වෙලා ගත් එල්ටීටීඊ එකේ රුදුරු ත්‍රස්තවාදය උතුරේ සිට දකුණ දක්වා වෙනසක් නැතුව මිනී මැරුවා; ද්‍රවිඩ නායකයෝ මැරුවා. අප්පාපිල්ලේ අමිර්තලිංගම් මැතිතුමා, නීලන් තිරුචෙල්වම් මැතිතුමා, ලක්ෂ්මන් කදිර්ගාමර් මැතිතුමා වැනි ද්‍රවිඩ ජන සමාජය තුළ මහා සම්මතයන් ඇති කළ, මහා සම්ප්‍රදායන් ඇති කළ ද්‍රවිඩ විද්වතුන් විශාල සංඛ්‍යාවක් එල්ටීටීඊ එකෙන් මරලා දැම්මා. අවුරුදු 30ක් තිබුණු ත්‍රස්තවාදය අවසන් කරලා ඒ කටයුතු ප්‍රතිසංවර්ධනය කිරීම ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. කවදාද බිම් බෝම්බ අයින් කරන්නේ, කවදාද ගෙවල් හදන්නේ කියා මේ ගොල්ලෝ අපෙන් කාලසටහන් ඉල්ලනවා. ඒ ගොල්ලන් තමයි ඒවාට මූලික වුණේ. ඒවා හොඳින් දන්නා මගේ නියෝජ්‍ය අමාත්‍යතුමා මා ළඟ සිටිනවා. මං 2010 දී බඩු බෙදන්න යන විට එතුමා සමඟ තමයි ගියේ. මොකද, බිම් බෝම්බ මඟ හැර යන්න ඕනෑ නිසා. එතුමා තමයි ඒක හරියටම දන්නේ. අපි දෙදෙනා

[ගරු ගුණරත්න වීරකෝන් මහතා]

බොහොම සතුටින් එකතු වෙලා ද්‍රවිඩ ජනතාවගේ සුබසාධනය සඳහා කටයුතු කරන වෙලාවේ ද්‍රවිඩ ජාතික සන්ධානයේ අය නොයෙකුත් දේවල් කියනවා. මට මතකයි, ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රීතුමෙකු ජාතික ගීය පිළිබඳව කිව්වා. ඒ වාගේම ජාතික ධජය පිළිබඳව මහා බරපතළ ප්‍රකාශයක් අද මේ සභාවේත් සිදු කළා. ඒක බරපතළ ප්‍රකාශයක්. අවුරුදු 30ක් තිබුණු එල්ටීටීඊ ත්‍රස්තවාදී සංවිධානයේ දෙවැනි නායකයා තමයි මේ විනයාගමූර්ති මුරලිදරන් මැතිතුමා. එතුමා තමයි සන්නද්ධ අංශයේ නායකයා. ප්‍රභාකරන් කැළේ ඉඳගෙන අණ දෙන කොට මෙතුමා තමයි ඒ සියල්ල කළේ. එතුමා අද ප්‍රජාතන්ත්‍රවාදයට පිවිසිලා සිටීම ගැන අපි සතුටු වෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මහත්තයලාත් ඒ කාලයේ එහෙමනේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ අමාත්‍යාංශය තුළ මෙම කාර්ය සාධනය සිදු කරන අතරේ, ඉදිරි කාලය තුළදී ද මේ කටයුතු සාර්ථකව ගෙනි යන්නට අපේ අතිගරු ජනාධිපතිතුමා අපිට මුදල් ප්‍රතිපාදන වෙන් කරලා දුන්නා. ඒ වාගේම ආරක්ෂක ලේකම්තුමා අපිට ලබා දෙන සහයෝගය ඉතාම අගය කරන්නට ඕනෑ. ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අපට ලබා දෙන සහයෝගයත් අගය කරනවා.

මගේ නියෝජ්‍ය අමාත්‍යතුමා -විනයාගමූර්ති මුරලිදරන් මැතිතුමා- අද වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උපසභාපතිවරයෙක්. මටවත් එහෙම තනතුරක් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදයට පිවිසිලා අද අපේ රට වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා සමඟ අත් වැල් බැඳගෙන මහා කාර්යයක් කරන අපේ විනයාගමූර්ති මුරලිදරන් මැතිතුමාටත්, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රධාන සියලුම කාර්ය මණ්ඩලයටත් මගේ ගෞරවයත්, ස්තුතියත් පුද කරමින් මගේ කථාව හමාර කරනවා. බොහොම ස්තුතියි

[අ.භා. 5.57]

**ගරු මහින්ද අමරවීර මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)

(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අමාත්‍යාංශ ගණනාවක වැය ශීර්ෂ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ සාකච්ඡා කරලා, ඉන් අනතුරුව අද මේ විවාදය පැවැත්වෙනවා. විරුද්ධ පක්ෂය අපේ කථා ගණනාවක් අහගෙන හිටියා. හැබැයි, දැන් පිළිතුරු කථා අහන්න ඉන්නේ අජිත් පෙරේරා මන්ත්‍රීතුමා විතරයි. මේ පිළිබඳව අපි කනගාටු වෙනවා. මොකද, සමහර කාරණා බරපතළ චෝදනා විධියට ඉදිරිපත් කළා. අපේ ටී.බී. ඒකනායක ඇමතිතුමා අද උදේ ඉඳලා මේ ගරු සභාවේ ඉන්නවා. එතුමා පොඩ්ඩක් සභා ගැබෙන් එළියට ගිය වෙලාවේ, විපක්ෂයේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා එතුමාට බරපතළ චෝදනාවක් ගෙනාවා, රූපවාහිනියේ ටෙලිනාට්‍ය සම්බන්ධව. එතුමාගේ මොළයේ අඩුවක් තිබෙනවා ද කියලා මම දන්නේ නැහැ. එතුමාට අඩු ගණනේ අද කථා කරන්නේ මොන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන ද කියලා තෝරා ගන්න බැහැ. වැය ශීර්ෂය මොකක්ද කියලා දන්නේ නැහැ. පැටලිලා. රහපාන්න ගිහිල්ලා වුණු පැටලිල්ලක් ද දන්නේ නැහැ. ඇත්ත, බොරුව කෙසේ වෙතත් ඒ චෝදනා සම්බන්ධයෙන් අඩුම ගණනේ කථා කරන්න ඕනෑ, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය දවසේයි. නමුත් එතුමා අද මේ ගරු සභාවේ කථා කළේ වයර් මාරු වෙලායි. "One Shot"ගේ කථාවට මට කියන්න තිබෙන්නේ එපමණයි. ටී.බී. ඒකනායක මැතිතුමා තවමත් සභා ගැබේ ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා අපේ අමාත්‍යාංශය පිළිබඳව චෝදනා ගණනාවක් එල්ල කළා. ඒවාට මම එකින් එක උත්තර දිය යුතු වෙනවා. එතුමා කිව්වා, අවිස්සාවේල්ල ෆෙඩ්රික් වත්තේ ඇති වුණු සිද්ධිය සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කිසි දෙයක් කළේ නැහැ, එතැනට සම්බන්ධ වුණේවත් නැහැ කියලා. ඔක්තෝබර් 09වැනි දා රාත්‍රී 8.30ට වාගේ තමයි මේ සිද්ධිය ඇති වුණේ. රාත්‍රී 10.30, 11.00 වන කොට අපේ නිලධාරින් එතැනට සම්බන්ධ වුණා. ඒ වාගේම හමුදා කඳවුරු සමඟ මනා සම්බන්ධීකරණයක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තිබෙනවා. ඒ නිලධාරින් සම්බන්ධ කරගෙන, රෝහල් එක්ක සම්බන්ධ වෙලා, අද වන තුරු අපේ නිලධාරින් ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු කරනවාය කියන කාරණය මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. එම ජනතාවට සහන ලබා දීමේදී තිබෙන ප්‍රධාන බාධකය තමයි, දේශපාලන වශයෙන් එක්සත් ජාතික පක්ෂයේ සමහර මන්ත්‍රීවරු ගිහිල්ලා කරන පෙළඹවීම්. ඒ අයට ගෙවල් ලබා ගන්න, ඉඩම් ලබා ගන්න ආදී වශයෙන් විවිධ දේවල් කියලා ඒ ගෙවල්වල පදිංචියට යන්න ඉඩ නොදීම නිසා තමයි එතැන ගැටලුවක් නිර්මාණය වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කිව්වා, "සුනාමි අනතුරු ඇඟවීමේ කුලුනු ටික වැඩ කරන්නේ නැහැ" කියලා. එතුමා ඒ පිළිබඳවත් දන්නේ නැහැ. ඒ නිසායි එහෙම සඳහන් කළේ. සුනාමි අනතුරු ඇඟවීමේ කුලුනු 79ක් තිබෙනවා. සමහර වෙලාවට එකක්, දෙකක් වැඩ කරන්නේ නැති වෙනවා. මොකද, මුහුද අයිනේ තමයි මේ කුලුනු තිබෙන්නේ. අපි දන්නවා, මුහුද අයිනේ තිබෙන ඕනෑම උපකරණයක් එහෙම වැඩ නොකරන අවස්ථා තිබෙන බව. සමහර විට බැටරියේ අඩු පාඩුවක් තිබෙන්න පුළුවන්. නමුත් අපේ නිලධාරින් මේ ගැන නිරන්තරයෙන් විමසිලිමත් වනවා. මේ සියලුම කුලුනු අද වන කොට ක්‍රියාකාරි තත්ත්වයේ තිබෙනවාය කියන කාරණයත් මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි.

ඒ වාගේම එතුමා කිව්වා, "අපේ වෙබ් අඩවිය යාවත්කාලීන වෙන්නේ නැහැ, 2011 තොරතුරු තමයි තවම තිබෙන්නේ" කියලා. ඒකත් වැරදි තොරතුරක්. එතුමාට මේ තොරතුරු කවුරු දුන්නා ද දන්නේ නැහැ. 2011, 2012, 2013 අවුරුදුවල අපේ වෙබ් අඩවිය තුළ යාවත්කාලීන කිරීම් සියල්ලම සිද්ධ වන බවත් මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම එතුමා කිව්වා, "දැනුවත් කිරීම පිළිබඳව ගැටලුවක් තිබෙනවා"ය කියලා. මම ඒ කාරණයේ යම් කොටසක් පිළිගන්න කැමැතියි. අපේ ඒ දැනුවත් කිරීමේ වැඩසටහන් තවත් ඉස්සරහට යන්න ඕනෑය කියලා අපි පිළිගන්නවා. හැබැයි, අපි විශාල වශයෙන් මේ වන විටත් ගම් මට්ටමින් කමිටු පිහිටුවලා, ගම් මට්ටමින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ඒ වාගේම සුනාමි අනතුරු ඇඟවීම් පද්ධති, සුනාමි පෙරහුරු, ඒ වාගේම අනිකුත් පෙරහුරු වැඩසටහන් ගණනාවක් අපි ක්‍රියාත්මක කරනවා. මේ මාසයේ 26වන දා "ජාතික ආරක්ෂක දිනය" කලුතරදී පැවැත්වෙනවා. ඊට සමගාමීව කලුතර දිස්ත්‍රික්කයේත්, රට පුරාමත් මේ වාගේ දැනුවත් කිරීම් වැඩසටහන්, අකුණු අනතුරු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වන බවත් මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එතුමා කිව්වා, සම්බන්ධ වෙලා වැඩ කිරීම පිළිබඳව. අපේ ආයතන තරම් අනික් අමාත්‍යාංශ එක්ක එකතු වෙලා වැඩ කරන ආයතනයක් නැතුව ඇති කියලා මා හිතනවා. මොකද, එහෙම තමයි මේ ව්‍යුහය සකස් වෙලා තිබෙන්නේ. අපේ අමාත්‍යාංශය කටයුතු කරන්නේ අතිගරු ජනාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවෙන් දෙන උපදෙස් අනුවයි. විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝ පිරිසක් එහි සාමාජිකත්වය දරනවා. නමුත් අවාසනාවකට විපක්ෂ නායකතුමාවත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්වත් අද වන කල් එම සභාවට සහභාගි වන්නේ නැහැ. එම නිසා පාර්ලිමේන්තුවේ සිට බෙරිහන් දෙන්නේ නැතුව, ජනමාධ්‍යවලට ගිහින් බෙරිහන් දෙන්නේ නැතුව, අඩු පාඩු තිබෙනවා නම්, යෝජනා තිබෙනවා නම්, ඒ සඳහා හොඳම දෙය තමයි, ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවට ඇවිල්ලා උත්තර ලබා දීම කියන එක මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව හැම දාම විවිධ කථා කියනවා. මේ සභාව පවත්වන තැන හොඳ නැහැ, මේ සභාව අරලියගහ මන්දිරයේ පවත්වන එක හොඳ නැහැ, - [බාධා කිරීමක්] මොකක්ද කියන්නේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

එය පාර්ලිමේන්තු කමිටුවක් නේ. එය පාර්ලිමේන්තුවේ පවත්වන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මෙම සභාව ජාතික මට්ටමේ කමිටුවක්. මෙය අරලියගහ මන්දිරයේ පවත්වන කොට තමුන්නාන්සේලාට භයක් තිබෙනවා ද? තමුන්නාන්සේලාගේ නායකයාට කළු කෝපි බොන්න එතැනට යන්න පුළුවන් නම්, තමුන්නාන්සේලාගේ නායකයාට කළු කෝපි බොන්න, එක එක යෝජනා අරගෙන ජනාධිපතිතුමා හම්බ වෙන්න යන්න පුළුවන් නම් තමන්ගේ මන්ත්‍රීවරුන් එක්ක එතැනට යන්න බැරි ඇයි? තමන්ගේ මන්ත්‍රීවරුන් ගැන විශ්වාසයක් නැහැ. එම නිසා තමයි එතැනට යන්නේ නැත්තේ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන් ගැන තමුන්නාන්සේලාගේ නායකයාට තවමත් කිසිම විශ්වාසයක් නැහැ. මොකද, ගියාම එතැන නවතීවිය කියන භයක් තිබෙනවා. ඒකයි වෙලා තිබෙන්නේ. අරලියගහ මන්දිරය කියන්නේ ජනාධිපතිතුමාගේ නිල නිවසවත්, ජනාධිපතිතුමාගේ පෞද්ගලික බූදලයක්වත් නොවෙයි නේ. ඒක රජයේ කාර්යාලයක්. ජනාධිපතිතුමාගේ කාර්යාලයයි එතැන තිබෙන්නේ. එතැන අනික් සියලුම රැස්වීම් පවත්වනවා. ජාතික මට්ටමේ, ජාත්‍යන්තර මට්ටමේ නායකයෝ එතැනට එනවා. එතැන සියලු සම්මන්ත්‍රණ පැවැත්වෙනවා; රැස්වීම් පැවැත්වෙනවා. ඔබතුමන්ලාගේ නායකයා එතැනට යනවා. එහෙම නම් මෙම සභාවට සම්බන්ධ වෙලා යෝජනා ඉදිරිපත් කිරීම තමයි වඩා වැදගත් වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා තවත් කාරණයක් කිව්වා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සේවක හිඟය සම්බන්ධව. මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. මෙය කාටවත් බෝලය පාස් කරන එකක් නොවෙයි. විද්‍යාත්මක සේවයේ නිලධාරින් බඳවා ගන්න අපට පුළුවන්කමක් නැහැ. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ඒ සඳහා වෙනම විභාගයක් පවත්වා තමයි මේ නිලධාරින් බඳවා ගන්නේ. මේ ක්‍රමය තමයි දැනට පවත්වා ගෙන යන්නේ. අපට එය වළක්වන්න බැහැ. ඒ විභාගය දැන් පවත්වා තිබෙනවා.

මෙය ඇමතිතුමාගේ අඩු පාඩුවක් නොවෙයි. ඒ විභාගය වාර්ෂිකව පැවැත්වෙනවා. නමුත් ඒ විභාගයෙන් සමත් වන පිරිසේ අඩුවක් තිබෙනවා. ඒ වාගේම ඒ අය මුළු රටේම විද්‍යාත්මක සේවයටයි බඳවා ගන්නේ. අපට ප්‍රමාණවත් තරම් නිලධාරින්ගේ අඩුවක් තිබෙන බව අපි පිළිගන්නවා. නිලධාරින් 23දෙනකුගේ හිඟයක් දැනටමත් තිබෙනවා. මේ නිලධාරින් බඳවා ගෙන අපට ලබා දෙන කල් කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාම ගිය අය ලබා ගැනීම සඳහා අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. එය පහසු කටයුත්තක් නොවෙයි. දැන් එය ක්‍රියාත්මක වනවා. ලබන මාසය වන විට මේ නිලධාරින් ලබා දෙන බවට අපව දැනුවත් කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම පිළිබඳව එතුමා කිව්වා. එයට යම් ආකාරයකට එකඟ වන්න අපට සිද්ධ වනවා. මා අමාත්‍යවරයා විධියට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම සඳහා ව්‍යාපෘතියක් සකස් කරලා, එයට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කරලා තිබෙනවා. අවාසනාවට වාගේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතාව මේ සඳහා යොමු වුණාද කියන ගැටලුව තිබෙනවා. ඒ පිළිබඳව අපි ඇත්ත කථා කරන්නේ. අපට කිව්වා, මෙයට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ජයිකා ආයතනයෙන් ලබා දෙනවාය කියලා. නමුත් ඒක සාර්ථක වුණේ නැහැ. ගිය මාසේ කිව්වා, කොයිකා ආයතනයෙන් මේ මුදල අපට ලබා දෙනවාය කියලා. අපි බලාපොරොත්තු වනවා, මේ මුදල ලැබුණු විගසම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීමේ කටයුතු කරන්න. එය අපේ අමාත්‍යාංශයේ කාර්ය භාරයක්. මුදල් සොයා දීමේ කාර්ය භාරයට අපේ අමාත්‍යාංශයට උදවු කළොත්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අනිවාර්යයෙන්ම මීට වඩා වැඩි වග කීමකින් නිවේදන නිකුත් කිරීමේ හැකියාව, එහෙම නැත්නම් වග කීමක් සහිත අනාවැකි කීමේ හැකියාව ඇති කර ගන්නවා වාගේම ඒ කටයුතු සාර්ථකව කර ගෙන යෑමට හැකියාව ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම එතුමා කථා කරපු තවත් කාරණයක් තමයි, මාතලේ ගිලා බැසීම සම්බන්ධ කාරණය. දැන් අපි ඒවාත් සිතියම්ගත කරලා බොහොමයක් කටයුතු කරලා තිබෙනවා. අපේ අතිගරු ජනාධිපතිතුමාට අපි ස්තුතිවන්ත වන්න ඕනෑ.

නාය යෑම් සම්බන්ධයෙන් කටයුතු කරන අපේ අමාත්‍යාංශයේ තිබෙන ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය වෙනුවෙන් දැනටමත් විශාල මුදලක් අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීමෙන් ආසියානු සංවර්ධන බැංකු ආධාර වැඩ සටහන යටතේ අපට ලබා දීලා තිබෙනවා. ඒ අනුව ලබන වර්ෂය තුළ පාසල් 18ක නාය යෑම අවම කිරීම සඳහා රුපියල් මිලියන 1,000කට ආසන්න මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා. ඊට අතිරේකව නාය යෑමේ අවදානමට ලක්වන මාර්ග ගණනාවක් සකස් කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියත් සමඟ එකතුව කටයුතු කිරීමට අපේ ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන බවත් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි නිරන්තරයෙන්ම අපේ අමාත්‍යාංශය මෙහෙයවන්න බලාපොරොත්තු වන්නේ, විපතක් සිදු වුණාම සහනාධාර දෙන අමාත්‍යාංශයක් බවට පත් කිරීමට නොවෙයි. විපත් වළක්වන්න අපි කටයුතු කරන්නේ කොහොමද, විපත්වලින් වන හානිය අවම කිරීමට කටයුතු කරන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව තමයි අපේ දැඩි අවධානය යොමු කරලා තිබෙන්නේ. ඒ කටයුතු සඳහා අපට පසු ගිය වර්ෂයට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් මේ වර්ෂයේදී ලබා දීලා තිබෙනවා. ඒ

[ගරු මහින්ද අමරවීර මහතා]

